74 වන කාණ්ඩය
12 වන කලාපය

අඟහරුවාද
1967 සැප්තැම්බර් 5

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

### නිල වාර්තාව

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 3065]

පෞද්ගලික මන්ත්‍රීන්ගේ කෙටුම්පත් පනත් [තී. 3080] :

The Susitha Wadana Samithiya of Hendala (Incorporation) Bill—
[රාජනීතිඥ වර්නන් ජෝන්ක්ලස් මයා.]
පළමුවන වර කියවන ලදී.

විසර්ජන කෙටුම්පත් පනත, 1967-68 [විසිවන වෙන් කළ දිනය] [තී. 3081] :
ශීර්ෂ 125 සහ 134 කාරක සභාව විසින් සලකා බලන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 74
இல. 12

செவ்வாய்க்கிழமை
5, செப்ரம்பர் 1967

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

வினுக்களுக்கு வாய்மூல விடைகள் [ப. 3065]

தனியங்கத்தவர் மசோதா [ப. 3080] :

The Susitha Wadana Samithiya of Hendala (Incorporation) Bill—
[திரு. வேணன் ஜொங்ளஸ், கியூ. சி.]
முதன்முறை மதிப்பிடப்பட்டது.

ஒதுக்கீட்டு மசோதா, 1967–68 [ஒதுக்கப்பட்ட இருபதாம் நாள்] [ப. 3081] :
குழுவில் ஆராயப்பட்ட தலைப்புக்கள் 125 ; 134

---

Volume 74
No. 12

Tuesday
5th September 1967

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [Col. 3065]

PRIVATE MEMBERS' BILL [Col. 3080]:

The Susitha Wadana Samithiya of Hendala
(Incorporation) Bill—[Mr. Vernon Jonklaas, Q.C.]
Read the First time

APPROPRIATION BILL, 1967-68 [Twentieth Allotted Day] [Col. 3081]
Considered in Committee Heads 125 and 134

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## House of Representatives

### 1967 සැප්තැම්බර් 5 වන අඟහරුවාදා

செவ்வாய்க்கிழமை, 5 செப்ரம்பர் 1967

*Tuesday, 5th September 1967*

---

පූ. භා. 9.30 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [එස්. සී. ෂර්ලි කොරයා මහතා] මූලාසනාරූඪ විය.

சபை, மு.ப. 9.30 மணிக்குக் கூடியது. உப சபா நாயகர் அவர்கள் [திரு. எஸ். சீ. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at 9.30* A.M., MR. DEPUTY SPEAKER [MR. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

## வினாக்களுக்கு வாய்மூல விடைகள்

## ORAL ANSWERS TO QUESTIONS

### මෝටර් රථ ආනයනය

### மோட்டார் வாகன இறக்குமதி

### MOTOR VEHICLE IMPORTS

7. **කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා.** (සොරණාතොට)

*(திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா —சொரணத்தோட்டை)*

(Mr. K. Y. M. Wijeratne Banda—Soranatota)

රාජ්‍ය කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1965 අප්‍රේල් මාසයේ 1 වැනි දින සිට 1967 අප්‍රේල් 1 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් වාහන කොපමණ ගෙන්වන ලද්දේද? (i) කාර්, (ii) ලොරි, (iii) ජීප්, (iv) ට්‍රැක්ටර්. (ආ) මෙම වාහන ලබාගත් අයගේ නාම ලේඛනය ඉදිරිපත් කරනවාද? (ඉ) එකී වාහන සඳහා රජයට දරන්නට වූ විදේශ විනිමය කොපමණද?

*இராஜாங்க அமைச்சரைக் கேட்ட வினா: (அ) 1965 ஏப்ரில் மாதம் 1 ஆம் தேதியிலிருந்து 1967 ஏப்ரில் 1 ஆம் தேதி வரையான காலத்துள் கீழே குறிப்பிட்டுள்ள வாகனங்கள் எத்தனை இறக்குமதி செய்யப்பட்டன: (i) கார் (ii) லொறி (iii) ஜீப் (iv) டிருக்ரர்? (ஆ) இவ்வாகனங்களைப் பெற்றுக் கொண்டவர்களின் பெயர் அட்டவணையை அவர் சமர்ப்பிப்பாரா? (இ) மேற்படி வாகனங்களுக்காக அரசாங்கத்திற்குப் பொறுக்க நேரிட்ட வெளிநாட்டுச் செலாவணி எவ்வளவு?*

asked the Minister of State: (*a*) How many of the following vehicles were imported during the period 1.4.65 to 1.4.67: (i) Cars, (ii) Lorries, (iii) Jeeps, (iv) Tractors? (*b*) Will he table a list of the names of those who received these vehicles? (c) How much foreign exchange did the Government have to use for these vehicles?

**ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති—රාජ්‍ය කටයුතු ඇමති වෙනුවට)**

*(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க— உள்நாட்டு விவகார அமைச்சர்—இராஜாங்க அமைச்சர் சார்பாக)*

(The Hon. Dr. W. Dahanayake—Minister of Home Affairs—on behalf of the Minister of State)

(අ) (i) 844, (ii) 731, (iii) 517, (iv) 259. (ආ) * බලපත්‍රලත් අයගේ නම් ලැයිස්තුවක් මේ සමග ඉදිරිපත් කරමි. (ඉ) රු. 8,45,49,510 වටිනාකම ඇති විදේශ විනිමයක් පාවිච්චි කරන ලදී.

---

* ඉදිරිපත් කරන ලද ලැයිස්තුව මෙදින වැඩ කටයුතු අවසානයේ පරිශිෂ්ට අංක II වශයෙන් පළ කරනු ලැබේ.

சபாபீடத்து வைக்கப்பட்ட நிரல், இன்றைய நடவடிக்கைகளினிறுதியில் அநுபந்தம் II ஆகத் தரப்பட்டிருக்கின்றது.

*The Statements tabled are reproduced as Appendix No. II at the end of this Day's Proceedings.*



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ඉන්දියානුවන්ගේ ඉඩම් ගනු දෙනු : ලියාපදිංචි කිරීම තහනම් කිරීම

## இந்தியர் சொத்துக்கள் வாங்கல் : பதிவுத்தடை

## PROPERTY TRANSACTIONS OF INDIANS : BAN ON REGISTRATION

1. බී. එච්. බණ්ඩාර මයා. (බදුල්ල—ලක්ෂ්මන් ජයකොඩි මයා.—දිවුලපිටිය—වෙනුවට)

*(திரு. பி. எச். பண்டார—பதுளை—திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய—சார்பாக)*

(Mr. B. H. Bandara—Badulla—on behalf of Mr. Lakshman Jayakody—Divulapitiya)

ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ඉන්දු ලංකා ගිවිසුම (ක්‍රියාවට නැගීමේ) පනතට අග්‍රාණ්ඩුකාරතුමා අනුඥාව දුන් දිනයෙ සිට අවුරුදු 15ක් ඉකුත්වන තෙක් ; (i) ඕනෑම ඉන්දියානු පුරවැසියෙකු ; (ii) ඉන්දියානු සහ පකිස්තානු පුරවැසි පනත යටතේ ලියාපදිංචි වූ ඕනෑම ලාංකික පුරවැසියෙකු ; (iii) ඕනෑම නිර්රාජ්‍ය පුද්ගලයෙකු ; (iv) ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාවට නැගීමේ) පනත යටතේ ලාංකික පුරවැසි භාවය ඉල්වා සිටින ඕනෑම නිර්රාජ්‍ය පුද්ගලයෙකු ; විසින් විකුණුම්කර, බදුකර, උකස්කර යනාදිය ලියා පදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් ලියාපදිංචි නොකරන ලෙසට දිවයිනේ (විශේෂයෙන් උඩරට පළාත්වල) සිටින සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර් වරුන්ට එතුමා නිත්‍ය උපදෙස් දෙනවා ද ? (ආ) නොඑසේ නම්, ඒ මන් ද ?

*உள்நாட்டு விவகார அமைச்சரைக் கேட்ட வினா : (அ) இந்திய-இலங்கை (அமுல் நடத்தும்) சட்டத்திற்கு மகாதேசாதிபதி இசைவு கொடுத்த தேதியிலிருந்து 15 ஆண்டுகள் முடியும் வரைக்கும், (i) இந்தியப் பிரஜை எவராவது ; (ii) இந்தியர், பாகிஸ்தானியர் பிரஜாவுரிமைச் சட்டத்தின் கீழ் பதிவு செய்யப்பட்ட இலங்கைப் பிரஜை எவராவது ; (iii) நாடற்றவர் எவராவது ; (iv) இந்திய-இலங்கை (அமுல் நடத்தும்) சட்டத்தின் கீழ் இலங்கைப் பிரஜா உரிமைக்கு விண்ணப்பிக்கும் நாடற்றவர் எவராவது மாற்றல்கள், குத்தகைகள், ஈடுகள் முதலியவற்றைப் பதிவு செய்யும்படி கேட்டு விடுக்கும் விண்ணப்பங்களைப் பதிவு செய்யக்கூடாதென்று நாட்டிலுள்ள காணிப் பதிவாளர்களுக்கு (முக்கியமாகக் கண்டிய மாகாணங்களிலுள்ளவர்களுக்கு) அவர் திட்டவட்டமான உத்தரவு விடுப்பாரா ? (ஆ) இல்லையெனில் ஏன் ?*

asked the Minister of Home Affairs : (*a*) Will he give specific instructions to all registrars of lands (especially in the Kandyan provinces) in the island not to register transfers, leases, mortgages, etc., on applications made by : (i) any Indian citizen ; (ii) any Ceylon citizen registered under the Indian and Pakistani Residents (Citizenship) Act ; (iii) any stateless person ; (iv) any stateless person who applies for Ceylon citizenship under the Indo-Ceylon Agreement (Implementation) Act ; until 15 years elapse from the date of assent of the Governor-General given to the Indo-Ceylon Agreement (Implementation) Act ? (*b*) If not, why ?

ගරු ආචාර්ය දහනායක

*(கௌரவ கலாநிதி தகநாயக்க)*

(The Hon. Dr. Dahanayake)

(අ) (i) නැත. (ii) නැත. (iii) නැත. (iv) නැත. (ආ) ඉහත සඳහන් ගනයට අයත් අයගේ ඔප්පු ලියාපදිංචි නොකර සිටීමට දැනට බලපවත්වන නීති අනුව ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන්ට බලයක් නොමැති හෙයින් ඔවුන්ට එසේ කරන ලෙස උපදෙස් දිය නොහැක. කෙසේ වෙතත්, 1963 අංක 11 දරන මුදල් පනතේ හයවන කොටසේ අවශ්‍යතාවයන් වන, ලංකා පුරවැසියෙක් නොවන අයකු විසින් ලංකාවේ පිහිටි ඉඩමක අයිතිය පවරා ගන්නා විට, එම ඉඩමේ වටිනාකමට සමාන බද්දක්, එම ඔප්පුව ලියාපදිංචි කිරීම පිණිස ඉදිරිපත් කිරීමට ප්‍රථම, ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත ගෙවීම, ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් ක්‍රියාත්මක කර ඇත. (අ) කොටසේ (i), (iii) සහ (iv) ගණයට අයත් අයවළුන් විසින් මෙම බද්ද ගෙවිය යුතු වේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

### යාපනයේ දිස්ත්‍රික් සම්බන්ධතා කමිටුවේ සහ කෘෂිකාර්මික කමිටුවේ රැස්වීම්වල නිලවාර්තා

யாழ்ப்பாண மாவட்ட இணைப்புக் குழு, மாவட்ட விவசாயக் குழு : அறிக்கை

JAFFNA DISTRICT CO-ORDINATING COMMITTEE AND DISTRICT AGRICULTURAL COMMITTEE : MINUTES

2. බී. එච්. බණ්ඩාර මයා. (ජයකොඩි මයා. වෙනුවට)

*(திரு. பி. எச். பண்டார—திரு. ஜயக்கொடி சார்பாக)*

(Mr. B. H. Bandara—on behalf of Mr. Jayakody)

ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) යාපනේ කච්චේරියේදී පවත්වන ලද, යාපනේ දිස්ත්‍රික් සම්බන්ධතා කමිටුවේ සහ යාපනේ දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික කමිටුවේ පසුගිය රැස්වීමේ නිලවාර්තාව, එතුමා මෙම සභාවට ඉදිරිපත් කරනවාද? (ආ) නොඑසේ නම්, ඒ මන්ද?

*உள்நாட்டு விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) இறுதியாக, யாழ்ப்பாணக் கச்சேரியில் நடைபெற்ற யாழ்ப்பாணம் மாவட்ட இணைப்புக்குழுக் கூட்டம், யாழ்ப் பாணம் மாவட்ட விவசாயக் குழுக் கூட்டம் ஆகியவற்றின் உத்தியோகபூர்வமான அறிக் கையின் பிரதியை அவர் சமர்ப்பிப்பாரா? (ஆ) இல்லையெனில், ஏன்?*

asked the Minister of Home Affairs: (*a*) Will he table a copy of the official minutes of the meeting of the Jaffna District Co-ordinating Committee and of the Jaffna District Agricultural Committee which was last held at the Jaffna kachcheri? (*b*) If not, why.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

(අ) ඔව්.* (ආ) උද්ගත නොවේ.

---

* සභාගත කරන ලද ලේඛනය මෙ දින වැඩ කටයුතු අවසානයේ පරිශිෂ්ට අංක I වශයෙන් පළ කරනු ලැබේ.

වාචික පිළිතුරු

### ලංකා කාර්මික විද්‍යාලයේ රසායනාගාර සහකාර පී. එස්. කුමාරපේලි මහතා

இலங்கை நுண்தொழிற் கல்லூரி ஆய்கூட உதவியாளர் திரு. பீ. எஸ். குமாரப்பெலி

MR. P. S. KUMARAPELI, LABORATORY ASSISTANT, CEYLON TECHNICAL COLLEGE

3. බී. වයි. තුඩාවෙ මයා. (මාතර—පර්සි වික්‍රමසිංහ මයා.—කඹුරුපිටිය—වෙනුවට)

*(திரு. பி. வை. துடாவ—மாத்தறை—திரு. பேர்ஸி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய—சார்பாக)*

(Mr. B. Y. Tudawe—Matara—on behalf of Mr. Percy Wickremasinghe—Kamburupitiya)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (i) (අ) ලංකා කාර්මික විද්‍යාලයේ රසායනාගාර සහකාර තනතුරට පී. ඇස් කුමාරපේලි මහතා පත් කරන ලද දිනය; (ආ) එම තනතුරෙහි ඔහු ස්ථිර කරන ලද දිනය; (ඉ) ඔහු එම තනතුර අත්හල දිනය; (ii) ඔහුගේ පත්වීමේ වැටුප් පරිමාණය සහ සේවය අත්හරින අවස්ථාවේ ඔහු ලබමින් සිටි වැටුප; (iii) තනතුර අත්හරිනලද දිනයේ සිට 1961.10.31 වැනිදා දක්වා රසායනාගාර සහකාර තනතුරේ සිටියානම් ඔහුට ලැබෙන සම්පූර්ණ වැටුප් සහ වේතන ප්‍රමාණය එතුමා සඳහන් කරනවාද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (i) (அ) திரு. பீ. எஸ். குமாரப்பெலி இலங்கை நுண்தொழிற் கல்லூரியில் ஆய்கூட உதவியாளராக நியமிக்கப்பட்ட, (ஆ) அப் பதவியில் அவர் உறுதிப்படுத்தப் பட்ட, (இ) அவர் அதிலிருந்து விலகிய தேதிகளும்; (ii) அவர் எச்சம்பள விகிதத்தில் நியமிக்கப்பட்டாரோ அச்சம்பள விகிதமும், அவர் பதவியிலிருந்து விலகியபோது பெற்ற சம்பளமும்; (iii) பதவியிலிருந்து விலகிய நாளிலிருந்து 31.10.1961 வரை ஆய்கூட உதவியாளராக அவர் பெற்றிருக்கக் கூடிய சம்பளமும், வரும்படிகளும் யாவை என அவர் தெரிவிப்பாரா?*

asked the Minister of Education and Cultural Affairs: Will he state (i) the date (*a*) on which Mr. P. S. Kumarapeli was appointed a laboratory assistant in the Ceylon Technical College; (*b*) he was confirmed in that post; (*c*) he relinquished it; (ii) the salary scale on which he was appointed and the point at which he was at

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවෙ මයා.]

the time he relinquished his duties ; (iii) the total salary and emoluments he would have drawn as a laboratory assistant from the date he relinquished the duties of that post until 31.10.1961 ?

**ගාමිණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. காமனி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

(i) (*a*) 1.5. 1952. (*b*) There is no letter of confirmation to be found in the Personal File. (c) 15.9.1958.

(ii) Rs. 840—14 × 120—2,520 (Efficiency Bars before Rs. 1,320 and 2,040). In terms of the salary conversion in 1955 this scale changed to Rs. 1,020—15 × 120—2,820 (Efficiency Bars before Rs. 1,500 and 2,220) Rs. 1,740 p.a.

| | | Rs. |
|---|---|---|
| (iii) | Salary .. | 5,982.34 |
| | Rent Allowance .. | 508.31 |
| | Cost of Living Allowance .. | 3,779.99 |
| | Special Living Allowance .. | 647.50 |
| | Total .. | 10,918.14 |

## මාතර රාහුල පාරේ පදිංචි ආර්. එෆ්. වී. තිලකරත්න මහතා වෙනුවෙන් ඉඩමක් අත්පත් කරගැනීම

மாத்தறை இராகுல வீதி திரு. ஆர். எப். வி. திலகரத்னவுக்கு காணி கொள்வனவு

ACQUISITION OF LAND FOR MR. R. F. V. TILAKARATNE, RAHULA ROAD, MATARA

4. **බී. එච්. බණ්ඩාර මයා.** (එස්. ඩී. බණ්ඩාරනායක මයා.—ගම්පහ—වෙනුවට)

*(திரு. பி. எச். பண்டார—திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹ—சார்பாக)*

(Mr. B. H. Bandara—on behalf of Mr. S. D. Bandaranayake—Gampaha)

කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මාතර රාහුල පාරේ අංක 96 දරන ස්ථානයේ පදිංචි ආර්. එෆ්. වී. තිලකරත්න මහතා, ජාතික නිවාස කොමසාරිස්තුමාගේ අංක අත්. ශා/3 දරන චක්‍ර ලේඛනය ප්‍රකාර මාතර රාහුල පාරේ වැලිවේරියවත්තෙන් පර්චස් 20 ක බිම් කැබැල්ලක් අත්පත් කර ගැනීම පිණිස ඉල්ලුම් පත්‍රයක් (ඉල්ලුම් පත්‍රයේ අංකය 277යි) ඉදිරිපත් කළ බව එතුමා දන්නවාද? (ආ) මෙම ඉඩම අත්පත් කර ගැනීම පිණිස ඉල්ලුම්කරු ලංකා බැංකුවෙන් ණය මුදලක් ලබාගෙන 64. 5. 4 වන දින රු. 866ක් ද, 64. 10. 15 වන දින රු. 3,465 ක් ද, 65. 10. 19 වන දින රු. 867 ක් ද කොමසාරිස්තුමාට ගෙවූ බව එතුමා දන්නවාද? (ඉ) අත්පත් කළ යුතු යයි යෝජනා කරන ලද ඉඩම හිමි පුද්ගලයාට, මාතර නගර සභා සීමාව තුළ ගෙවල් 25 කට වඩා වැඩි ගණනක් අයිතිව තිබෙන බැවින් මේ අත්පත් කර ගැනීම වහාම කරන ලෙස එතුමා නියෝග කරනවාද?

*தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா: (அ) மாத்தறை, இராகுல வீதி, 96 ஆம் இலக்கத்தைச் சேர்ந்த திரு. ஆர். எப். வி. திலகரத்ன, தேசிய வீடமைப்பு ஆணையாளரின் அத்-ஶா/3 இலக்கச் சுற்றறிக்கைக்கு அமைய, மாத்தறை, இராகுல வீதி வலிவெறியவத்தையிலிருந்து 20 பேச்சஸ் காணித்துண்டைக் கொள்வனவு செய்து தரும்படி விண்ணப்பித்தார் (விண்ணப்ப இலக்கம் 277) என்பதனை அவர் அறிவாரா? (ஆ) இந்த விண்ணப்பதாரர் இலங்கை வங்கியிலிருந்து கடன்பெற்று தேசிய வீடமைப்பு ஆணையாளரிடம் 4.5.64 இல் ரூ. 866 உம்; 15.10.64 இல் ரூ. 3,465 உம் 19.10.65 இல் ரூ. 867 உம் இந்தக் காணிக் கொள்வனவுக்கெனக் கொடுத்தார் என்பதை அவர் அறிவாரா? (இ) உத்தேசக் கொள்வனவுக் காணியின் உடைமையாளர் மாத்தறை நகர சபை எல்லைக்குள் 25 க்குமதிகமான வீடுகள் வைத்திருப்பதால், இந்தக் கொள்வனவு உடனடியாக நடைபெற வேண்டுமென்று அமைச்சர் உத்தரவிடுவாரா?*

asked the Minister of Labour, Employment and Housing: (*a*) Is he aware that Mr. R. F. V. Tilakaratne of No. 96, Rahula Road, Matara, had applied for the acquisition of a block

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

of 20 perches of land from Waliweriyawatta, Rahula Road, Matara, in accordance with circular No. අත්,ශ./3/ (Application No. 277) of the Commissioner of National Housing ? (b) Is he aware that this applicant obtained a loan from the Bank of Ceylon and paid the Commissioner of National Housing on 4.5.64—Rs. 866, on 15.10.64—Rs. 3,465 and on 19.10.65—Rs. 867 for the acquisition of this land ? (c) In view of the fact that the owner of this land proposed for acquisition has over 25 houses within the U.C. limits of Matara, will he order this acquisition to be done immediately ?

**එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. S. de S. Jayasingha—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing)

(අ) ඔව්. (ආ) 1964.5.4 වැනි දින රු. 866 ක් ද, 1964.10.15 වැනි දින රුපියල් 3,465 ක් ද, 1965.10.19 වැනි දින තවත් රු. 867 ක් ද, ජාතික නිවාස කොමසාරිස් වෙත තැන්පත් කර ඇත. මේ සඳහා ණය මුදලක් ලංකා බැංකුවෙන් ලබා ගෙන ඇති බවක් මම නොදනිමි. (අත්පත් කරගැනීම අත්හැර දමූ හෙයින්, තැන්පත් මුදල ආපසු ගෙවීමට හැකිවන පරිදි නිසි පරිදි පුරවා ආපසු එවීම පිණිස, එම මුදලට වවුචරයක් 1966.8.5 වැදි දින අයදුම්කරු වෙත තැපැල් කර ඇත. එම වවුචරය ජාතික නිවාස කොමසාරිස් වෙත මෙතෙක් ආපසු එවා නැත.) (ඉ) මෙම ඉඩම නිවාස කටයුත්තක් සඳහා සම්පූර්ණයෙන්ම නුසුදුසු බව අත්පත් කර ගැනීමේ නිලධාරියා වන මාතර දිසාපති සලකන හෙයින්, ඔහු මෙම ඉඩම අත්පත් කර ගැනීම නිර්දේශ නොකළේය. ජාතික නිවාස කොමසාරිස් ද මේ ගැන ස්වාධීනව පරීක්ෂා කර බලා දිසාපතිගේ අදහස් අනුමත කර ඇත. කරුණු මෙසේ හෙයින් යථෝක්ත අත්පත් කර ගැනීම අත්හැර දැමීමට තීරණය කරන ලදී.

## ලංගම ඩිපෝව, බැන්ඩියමුල්ල, ගම්පහ

*இ. போ. ச. நிலையம், பண்டியமுல்லை, கம்பஹ*

**C. T. B. DEPOT, BENDIYAMULLA, GAMPAHA**

5. **ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල—එස්. ඩී. බණ්ඩාරනායක මයා. වෙනුවට)

*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புளை—திரு. எஸ். டீ. பண்டாரநாயக்க சார்பாக)*

(Mr. T. B. Tennekoon—Dambulla—on behalf of Mr. S. D. Bandaranayake)

ජනසතු සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ගම්පහ ඡන්ද කොට්ඨාශයේ බැන්ඩියමුල්ලේ පිහිටි ලංගම ඩිපෝව 67.9.1 වන දින වසා දැමීමට යෝජනාවක් කර තිබේ ද? (ආ) බස්වලින් ගමන් කරන මහජනයාට මෙන්ම කම්කරුවන්ට ද මෙම ඩිපෝව ප්‍රයෝජනවත් වන බැවින්, මේ ප්‍රශ්නය ගැන එතුමා නැවත සලකා බලනවාද ?

*தேசியமயச் சேவை அமைச்சரைக் கேட்ட வினா : (அ) கம்பஹத் தொகுதியிலுள்ள பண்டியமுல்லையிலுள்ள இ. போ. ச. நிலையத்தை 1.9.67 இல் மூடிவிடுவதென தீர்மானிக்கப்பட்டுள்ளதா ? (ஆ) பிரயாணம் செய்யும் பொது மக்களுக்கும் தொழிலாளர்கட்கும் இந்நிலையம் மிகவும் பயன்படக் கூடியதாயிருப்பதால் அமைச்சர் இவ்விடயத்தை மறு பரிசீலனை செய்வாரா ?*

asked the Minister of Nationalized Services : (a) Is there a proposal to close down the C. T. B. depot at Bendiyamulla in the Gampaha Electorate on 1.9.67 ? (b) In view of the fact that this depot is helpful to both the travelling public and the workers, will he reconsider this matter ?

**ගරු ඩී. බී. වෙලගෙදර (ජනසතු සේවා කටයුතු පිළිබඳ වැඩ බලන ඇමති)**

*(கௌரவ டீ. பி. வெலகெதர—பதில் தேசியமய சேவை அமைச்சர்)*

(The Hon. D. B. Welagedera—Acting Minister of Nationalized Services)

(අ) ගම්පහ ඡන්ද කොට්ඨාශයේ බැන්ඩියමුල්ලේ ලං. ග. ම. ඩිපෝවක් නැත. එහි ඇත්තේ උප ඩිපෝවක් පමණි. එය 67. 9. 1 වෙනි දින සිට වසා දැමීමට යෝජනා කර නැත. (ආ) පැන නො නගී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## යටියන්තොට සුළු නගර සභාව: අනිසි පාලනය

யட்டியாந்தோட்டைப் பட்டினசபை : சீர்கெட்ட நிர்வாகம்

YATIYANTOTA TOWN COUNCIL : MISMANAGEMENT

6. ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන්තොට)

*(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)*

(Dr. N. M. Perera—Yatiyantota)

පළාත් පාලන ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) යටියන්තොට සුළු නගර සභාවේ පාලනය බොහෝ සෙයින්ම අනිසි ලෙස කර තිබෙන බව එතුමා දන්නවාද (ආ) පහත සඳහන් කරුණු ගැන එතුමා පරීක්ෂාකර බලනවාද? (i) මැයි හා ජූනි යන මාසවල මාසික රැස්වීම්, ගණපූරණයක් තිබියදීත් න්‍යාය පත්‍රය සලකා බලන්නේ නැති ව කල්දමා ඇත; (ii) ජූලි මාසයේ 5 වන දින සිට 15 වන දින තෙක්, මහජනයාට ගෙවන්නට උවමනා වූ බදු මුදල් හෝ විදුලි බල ගාස්තු හෝ භාර ගැනීමට කිසිවකු කාර්යාලයේ සිටියේ නැත; (iii) ජූලි මස 15 වන දින සිට මුදල් භාර ගැනීමේ කාර්යය තාවකාලික සේවකයකුට පවරා තිබීම; (iv) බදු මුදල් එකතු කිරීමේ දී සැළකිය යුතු මුදලක් හිඟ වී තිබීම; (v) ගොඩනැගිලි සැලස්ම කෙරෙහි බල පවත්වන රෙගුලාසිවලට පටහැනි ව ගොඩනැගිලි ඉදිකිරීමට අවසර දීම; (vi) මෙම සුළු නගර සභාවට අයත්, එමෙන්ම වෙළඳ පොළක් ඇති කිරීම සඳහා රජය විසින් අනුමත කරන ලද ඉඩමක ස්ථිර ගොඩනැගිල්ලක් තනා ඇති පුද්ගලයකුට විරුද්ධව ක්‍රියා නො කිරීම; (vii) නොමිලේ දෙන පාසැල් පොත් පුරවැසියන් නො වන අයටත් සුළු නගර සභා සීමා තුළ වාසය නොකරන අයටත් බෙදා දීම; (viii) ගණන් පරීක්ෂකයා විසින් ද සොයා ගෙන තිබෙන පරිදි, එකතු කරන ලද බදු මුදල් වලින් රු. 8,000 ක හිඟයක් තිබීම; (ඉ) මෙම පරීක්ෂාව පදනම් කර ගෙන එතුමා නොපමාව ක්‍රියා කරනවාද?

*உள்ளூராட்சி அமைச்சரினதும் தகவல், ஒலிபரப்பு அமைச்சரினதும் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா: (அ) யட்டியாந்தோட்டைப் பட்டின சபை மிகவும் சீர்கேடான முறையில் நிர்வகிக்கப்படுகின்றது என்பதை அவர் அறிவாரா? (ஆ) பின்வரும் விடயங்களைப்பற்றி அவர் விசாரணை நடாத்துவாரா: (i) மே, ஜூன் மாதக் கூட்டங்கள் நிறைவெண் இருந்தும் நிகழ்ச்சி நிரலை ஆராயாமல் ஒத்தி வைக்கப்பட்டமை; (ii) ஜூலை மாதம் 5 ஆம் தேதி தொடக்கம் 15 ஆம் தேதிவரை மக்கள் செலுத்த விரும்பிய வரிகளையோ, மின்சாரக் கட்டணங்களையோ ஏற்க அலுவலகத்தில் எவரும் இல்லாதிருந்தமை; (iii) ஜூலை 15 ஆம் தேதிக்குப் பின்னர் பணத்தை ஏற்கத் தற்காலிகமாக நியமிக்கப்பட்ட ஒருவரிடம் ஒப்படைத்தமை; (iv) குறிப்பிடத்தக்க அளவு வரித்தொகை நிலுவையிலிருப்பது; (v) கட்டட அமைப்புக்கள் பற்றிய பிரமாணங்களை மீறும் விதத்தில் கட்டடங்களைக் கட்டியெழுப்ப அனுமதித்தமை; (vi) சபைக்குச் சொந்தமானதும், அரசாங்கம் சந்தை அமைக்க அனுமதித்ததுமான காணியில் ஒருவர் நிரந்தரக் கட்டடமொன்றைக் கட்டிய போதிலும் அவருக்கு எதிராக எவ்வித நடவடிக்கையும் எடுக்கத் தவறியமை; (vii) பட்டின சபை எல்லைகளுக்குள் வசியாதவர்களுக்கும், இலங்கைப் பிரசையல்லாதவர்கட்கும் பாடப் புத்தகங்களை இலவசமாக வழங்கியமை; (viii) சேகரிக்கப்பட்ட வரித்தொகையில் ரூ. 8,000 குறைவாக இருந்து கணக்குப் பரிசோதகராலும் கண்டு பிடிக்கப்பட்டவை; (இ) இவ்விசாரணையின் அடிப்படையில் அவர் கூடிய விரைவில் நடவடிக்கை எடுப்பாரா?*

asked the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information and Broadcasting: (*a*) Is he aware that the Yatiyantota Town Council has been hopelessly mismanaged? (*b*) Would he inquire into the following matters: (i) the monthly meetings of May, June have been adjourned without considering the agenda notwithstanding the presence of a quorum; (ii) from the 5th to the 15th July, there has been nobody in the office to accept either taxes or electricity dues which the people wished to pay; (iii) the entrusting of the acceptance of money to a temporary hand since 15th of July; (iv) considerable arrears in the collection of taxes; (v) permitting the putting up of buildings

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

contrary to the regulations governing building plans ; (vi) failure to take action against a person who has put up a permanent structure on a land belonging to the council and approved by the Government for a market ; (vii) distribution of free school books to non-citizens and to those who do not come within the T. C. limits ; (viii) Shortage of Rs. 8,000 in the taxes collected which has been discovered by the auditor also ? (c) Would he take early action on the basis of this inquiry ?

ආර්. ප්‍රේමදාස මයා. (පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரதும், தகவல், ஒலிபரப்பு அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. R. Premadasa—Parliamentary Secretary to the Minister of Local Govern ment and to the Minister of Information & Broadcasting)

(a) I am not aware. (b) Yes. (c) A special officer will be sent to inquire into these allegations.

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

Thank you very much. I hope you will take firm action.

**නු/කුඹල්ගමුව විද්‍යාලයේ ශිෂ්‍ය ගුරු එම්. ඒ. සෝමදාස මයා.**

என்/கும்பல்கமுவ வித்தியாலய மாணவ ஆசிரியர் திரு. எம். ஏ. சோமதாச

**MR. M. A. SOMADASA, PUPIL TEACHER, N/KUMBALGAMUWA VIDYALAYA**

8. ටී. බී. තෙන්නකෝන් මයා. (ටී. බී. එම්. හේරත් මයා.—වලපනේ—වෙනුවට)

(திரு. ரீ. பி. தென்னகோன்—திரு. ரி. பி. எம். ஹேரத்—வலப்பனை—சார்பாக)

(Mr. T. B. Tennekoon—on behalf of Mr. T. B. M. Herath—Walapone)

අධ්‍යාපන හා, සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) නු/කුඹල්ගමුව විද්‍යාලයේ 1966.1.1 දිනට සාමාන්‍ය පැමිණීම කවරේද ? (ආ) ඒ අනුව එහි සිටිය යුතු සාමාන්‍ය හා විශේෂ මුළු ගුරු මණ්ඩලය කොතෙක්ද ? (ඉ) 1966.1.1 දින එම විද්‍යාලයේ සෑහෙන තරම් ගුරු මණ්ඩලයක් නොසිටි බව එතුමා දන්නවාද ? (ඊ) එසේ තිබියදී ශිෂ්‍ය ගුරු ඇම්. ඒ. සෝමදාස මහතා දුරබැහැර පාසලකට මාරු කරන ලද්දේ මන්ද ? (උ) ඒ මහතා ආපසු එම පාසැලට මාරු කිරීමට එතුමා ක්‍රියා කරනවාද ? (ඌ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) என்/கும்பல்கமுவ வித்தியாலயத்தில் 1.1.1966 இல் இருந்த சராசரி வரவு என்ன ? (ஆ) இதன்படி, அங்கு இருக்க வேண்டிய விசேட, சாதாரண ஆசிரியர்கள் எண்ணிக்கையென்ன ? (இ) 1.1.66 இல் இந்தப் பாடசாலையிலே போதிய அளவு ஆசிரியர்கள் இருக்கவில்லை என்பதை அவர் அறிவாரா ? (ஈ) இப்படியிருந்துங் கூட, திரு. எம். ஏ. சோமதாச என்ற மாணவ ஆசிரியர் ஏன் தூர இடத்திலுள்ள ஒரு பாடசாலைக்கு மாற்றப்பட்டார் ? (உ) இவ்வாசிரியரைப் பழைய பாடசாலைக்குத் திரும்பவும் மாற்றுவதற்கான நடவடிக்கைகளை அவர் எடுப்பாரா ? (ஊ) இல்லையெனில் ஏன் ?

asked the Minister of Education and Cultural Affairs : (a) What was the average attendance of N/Kumbalgamuwa Vidyalaya as at 1.1.1966 ? (b) According to this figure, what should be the total strength of the staff consisting of specialist and non-specialist teachers ? (c) Is he aware that on 1.1.66 this school did not have an adequate staff ? (d) Despite this, why was pupil teacher, Mr. M. A. Somadasa, transferred to a far-away school ? (e) Will he take action to transfer this teacher back to the old school ? (f) If not, why ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගාමණී ජයසූරිය මයා.**

*(திரு. காமனி ஜயசூரிய)*

(Mr. Gamani Jayasuriya)

(අ) 1966.1.1 දින සිටිය යුතු ගුරු සංඛ්‍යාව තීරණය කරන්නේ 1965 දී අවසන් වූ පාඨශාලා වර්ෂයේ පැමිණීමේ සාමාන්‍ය ගණන අනුවය. එම පැමිනීමේ සාමාන්‍ය ගණන 569.71 කි. (ආ) ඒ අනුව 66.1.1 දින සිටිය යුතු යෝග්‍ය ගුරු සංඛ්‍යාව 21කි. විදුහලක විශේෂඥ ගුරුවරුන් පත්කිරීම එම පාසැලේ පැමිණීමේ සාමාන්‍ය ගණන අනුව සිදු නොවේ. 66.1.1 වැනි දින මේ පාසැලේ සිටි ගුරු සංඛ්‍යාව 24 කි. (ඉ) 66.1.1 වැනි දින එම පාසැලේ සෑහෙන තරම් ගුරු මණ්ඩලයක් සිටියේය. (ඊ) ශිෂ්‍ය ගුරු එම්. ඒ. සෝමදාස මහතා 1967.1.1 දින සිට පරිපාලන අවශ්‍යතාව උඩ වෙනත් පාසලකට මාරු කර යවා ඇත. එය දුර බැහැර පාසලක් නොවේ. (උ) 67.7.15 දින සිට සෝමදාස මහතා නැවතත් කුඹල්ගමුව විද්‍යාලයට මාරු කර ඇත. (ඌ) ඉහත (උ) අනුව උද්ගත නොවේ.

## නොපැමිණීමේ අවසරය: එම්. ඒ. අබ්දුල් මජීඩ් මයා.

*வராதிருக்க அனுமதி : திரு. எம். ஏ. அப்துல் மஜீது*

## Leave of Absence : Mr. M. A. Abdul Majeed

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*

(The Hon. J. R. Jayewardene—Minister of State and parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

I move,

"That Mr. M. A. Abdul Majeed, Member for Pottuvil, be granted leave under Section 24 (1) (*e*) of the Ceylon (Constitution) Order in Council, 1946, to be absent from the Sittings of the House for a period of three months from 5th September 1967."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ කෙටුම්පත් පනත්

*தனி அங்கத்தவர் மசோதா*

## Private Member's Bill

### SUSITHA WADANA SAMITHIYA OF HENDALA BILL

**වර්නන් ජොන්ක්ලස් මයා.** (පත් කරන ලද මන්ත්‍රී)

*(திரு. வீ. ஜொங்க்ளஸ்—நியமன அங்கத்தவர்)*

(Mr. V. Jonklaas—Appointed Member)

I move,

"That leave be granted to introduce a 'Bill to incorporate the Susitha Wadana Samithiya of Hendala'."

The objects of this Society are, without distinction of any kind, such as race, language, religion, political views, social origin, to provide assistance to those who are without any means, care and support; (*b*) in need of medicine and assistance; and (*c*) in urgent and grave need of financial assistance.

**කේ. ඩබ්ලිව්. දේවනායගම් මයා.** (කල්කුඩා)

*(திரு. கே. டபிள்யூ. தேவநாயகம்—கற்குடா)*

(Mr. K. W. Devanayagam—Kalkudah)

විසින් සථිර කරන ලදී.

அனுவதித்தார்.

*seconded.*

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පනත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 51 (4) වන ස්ථාවර නියෝගය යටතේ කෙටුම්පත් පනත අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති වෙත පවරන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

வினு விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

இதன்படி, மசோதா முதன்முறை மதிப்பிடப்பட்டு அச்சிடப்படப் பணிக்கப்பட்டது.

மசோதா, நிலையற் கட்டளை இல. 51 (4) இன்படி கல்வி, கலாசார அலுவல்கள் அமைச்சருக்கு, அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

*Question put, and agreed to.*

*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 51 (4), to the Minister of Education and Cultural Affairs, for report.*

## විසර්ජන කෙටුම්පත් පනත, 1967-68

*ஒதுக்கீட்டு மசோதா, 1967-68*

## APPROPRIATION BILL, 1967-68

**කාරක සභාවෙහිදී සලකා බලන ලදී.— [ප්‍රගතිය සැප්තැම්බර් 4]**

**[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]**

முழுச் சபைக் குழுவில் ஆராயப்பெற்றது. [தேர்ச்சி 4, செப்ரெம்பர்]

[உப சபாநாயகர் அவர்கள் தலைமை தாங்கினார்கள்.]

*Considered in Committee.—[Progress, 4th September]*

[MR. DEPUTY SPEAKER *in the Chair.*]

### 125 වන ශීර්ෂය.—පළාත් පාලන ආමාත්‍ය වරයා

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩි නඩි සහ අනිකුත් දීමනා, රු. 42,87,058**

*125 ஆம் தலைப்பு.—உள்ளூராட்சி அமைச்சர்*

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூ. 42,87,058

### HEAD 125.—MINISTER OF LOCAL GOVERNMENT

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 4,287,058*

**ඉදිරිපත් කරන ලද සංශෝධනය.—[සැප්තැම්බර් 4] :**

" වැය සම්මතය රු. 10කින් අඩු කළ යුතුය. "—[පර්සි වික්‍රමසිංහ මයා.]

பிரேரிக்கப்பட்ட திருத்தம்—[4 செப்ரெம்பர்] :

" வாக்குப்பணத்தில் ரூபா 10 குறைக்கப்படுமாக ". —[திரு. பேஸி விக்ரமசிங்ஹ].

*Amendment moved. [4th September] :*

" That the Vote be reduced by Rs. 10. " —[*Mr. Percy Wickremasinghe*].

**ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.**

வினு மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Question again proposed.*

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ගරු සභාපතිතුමනි, මා දැනගන්න කැමතියි මගේ පිළිතුරු කථාව කියට පමණ කරන්න මට අවස්ථාව ලැබේවිද කියා. මට පැයක පමණ කාලයක් අවශ්‍යයි.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

අ. භා. 2 වන විට කථාව පවත්වන්න අවස්ථාව ලබා දෙනවා.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

ගරු සභාපතිතුමනි, මා ඊයේ කථා කර මින් සිටියේ කොළඹ නගර සභාවේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ සුපිරින් ටෙන්ඩන්ට් තනතුරු පිළිබඳවයි. පත් කිරීම් කරන මණ්ඩලයෙන් සුදුසු අය තෝරා නිර්දේශ කළ නමුත්, ගරු ඇමති තුමාගේ බලපෑම උඩ, ඇඟිලි ගැසීම උඩ, ඒ පත්වීම් දීම නතර කර තිබෙනවා. කොළඹ නගර සභාවටත් වුවමනා කර තිබෙනවා මේ උදවියගේ සේවය ඉක් මනින්ම ලබා ගැනීමට. මේ පිළිබඳව කීප වතාවක්ම කොළඹ නගර සභාව පළාත් පාලන කොමසාරිස්තුමාට දන්වා තිබෙන වා. පළාත් පාලන කොමසාරිස්තුමා ඇමති තුමාට දන්වා තිබෙනවා. කෙසේ වුවද, පළාත් පාලන ආඥාපනත යටතේ මේ කාර ණයෙහිදී ඇමතිතුමාට ඇඟිලි ගසන්නට පුළුවන්කමක් නැහැ. එසේ නමුත්, තමන් ට වුවමනා අයට පත්වීම් නොලැබුණ නිසා වෙන්න පුළුවන්, ඇමතිතුමා මේ ලෙස නුවු වමනා අන්දමට ඇඟිලි ගසා තිබෙන්නේ. ගරු උප ඇමතිතුමාත් එකඟ වන්න පුළු වන් මෙය අයුක්තියක්ය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

තෝරණ මණ්ඩලය විසින් ඉතාමත් සාධාරණ අන්දමට මේ තේරීම් කර තිබෙන නිසා, තව දුරටත් ප්‍රමාද නොකර පත්වීම් දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා.

පත්වීම් ගැන පමණක් නොවෙයි, ඇමති තුමා නුවුවමනා අන්දමට ඇඟිලි ගසා ඇති තවත් දේවල් ගැන උදාහරණ කීප යක්ම සඳහන් කරන්න පුළුවනි. "ග්‍රාන්ට්" මුදල් පිළිබඳව ඇමතිතුමා නුවුවමනා අන් දමට ඇඟිලි ගසා තිබීම ගැන මම කරුණු කීපයක් ඉදිරිපත් කරන්නම්.

පූ. භා. 9.45

ඒ ඒ ගම්කාර්යසභාවට ආධාර මුදල් බෙදා දීම සම්පූර්ණයෙන්ම තිබුණේ පළාත් පාලන කොමසාරිස්වරයා අතේයි. එහෙත් දැන් ඒ තත්ත්වය වෙනස් අතකට හැරී තිබෙන බව කියන්නට සිදු වී තිබෙනවා. අවශ්‍ය ස්ථාන බලා, අවශ්‍ය අන්දමට "ග්‍රාන්ට්" මුදල් අවුරුදු පතා වෙන් කිරී මේ බලය සම්පූර්ණයෙන්ම කොමසාරිස් වරයා අතේ මෙතෙක් කල් තිබුණා. එ හෙත් දැන් කොමසාරිස්තුමාගෙන් ඒ බලය පැහැරගෙන තිබෙනවා, ගරු ඇමති තුමා. 1967 ජූනි මාසයේදී ගරු ඇමතිතුමා පළාත්පාලන කොමසාරිස්වරයාගේ බල තලත්, අයිතිවාසිකමත් පැහැර ගත්තා. දැන් පෙර මෙන් පළාත් පාලන කොමසා රිස්තුමා නොවෙයි ඒ ඒ ගම්කාර්යසභාවට ආධාර මුදල් ගෙවන්නේ. මේ නිසා සම් පූර්ණයෙන්ම දේශපාලන බලපෑම්වලට යට වන්නට ඉඩ තිබෙනවා. මෙම තත් වය පවතින්නට ඉඩ තැබීමෙන් පෙඩරල් රාජ්‍යයක් ඇති වන්නට ඉඩ තිබෙන බව පෙනී යනවා. නිලධාරීන් සුදුසුයයි කල් පනා කරන ආකාරයට ඒ ඒ ආයතනවලට අවශ්‍ය අන්දමට ඒ කාරණය ඉෂ්ට කරන් නට ඉඩ නොදී ගරු අමැතිතුමා මේ අන්ද මට ඇඟිලි ගැසීම ඇත්ත වශයෙන් ගම් කාර්යසභා වලට කරන ලොකු අසාධාරණ යක් බව මතක් කරන්නට ඕනෑ. අවශ්‍ය කරුණු රජයේ නිලධාරීන් ලවා හරියාකාර සෝදිසි කරවා තොරතුරු දැනගෙන ඒ අනු ව කොමසාරිස්තුමා විසින් "ග්‍රාන්ට්" මුදල් බෙදා දීම ඉතාමත් උචිත ක්‍රමය බව ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා පිළිගනු ඇතැයි මා කල්පනා කරනවා. කොමසාරිස්තුමා ඒ ආකාරයටයි "ග්‍රාන්ට්" මුදල් බෙදා දුන්නේ. ගරු ඇමතිතුමා දැන් ඊට ඇඟිලි ගසන නිසා සාධාරණත්වය ඉෂ්ට නොවන බව ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට මතක් කරන්ට කැමතියි.

ඌව පළාතේ ගම්කාර්යසභා 42ක් තිබෙනවා. ජලකර්මාන්තය සඳහා රුපි යල් හාරදාහ බැගින් දෙනු ලබන ආධාර මුදල ලැබී තිබෙන්නේ ඌව පළාතේ තිබෙන ගම්කාර්යසභා 42 න් දහයකට පමණයි. ඌව පළාතේ හතළිස් ගණනකින් දහයකට පමණක් මෙම ආධාරය දී තිබෙන නමුත් යාපනේ පළාතේ ඊට වඩා ආධාර මුදල් දී තිබෙන බව අපට දැනගන්නට ලැබී තිබෙනවා. මගේ ආරංචියේ හැටියට මා කරුණු ඉදිරි පත් කරන්නේ. උදාහරණයක් හැටියට ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වන් නේ රාසමානික්කම් මැතිතුමා විසින් නියෝජනය කරනු ලබන මැතිවරණ කොට් ඨාශයයි. ඒ කොට්ඨාශයේ නායපදුමුනයි නැමැති ගම්කාර්යසභාවට සහ තිරුනීලා වනයි නැමැති ගම්කාර්යසභාවටත් ජල කර්මාන්ත යෝජනා ක්‍රම දෙක බැගින් ඇති කිරීමට ආධාර දී තිබෙනවා. එකකට දෙක බැගින් දීමෙන් ගරු ඇමතිතුමා ඒ ප්‍රදේශයට විශේෂ සැලකිල්ලක් දක්වා තිබෙනවා. ඌව පළාත වැනි නොදියුණු ප්‍රදේශයක තිබෙන ගම්කාර්යසභා හතළිස් දෙකකට සලකා තිබෙන ආකාරය දෙස බලන්න. එක් ගම්කාර්යසභාවකට එක බැගින් පමණයි දී තිබෙන්නේ. ගම්කාර්ය සභා හතළිස් දෙකෙනුත් දහයකට පම ණයි එක බැගින් වුවත් දී තිබෙන්නේ. මා ඉදිරිපත් කරන මේ කරුණු අසත්‍ය ඒවා වෙන්නට බැහැ. ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා මේවා ගැන සොයා බලනවා නම් හොඳයි. මේ තරම් අසාධාරණ අන් දමට "ග්‍රාන්ට්" මුදල් බෙදා දීමෙන් ගරු ඇමතිතුමා ඉතාමත් අසාධාරණ ලෙස ක්‍රියා කරගෙන යන බව මතක් කරන්නට සිදු වීම ගැන මා කනගාටු වෙනවා.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ගරු මන්ත්‍රීතුමාගේ තර්කය වැරදි පද නමක් උඩ ගොඩනගන්නට පෙර, ගරු මන්ත්‍රීතුමා ඉඩ දෙනවා නම්, කාරණය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පැහැදිලි කර දෙන්නට මා කැමතියි. මොනම අවස්ථාවකදීවත් රජයේ ආධාර මුදල් බෙදීම නිලධාරීන් සතුව තිබුණේ නැහැ. එහෙම තිබෙන්නේත් නැහැ. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය යටතේ එවැනි තත්ත්වයක් පවතිනවා නම් එය සම්පූර්ණයෙන්ම වැරදියි. පළාත් පාලන කොමසාරිස්තුමාට කරන්නට පුළුවන් ඒ සම්බන්ධයෙන් නිර්දේශ කිරීම පමණයි. "ග්‍රාන්ට්" මුදල් බෙදීමේ බලය කවදත් තිබුණේ ඇමතිවරයා අතේයි. එය එසේම වෙන්නට ඕනෑ. මා එසේ කියන්නේ ඇයි? මේ කටයුතු පිළිබඳ බලතල ගරු ඇමතිතුමාට පැවරී නැත්නම් මේ ගරු සභාවට වග කියන්නෝ කවුරුද? ගරු ඇමතිවරයා තමයි පාර්ලිමේන්තුවට වගකියන්නේ. කොමසාරිස්තුමා නිර්දේශ කරන්නට ඕනෑ. ඒ කෙසේ වෙතත් ප්‍රතිපත්තිය නියම කිරීම ගරු ඇමතිවරයා සතුවයි තිබෙන්නේ. මුදල් බෙදීම කරන්නේ ගරු ඇමතිතුමා. මේ ගරු සභාවට වගකියන්නේ ගරු ඇමතිතුමා. එතකොට තමයි ගරු මන්ත්‍රීවරුන්ට ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න කරන්නට පුළුවන් වන්නේ. ඒ පළමුවන කාරණයයි.

දෙවැනි කාරණය, ගරු මන්ත්‍රීතුමා කියා සිටියා වැරදි අන්දමට, අසාධාරණ අන්දමට, "ග්‍රාන්ට්" මුදල් බෙදා තිබෙන බවක්. ආධාර මුදල් වෙන් කිරීම අසාධාරණ ලෙස සිදු වී තිබෙනවායයි ගරු මන්ත්‍රීතුමා කියා සිටියා. ඒ කොයි කොයි ආයතනවලටදැයි නම් සහිතව, විස්තර සහිතව කීවොත් සොයා බලා තොරතුරු දෙන්නට පුළුවන් වේවි.

බී. එච්. බණ්ඩාර මයා.

(திரு. பி. எச். பண்டார)

(Mr. B. H. Bandara)

මම ඉදිරිපත් කරන්නම්. සාමාන්‍යයෙන් ප්‍රශ්නයෙන් බේරෙන්නට නම් උත්තර දෙන්නට පුළුවනි. "වහෙන් ඔරෝ" කියන්නා වාගේ මොනවා කිව්වත් කෙරෙන්නේ කොහොමදැයි අපට තේරෙනවා. කොමසාරිස්තුමාගේ නිර්දේශ නොවෙයි පිළිගන්නේ. කොමසාරිස්තුමාගේ නිර්දේශ පිළිගන්නවා නම් බදුල්ල ප්‍රදේශයේ තිබෙන ගම්කාර්ය සභා හතළිස් දෙකෙන් දහයකට පමණක් එකකට ජල යෝජනා ක්‍රම එකක් බැගින් දෙන්නටත්, මා සඳහන් කළ ප්‍රදේශයේ එක ගම්කාර්ය සභාවකට ජල යෝජනා ක්‍රම දෙක බැගින් දෙන්නටත් පුළුවන්කමක් ඇති වුණේ කොහොමදැයි අහනවා. දැන් මට කථා කරන්නට තවත් ඉතිරි වී තිබෙන්නේ ඉතා සුළු කාලයක් නිසා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා කළ ඉල්ලීම අනුව ගම්කාර්ය සභාවල නම් ආදී විස්තර ඇතුළත්ව කරුණු ඉදිරිපත් කරන්නට එතුමා හමු වන්නම්.

ප්‍රේමදාස මයා.

(திரு. பிரேமதாச)

(Mr. Premadasa)

ගම්කාර්ය සභාවල නම් කියන්න, නැත්නම් ගම්කාර්ය සභාවේ නම කියන්න.

බී. එච්. බණ්ඩාර මයා.

(திரு. பி. எச். பண்டார)

(Mr. B. H. Bandara)

නායපදුමුනයි සහ තිරුනීලාවනයි යන ගම්කාර්ය සභා ගැනයි මා සඳහන් කළේ. මේ ගැන විස්තර ඉදිරිපත් කරන්නට අවශ්‍ය නම් තමුන්නාන්සේගේ කාර්යාලයට එන්නට පුළුවනි. මට ලැබී තිබෙන ආරංචි අනුව මා මේ විස්තරය ඉදිරිපත් කළා. ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා මේ ගැන සොයා බලනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

නිවාස යෝජනා ක්‍රම සඳහා ආධාර මුදල් දී තිබෙන්නේ කෙසේදැයි ඊළඟට බලමු. අපේ පළාත්වල එකම පළාත් පාලන ආයතනයකටවත් නිවාස සඳහා මුදල් දුන් බවට ආරංචියක්වත් නැහැ. එහෙත්, 1965/66 මුදල් වර්ෂයෙන් පසු යාපනේ අච්චුවේලි ගම් සභාවට ලක්ෂ 3 ක් දී තිබෙනවා. එපමණක් නොවෙයි. යාපනය ප්‍රදේශයේ තවත් බොහෝ ගණනකට දී තිබෙනවා. වේලාව මදි නිසා ඒ හැම එකක් ගැනම විස්තර මේ අවස්ථාවේදී කියන්නට කාලය ගන්නේ නැහැ. මා ඒවා පළාත් පාලන උප ඇමතිතුමාට පෞද්ගලිකව ඉදිරිපත් කරන්නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

ළිං සඳහා පළාත් පාලන ආයතනවලට ආධාර මුදල් දීමේදීත් එවැනි ප්‍රතිපත්තියක් තමයි අනුගමනය කර තිබෙන්නේ. කොළඹ, ගාල්ල, කළුතර, මාතර ආදී ප්‍රදේශවලට කිසිවක් දී නැහැ. යාපනයට පමණයි දී තිබෙන්නේ. එහි එක් ගම් කාර්ය සභාවකට, එකකට රුපියල් 1,800 බැගින් ළිං දෙකකට ආධාර දී තිබෙනවා. මෙ මුදල් දී තිබෙන්නේ සම්පූර්ණයෙන්ම පළාත් පාලන ඇමතිවරයාගේ වුවමනාව පරිදියි.

විශාල පාලම් ඉදි කිරීම සඳහා පළාත් පාලන ආයතනවලට ආධාර දීමේදී දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවලදී ගනුලබන තීරණයන් අනුව කටයුතු කිරීමේ ප්‍රතිපත්තියයි කලින් අනුගමනය කෙරුණේ. එහෙත් දැන් එය වෙනස් වී පළාත් පාලන ඇමතිවරයාට ඕනෑ හැටියට එක්සත් ජාතික පක්ෂයේ හෝ පෙඩරල් පක්ෂයේ හෝ මන්ත්‍රීවරුන්ගේ කීම අනුව මුදල් දෙනවා. මේ නිසා, නොදියුණු ප්‍රදේශවල අවශ්‍යතාවන් බොහෝදුරට අතපසු වී යනවා. එක් එක් ප්‍රදේශවල අවශ්‍යතාවන් සොයා බලා ඊට අනුව ආධාර මුදල් දීමට නිර්දේශ කරන අවංක නිළධාරීන් සිටියත් ඇමතිවරයාගේ ඇඟිලි ගැසීම් නිසා අද අයුතු විධියටයි වැඩ කෙරෙන්නේ. ඒ ගැන අපගේ බලවත් කණගාටුව පළ කර නවා.

දේශීය ණය සංවර්ධන අරමුදල සම්බන්ධයෙනුත් කියන්නට තිබෙන්නේ එයමයි. නීත්‍යානුකූලව කොමසාරිස්වරයා මුදල් වෙන් කළත් ඇමතිවරයා ඊට ඇඟිලි ගැසීම නිසා ඒ මුදල් එක කොටසකට පමණක් වෙන් වෙනවා. මෙහිදීත් අපේ ප්‍රදේශවල පළාත් පාලන ආයතන ගැන සැලකිල්ලක් නොදැක්වීම ගැන අපගේ අප්‍රසාදය පළ කරනවා.

ඊළඟට ගෙවල් කුලී පාලක සභා පත් කිරීම ගැනත් වචනයක් කිව යුතුයි. මෙම සභාවට පත් කිරීමට සුදුසු පුද්ගලයින් නම් කරන ලෙස අපට දන්වා එවනවා. බදුල්ලේ නගර සභාවේ ගෙවල් කුලී පාලක සභාව සඳහා සුදුසු අය නම් කරන ලෙස මටත් දන්වා එවූ නිසා මාත් නම් කීපයක් ලියා යැවුවා. එහෙත් පත් කර තිබෙන්නේ මා ලියා යැවූ නම්වලට අහළකින්වත් ගිය අය නොවෙයි. පත්කරනු ලබනැයි කිසිම විධියකින් බලාපොරොත්තු නොවූ, කිසිම සුදුසුකමක් නැති පුද්ගලයින් පත් වී සිටිනවා. බදුලු නගර සභාවේ ගෙවල් කුලී පාලක සභාවට සභිකයින් පත් කෙරෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ පරාජිත අපේක්ෂකයාගේ කීම අනුවයි. එහෙම නම්, පත්කළ යුත්තන් කවුරුන්දැයි අපෙන් අහන්නේ මොනවාටද? බොරුවට අපෙන් එය අහලා, අන්තිමේදී එක්සත් ජාතික පක්ෂයේ වන්දිභට්ටයින් ටොන් ගණනේ පත් කරනවා. එම නිසා මේ ගැනත් අපගේ බලවත් අප්‍රසාදය පළ කරනවා.

පළාත් පාලන ඇමතිවරයාගේ ක්‍රියා පටිපාටිය මේ අන්දමට සකස් වී තිබෙන අතර, අලි මදිවාට හරක් කීවාක් මෙන්, ජලාපවාහන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා ගැනත් වචනයක් කිව යුතුව තිබෙනවා. මොහු, අවුරුදු 40 ක පමණ කාලයක් තිස්සේ ඇමතිවරයා කිට්ටුවෙන් ආශ්‍රය කරන, ඇමතිවරයාගේ බලවත් සගයෙක්. ජලාපවාහන දෙපාර්තමේන්තුව රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් ඉවත් කොට පළාත් පාලන අමාත්‍යාංශය යටතට ගත්තේ නගර සභා, සුළු නගර සභා ආදී පළාත් පාලන ආයතනවල ජලසම්පාදන යෝජනා ක්‍රම ඉක්මනින් ක්‍රියාත්මක කිරීම සඳහායි. මා හිතන හැටියට 1962 දී පමණ ජල සම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව පළාත් පාලන අමාත්‍යාංශය යටතට ගත්තා. එහෙත් එතැන් සිට මෙතෙක් ගත වී ඇති පස් අවුරුදු කාල සීමාව තුළ එම දෙපාර්තමේන්තුව ජල සම්පාදන යෝජනා ක්‍රම ආරම්භ කිරීමෙන් හෝ ඒ පිළිබඳ වෙනත් කටයුතු කිරීමෙන් හෝ අමුතු උනන්දුවක් දක්වා තිබෙනවා ද? මහනුවර හා දෙහිවල-ගල්කිස්ස නගර සභාවල ජල සම්පාදන යෝජනා ක්‍රම සම්බන්ධයෙන් කටයුතු කළේ විදේශීය කොම්පැණියි. මේ අනුව බලන විට අපට කොයි විධියකින්වත් පෙනෙන්නේ නැහැ, මහ නගර සභා හෝ සුළු නගර සභා හෝ සම්බන්ධ ජල සම්පාදන යෝජනා ක්‍රම සකස් කිරීම පිළිබඳව එම දෙපාර්තමේන්තුව දැන් ඉස්සරට වඩා දියුණුවක් දක්වන බව.

ඊට හේතුව වශයෙන් අධ්‍යක්ෂවරයා කියන්නේ, කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බවයි. වැඩ ප්‍රමාද වීමේ එකම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හේතුව හැටියට ඔහු දක්වන්නේ, ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නැතිකමයි. එහෙත් වුවමනාවටත් වඩා කාර්ය මණ්ඩලයක් ඉන්නා බව අප දන්නවා. ඒ කාර්ය මණ්ඩලයෙන් නියම විධියට වැඩ ගැනීමට අධ්‍යක්ෂවරයා අපොහොසත් වීමයි, මේ ප්‍රමාදයට හේතු වී තිබෙන්නේ. ඒ වාගේම සමහර අවස්ථාවල අධ්‍යක්ෂවරයා අසාධාරණ පත්වීම් පවා කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් එක උදාහරණයක් දක්වන්නට පුළුවනි. ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තනතුරට පත් කළේ කාවද? මේ කාරණා සමහර විට පාර්ලිමේන්තු ලේකම්තුමා දන්නේ නැතිවා වන්නට පුළුවනි. එම ප්‍රධාන ඉංජිනේරු තනතුර සඳහා පත් කළේ ඔහුගේ භාර්යාවගේ බෑණාවයි. එම තනතුරට පත් වීමට සුදුසුකම් ඇති ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනකු හිටියා. එහෙත් පත්වීම ලැබුණේ ඔවුන්ට නොවෙයි, අධ්‍යක්ෂවරයාගේම භාර්යාවගේ බෑණාටයි.

ඔහු එම තනතුරට පත් කර ගැනීම සඳහා අධ්‍යක්ෂවරයා එක්තරා කූට උපක්‍රමයක් යොදා ගත්තා. සාමාන්‍යයෙන් මේ තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම වී ඇත්තේ ඒ.එම්.අයි.සී. විභාගයෙන් සමත් වී සිටීමයි. එහෙත් තම භාර්යාවගේ බෑණා මේ තනතුරට පත් කර ගන්නට වුවමනා වූ නිසා එම තනතුර සඳහා විශ්ව විද්‍යාලයීය ඉංජිනේරු උපාධියක් අවශ්‍ය බවට ඔහු නිර්දේශ කළා. ඒ හේතුවෙන්, සාමාන්‍යයෙන් අවශ්‍ය සුදුසුකම් ලබා සිටි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට අහිමි වූ ඒ තනතුර අධ්‍යක්ෂවරයාගේම භාර්යාවගේ බෑණාට හිමි වුණා.

ඔහු එම ප්‍රධාන ඉංජිනේරු තනතුරට පත් කර ගැනීමෙන් පමණක් අධ්‍යක්ෂවරයා සෑහීමකට පත් වුණේ නැහැ. ඔහුට සාමාන්‍යයෙන් අයත් අංශයේ වැඩ හැරෙන්නට, විදේශීය ඉංජිනේරුවන් සමඟ වෙනත් අංශවල වැඩ කරන්නටත් ඔහු යොදවා තිබෙනවා. අධ්‍යක්ෂවරයාගේ වයස දැනට අවුරුදු 58 මාස 6 ක් වෙනවා. තමන්ගේ විශ්‍රාම යෑමෙන් පුරප්පාඩු වන අධ්‍යක්ෂ තනතුරට තම භාර්යාවගේ බෑනා වන අළුත් ප්‍රධාන ඉංජිනේරුවා පත් කරවා ගැනීමට අධ්‍යක්ෂවරයා වෑයම් කරනවා. අනෙක් අංශවල වැඩවලත් ඔහු යොදවා, හැම අංශයකම පළපුරුද්දක් ලබා දී, ඒ ඒ කටයුතු පිළිබඳ සුදුසුකම් ඇති කරවා, තමන් විශ්‍රාම යෑමෙන් පුරප්පාඩු වන අධ්‍යක්ෂ තනතුර එමඟින් තම භාර්යාවගේ බෑනාටම හිමි කර දීමට අධ්‍යක්ෂවරයා දැන් සිටම කටයුතු කරගෙන යනවා. අධ්‍යක්ෂවරයාගේ දැන් වයස අවුරුදු 58 මාස 6 ක් වුණත්, වයස අවුරුදු 57 දී ශිෂ්‍යත්වයක් ලබාගෙන ඇමෙරිකාවටත් ගිහින් ආව.

එපමණක් නොවෙයි. ඒ අධ්‍යක්ෂවරයා දෙමළ නිලධාරීන්ගෙන් ඒ දෙපාර්තමේන්තුව පිරවීමටත් කටයුතු කරගෙන යනවා. තමා විශ්‍රාම යන්නට කලින් දෙපාර්තමේන්තුව දෙමළ රාජ්‍යයක් කිරීමට ඔහු කටයුතු කර තිබෙනවා. දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා දෙමළ. ප්‍රධාන ඉංජිනේරුවා දෙමළ. ගණකාධිකාරිවරයා දෙමළ. ගණකාධිකාරි අංශයේ ප්‍රධාන ලිපිකරු දෙමළ. පාලක නැන දෙමළ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ලිපිකරු දෙමළ. මේ විධියට උසස් තනතුරු දරන සේරම වාගේ දෙමළ, දෙමළ, දෙමළ. මේ අනුව බලන විට සිංහලයකුට මේ තනතුරුවලට පත් වන්නට පුළුවන්කමක් නැහැ. මෙවැනි අධ්‍යක්ෂවරයකු දෙපාර්තමේන්තු ප්‍රධානයා හැටියට කටයුතු කරන විට මේ විධියට දෙමළ ජාතිකයන්ම ඒ ඒ තනතුරුවලට පත් වීම පුදුමයක් නොවේ. ඒ හැරෙන්නට එම දෙපාර්තමේන්තුව භාරව ඉන්නේත් පළාත් පාලන ඇමතිතුමා වැනි කෙනකු වන විට, මහා ජාතියේ අයිතිවාසිකම් වැළලී යාම අහන්නට දෙයක් නොවෙයි. මේ අන්දමට, අසාධාරණ විධියට ක්‍රියා කිරීම ගැන අපේ බලවත් කනගාටුව ප්‍රකාශ කරන අතරම, තවත් කරුණු රාශියක් ඇතත් කාලය ප්‍රමාණවත් නොවන නිසා මේ අවස්ථාවේදී සඳහන් කරන්න යන්නෙ නැහැ; උප ඇමතිතුමා පසුව සම්භ වී මේවා ගැන හෙළිදරව් කිරීමට මා අදහස් කරනවා.

පූ. භා. 10

ගරු සභාපතිතුමනි, ගම්කාර්ය සභාවල වැඩ කටයුතු සඳහා "ග්‍රාන්ට්" මුදල් නැති නම් ආධාර මුදල් වෙන් කරනවා. එසේ වුණත් යම් යම් කටයුතු සඳහා දෙන ආධාර මුදල් ප්‍රමාණවත් මදි. ඒ හැරෙන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

ලබාගැනීමට නොයෙකුත් අපහසුකම් තිබෙනවා. නිලධාරීන්ගේ ක්‍රියා කලාපය නිසා නොයෙකුත් අන්දමේ අපහසුකම්. අවහිරකම්, ප්‍රමාද ඇති වුණත්, නිලධාරීන්ට පොදුවේ මා දොස් කියන්නෙ නැහැ. අවංකව කටයුතු කරන නිලධාරීන් සිටිනවා. එම නිසා ඒ නිලධාරීන් උනන්දු කරවා ගම්කාර්ය සභාවලට අවශ්‍ය ආධාර මුදල් ලබා දීමට ක්‍රියා කරන ලෙස උප අමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මා විශෙෂයෙන්ම උප ඇමතිතුමාට මේ කාරණා ගැන සඳහන් කළේ, රටේ අවශ්‍යතාවන් ගැන එතුමාට සෑහෙන අව බෝධයක් ඇති නිසයි. පළාත් පාලන ඇමතිතුමාට නම් අපේ ප්‍රදේශවල ජනතා වට ඇති අමාරුකම් ගැන අවබෝධයක් නැහැ. යාපනය වැනි ප්‍රදේශ ගැන පමණයි එතුමාට කැක්කුමක් ඇත්තෙ. ආධාර මුදල් දෙන්නේ ඒ ප්‍රදේශවලට පමණයි. එම නිසා මේ ක්‍රමය සම්පූර්ණයෙන් වෙනස් කර සෑම ගම්කාර්ය සභාවකටම පොදුවේ සාධාරණ අන්දමින් ආධාර මුදල් ලබා දීමට කටයුතු කරන ලෙස උප ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එවැනි පියවරක් ගැනීම පිණිස ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන සුවල්පය මෙයින් අවසන් කරනවා.

**ආර්. එම්. ධර්මදාස බණ්ඩා මයා.** (බිබිලෙ)
*(திரு. ஆர். எம். தர்மதாச பண்டா—பிபிலை)*
(Mr. R. M. Dharmadasa Banda—Bibile)

ගරු සභාපතිතුමනි, පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරන මේ මොහොතේ මට පෙර කථා කළ බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා, බදුල්ලට ඉතාමත්ම අවශ්‍යව තිබූ ජලපහසුකම් ලබා දීමට ක්‍රියා කිරීම ගැන පළාත් පාලන ඇමතිතුමාට ස්තුති කළ බව ප්‍රථමයෙන්ම මතක් කර දෙන්න කැමතියි. එතුමා ඒ අන්දමට ස්තුති කිරීම ගැන මා පුදුමයට පත් වෙන්නෙ නැහැ. බදුල්ල නගර සභාවට ජලය ලබාගැනීමට අපහසුකම් රාශියක්ම තිබුණා. එසේ වුණත් මට මතකයි, 1963 අවුරුද්දේදී, එවකට තිබුණු රජය ජල පහසුකම් සැපයීම පිණිස බොහෝ දුරට වැඩ කටයුතු අවසන් කර තිබුණු බව. එවකට මන්ත්‍රීවරයා වශයෙන් සිටියෙත් දැනට මන්ත්‍රී ධුරය දරන මේ මන්ත්‍රීතුමායි. අවාසනාවකට මෙන්, මෙම පළාත් ආණ්ඩු සභාව නගර සභාවක් බවට පරිවර්තනය කිරීමෙන් පසුව පැවති පළමුවන මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අන්ත පරාජයකට පත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් බදුල්ල නගර සභාවට ජලය සැපයීමේ වැඩ පිළිවෙළ නතර කර දැම්මා.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

ජලය සැපයීමේ වැඩ පිළිවෙළ අප ක්‍රියාත්මක කර ගෙන ආවා. එසේ ක්‍රියා කර ගෙන ගිය නිසයි, මේ රජයට එය විවෘත කිරීමට අවස්ථාවක් ලැබී තිබෙන්නෙ. අපේ ආණ්ඩුව කාලයේදී ආරම්භ කළ බොහොමයක් ව්‍යාපාර විවෘත කරන්න මේ ආණ්ඩුවට අවස්ථා ලැබී තිබෙනවා.

**ධර්මදාස බණ්ඩා මයා.**
*(திரு. தர்மதாச பண்டா)*
(Mr. Dharmadasa Banda)

ගරු සභාපතිතුමනි, මොහොතකට පෙර මා කී කාරණේ ගරු මන්ත්‍රීතුමාගෙ ප්‍රකාශයෙන්ම ඔප්පු වෙනවා. ජල පහසුකම් සැපයීමට ක්‍රියා කරගෙන ගිහින්, බදුල්ල නගර සභා මැතිවරණයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අන්ත පරාජයට පත් වුණාට පස්සෙ, ඒ වැඩ කටයුතු නතර කළා. 1965 වන තුරු, මේ ආණ්ඩුව බලයට පැමිණෙන තුරු, ඒ ගැන කිසිම පියවරක් ගෙන නැහැ. නමුත් 1967 අවුරුද්දේදී එම පහ පහසුකම් ලබා දීමට ක්‍රියා කිරීම ගැන දැන්වත් ගරු ඇමතිතුමාට ස්තුති කිරීම ගැන, මා පුදුමයට පත් වෙන්නෙ නැහැ. නමුත් එදා ලැබූ පරාජය නිසා බදුල්ල නගරයට ජල පහසුකම් ලබා දීමේ වැඩ පිළිවෙළ නතර කළ බව අමතක කරන්න නරකයි. ඒ ගැන දැන්වත් කණගාටු විය යුතුව තිබෙනවා.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

කවුද නැවැත්තුවෙ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ධර්මදාස බණ්ඩා මයා.**
*(திரு. தர்மதாச பண்டா)*
(Mr. Dharmadasa Banda)

තමුන්නාන්සෙලා එදා පටන් ගෙන විත් නතර කර දැම්මා. මා දන්නා තරමට, එම පහසුකම් සැපයීමට මුදල් අනුමත කර තිබුණා, මුදල් නගර සභාවට ලැබී තිබුණා. නමුත් 1967 වන තුරු එම වැඩ පිළිවෙළ නතර කර දැමුවා. කෙසේ වුණත් දැනට සිටින නගරාධිපතිතුමා ඇතුළු සභිකයන්ගේ බලවත් ඉල්ලීම උඩ ජල නළ පහසුකම් ඇති කිරීම ගැන මා ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඒ මන්ත්‍රීතුමා බොහෝ දුරට සඳහන් කළේ දැනට ගම්කාර්ය සභාවලට පාරවල් තැනීම, ළිං තැනීම ආදියට ආධාර මුදල් දෙන ආකාරය ගැනයි. එතුමා එවැනි ප්‍රකාශයක් කිරීම ගැන මා කණගාටු වෙනවා. මා දන්නා සංඛ්‍යා ලේඛනවලට අනුව නම් එතුමාගේ ප්‍රකාශය පිළිගන්නට අමාරුයි. සමහරවිට යාපනයටත් ආධාර දෙන්නට ඇති. එහෙත් අපට ආධාර නුදුන්නායැයි කීම සාධාරණ නැහැ. අපේ ගම් සභාවලත් නගර සභාවලත් සුළු නගර සභාවලත් අඩුපාඩු රාශියක් තිබෙනවා. ඒවා මග හැරවීමට හැකි පමණ ආධාර දීමට කටයුතු යොදාගෙන යනවා. පළාත් පාලන ආයතනවල දියුණුව සඳහා උඩරට ගැමි කොමිසම මාර්ගයෙනුත් සැහෙන ආධාර දීගෙන යනවා. ගම්සභාවකට එක් අවුරුද්දක් තුළ එක් ළිඳක් තැනීම සඳහා පමණයි, දෙපාර්තමේන්තුවෙන් ආධාරයක් ලැබෙන්නේ. කොට්ඨාශ 10 ක් 15 ක් අයිති යම්කිසි ගම්සභාවකට වුවත් වසරකට ලැබෙන රුපියල් 1,500 න් හෝ 2,000 න් තනන්නට හැකි වන්නේ එක් ළිඳක් පමණයි. කොට්ඨාශ 10 ට නැතිනම් 15 ට අවශ්‍ය ළිං තනා දීම සඳහා අවුරුදු 10 ක් 15 ක් ගත විය හැකි බව එයින් පෙනෙනවා. ගම්බද ජල ප්‍රශ්නය විසඳීම සඳහා උඩරට ගැමි කොමිසමට විශේෂ වරප්‍රසාද සලසා දීම ගැන මා විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. ජල ප්‍රශ්නය විසඳීම සඳහා ඒ අංශයෙනුත් නිසියාකාර දැන් ක්‍රියා කර ගෙන යන බව පෙනෙනවා.

පළාත් පාලන අමාත්‍යාංශය මගින් පසුගිය වර්ෂය තුළ විශාල වැඩ කොටසක් කර තිබෙන අතර තවදුරටත් වැඩ කටයුතු කරන්නට බලාපොරොත්තු වෙනවා. මා නියෝජනය කරන බිබිල වැනි ප්‍රදේශවලට මෙම සුළු කාලය තුළ විශාල දියුණුවක් ලබා දීම සඳහා වෙහෙස වීම ගැන ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට විශේෂ ස්තුතිය පුද කරනවා. මොණරාගල ජල යෝජනා ක්‍රමයට ආධාර ලබා දුන්නා වාගේම මොණරාගල දිස්ත්‍රික්කයේ සෑම ගම්සභාවකටම වාගේ වෙන අවුරුදුවලට වඩා පසුගිය අවුරුද්දේ ආධාර ලබා දීම ගැන ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා.

පසුගිය කාලයේ මුළු ඌවටම තිබුණේ එකම සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයයි. දැන් එම කාර්යාලය දෙකට කඩා මොණරාගල දිස්ත්‍රික්කයටත් අළුත් සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයක් ලබා දී තිබීම ගැන මා විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. එම කාර්යාලය විවෘත කළාට මොකද ඊට අවශ්‍ය උපකරණවත් සහකාර කොමසාරිස්වරයෙක්වත් තවම ඇත්තේ නැහැ. ඒවාගේම අවශ්‍ය නිලධාරි මඩුල්ලකුත් නැහැ. ඉතා ඉක්මණින්ම එම අඩුපාඩුකම් සම්පූර්ණ කර දෙන හැටියට මා ඉල්ලා සිටිනවා. දැනට එහි වැඩ බලන්නේ බදුල්ලේ සහකාර පළාත් පාලන කොමසාරිස්වරයායි. අප ඒ ගැන කනගාටු වෙනවා. බදුල්ලේ සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් එම වැඩ කටයුතු කරන්නට පහසු නැති නිසායි මෙම කාර්යාලය මොණරාගලට දෙන මෙන් අප ඉල්ලා සිටියේ. එහෙත් සතියකට වරක් ගොස් ඔහුම එතැන වැඩ බලනවා නම් අප අළුත් කාර්යාලය විවෘත කිරීමෙන් බලාපොරොත්තු වූ ප්‍රගතිය ඇති වේ යැයි මා සිතන්නේ නැහැ. බදුල්ලේ සහකාර පළාත් පාලන කොමසාරිස්තුමාගේ නොයෙකුත් වැඩ කටයුතු පිළිබඳව කතා කරන්නට ගියොත් හුඟක් වෙලා ගත වේවි.

බදුල්ලේ සහකාර පළාත් පාලන කොමසාරිස් වශයෙන් ඊයේ පෙරේදා එතුමා නොයෙකුත් නියෝග කර තිබුණා. එතුමාට දැන් පුළුවන්කමක් නැහැ. මොණරාගල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධර්මදාස බණ්ඩා මයා.]

ගම්සභාවට නියෝග නිකුත් කරන්නට, බදුල්ලේ සහකාර පළාත් පාලන කොමසාරිස්වරයා හැටියට. මොණරාගලට වෙනම සහකාර කොමසාරිස් කාර්යාලයක් ඇති බවට දැන් නිර්දේශ වී අවසානයි. එම නිසා මොණරාගල ප්‍රදේශයේ වැඩ බලන සහකාර පළාත් පාලන කොමසාරිස්වරයා හැටියට මිස බදුල්ලේ සහකාර පළාත් පාලන කොමසාරිස්වරයා හැටියට අත්සන් කරන්නට ඔහුට බලයක් නැහැ. එහෙත් එම පිළිවෙළට තවමත් නියෝග කරනවා. ඊයේ පෙරේදා විශේෂ ආධාර වගයක් දුන්නා, අපේ සැම ගම්සභා කොට්ඨාශයකටම පාහේ. වගා කටයුතු සඳහාත් ඒ දවස්වල පොල් අතු මඩුවලත් අනුන්ගේ ගෙවලත් පවත්වාගෙන ගිය ගම්සභා කාර්යාල ඒවායින් අයින්කොට අළුත් කාර්යාල පිහිටුවීමටත් එම ආධාර ලබා දුන්නා. එදා අපේ ප්‍රදේශවල ගම්කාර්ය සභා කාර්යාල පවත්වාගෙන ගියේ අනුන්ගේ ගෙවල්වල— සමහරවිට පොල් අතු මඩුවලයි. වැස්ස දවස්වල ෆයිල් ටික සභාපතිවරයාගේ ගෙදරට උස්සාගෙන යා යුතු තත්ත්වයකයි, එදා ගම්කාර්ය සභා කාර්යාල තිබුණේ. වර්තමාන ඇමතිතුමාත්, පාර්ලිමේන්තු ලේකම්තුමාත් මේ අමාත්‍යාංශය භාර ගැනීමෙන් පසුව කාර්යාල නොමැතිව තිබුණු සැම ගම්කාර්ය සභාවකටම කාර්යාල ලබා දීමට කටයුතු කර තිබීම ගැන මා ඒ දෙපොළට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා.

1957 සිටම මැදගම්පත්තු ගම්කාර්ය සභාව සඳහා කාර්යාලයක් ගොඩ නැගීමට අපි මුදල් ඉල්ලා සිටි නමුත් 1965 වන තෙක් අපට ලබා ගන්ට බැරි වුණා. 1965 දී ඒ මුදල් ලැබුණාට පසුව දැන් ඒ ගොඩනැගිල්ල සාදා අවසාන කර තිබෙනවා. මේ ගොඩනැගිල්ලේ අඩුපාඩුවක් සම්පූර්ණ කර ගැනීමට අපට සුළු මුදලක අඩුපාඩුවක් තිබුණා. මේ වතාවේදී විශේෂ දීමනාවක් වශයෙන් ඒ මුදල දී තිබෙනවා. බදුල්ලේ සහකාර කොමසාරිස් හැටියට අත්සන් කර අපට වෙන් කර දී තිබෙන ඒ මුදලින් සතයක්වත් මගේ අනුමැතියක් නැතිව පාවිච්චි කරන්නට එපා යයි බදුල්ලේ සහකාර කොමසාරිස්තුමා අපේ ලිපිකාර මහත්මයාට තර්ජනාත්මකව කියා තිබෙනවා. මේ මුදල් වර්ෂයේ අවසානයයි. මා දන්නෙ නැහැ. මේ මුදල වියදම් කරන්නෙ කොහොමද කියා. ගම්කාර්ය සභාවක වැඩකට දුන්න මුදල්, ගම්කාර්ය සභා කමිටුවේ තීරණය අනුව වියදම් කරන්ට බැරි නම්, වියදම් කළ යුත්තේ සහකාර කොමසාරිස්තුමාට ඕනෑ හැටියට නම්, මා ඉල්ලා සිටිනවා, මුදල් වියදම් කළයුතු ආකාරය ගැන අපට විශේෂ උපදෙස් මාලාවක් සකස් කර දෙන්න කියා. ඒ විතරක් නොවෙයි, ඒ සහකාර කොමසාරිස්තුමා කියා තිබෙනවා, එතුමා අනුමත කරන දේවලට අමතරව කිසිම වැඩක් කරන්ට ගම්කාර්ය සභාවට පුළුවන්කමක් නැහැ කියා.

ගරු සභාපතිතුමනි, ඒ කොමසාරිස්තුමා මුදල් අනුමත කර තිබෙන පාරවල් ගැන මතක් වන විට මට පුදුමයි. බදුල්ලෙ සහකාර කොමසාරිස්තුමා මුදල් වගයක් අනුමත කර තිබෙනවා, බිබිලෙ-පිටකුඹුර නමැති පාරක් හදන්න. ඊයෙ-පෙරේද ඒ පාරෙ ඇස්තමේන්තු හදන්ට ආව නිලධාරියකු මගෙන් ඇහුව, බිබිලෙ-පිටකුඹුර පාර තියෙන්නෙ කොහෙද කියා. මුදල් අනුමත කර තිබෙන්නෙ පාරවත් නොදැනයි. එහෙත් ඇතැම් පළාත් පාලන ආයතනවලින් එවන ලිපි මේ සහකාර කොමසාරිස්තුමා මාස ගණන් ප්‍රමාද කරමින් තම කාර්යාලයේ තබාගෙන සිටින බවට මා ඕනෑ තරම් සාක්ෂි ඉදිරිපත් කරන්ට සූදානම්. සමහර ගම්කාර්ය සභා මගින් ඉතා ඉක්මණින් කළ යුතු වැඩ කටයුතු සම්බන්ධයෙන් මෙම කාර්යාලයට එවන ලිපිවලට කිසිම පිළිතුරක් නොයවා, ඒවා ප්‍රධාන කාර්යාලයටවත් ඉදිරිපත් නොකර මේ සහකාර කොමසාරිස්තුමා තම කාර්යාලයේ තබාගෙන සිටිනවා. හැබැයි, තමන්ට ඕනෑ කටයුතු විතරක් කරනවා. එහි ප්‍රතිඵලයක් වශයෙන් තමයි මේ නොදන්න පාරකටත් ; නිලධාරියෙකුටවත් සොයා ගන්න බැරි පාරකට ආහාර වගා කිරීමේ ක්‍රමය යටතේ රුපියල් 10,000 ක ආධාර මුදලක් අනුමත කර තිබෙන්නෙ. මේ පාර කපන්ට යන්නෙ කොහේදැයි මා දන්නෙ නැහැ. එහෙත් මින් පසු මුදල් අනුමත කරන විට අඩු ගණනේ ඒ පාර තිබෙන තැනවත් දැනගෙන මුදල් අනුමත කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සභාපතිතුමනි, බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා (බී. එච්. බණ්ඩාර මයා.) මේ අවස්ථාවේ සභාව තුළ නොසිටීම ගැන මා කනගාටු වෙනව. පළාත් පාලන ආයතනවලට ආධාර දෙන්නෙ නැහැ කියනව. එහෙත් මේ සුළු කාලය තුළ අපේ ප්‍රදේශයට විශාල ආධාර මුදලක් ලබා දී තිබීම ගැන මා පළාත් පාලන අමාත්‍යාංශයට ස්තුති වන්ත වෙනව. සමහර ගම්කාර්ය සභාවලට වුව මනාවට වැඩියෙනුත් ආධාර දී තිබෙනව. නිදර්ශනයක් වශයෙන් මා එකක් කියන්නම්. බුත්තල ගම්කාර්ය සභාවට ආධාරයක් වශයෙන් ලැබී තිබෙන රුපියල් 7,500කින් කළ යුතු වැඩය කුමක් දැයි ඒ ගම්කාර්ය සභාව දන්නෙ නැහැ. ඒ ආධාරය අනුමත කර තිබෙන්නෙ ගොඩනැගිල්ලක් වැඩි දියුණු කිරීම සඳහා වුවත් එහි වැඩි දියුණු කරන්ට දෙයක් ඇත්තෙ නැහැ; වැඩ සම්පූර්ණ කරලයි තිබෙන්නෙ. මා හිතන හැටියට මේකත් බදුල්ලේ සහකාර කොමසාරිස්තුමා නිර්දේශ කළ වැඩක් වෙන්ට ඇති. සමහර විට ගොඩනැගිල්ල ගැන සොයා නොබලා 1962-63 කළ ඉල්ලීමක් සම්බන්ධයෙන් ඉදිරිපත් වුණු වාර්තාවක් උඩ මේ රුපියල් 7,500 අනුමත කරන්ට ඇති.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

The hon. Member should adress the Chair, and not the officials in the Public Officers' Box. The hon. Member was given fifteen minutes and he has almost exhausted his time.

**ධර්මදාස බණ්ඩා මයා.**
*(திரு. தர்மதாச பண்டா)*
(Mr. Dharmadasa Banda)

ගරු සභාපතිතුමනි, ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මා ඉල්ලා සිටිනව, මේ පිළිබඳව සොයා බලා මින් පසු මෙවැනි දේවලට ඉඩ තබන්න එපා කියා. අපේ ප්‍රදේශවල හුඟක් වැඩ කටයුතු අත පසු වී ප්‍රමාද වී තිබෙනව. රුපියල් දාහ-දෙදාහ වියදම් වන සුළු වැඩ සමහර විට අවුරුද්දක් දෙකක් තිස්සේ කරන්ට සිදු වෙනව. එවැනි තත්ත්වයක් පවතින්නට හේතුව ඒ ප්‍රදේශයේ අවශ්‍ය තරම් නිලධාරීන් නොමැතිකමයි. සමහර විට කොන්ත්‍රාත් එකක් දමන්නට වුවමනා වුණොත් ඕවර්සියර් එන තුරු මාස දෙක තුන බලාගෙන ඉන්නට ඕනෑ. සමහර අවස්ථාවලදී මාස හය හත ගත වනව. ඒ හේතුව නිසාම අපේ ප්‍රදේශවල තිබෙන ගම්කාර්ය සභාවල වැඩ කටයුතු කරගෙන යාමේදී විශාල අමාරුකම් රාශියකට මුහුණ පාන්නට සිද්ධ වී තිබෙනවා. කොන්ත්‍රාත්කරුවන් සොයා ගන්නටත් නොහැකි වී තිබෙනවා. ගම්කාර්ය සභාවල වැඩ කරන කොන්ත්‍රාත්කරුවන් වුවමනා තරම් සිටිනවා. ඒ වාගේම මේ වැඩ කරන වෙනත් සමිති සමාගම් වුවමනා තරම් තිබෙනවා. නමුත් ඒ කිසිවකු දැන් මේ කොන්ත්‍රාත් වැඩ භාර ගන්නට කැමැත්තක් දක්වන්නේ නැහැ. හේතුව ඕවර්සියර්වරුන් ගෙන්වා ගැනීමට තිබෙන ප්‍රමාදයයි. මාස ගණන් වැඩ ප්‍රමාද කරන්නට සිද්ධ වී තිබෙනවා. සෑම ගම්කාර්ය සභාවකටම එවැනි තත්ත්වයකට මුහුණ පාන්නට සිදුව තිබෙනවා.

පූ. භා. 10.15

ඒ ප්‍රදේශය දැන් දිස්ත්‍රික්ක දෙකකට බෙදා තිබෙනවා. එම නිසා අවශ්‍ය නිලධාරි පිරිස හැකි තරම් ඉක්මනින් ලබා දී වැඩ ඉක්මන් කිරීමට කටයුතු කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

තවත් කාරණයක් තිබෙනවා. අපේ ප්‍රදේශවල ගම්කාර්ය සභා මගින් නඩත්තු කරන සුසාන භූමි පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. මේ සුසාන භූමි එකක්වත් ගම්කාර්ය සභාවලට මැන වෙන් කර දී නැහැ. නමුත් ලැයිස්තුවල සෑම ගමකටම සුසාන භූමියක් බැගින් තිබෙනවා. සමහර පළාත් පාලන ආයතනවලට සුසාන භූමි 50, 60 තිබෙනවා. සුසාන භූමි 100ක් තිබෙන පළාත් පාලන ආයතනත් තිබෙනවා. නමුත් මේ එකම සුසාන භූමියක්වත් මැන වෙන් කර දී නැහැ. එම නිසා අද මොකක්ද සිද්ධ වී තිබෙන්නේ? සමහර මිනිසුන් මේ සුසාන භූමිවල පදිංචි වී ඒවා වගා කරනවා. සුසාන භූමියකට මළ කඳක් රැගෙන යාමේදී පසුගියදා විශාල සට්ටනය කුත් ඇති වුණා. පොලිසියටත් මැදහත් වන්නට සිද්ධ වුණා. මේ සුසාන භූමි මැන වෙන් කර නැති නිසයි මෙවැනි දේවල් සිදු වෙන්නේ. එම නිසා සුසාන භූමි වටා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධර්මදාස බණ්ඩා මයා.]

කම්බි වැටවල් බැඳ ඒවා නඩත්තු කරන්නට ගම්සභාවලට නොහැකි වී තිබෙනවා. එහි ප්‍රතිඵලයක් වශයෙන් දැනට මිනිසුන් ඒවායේ පදිංචි වී වගා කරනවා. මේ තත්ත්වය නිසා ගම්වල සුසාන භූමි නැති වන තැනට කටයුතු සිද්ධ වී තිබෙනවා. මේ කාරණය ගැන අවධානය යොමු කර ක්‍රියා කරන මෙන් මා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා. අපේ ප්‍රදේශයේ සෑම ගම්සභාවකටම සුසාන භූමි පිළිබඳ මේ ප්‍රශ්නයට මුහුණ පාන්නට සිද්ධ වී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අවුරුදු හයකටම මොනරාගල දිස්ත්‍රික්කයට ලැබී තිබෙන්නේ එකම එක පුස්තකාලයක් සෑදීමට ආධාර පමණයි. ඌව ප්‍රදේශයට කොපමණ ලැබුණාද කියා මා දන්නේ නැහැ. නමුත් මොනරාගල දිස්ත්‍රික්කය පිළිබඳව පසුගිය කාලය තුළ කටයුතු සිද්ධ වී තිබෙන්නේ එහෙමයි. අද බොහොම අසාධාරණකමක් සිද්ධ වෙනවාය කියා විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරයකු කියන්නට යෙදුණා. එහෙත් ගම්බද ප්‍රදේශවල තිබෙන ගම්සභාවලට එදාට වඩා දෙගුණයකටත් වැඩිය අද ආධාර ලැබී ගෙන යන බව මා කියන්නට සතුටුයි.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)
අපට නැහැ.

**ධර්මදාස බණ්ඩා මයා.**
*(திரு. தர்மதாச பண்டா)*
(Mr. Dharmadasa Banda)
මා සිතන හැටියට නමුන්නාන්සේගේ නගර සභාවට මේ වාරයේ පමණ කවදාවත් මුදල් ලැබුණේ නැහැ. ඒ ගැන නමුන්නාන්සේ මේ ජාතික රජයටත් පළාත් පාලන ඇමතිතුමාටත් ස්තුතිවන්ත විය යුතුයි.

ගරු සභාපතිතුමනි, පසුගිය හය අවුරුද්දක පමණ කාලය තිස්සේ අපට පුස්තකාලවලට ආධාර ලැබුණේ නැහැ. පුස්තකාල නොමැතිවීම මොනරාගල දිස්ත්‍රික්කයේ තිබෙන විශාල අඩුපාඩුවක්. අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් විශාල පුස්තකාල පිහිටුවා නඩත්තු කරන්නට බැරි තත්ත්වයක් තිබෙන මේ අවස්ථාවේදී ගම්සභා මගින් අපේ ප්‍රදේශවල පුස්තකාල රාශියක් පිහිටුවන්නට ආධාර දී තිබීම ගැන මා කෘතඥ වෙනවා. අපේ ප්‍රදේශවල පොත්පත් කියවන්නන්ගේ දැනුම වැඩි දියුණු කර ගැනීමටත් පාඨශාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දැනුම වැඩි දියුණු කර ගැනීමටත් අවස්ථාව සැලසී තිබෙනවා.

අවසාන වශයෙන් නගර සභාවලට දෙන ආධාර අඩු කර හෝ ගම්බද ප්‍රදේශවල ගම්සභාවලට තව තවත් වැඩියෙන් ආධාර කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

**විජේරත්න බණ්ඩා මයා.**
*(திரு. விஜேரத்ன பண்டா)*
(Mr. Wijeratne Banda)
ගරු සභාපතිතුමනි, ගම්සභාවක සභාපතිවරයකු වශයෙන් මටත් පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ වචන සවල්පයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන සන්තෝෂ වෙනවා. මට පෙර කථා කළ බිබිලේ ගරු මන්ත්‍රීතුමා කිව්වා ඌව ප්‍රදේශවලට දෙපාර්තමේන්තුවෙන් සහන සැලසෙනවාය කියා. ඌවේ සෑම ගම්සභාවක් පිළිබඳවම කරුණු කියන්න මා දන්නේ නැහැ. කෘෂිකර්ම සංවර්ධනය යටතේ පාරක් කැපීම පිණිස රුපියල් 10,000 ක් ලැබුණාය කියා බිබිලේ ගරු මන්ත්‍රීතුමා කිව්වා. මගේ ගම්සභාවට නම් ලැබුණේ රුපියල් 4,000 යි. ඒ මුදල් ප්‍රමාණය කිසිසේත්ම ප්‍රමාණවත් නැති බව ගරු උප ඇමතිතුමාට දැනුම් දෙන අතර, දෙපාර්තමේන්තුව මගින් මේ ආධාර දෙන විට විශේෂයෙන්ම ඌව ප්‍රදේශ ගැන වැඩි සැලකිල්ලක් දක්වා ආධාර දීම පිණිස ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

රුපියල් 4,000ක් වැනි මුදල් ප්‍රමාණයකින් බෝක්කු කීපයක් බැඳගන්නවත්, පාලමක් තනා ගන්නවත් බැරි බව නමුන්නාන්සේ දන්නවා ඇති. "කෝස් වේ" එකක් දා ගැනීම පිණිස ඒ රුපියල් 4,000 යෙදීමට කල්පනා කර ඇති නිසා ශ්‍රමදානයක් මගින් දැන් පස් කපා සකස් කර තිබෙනවා. අපට යම් කිසි ප්‍රමාණවත් මුදලක් නොලැබෙනවා නම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එයින් නියම ප්‍රයෝජනය ලබා ගැනීමට බැහැ. පැරවල් සහ ජල සම්පාදන කටයුතු සඳහා අපට දෙපාර්තමේන්තුවෙන් ආධාර ලැබෙනවා. පාරවල් සඳහා ලැබෙන මුදල් වාර්ෂිකව අවුරුදු 7ක් 8ක් තිස්සේ යෙදු වත්, අපේ ප්‍රදේශවල පාරක හැතැප්ම දෙකකවත් වැඩ අවසන් කරන්න බැහැ. මගේ ගම්කාර්ය සභාවේ පුස්සැල්ල කඳ -කොහාන නමැති පාරට දැන් අවුරුදු ගණනාවක් තිස්සේ රුපියල් 54,000ක් පමණ වියදම් කර තිබෙනවා. අවුරුද්දකට රුපියල් 10,000ක් ලැබෙනවා. ඒ මුදලින් ටික දුරක් කපනවා. ඒ මුදල වියදම් වන තුරු කපා ඉන් පසුව වැඩ නවතා නැවත ආධාරය ලැබෙනතුරු බලා සිටිනවා. ඊළඟ අවුරුද්දේ ආධාර මුදල ලැබෙන විට කලින් අවුරුද්දේ කැපූ කොටස සම්පූර්ණයෙන් කැලෑව වී පාරක් නැති තත්ත්වයකට වැටෙනවා. එසේ සිදු වන්නේ දිගටම වැඩ කරගෙන යාමට තරම් අවශ්‍ය ආධාර මුදලක් නොලැබ සුළු ආධාර මුදලක් ලැබෙන නිසයි. ඒ හේතුකොටගෙන අප බලාපොරොත්තු වන ප්‍රයෝජන එම මුදල් ප්‍රමාණය අනුව ලබා ගන්න බැහැ. ඒ නිසා පාරවල් සඳහා ආධාර මුදල් වෙන් කරන විට හැතැප්ම භාගයක හමාරකවත් වැඩ අවසන් කර ගැනීමට පුළුවන් වන විධියේ මුදල් ප්‍රමාණයක් දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා.

ඊයේ මා උප ඇමතිතුමාත් සමග සතුටු සමාචි කථාවෙහි යෙදී සිටියදී මා මතක් කළා, අපේ ගම්කාර්ය සභාවට කෘෂිකර්ම දියුණුව සඳහා ලබා දෙන ආධාර මුදල වන රුපියල් 4,000 කිසිසේත් ප්‍රමාණවත් නැත කියා. ඒ නිසා ඒ සඳහා තවත් රුපියල් 6,000ක් එකතු කර රුපියල් 10,000ක් ලබා දීමට එතුමන්ගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලනවා.

බදු මුදල් පිළිබඳව තමුන්නාන්සේට කරුණු කීපයක් ඉදිරිපත් කරන්න ඕනෑ. අපේ ගම්බද ගම්කාර්ය සභාවලට තිබෙන ආදායම් මාර්ග ඉතාමත් අඩුයි. කරත්තයක් බයිසිකලයක් වැනි සුළු දේකින් තමයි දැනට ආදායමක් ලබාගන්නෙ. මීට පෙර වර්ෂවලත් මේ කාරණය මා ඉදිරිපත් කර තිබෙනවා. ඒ ඒ ගම්කාර්ය සභා ප්‍රදේශවල තිබෙන ගුවන් විදුලි යන්ත්‍ර සහ මෝටර් රථවාහන ආදිය සඳහා නියමිත බලපත්‍ර ගාස්තුව ඒ ඒ ගම්කාර්ය සභා මගින් අය කර ගැනීමට අවස්ථාව සල සන්නේ නම් ඒ හේතුකොටගෙන සෑහෙන ආදායමක් ලැබෙන නිසා ගම් ප්‍රදේශවල මීට වඩා වැඩියෙන් වැඩ කිරීමට අවස්ථාව ලැබෙනවාට කිසිම සැකයක් නැහැ.

ජල සම්පාදන දෙපාර්තමේන්තුව ගැන කල්පනා කරන විට ඉතාමත් කණගාටු දායක තත්ත්වයක් තිබෙන බව කියන්න සිදු වී තිබෙනවා. 1965 සිටම අය වැය විවාදවලදී තමුන්නාන්සේගේ ශ්‍රීය යට තේ මා මේ කාරණය ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා නැවත වරක් මේ කාරණය ගැන මතක් කිරීමට මට අවස්ථාව නොලැබේවාය කියා මා ප්‍රාර්ථනා කරනවා. මා මතක් කරන කාරණය මේකයි. 1959 දී පසු ගිය රජය විසින් කන්දේගෙදර ජල යෝජනා ක්‍රමයට මුදලක් වෙන් කළා. මේ ජලසම්පාදන දෙපාර්තමේන්තුවේ අත්තනෝමතික වැඩ නිසා රජයට මුදලත් නැහැ; කන්දෙගෙදර ප්‍රදේශයේ මහජනයාට වතුරත් නැහැ. එයට හේතු වුණේ මේකයි: ටැංකි බැන්දා; පයිප්ප ගොඩක් අරගෙන ගියා; අනිකුත් බඩු බාහිරාදියත් අරගෙන ගොස් වැඩ පටන් ගත්තා; එහෙත් ජලය ලබා ගැනීමට දිසාපතිවරයාගෙන් අවසර ගත්තේ නැහැ. නිකම් නිරපරාදේ මුදල් වියදම් කළා. මහජනයා අහනවා "කෝ වතුර" කියා.

අපත් තමුන්නාන්සේලාගෙන් ප්‍රශ්න පිට ප්‍රශ්න අහනවා; පාර්ලිමේන්තුවේදීත් විවාදයට භාජන කරනවා. එහෙත් මේ දෙපාර්තමේන්තුව කරන්නේ කුමක් ද කියා මා තබා ගරු පාර්ලිමේන්තු ලේකම් තුමාවත් දන්නේ නැතිව ඇති. ඒ සඳහා වෙන් කළ රුපියල් 59,000 ක මුදල රුපියල් 20,000 දක්වා බැස තිබෙනවා. අනික්වා වියදම් කර අවසානයි. මා දන්න හැටියට—පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් පිළිතුරු ලැබී තිබෙන හැටියට—දෙපාර්තමේන්තුව කොන්ත්‍රාත්කරුවන් සමග නඩු කියනවා. යම්කිසි වැඩක් කරන විට පරීක්ෂණ පවත්වා ස්ථිර පදනමක් යටතේ එය කරන්නට ඕනෑ. එසේ නොකොට කොළඹ සිටින නිලධාරීන් ඌවට ගොස් දිසාපතිවරයා සමගවත් සාකච්ඡා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේරත්න බණ්ඩා මයා.]

නොකොට, ඒ ජලසම්පාදන යෝජනා ක්‍රමය සකස් කළ යුත්තේ කොයි අන්දම වද කියාවත් සොයා නොබලා, කටයුතු කිරීම නිසා ඒ වැඩේ හරියාකාර කෙරුණේත් නැහැ; අපට දොස් අහන්නටත් සිදු වුණා. ඒ නිසා අපට තිබෙන්නේ තමුන්නාන්සේලාට දෝෂාරෝපණය කිරීමයි. ඒ නිසා ඒ කරුණ ගැන ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. මීට පසුව ඒ ගැන සාකච්ඡා කරන්නට ඉඩක් නොතබා, කුමක් හෝ විසඳුමක් ඇති කර, එහි අවසානයක් ඇති කරන ලෙස මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

එම යෝජනා ක්‍රමය සම්පූර්ණ කර ප්‍රයෝජන ගත හැකි අන්දමට සකස් කරන්නට දෙපාර්තමේන්තුවට බැරි නම් ඉතිරිව තිබෙන රුපියල් 20,000 ගම්සභාවට දෙන ලෙසත්, එසේ දුන්ණොත් මාස දෙකක් ඇතුළතදී කන්දෙගෙදර ජනතාවට ජලය සැපයීමට ගම්සභාවට හැකිකම තිබෙන බවත්, ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට මෙයට අවුරුද්දකට පමණ පෙර අප කියා හිටියා. ඒ නිසා ඒ ඉතිරිව තිබෙන මුදල අපට ලබා දෙන්නය කියා ඉල්ලා සිටිනවා. එය කරන්නත් දෙපාර්තමේන්තුව ඉඩ දෙන්නේ නැහැ. එයට හේතුව අර වියදම් කළ මුදලට වගකියන්නට කෙනකු නැති වීමයි. රහස ඒකයි. කාගෙන්වත් අහන්නේ නැතිව, සොයන්නේ බලන්නේ නැතිව, දෙපාර්තමේන්තුව මඟින් විශාල මුදලක් යට කළා. පයිප්ප, "ස්ටෑන්ඩ් පෝස්ට්ස්" ආදී සියල්ලක්ම දැන් බණ්ඩාරවෙල බස් උන් නැහේ කෙනකුගේ ගෙදර තබා තිබෙනවා. අන්න ඒ හොරේ අසු වන නිසා අර ඉතිරි මුදල් ටික ගම්සභාවට දෙන්න කැමති වන්නෙත් නැහැ; දෙපාර්තමේන්තුව මේ කටයුත්ත කරන්නෙත් නැහැ. මේක දේව අපරාධයක්. කරුණා කර මේ ගැන පරීක්ෂා කර බලන්න. මේ සම්බන්ධව තිබෙන ලිපිගොනු ගම්සභාවේ මාර්ගයෙන් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට ඉදිරිපත් කරන්නට මට පුළුවන්. මේ ජලසම්පාදන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරවා ගන්නට අප ගම්සභාව හුඟක් මහන්සි ගෙන තිබෙනවා. එහෙත් මේ දෙපාර්තමේන්තුව ඒකට ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා මේ ගැන සොයා බලා අර ඉතිරි මුදල ගම්සභාවට ලබා දෙනවා නම් මාස දෙකක් යන්නටත් කලින් ඒ නගරයට ජලය ලබා දීමට ගම්සභාවට පුළුවන් බව මා කියනවා.

මේ පිළිබඳවම තවත් කරුණක් මතක් කරන්නට ඕනෑ. සාර්නියා වත්තට ඔය කියන ස්ථානයෙන්ම අඟල් දෙකහමාරේ දෙකහමාරේ පයිප්ප දෙකක් අරගෙන පයිප්ප දෙකක් අරගෙන ජලය අපතේ යන ආකාරයට ඒ වතු සමාගම කටයුතු කරගෙන යනවා. වතු සමාගම අරගෙන තිබෙන ඒ පයිප්ප දෙකින් සම්පූර්ණයෙන්ම අඟල් 3 ක පමණ ජලයක් අපතේ යනවා. ඒ පයිප්ප දෙකම හරවා තිබෙන්නේ එක ටැංකියකටයි. ඒ පයිප්පවලින් එන ජලය වැඩි නිසා ටැංකිය උතුරා ජලය අහක යනවා. එයින් එක පයිප්පයක් දෙපාර්තමේන්තුවෙන් සාදා තිබෙන ටැංකියට ගෙන යන්නට පුළුවන් අන්දමට ඒ කිව්වුවෙනුයි ඇවිත් තිබෙන්නේ. ඒ නිසා ඒ ජල නළය දෙපාර්තමේන්තුවට පවරා ගෙන එමඟින්වත් අර දුර්වලතාවන් මඟ හරවා ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා. එහෙත් එය කරන හැටි ඒ අයට තේරෙන්නෙ නැහැ. දෙපාර්තමේන්තුවෙන් බැඳ තිබෙන ටැංකියට අර පයිප්පයක් ගෙන ගොස් හේත්තු කර ජලය ලබාගන්නා ලෙස මා ඉලලනවා.

ගරු සභාපතිතුමා මා දෙස බලන්නේ වේලාව ගත වී ඇති නිසා යයි මා හිතනවා. එහෙත් තවත් එක කරුණක් පමණක් මතක් කළ යුතුව තිබෙනවා. බිබිලේ ගරු මන්ත්‍රීතුමා (ආර්. එම්. ධර්මදාස බණ්ඩා මයා.) සොහොන් භූමි ගැන මතක් කළා. එතුමා සඳහන් කළාක් මෙන්ම, ඔය සුසාන භූමි ප්‍රශ්නය අපේ ගම්සභාවලටත් බලපා තිබෙනවා. පසුගිය දිනක එක්තරා ගමක මරණයක් සිදු වී සොහොන් භූමියට අර ගෙන ගිය අවස්ථාවේ එම සොහොන් භූමියේ වෙනත් කෙනකු ගෙයක් සාදාගෙන පදිංචි වී සිටි නිසා මිනිය ගෙනයන්නට දෙන්නට බැරිය කියා අර නෑනෑත්තා පොර අල්ලන්න පටන් ගත්තා. එයට හේතුව සොහොන් පිටිය වෙන් කර නොමැති වීමයි. අප විසින් ඒ ගැන දිසාපතිතුමාටත් යෝජනාවක් යවා තිබෙනවා. එහෙත් එය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ක්‍රියාත්මක වී නැහැ. විශේෂයෙන්ම ගම්බද ජනතාවට සොහොන් භූමි අවශ්‍යයි. ඒ සොහොන් භූමි පිළිබඳ ප්‍රශ්නය නිරාකරණය කරගන්නට වැඩ පිළිවෙළක් යොදන ලෙස මා ඉල්ලා සිටිනවා.

පළාත් පාලන සේවකයන්ට හා රජයේ සේවකයන්ට දෙවිධියකට සලකන බව පෙනෙන්නට තිබෙනවා. පළාත් පාලන සේවකයන්ටත් රජයේ සේවකයන්ට තිබෙන වරප්‍රසාද ලබා දීමට කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. කාල වේලාව ගත වන නිසා වැඩිදුර කථා නොකරමින්, ජල සම්පාදන යෝජනා ක්‍රම, පාරවල් සෑදීම වැනි කාරණා සඳහා තව ටිකක් වැඩියෙන් ආධාර ලබා දීමට ක්‍රියා කරන ලෙස ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

පූ. භා. 10.30

**ඒ. අමිර්තලිංගම් මයා.** (වඩ්ඩුක්කොඩෙයි)

*(திரு. அ. அமிர்தலிங்கம்—வட்டுக் கோட்டை)*

(Mr. A. Amirthalingam—Vaddukoddai)

Mr. Chairman, I was shocked to read the report of the speech made by the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) yesterday on the Floor of this House. One would have expected a parliamentarian of his calibre, a senior politician in this country whose students all of us have been at some time or other, to whom we look up as a model parliamentarian, to check up his facts before he came to this House and made his speech. I think the hon. Member has let his anger and bitterness against the Hon. Minister of Local Government get the better of his judgment and his sense of propriety. That is why he has indulged in cheap personal attacks of this sort against the Hon. Minister of Local Government.

As I said, we can understand his reason for being very angry with the Hon. Minister of Local Government. He and his colleagues are unable to forget the role played by the Hon. Minister of Local Government on the momentous night of the 24th of March 1965 when the fate of this country was in the balance, when we had to decide whether we were to hand over this country to a totalitarian regime under the Fair Leader of the Opposition, or whether we were to safeguard democracy in this country for posterity. The Hon. Minister of Local Government played a very significant role in taking that momentous decision.

The hon. Member for Yatiyantota danced attendance on the then simple Mr. Tiruchelvam. He went to the Hon. Minister's house that morning and late at night in the company of the President of the D. W. C., Mr. Azeez. Late at night he went to the Hon. Minister's house. On the following morning also he went to the house of our Leader. The hon. Member for Yatiyantota is very angry with the Hon. Minister of Local Government because he thinks that all the schemes he and his colleagues had of entrenching themselves for ever in power in this country were foiled by the intelligence and patriotism of the Hon. Minister of Local Government. That is why the hon. Member has indulged in this sort of cheap personal attacks against the Hon. Minister.

He has tried even to make out that the Hon. Minister of Local Government has appointed his brother and Mr. Balasingham, who was referred to by him as the Hon. Minister's brother-in-law, to some committee. That is why I say that the hon. Member has allowed his anger to get the better of his judgment.

The hon. Member would have known that a committee on administrative reforms had been set up by the Hon. Prime Minister himself without any reference to the Hon. Minister of Local Government. That committee consisted of three Permanent Secretaries, namely Mr. G. V. P. Samarasinghe, Permanent Secretary to the Ministry of Defence and External Affairs, Mr. M. Rajendra Permanent Secretary to the Ministry of Nationalized Services, and Mr. C. Balasingham, Permanent Secretary to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමිර්තලිංගම් මයා.]
the Ministry of Health. Mr. Mahadeva and Mr. Chandra Cooray were also members of the committee that was appointed to report on the administrative reforms in this country which were thought to be long overdue not only by the Hon. Prime Minister but also by everyone who had experienced the difficulties that the administration was going through.

In fact, the Hon. Minister of Local Government submitted certain proposals on the reforms to be introduced in his Ministry even before the report of the committee of Permanent Secretaries appointed by the Hon. Prime Minister was submitted. The paper presented by the Hon. Minister of Local Government was in keeping with the modern trends in administrative reforms in all parts of the world, and on a decision of the Cabinet, those proposals had been introduced and implemented in certain ministries including the Ministry of Local Government.

On what authority, Sir, did the hon. Member for Yatiyantota say that Mr. C. Balasingham was a brother-in-law of the Minister ? It is an absolute falsehood when the hon. Member for Yatiyantota said so on the Floor of this House knowing it to be untrue. That is why I say that he has descended very low and has lost all the regard we as junior Members of this House had for him as a man of stature. That is not all. He went on to say that the Hon. Minister for Local Government dissolved the Jaffna Municipal Council one and half months before the report of the commissioner was given to him. That again is absolutely incorrect.

I have with me the judgment of the Privy Council on this matter. I think I need read an extract from that judgement as reported in the New Law Report, Volume LXIX, Part 12, to prove my point. I am reading from page 268 of this New Law Report. After perusing all the affidavits and the facts placed before it by counsel for the appellant as well as the affidavits submitted by the other side, this is the decision that the Privy Council came to :

"The Commissioner of Local Government visited Jaffna on 27th and 28th May 1966 and it is fair to say that the appellant who had been informed by the Minister of his impending visit gave to him every facility that he required for this purpose. He had full access to all the minutes of the Council but he did not ask anyone any questions or give any member of the Council any opportunity of expressing their views on any matter. His report, first oraly and then in writing, was received by the Minister on 29th May who on the same day made an Order stating that it appeared to him that the Jaffna Municipal Council was not competent to perform the duties imposed upon it and that pursuant to the powers conferred upon him by section 277 as amended he directed that the Council should be dissolved and superseded on 29th May 1966".

The Privy Council came to the definite conclusion, on the facts that were placed before it by both sides, that the Minister made his order only after the written report was submitted by the Commissioner of Local Government, Mr. W. J. Fernando, an officer of impeccable integrity and character, whom even the Opposition when they were in power regarded as a man who was nobody's stooge. So, on the report of an impartial officer—he cannot be called a Federalist or a member of the Tamil Congress—the Hon. Minister took a certain decision and acted on it, and the Privy Council held that both sides have conceded that. This is what the Privy Council held, at page 266 of the New Law Report, in its judgment :

"While it was an isue in the lower courts, it is now no longer disputed that the Minister acted in complete good faith and that in fact he would have given the Council the opportunity of being heard but for the urgency of the case as he or his advisers regarded it and it is not in doubt that if he was bound to observe the principle *audi alteram partem* he failed to do so."

That is the only fault that they found in him and even in that matter the Hon. Minister had followed the decision of the Supreme Court of Ceylon. The Supreme Court of Ceylon decided that the action of the then Minister of Local Government, Mr. A. P. Jayasuriya, under the former Government, in dissolving the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Colombo Municipal Council which was taken without giving them an opportunity of explaining their position was justified.

I think it was in the Sugathadasa case, that the action of the Minister of the then Government, the present Opposition, was challenged in the Supreme Court. The Supreme Court upheld the action and the Minister of Local Government had to follow the decision of the Supreme Court—he had to follow the law as laid down by the Supreme Court and it is only now that the Privy Council has laid down the principle which should be followed.

The hon. Member for Yatiyantota is seeking to throw mud at the Hon. Minister of Local Government merely because he was not prepared to oblige him and his friends to come into power with our help and establish a totalitarian regime in this country. That is why he indulged in this sort of talk. He sunk to low depths to the level of the hon. Member for Badulla (Mr. B. H. Bandara) in trying to make out that the Hon. Minister had favoured the Tamil areas in the allocation of funds. Even there he did not care to check up facts.

He said that two schemes had been granted money in the Paddiruppu Electorate. That was repeated by the hon. Member for Badulla. Actually, there is only one scheme which was accepted long ago. In fact, even the money was allocated but at a certain stage the then Member for Kalmunai, Mr. Ahamed intervened and it was upset and delayed.

Thuraineelvanai water supply scheme is the only one in the Paddiruppu Electorate. Natpiddimunai-Chenakudi scheme is in the Kalmunai Electorate. These are villages where Tamils and Mulsims live and one has only to go there and see for oneself the long distances that the poor women have to trudge to get water for their daily consumption. And that too was a scheme which was accepted by the last Government.

In fact, in spite of my repeated representations for certain schemes in my electorate I have got nothing. Mere token votes have been given and nothing else. People in my electorate are blaming me saying, " The Minister is of your Party, why cannot you do it ? " I had to tell them that the Minister has to act on certain principles and he has long-standing schemes for which he has to give priority, and these have to be investigated. And, these schemes are being investigated.

පූ. භා. 10.45

Even today these hon. Members try to make out that there are two housing schemes for Atchuvely. Really, the amount of money provided is for 108 houses for the so-called minority Tamils. The hon. Third Member for Colombo Central (Mr. Keuneman) shed copious tears for the minority Tamils and for their sufferings. This was an attempt on the part of the Minister of Local Government to alleviate the hardships that they are undergoing ; this scheme is meant for the poor people there. A sum of Rs. 333,000 out of a total vote of Rs. 2,900,000 for housing is the only sum that has been given to any Tamil area. Can anyone in his senses say that it is out of proportion or that it is undue action on the part of the Minister of Local Government ? Merely because he happens to be a Tamil should he discriminate against the Tamil areas ? In fact he has come in for a lot of criticism by the recently formed group called the *Eela Tamil Viduthalai Iyakkam* led by the former Member for Vavuniya, Mr. C. Suntheralingam, of which one of our former colleagues, ex-Senator M. Manickam, is general secretary. They attacked him very strongly saying that he has not given a grant to the Jaffna Municipal Council for the construction of the Jaffna model market. So, the Hon. Minister is being attacked on the one side by deliberate slanderers like the hon. Member for Yatiyantota who have a motive and a purpose in doing so, and on the other, by extremists who are trying to make out

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමිර්තලිංගම් මයා.]

that he is not playing fair by the Tamils. That itself is a sure indication that the Hon. Minister is holding the scales evenly.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Kindly finish by 10.50 A.M. There are ten more Members to speak on these Heads.

අමිර්තලිංගම් මයා.
(திரு. அமிர்தலிங்கம்)
(Mr. Amirthalingam)

I shall not take much time.

In fact the hon. Member for Yatiyantota as well as other Members on that side tried to make out that the Hon. Minister of Local Government was using his powers in a way which is detrimental to the local bodies which are with the Opposition. Actually that is not correct. One chairman of a local authority was removed, in Jaffna, and that chairman, Mr. K. Thuraisingham, happened to be a founder member of my party and the Minister's own party. There was a charge of improper use of funds. When the report of the Assistant Commissioner who investigated the matter was submitted, stating that the chairman was guilty of the charge, the Hon. Minister did not hesitate to act against him.

Then, the Government Party's own stalwart who contested the hon. Fair Leader of the Opposition, Mr. Seneviratne, was another of those whom the Hon. Minister removed from office. In fact he has dissolved a number of local bodies. There is the Chairman of the Vakarai V.C., which is in the Eastern Province, who was removed from office by the Hon. Minister. He was a supporter of our own party. So, it is absolutely unfair and unbecoming of members like the hon. Member for Yatiyantota to make allegations which, if they would only pause to investigate for a moment, they will find are groundless, without any foundation.

I chose to speak at this stage in order to clear the wrong impression that is sought to be created in this country by the Opposition that the Hon. Minister of Local Government is using his powers for party or for communal advantage. In fact they are angry with him for other reasons, so much so that I understand that even at the last S.L.F.P. convention which was held in the capital of the South, he was singled out for attack in the slogans that were shouted in the procession. Neither he nor members of his party will be daunted by this sort of wild attack. We will work hand in hand with the Hon. Prime Minister to see that all communalists and people who are out to destroy democracy in this country are not given a chance to come back to power, and that justice is done to all sections, to all parties and to all local bodies.

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

ගරු සභාපතිතුමනි, වඩ්ඩුක්කොඩෙයි ගරු මන්ත්‍රීතුමාගේ ඉතා වේගවත් කථා වට පසු වචන කිහිපයක් කථා කරන්නට ඉඩක් ලැබීම ඉතා උසස් කාරණයකැයි මා කල්පනා කරනවා. මොහොතකට පෙර කථා කළ ඒ ගරු මන්ත්‍රීතුමා යම් යම් කරුණු ගැන සඳහන් කරද්දී අපට පෙනී ගියේ ඇත්තෙන්ම එතුමා යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) සමග වෛරයක් ඇතිව වේග වත් ලෙස කථා කළ බවයි. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා තුළ යම්කිසි ක්‍රෝධයක් ඇතැයි වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ නමුත් ඒ ගරු මන්ත්‍රීන් දෙදෙනාම කථා කරද්දී මා ඒවා ඇසීමට මෙහි සිටි නිසා ඒ ගැන මට යමක් කියන්නට පුළුවනි. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා නම් ක්‍රෝධයකින් කථා කළ බවක් අපට දකින්නට ලැබුණේ නැහැ. එතුමා කථා කළේ ලේඛන සහ ඉලක්කම් ආදිය ඉදිරි පත් කරමිනුයි. තොරතුරු ඉදිරිපත් කර මින් සාරවත් කථාවක් යටියන්තොට ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා. එතුමා කළ කථාවට සවන් දීගෙන සිටි නිසා මට එතුමා කථා කළේ ක්‍රෝධයෙන් නොවන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බව කියන්නට පුළුවනි. ඒ නිසා වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමා කොයි අන්දමට කියා සිටියත් යටියන්තොට ගරු මන්ත්‍රීතුමා නම් වෛරයෙන්, ක්‍රෝධයෙන් කථා කළේ නැතැයි මා කියනවා. එහෙත් මේ දන් කථා කළ වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමා නම් හුඟක්ම වෛරසහගතවයි කථා කළේ.

මට අද තවත් පුදුම දෙයක් දනගන්නට ලැබුණා. මෙතෙක් කල් අප හිතාගෙන හිටියේ 1965 දී මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නට වැඩ කර තිබෙන්නේ සඟපෙරමුණ ආදී සංවිධාන මගින්ය කියායි. එහෙත් අපට අද දනගන්නට ලැබුණා ෆේඩරල් පක්ෂයත් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීම පිණිස තමයි වැඩ කර තිබෙන්නේ කියා. ඒක බොහොම හොඳයි. උතුරේ එක්තරා පිරිසකට අද නිදහසේ ඕනෑම තැනකින් වතුර ටිකක් බොන්නටවත්, හරියාකාර බස්රථයක පවා ගමන් කරන්නටවත්, ඇඳුමක් තමන් කැමති අන්දමට අඳින්නටවත්, පාරේ ගමන් කරන්නටවත්, කෝවිලකට ගොස් තමන් කැමති ආකාරයකට නිදහසේ වැඳුම් පිදුම් කරන්නටවත් ඉඩ නොදෙන බව අප දන්නවා. ඒ උදවියට ලැබිය යුතු නිදහස ලබා දීමට මෙතෙක් කර තිබෙන දේ දනගන්නටත් අප කැමතියි. ඒ කොයි හැටි වෙතත් මෙතන ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම ගැනත් ප්‍රජාතන්ත්‍රවාදය ගැනත් නොයෙක් විධියට අර්ථ නිරූපණය කරන්නට නම් ඉදිරිපත් වන බව අපට පෙනෙනවා.

1965 මහා මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අන්ත පරාජයකට මුහුණ පෑ බවක් බිබිලේ ගරු මන්ත්‍රීතුමා (ධර්මදාස බණ්ඩා මයා.) ප්‍රකාශ කළා. ඒ ප්‍රකාශය අසා මා පුදුමයෙනුත් පුදුමයට පත් වුණා. ඇත්ත වශයෙන්ම අන්ත පරාජය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දයි ඒ ගරු මන්ත්‍රීතුමා තේරුම් ගෙන සිටිනවා දැයි මා දන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂය ආසන 68 කුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු සමගි පෙරමුණ ආසන 58 කුත් ලබා ගත්තා නම් ඒ අනුව අන්ත පරාජයක් ලත් පක්ෂයක් ගැන කථා කරන්නේ කොහොමද? 1956 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ආසන 51ක් ලැබුණා. ඒ මහා මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයට ලැබුණේ ආසන 8ක් පමණයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන 51ක් ලබන විට ආසන 8ක් පමණක් ලැබූ එක්සත් ජාතික පක්ෂයට අන්ත පරාජයක් එදා අත් වුණේ නැත්නම්, 1960 ජූලි මාසයේ පවත්වන ලද මහා මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන 75ක් දිනා ගත් අවස්ථාවේ ආසන 30ක් පමණක් ලැබුණු එක්සත් ජාතික පක්ෂයට එදා අන්ත පරාජයක් අත් වුණේ නැත්නම්, 1965 දී එක්සත් ජාතික පක්ෂයට ආසන 68ක් ලැබෙන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු සමගි පෙරමුණට ආසන 58ක් ලැබීම අන්ත පරාජයකැයි විස්තර කිරීම මොන බොළඳ කථාවක්දැයි මට නම් තේරෙන්නේ නැහැ.

පළාත් පාලනය ගැන නොයෙක් ගරු මන්ත්‍රීන් නොයෙක් දේවල් කථා කළා. එතුමන්ලා කොපමණ කථා කළත් මට එකක් කියන්නට පුළුවනි. මා ඒ කාරණය සඳහන් කිරීමේදී මේ ආණ්ඩුව මත පමණක් වරද පටවන්නට හදනවා නොවෙයි. ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට කියන්නට කැමතියි, පළාත් පාලන ආයතනවලින් ලැබෙන සේවය ක්‍රමක්‍රමයෙන් පහත් වේගන, දුර්වල වේගන යන බව අපට පෙනෙනවාය යන්න. අප කුඩා කාලයේදී මහනුවර නගර සභාවෙන් කරන ලද වැඩ අපට දකින්නට ලැබුණා. ඒ කාලයේදී මහනුවර නගර සභාවෙන් සේවාවන් ගණනාවක්ම සිදු වුණා. සෞඛ්‍ය, මාර්ග, අධ්‍යාපන, ජල, නිවාස යන මේ කාරණාවල් පහම පළාත් පාලන ආයතනවලින් ඉතාමත් උද්‍යෝගිමත්ව සහ පිරිසිදුව ඉටු වුණා. එදා ඔය කටයුතු ඉතාම හොඳින් කරගෙන ගිය බව අප දන්නවා. මහනුවර නගර සභාව මගින් ඇති කරන ලද පාඨශාලා අදත් තිබෙනවා. ඒවා දන් රජයට භාරගෙන රජයේ පාඨශාලා වශයෙන් පවත්වාගෙන යන නමුත්, ඒ කාලයේදී පාලනය කරන ලද්දේ නගර සභාව මගිනුයි. මහා ආණ්ඩුවට වඩා වැඩ ප්‍රමාණයක් සෞඛ්‍යාරක්ෂාව සම්බන්ධයෙන් එදා පළාත් පාලන ආයතනයෙන් සිදු වුණා. පාරවල් ගැන කියනත්, සමහර නගර සභා ප්‍රදේශ තුළ මහා ආණ්ඩුවේ පාරවලට වඩා හොඳ පාරවල් තිබුණු බව කියන්නට පුළුවනි. අවුරුදු 50 ක් 60 ක් තිස්සේ වැයම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]

කළ ජල ප්‍රශ්නය සම්පූර්ණයෙන් නිරාකරණය කර දෙන්නට අපට පසුගිය කාලයේදී පුළුවන් වුණා. ඒවාගේම, රුපියල් 5, 7, 10 ආදී වශයෙන් අඩු කුලී ගෙවාගෙන සාමාන්‍ය ජනයාට ජීවත් විය හැකි නිවාස සිය ගණනක් මහනුවර නගර සභාව මගින් හදා දීමටත් අපට පුළුවන් වුණා. එහෙත්, අද එම නගර සභාවෙන් එවැනි සේවයක් සිදු නොවන බවත් නගර සභාවේ සේවා වන් අඩු වී තිබෙන බවත් ගරු උප ඇමතිතුමාට පෙන්වා දෙන්නට කැමතියි. පළාත් පාලන ආයතනවලින් අප බලාපොරොත්තු වන මූලික කරුණු 5 ගම්බද පළාත්වලට කොයි අන්දමකින්වත් ඉටු නොවන බව කියන්නට සිදු වී තිබෙනවා.

බිබිලේ ගරු මන්ත්‍රීතුමා (ආර්. එම්. ධර්මදාස බණ්ඩා මයා.) ගැමි කොමිෂන් සභාව ගැන කරුණු කිව්වා. ගැමි කොමිෂන් සභාවේ කටයුතු පසුගිය අවුරුදු දෙක තුළේදී ඇති වුණු දේවල් නොවෙයි. 1957 සිටම ඒ කොමිෂම බිබිලේ ආදී ප්‍රදේශවල පවා අවශ්‍ය තැන්වල පාරවල් ඉදි කිරීම ආදී කටයුතු කරගෙන ගිය බව අප හොඳාකාර දන්නවා. එම නිසා ගැමි කොමිෂන් සභාවේ කටයුතු අලුත් දේවල් හැටියට ප්‍රකාශ කරන්නට කාටවත් පුළුවන්කමක් නැහැ.

ඊළඟට අපේ ප්‍රදේශයේ පාලම් සම්බන්ධයෙන් ගරු උප ඇමතිතුමාට කිව යුතු කරුණක් තිබෙනවා. ඇල්ලේපොල-ඇහැලේපොල පාලම සෑදීමට අප විශාල මහන්සියක් දරා ලොකු වියදමක් කොට වැඩ කරගෙන ගියා. එහෙත් පසුගිය අවුරුදු දෙක හමාර අතරතුර කාලයේදී ඒ පාළමේ කිසිම වැඩකට අතගසා නැති බව කියන්නේ ඉතාමත් කණගාටුවෙන්. මහනුවර-යාපනය පාරේ 39 වැනි හැතැප්ම කණුව අසල පිහිටා තිබෙන පන්නම්පිටිය ගමේ සිට කිරුලැස්සට යාමට තිබෙන පාරෙහි ඇති මේ පාළම අපට ඉතාම අවශ්‍ය එකක්. මේ පාලම් නැත්නම් එම ගමට යාමට මිනිසුන්ට වෙන මොනම පිළිවෙළක්වත් ඇත්තේ නැහැ.

දඹුල්ලට යාබදව තිබෙන පහලවැව නමැති ස්ථානයත් ජනතාවට විශාල කරදරයක් ඇති වන තැනක්. යන්තම් වැස්සක් ඇති වුණත්, මිනිසුන්ට එහා මෙහා යන්නට බැරි වන අන්දමට ඒ ගම සම්පූර්ණයෙන්ම ජලයෙන් කොටු වෙනවා. මේ ගම පිහිටා තිබෙන්නේ ගම් සභාවටත් නගර සභාවටත් අයිති ප්‍රදේශ දෙකේ මායිමෙයි. මෙය ජලයෙන් යට වීම නැවැත්වීමට පාළමක් දමන ලෙස නගර සභාවෙන් ඉල්ලූ විට, "එය අපට අයිති නැති නිසා ඒ වැඩේ කරන්නට බැරිය" කියනවා. ගම්සභාව කියන්නෙත් එයමයි. මේ ආයතන දෙකේ කඹ ඇදිල්ල නිසා පහලවැව නමැති ගමේ ජනතාව අද ඉතාමත් අමාරු තත්ත්වයකට පත්ව සිටින බව ගරු උප ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි.

වියළි කලාපයේ සාමාන්‍ය නගරවලට ජලයේ අවශ්‍යතාව තිබෙනවා. අප ලොකු වියදමකින් කරගෙන ගිය දඹුල්ලේ ජල යෝජනා ක්‍රමය ගැන නම් ගරු පළාත් පාලන උප ඇමතිතුමා මහන්සියක් ගෙන තිබෙන බව මා ඉතා සතුටින් ප්‍රකාශ කරනවා. එහෙත්, සතියකට වරක් දෙකක් පමණ එය අබලන් වීම නිසා නැවතත් පරණ ළිං සොයාගෙන යන්නට මිනිසුන්ට සිදු වන බව ගරු උප ඇමතිතුමාට පෙන්වා දෙන්නට ඕනැ. එම නිසා නගරයට ස්ථිර ජල මාර්ගයක් ලබා දීමේ කටයුතු සම්පූර්ණ කරන ලෙස මා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

පල්ලේපොල නමැති ස්ථානයටත් ජල යෝජනා ක්‍රමයක් අවශ්‍යව තිබෙනවා.

පූ. භා. 11

කොහොළන්වෙලට වතුර දෙන බව මීට අවුරුදු කීපයකට පෙර ප්‍රකාශ කර තිබෙනවා. කොහොළන්වෙල මාතලේ ආසනයේ මායිමක් වන නිසා මාතලේ ගරු මන්ත්‍රීතුමාටත් (ඇලික් අලුවිහාරේ මයා.) ඒ පිළිබඳව අයිතියක් තිබෙනවා. කොහොළන්වෙලට වතුර ලැබෙනවා නම් මාතලේ ආසනයේ කොටසකටත් එයින් ප්‍රයෝජනයක් ගන්නට පුළුවනි. එම නිසා ඒ සම්බන්ධයෙන් මාතලේ ගරු මන්ත්‍රීතුමාත් උනන්දු වෙනවාට කිසිම අඩමානයක් නැහැ. එබැවින් කොහොළන්වෙලට වතුර සැපයීම ගැන මා පාර්ලිමේන්තු ලේකම්තුමාගේ අවධානය යොමු කර වන්නට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපේ පළාතේ ශීඝ්‍රයෙන් දියුණු වේගෙන එන නගරයක්, ගලේවෙල. ගලේවෙලට වතුර නැතිකම නිසා ඒ ප්‍රදේශයේ මහජනයා බොහොම පීඩා විඳිනවා. එම නිසා, දඹුල්ලට වාගේම ගලේවෙලටත් ජල සම්පාදන යෝජනා ක්‍රමයක් ඇති කිරීමට පළාත් පාලන අමාත්‍යාංශය ක්‍රියා කරනවා ඇතයි අප බලාපොරොත්තු වෙනවා.

බිබිලේ ගරු මන්ත්‍රීතුමා සොහොන් බිම් ගැනත් ප්‍රකාශ කළා. අද කිසිම ගමකට නියම සොහොන් බිමක් නැහැ. දඹුල්ලේ පමණක් නොව ලංකාවේ හැම පළාතකම වාගේ සොහොන් බිම් සම්බන්ධයෙන් නොයෙකුත් අඩුපාඩුකම් තිබෙනවා. මා පෙරේදා පල්ලෙපොලට ගිය අවස්ථාවේදී පල්ලෙපොල මිනිසුන් මා වට කරගෙන කීවා, "දීර්ඝ කාලයක සිට පල්ලෙපොල ගම්වාසීන් විසින් භාවිතා කරගෙන ආ හුනියන්කොටුව සොහොන් බිම දැන් ග්‍රාම සේවකයාගේ පියාට හය අවුරුද්දකට බදු දී තිබෙනවා" කියා. එම ප්‍රදේශයට තිබුණු සොහොන් බිමට දැන් සිදු වී ඇත්තේ ඒ විධියයි. එම නිසා ඒ සොහොන් බිම පාවිච්චි කරන්නට ප්‍රදේශයේ ජනතාවට පුළුවන්කමක් නැහැ. අප සියලු දෙනාම කවදා හෝ මැරෙන බව අප දන්නවා. අප කාටත් අවසානයේදී සොහොන් බිම වුවමනා වන නිසා, සොහොන් බිම් සම්බන්ධයෙන් අළුත් වැඩ පිළිවෙළක් හෝ ඇති කොට දැනට සොහොන් බිම් සම්බන්ධයෙන් මතු වී තිබෙන නොයෙකුත් අඩුපාඩුකම් මගහරවා දෙන ලෙස පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා.

අපේ ප්‍රදේශයේ අඩුපාඩුකම් සම්බන්ධයෙන් කිව යුතු තවත් බොහෝ කරුණු ඇතත්, මා මේ අවස්ථාවේදී ඒ හැම කරුණක් ගැනම කියන්නට යන්නේ නැහැ. එහෙත් මුල්ලේරියාව ගැන වචනයක් දෙකක් කිව යුතුව තිබෙනවා. නිවාස යෝජනා ක්‍රමයක් සඳහා මුල්ලේරියාව සුළු නගර සභාවට රුපියල් 20,000 ක මුදලක් වෙන් කර දුන්නේ වී නමුත්, ඉඩම් නැතිකම නිසා මුල්ලේරියාවේ නිවාස යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන්නට බැරි වී තිබෙනවා. එහෙත් රෝහල් භූමියේ නම් ඉඩකඩ තිබෙනවා. ඒ නිසා එම නිවාස යෝජනා ක්‍රමය වෙනුවෙන් රෝහල් බිමෙන් අක්කර 5 ක් ඉල්ලා සිටියේ වී නමුත්, ඒ ඉඩම ලබා ගැනීමට තවමත් මුල්ලේරියාව සුළු නගර සභාවට බැරි වී තිබෙනවා.

විදුලි බලය ලබා ගැනීම සම්බන්ධයෙන් මුල්ලේරියාවේ සුළු නගර සභාව මහ ආණ්ඩුවෙන් රුපියල් 1,10,000 ක ණය මුදලක් ඉල්ලා තිබෙනවා. එහෙත් තවමත් ඒ ණය මුදල ලබා ගන්නට බැරි වී තිබෙනවා.

ඒ වාගේම, ලොකුම පුදුමය නම් අනෙකුත් ගම්කාර්ය සභා හා නගර සභාවලට ලැබෙන වාර්ෂික ආධාර මුදල පවා මුල්ලේරියාවේ සුළු නගර සභාවට නොලැබීමයි. එමනිසා මුල්ලේරියාව සුළු නගර සභාව සම්බන්ධයෙන් යම්කිසි අයුතු සහගත වැඩ පිළිවෙළක් අනුගමනය කරනවා නම් එය නතර කරන ලෙස මා ඉතා ආදරයෙන් පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටින බව සඳහන් කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

එම්. ඒ. ඩැනියෙල් මයා. (හේවාහැට)
*(திரு. எம். ஏ. டனியல்—ஹேவாஹெற்ற)*
(Mr. M. A. Daniel—Hewaheta)

සභාපතිතුමනි, දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමාට (ටී. බී. තෙන්නකෝන් මයා.) පසුව මේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. ඊයේ මේ වැය ශීර්ෂය ගැන සාකච්ඡා කරන අවස්ථාවේදී, පළාත් පාලනය ගැන මනා දැනුමක් ඇති ගරු ඉරව්වාචාර්යතුමා පළාත් පාලනය සම්බන්ධයෙන් කරුණු රාශියක් ඉදිරිපත් කළා. 1962 සිට 1966 දක්වා පළාත් පාලන ආයතනවල තිබුණු දූෂණකම් මැඩීමට පළාත් පාලන අමාත්‍යාංශයෙන් ක්‍රියා කළේ නැතැයි කියමින්, එතුමා පළාත් පාලන ඇමතිතුමාට දෝෂාරෝපණය කළා. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් සමග හවුල් වී ආණ්ඩු කළ කාලයේදී, එවකට සිටි ඇමතිතුමාට ඒ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කොට නීත්‍යානුකූලව කටයුතු නොකිරීම ගැන මා කණගාටු වෙනවා. නමුත් කියන්න කණගාටුයි,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩැනියෙල් මයා.]

ඔය ඉරට්ටෙට පත්තු වෙලා නැහැ ඒ කාල සීමාවේදී. දැන් පත්තු කරන්න බලාපොරොත්තු වෙන්නෙ ජාතික රජයේ ගරු ඇමතිතුමාටයි. කෙසේ හෝ වේවා, 1965 සිට මේ දක්වා මෙම අමාත්‍යාංශයෙන් පළාත් පාලන ආයතනවලට දී ඇති ආධාර මුදල් ගැන කල්පනා කර බලන විට, මෙ තෙක් කල් පළාත් පාලන ආයතනවලට වැඩිපුරම මුදල් ලබා දී තිබෙන්නේ මෙම ජාතික රජයෙන් බව ආඩම්බරයෙන් ප්‍රකාශ කරනවා.

මා, මෙම ගරු සභාවෙ අද කථා කරන්නෙ මහජන නියෝජිතයෙකු හැටියට පමණක් නොවෙයි, මැද රට ගම්කාර්ය සභා සභාපතිවරුන්ගේ සම්මේලනයේ සභාපති හැටියටත්, ගම්කාර්ය සභාවක සභාපතිවර යකු හැටියටත් බව සඳහන් කරන්න කැම තියි. ගරු උප ඇමතිතුමා උසස්ම පළාත් පාලන ආයතනය ලෙස ගණන් ගන්නා නගර සභා සීමාව තුළ ජීවත් වෙනත්, ගම් කාර්ය සභා සීමා තුළ ජීවත් වන අපට, ඒ දෙක අතරේ විශාල පරතරයක් ඇති බව පෙනී යනවා. නගර සභා, පළාත් ආණ්ඩු සභා, සුළු නගර සභා, ගම්කාර්ය සභා, ආදී පළාත් පාලන ආයතන වෙන් වෙන් වශයෙන් ගත් කල එම පළාත් පාලන ආයතන වෙනුවෙන් අනුගමනය කරන නීතිරීති, ව්‍යවස්ථා එක සමාන නොවන බව අප දන්නවා.

ගම්කාර්ය සභා වෙනුවෙන් බල පාන ව්‍යවස්ථා සකස් කිරීමේදී ගම්කාර්ය සභා පතිවරුන්ට පවරා ඇති බලතල ප්‍රමාණවත් නොවන බව හේතු සහිතව පෙන්නා දෙන්න කැමතියි. ගම්කාර්ය සභාවකට හෝ වේවා, සුළු නගර සභාවකට හෝ වේවා, පළාත් ආණ්ඩු සභාවකට හෝ වේවා, නගර සභාවකට හෝ වේවා, මහජන නියෝජිතයින් පත් වෙන්නේ මහජන මතය අනුව බව අප කවුරුත් දන්නා කාරණයක්. එහෙනම් ඒ අයටත් මහජන නියෝජිතයින් වශයෙන් සැහෙන වරප්‍රසාද ලැබිය යුතු බව මතක් කර දෙන්න ඕනෑ. උසස් පළාත් පාලන ආයතනවලට ඇති වරප්‍රසාද සියල්ලක්ම දෙන්න යයි මා කියන්නේ නැහැ, නමුත් මහජන නියෝජිතයින් වශයෙන් එක්තරා ප්‍රමාණයකවත් වරප්‍රසාද තිබිය යුතු බව ගරු ඇමතිතුමා පිළිගන්න ඕනෑ. ගම්කාර්ය සභාවක සභාපතිවරයකු වශයෙන් පුද්ගලයකු පත් වෙන්නෙ සහික යින්ගේ වැඩි කැමැත්ත ඇතුව බවත් තමුන්නාන්සේ දන්නවා ඇති. එසේ වුවත් ගම්කාර්ය සභාවක සභාපතිවරයකුට රාජකාරි කටයුතු පිණිස ලිපියක් යවන්න පුළුවන් වෙන්නෙ, පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ මුද්‍රාව කවරයේ තබා ගැනීමෙන් පමණයි. මෙහිදී කල්පනාවට ගත යුතු කාරණයක් තිබෙනවා. යම් අවස්ථාවලදී, කාර්යාල කාර්ය සභායක, සහකාර කොමසාරිස්වරයා ළඟට යවා කවරයේ මුද්‍රාව තබා ගෙන විත්, නැවතත් ඔහුටම එම කවරයේම ලිපි යවන බව පෙනී යනවා. එම නිසා උප ඇමතිතුමාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා, මොන ක්‍රමයකින් හෝ මෙම ගරු සභාවේ අනුමැතිය ලබාගෙන පළාත් පාලන ආයතනවල සිටින සභාපතිවරුන්ට, රාජකාරි කටයුතු සඳහා තම මුද්‍රාව තබා ලිපි යැවීමට වරප්‍රසාදය ලබා දෙන ලෙස. එවිට බොහෝ දුෂ්කරතා වන් මග හැරී යනවාට කිසිම අනුමාන යක් නැහැ.

ගම්කාර්ය සභාවලට අප්‍රමාණ හිරිහැර තිබෙනවා. මහජනයාට අවහිර වන අවස්ථාවලදී, මාර්ගයට අවහිර වන අවස්ථාවලදී ගස් කැපීමට සිදු වෙනවා. ගස් කැපීමට ගම්කාර්ය සභාවලට බලය ඇතත්, ගස් කපන්න ගිය අවස්ථාවලදී නොයෙකුත් කලබල ඇතිවීමෙන් පොලීසියට, උසාවියට, යන්න සිද්ධ වෙනවා. නමුත් නගර සභාවලට එවැනි තත්ත්වයක් නැහැ. නගර සභා සීමාවක නම්, නගරාධිපතිතුමාට ගස කපා දමන්න නියෝග කරන්න පුළුවනි. කිසිම අවහිරයක් ඇති වෙන්නේ නැහැ. නමුත් ඒ වරප්‍රසාදය ගම්කාර්ය සභාපතිවරුන්ට නැහැ. එම වරප්‍රසාද ගම්සභාපතිවරුන්ටත් ලබා දෙන ලෙස මා මතක් කර සිටිනවා. පාරවල්, ලිං, අම්බලම් සහ සුසාන භූමි යනාදී වශයෙන් නම් කළ හැකි බොහෝ දේ ගම්සභා මගින් පාලනය කරනත්, ඒවා පිළිබඳ කිසිදු පැවරීමක් ගම්සභාවලට ලැබී ඇත්තේ නැහැ. පළාත් පාලන අමාත්‍යාංශය මගින් ඒ සියල්ලක්ම ගම්සභා සතු කර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. එසේ කළ විට ගම්සභාපතිවරුන්ට පුළුවන්කම ලැබෙනවා, ඒ ඒ පළාත්වල වුවමනා එපාකම් පිළිබඳව සුදුසු පරිදි තීරණයකට බැස වැඩ කටයුතු සලස්වා ලීමට.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පසුගිය රජය මගින් කර තිබෙන එක්තරා හොඳ වැඩක් ගැන අප ප්‍රශංසා කළ යුතුයි. බණ්ඩාරනායක මැතිතුමාගේ කාලයේදී ගම්සභාපතිවරුන්ට නිල බලයෙන් සාමදාන විනිශ්චයකාර පදවි පිරිනැමුවා. අදත් ඒ උදවිය එම පදවි දරන බව සන්තෝෂයෙන් මතක් කර සිටිනවා. එහෙත් ඒ පිළිබඳව එක්තරා කරුණක් මෙහිලා සඳහන් කරන්නට මා කල්පනා කරනවා. එම පදවි සීමා කොට තිබෙන්නේ ඒ ඒ අයට අයත් ගම්සභා සීමාව තුළ පමණක් ක්‍රියාවේ යෙදවීමටයි. යම් කෙනෙක් සභාපතිත්වය දරණ කොට්ඨාශය තුළ පමණයි, එය ක්‍රියාවේ යෙදවිය හැකිව තිබෙන්නේ. එය වෙනස් කොට මුළු දිස්ත්‍රික්කය තුළම එම සාමදාන විනිශ්චයකාර ධුරයේ අයිතිය භුක්ති විඳීමට ඉඩ ලබා දෙන ලෙස මා මතක් කර සිටිනවා. මා මෙහිලා දිස්ත්‍රික්කය යැයි සඳහන් කළේ අධිකරණ දිස්ත්‍රික්කයයි.

කර්මාන්ත යනාදිය සම්බන්ධයෙන් එහෙම වැඩ කරගෙන යන්නට පසුගිය අවුරුදුවලදී යම් ආධාරයක් ලැබුණා නම් එම ආධාර සියල්ලක්ම ගම්සභාව සතු වුණා. මෑතක සිට ඒ ක්‍රමය වෙනස් කර තිබෙනවා. දැන් යම් ආධාරයක් තැන්පත් වෙනවා නම් තැන්පත් වන්නේ ටෙන්ඩර් මුදලට සීමා වූ එකක් පමණයි. යම්කිසි ආධාරයක් ලැබෙනවා නම් ඒ ආධාරය සම්පූර්ණයෙන්ම ගම්සභාව සතු කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

සුසාන භූමි සම්බන්ධයෙන් සිතා බලන විට මගේ කොට්ඨාශය පිළිබඳවත් වචනයක් දෙකක් කිව යුතුයි. 1964 අවුරුද්දේ සුසාන භූමි දෙකක් ලබා ගැනීම සඳහා රුපියල් 2,500 ක් තැන්පත් කළා, මහනුවර දිසාපති කාර්යාලයේ. මෙතෙක් ඒ පිළිබඳව ලියුම් හුවමාරු වෙනවා පමණයි. මේ දක්වාම බැරි වී තිබෙනවා, ඒ සුසාන භූමි දෙක ගම්සභාවට පවරා ගැනීමට. දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයේ ප්‍රමාදයක් නිසා වන්නට පුළුවනි, මෙසේ සිදු වන්නේ. එසේ හෙයින් විශේෂ වැඩ පිළිවෙළක් අනුගමනය කොට මෙසේ ඉල්ලා සිටිනු ලබන අත්‍යවශ්‍ය සුසාන භූමි ලබා දීමට ක්‍රියා කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

මවිසින් වරින් වර ඉදිරිපත් කරනු ලැබූ යෝජනා අතර මුදුනේකඩේ ජල යෝජනා ක්‍රමයද එකක් වෙනවා. ඒ ගැන මෙම අවස්ථාවේ දී වචනයක් කිව යුතුයි. 1954 අවුරුද්දේයි, මෙය ආරම්භ කළේ. 1966 අවුරුද්දේ පළාත් පාලන අමාත්‍යාංශය මගින් නොයෙකුත් නිලධාරි මහත්වරුන් සහ ඉංජිනේරුවන් එහෙම යවා ඒ ගැන සොයා බලා ඇවිත් තිබෙනවා. ඒ ප්‍රදේශවල ජීවත් වන දුප්පත් ජනතාව ඉඩෝර කාලවලදී සැතපුම් ගණන් දුර යනවා, ජලය ලබා ගැනීම පිණිස. ඒ දුෂ්කරතාව මගහරවා ගන්නට තවම වැඩ පිළිවෙළක් යෙදී නැති හෙයින් මා විශෙෂයෙන් ඉල්ලා සිටිනවා, මේ යෝජනා ක්‍රමය පිළිබඳ වැඩ කටයුතු ඉක්මන් කරන ලෙස. ගරු ඇමතිතුමාට මේ ගැන දැනුම් දීමේ ප්‍රතිඵලයක් වශයෙන් මේ ගැන බලන්නට නිලධාරීන්ට නියෝග කර තිබෙනවා. ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට මෙම අවස්ථාවේදී මා මතක් කර සිටිනවා, මෙම කටයුත්තට ප්‍රමුඛස්ථානය දී ජලය හිගකමින් පීඩා විඳින එම ප්‍රදේශයේ ජනතාවට ඉක්මනින් ජලය ලබා ගැනීමට හැකි වන පරිදි කටයුතු යොදන ලෙස.

පූ. භා. 11.15

ගරු සභාපතිතුමනි, පළාත් පාලන ආයතන මගින් පාලනය කරන විදුලිය සැපයීමේදී මධ්‍යම දිශාවේ සහකාර කොමසාරිස්තුමාට මුහුණ පාන්ට සිදු වී තිබෙන ප්‍රශ්න දෙක-තුනක් ගැන පැහැදිලි කළ යුතුව තිබෙනව. යම් වැඩ කටයුත්තක් පරීක්ෂා කර බලන්ට යෑම අවශ්‍ය වුණාම ඒ සඳහා පාවිච්චි කරන්ට වාහනයක් නැති නිසා පුළුවන් තරම් ඉක්මනින් වාහනයක් ලබා දෙන්න කියන කාරණය පළාත් පාලන කාර්යාලයේ නිලධාරීන් අපට මතක් කරනව. ඒ වගේම ගම්බද වැඩ පරිපාලක නිලධාරීන් මදි නිසා වැඩිපුර නිලධාරීන් ලබා දෙනවා නම් තමුන්නාන්සේලාගේ වැඩ කටයුතු ඉක්මන් කර දෙන්ට පුළුවන් යයි ඒ නිලධාරීන් කියනව. ඒ වගේම දැනට සිටින ඉන්ජිනේරු මහතුන් මදි නිසා ඉන්ජිනේරු මහතුන්ගේ ප්‍රමාණය වැඩි කර දෙන්නේ නම් අපේ වැඩ කටයුතු ඉක්මනින් කර දෙන්ට පුළුවන් බවත් කියනව. එම නිසා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩැනියෙල් මයා.]

මේ කරුණු ගැන සලකා බලා මැදරට ගම් කාර්ය සභාපතිවරුන් වෙනුවෙන් මා ඉදිරිපත් කළ මේ ඉල්ලීම් ගැන මේ අමාත්‍යාංශය විශේෂ අවධානය යොමු කරනවා ඇතැයි බලාපොරොත්තු වෙමින්, මේ අවස්ථාව ලබා දීම ගැන සභාපතිතුමාට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනව.

**බර්නාඩ් සොයිසා මයා. (දකුණු කොළඹ)**
*(திரு. பெர்னட் சொய்ஸா—கொழும்புத் தெற்கு)*
(Mr. Bernard Soysa—Colombo South)

Mr. Chairman, the first and most important matter I want to raise with the hon. Parliamentary Secretary, representing here the Minister for Local Government, is the question of rent restriction. I believe the hon. Third Member for Colombo Central (Mr. Keuneman) also wishes to raise the same matter with him. I want to ask the question : what is planned in regard to the rent restriction amending legislation which he has announced ?

After the last amending Act was passed by Parliament various representations were made to the Hon. Minister against the benefits conferred upon poor tenants by that Act. In response to those representations the Hon. Minister appointed a committee. It was solely responsible to the Minister and in that sense it was a ministerial committee. This committee was to report to the Minister regarding desirable changes in the law.

I do not know whether we have a right to demand that we be shown that document, but since it affects a public question such as rent restriction we have to ask the hon. Parliamentary Secretary whether he would table that report for us to have a look at it and to know what exactly has been recommended by this committee of advisers.

As far as we are aware it would appear that the committee has concerned itself not with the question of helping the tenants in any way, but with a self-imposed task of suggesting what might be expedient from the point of view of a Minister who is bent upon withdrawing from tenants benefits already conferred, and how it might be done with expediency. That appears to have been the framework within which this committee has functioned.

Now, I cannot discuss a report which I have not seen. I am only stating what I have seen in the press and what I have heard from various parties who were connected with this committee. What I have heard gives plenty of cause for alarm. What is, in fact, being sought to be advised is a withdrawal of benefits already conferred and benefits already enjoyed by the tenants. That is a matter on which we would like a categorical statement from the hon. Parliamentary Secretary. We should like him to table that report if it is possible and also let us know to what extent he is bound by those recommendations or whether he intends to implement them.

The main question is that rent restriction is being defeated through the process of assessment. The rent restriction law places certain limitations in regard to what we may call " restricted premises " at certain figures of annual value in regard to different areas : municipalities Rs. 2,000 a year —that is for residential premises ; commercial premises Rs. 6,000 a year. The values for urban council areas are somewhat lower. These figures were fixed at the time this law was first enacted, or first amended in a serious way somewhere in 1948. It is now 20 years after the late Mr. S. W. R. D. Bandaranaike brought that Rent Restriction Bill before Parliament. In these 20 years land values have changed, and assessments have changed considerably. It is possible to demonstrate that over a period of 15 years within the Colombo municial limits alone annual values have gone up so much that the totality of the rates collected from Colombo now equals the total amount of annual values of 1947. In Colombo

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

there is a consolidated rate of 30 per cent. The total sum of the rates collected today on the 30 per cent levy equals the total sum of annual values of 1947.

You can imagine the extent to which these assessments have gone up. I have often raised this matter both in the Colombo Municipal Council and here with the Hon. Minister and his predecessors in that Office under the previous Government. I have urged that while this taxation based upon annual values is an easy method of revenue collection, easy to operate on the part of a local authority, there is no justification for continuing this system of collecting rates and that other avenues of finance, other sources of revenue must be found for the local authorities. This has got nothing to do with the battle between socialism and capitalism, because so capitalist a country as South Africa has, in its principal City of Johannesburg, given various forms of revenue to its local authority which have relieved that local authority of the necessity of relying upon rates as a principal source of revenue. They have given the right to run beauty parlours, barber saloons, cinemas, theatres——

වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාතන් (නල්ලූර්)
*(டொக்டர் ஈ. எம். வி. நாகநாதன்—நல்லூர்)*
(Dr. E. M. V. Naganathan—Nallur)

Pawn shops.

බර්නාඩ් සොයිසා මයා.
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

——pawn shops and all kinds of utilities from which the local authority get revenue.

පී. ජී. බී. කෙනමන් මයා. (මැද කොළඹ තුන්වන මන්ත්‍රී)
*(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றாம் அங்கத்தவர்)*
(Mr. P. G. B. Keuneman—Third Colombo Central)

Here they can run rest-houses.

බර්නාඩ් සොයිසා මයා.
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

The real revenue sources in the rest-houses are apparently exploited by somebody else, but not the local authorities.

Johannesburg has also obtained revenue from development projects. They buy up land, carry through a development scheme and alienate that land again, and on the difference they make an income. I am not justifying that procedure but I want to point out that it has various sources of revenue other than rates. This was pointed out by the V. C. Jayasuriya Commission that looked into local government taxation somewhere in the 1940s.

I want to raise another question with the hon. Parliamentary Secretary. This matter has been thrown into his lap in a very violent sort of way. I hope he has not suffered any hurt as a result of this. The decision given by a court of law stating that the increase in assessments in regard to certain premises in Colombo is illegal and not justified in law, has placed the Colombo Municipal Council in the peculiar position of losing about Rs. 20 million a year in revenue. In that matter, while being a member of that Council, my sympathies are entirely with the ratepayers not because I think that this particular loss of Rs. 20 million is something that the Council can afford, but because this situation has come about on account of our own inability to face up to the necessity of changing the rating laws. We have a Rating Act which remained inoperative from the day it was enacted in 1948 by a previous U. N. P. Government. It is an inoperative Act because it cannot be operated. I have informed the Parliamentary Secretary before this that during the Coalition days there was a draft Bill prepared. The previous Minister of Local Government, the Hon. A. P. Jayasuriya—before the Coalition—had asked the Valuation Department for its views in regard to the question of rates and they had

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

දුම්රිය දෙපාර්තමේන්තුව මගින් පැත්තකට දමා තිබෙන රේල් පීලි පළාත් පාලන ආයතනවලට ලබාගන්නට පුළුවන් නම් ඒවා පාලම් බෝක්කු ආදී ග්‍රාමීය කර්මාන්ත සඳහා පාවිච්චි කරන්නට පුළුවන්ය කියන අදහස ගරු හක්මන මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා. ඒ කරුණ සම්බන්ධව ගමනාගමන ඇමතිතුමා සමග සාකච්ඡා කොට පුළුවන්කමක් තිබෙනවා නම් ඒවා ලබාගෙන පළාත් පාලන ආයතනවලට දීමට බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම මේ ගැන කථා කරන විට අපේ අවධානය යොමු විය යුතු වැදගත් අංශයක් ගැන සඳහන් කරන්නට කැමතියි. පළාත් පාලන අමාත්‍යාංශයට මධ්‍යම ගබඩාවක් අවශ්‍යයි. විදුලි බල, ජලසම්පාදන ආදී ග්‍රාමීය කටයුතු සඳහා අද කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් නොකරන තත්ත්වයක් ඇති වී තිබෙනවා. එයට හේතුව අවශ්‍ය බඩු ලබා ගැනීමට ඔවුන්ට ඇති අපහසුවයි. ඒ නිසා පළාත් පාලන අමාත්‍යාංශය මගින් මධ්‍යම ගබඩාවක් ඇති කිරීමට උත්සාහයක් තිබෙන බව මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. එමෙන්ම එවැනි ගබඩාවක් ඇති කරන අතරම එහි ප්‍රාදේශීය ගබඩා ඇති කිරීමත් සුදුසු බව කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. අප ප්‍රථමයෙන්ම මුල් පියවරක් වශයෙන් මධ්‍යම ගබඩාවක් ඇති කළාට පසුව එය පුළුල් කරන්නට පුළුවන් වුණොත් එසේ කරන්නට බලාපොරොත්තු වන බව මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමතියි.

හේමචන්ද්‍ර සිරිසේන මයා. (අකුරණ පළමුවන මන්ත්‍රී)
*(திரு. ஹேமச்சந்திர சிறிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)*
(Mr. Hemachandra Sirisena—First Akurana)

ගරු සභාපතිතුමනි, ඒ ගබඩාවලට ප්‍රථමයෙන්ම මී කතුරු තබන්නට වේවි. ඒ ගබඩාවලට මීයො යාවි.

ප්‍රේමදාස මයා.
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ඒක ඇත්ත. අපේ බඩුමුට්ටු හුඟක් බේරා ගන්නට සිදු වී තිබෙන්නේ මීයන්ගෙන් නමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
කකුල් දෙකේ මීයොද ?

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

පසුගිය වර්ෂ දෙක හමාර තුළ පළාත් පාලන අමාත්‍යාංශය පියවරවල් කිපයක්ම අරගෙන තිබෙන බව මේ ගරු සභාවේ සැලකිල්ලට යොමු කරන්න කැමතියි. ඉන් එකක් ගැන ගරු මන්ත්‍රීවරුන් විසින් ස්තුති පූර්වකව මෙහි දී සඳහන් කරන්නට යෙදුණා. ප්‍රාදේශීය කාර්යාල නොතිබුණු හැම තැනකම පාහේ ඒවා ආරම්භ කිරීමට විධිවිධාන යොදා තිබෙනවා. කළුතර හම්බන්තොට, මන්නාරම, කෑගල්ල, හලාවත, මොනරාගල සහ කල්මුනේ ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා තිබෙනවා. පොළොන්නරුවේත් කාර්යාලයක් පිහිටුවීමට ක්‍රියා කරගෙන යනවා. ඒ කාර්යාලවලට නිලධාරීන්ගේ අඩුපාඩුකම් තිබෙනවා. තවම හම්බන්තොට කාර්යාලයේ වැඩ කරන්නෙත් මාතර සහකාර කොමසාරිස්තුමායි. මොණරාගල කාර්යාලයේ වැඩ කරන්නෙත් බදුල්ලේ සහකාර කොමසාරිස්තුමායි. ඒ නිසා සහකාර කොමසාරිස්වරුන් කීප දෙනකුම පත් කළ යුතුව තිබෙනවා. සමහර අය පත් කර පුහුණු කිරීමේ පන්තිවලට යවනවා. පුහුණුවෙන් පසුව ඒ අය වැඩ බාර ගන්නවා ඇති. එමෙන්ම අනිකුත් පුරප්පාඩුත් සම්පූර්ණ කිරීමට අප බලාපොරොත්තු වෙනවා. එමෙන්ම එම කාර්යාල හැම එකකටම වාහනය බැගින් දෙන්නට කටයුතු පිළියෙළ කර අවශ්‍ය නිවේදන යවා තිබෙන බව මතක් කරන්න කැමතියි. වැඩි කලක් යන්නට කලින් ඒ රථ වාහන අමාත්‍යාංශයට ලැබෙනවා ඇති. එයත් වැදගත් පියවරක්. මෙය කාලයක් තිස්සේ ගරු මන්ත්‍රීවරුන් හා පළාත් පාලන ආයතන මගින් ලොකු උද්ඝෝෂණයක් ගෙන ගිය වැඩ පිළිවෙළක්.

අපේ විශේෂ අවධානය යොමු වූ ඊළඟ ප්‍රශ්නය පළාත් පාලන ආයතනවලට ආධාර මුදල් දීමයි. පසුගිය වාරයේදීත් මා මේ අදහස ඉදිරිපත් කළා. සියලුම පළාත් පාලන ආයතනවලට ආධාර මුදල් දෙන්නේ එකම ක්‍රමයකට බව සඳහන් කරන්නට කැමතියි. වැඩියෙන් ආදායම් ලැබෙන ආයතනවලටත්, අඩුවෙන් ආදායම් ලැබෙන ආයතනවලටත් දෙන ආධාරය එකයි. මේ ප්‍රතිපත්තියේ වෙනසක් කරන්නට අදහස් කළ නමුත් ඒ ගැන තව දුරටත් කල්පනා කර බැලීමේදී, නොයෙක් විධියේ දේශපාලන චෝදනාවන් අප වෙත එල්ල කරන්නට ඉඩ ඇතැයි පෙනී ගිය නිසා—එක් ආයතනයකට වැඩියෙන් දුන්නාය, තවත් ආයතනයකට ඊට අඩුවෙන් දුන්නාය යනාදි වශයෙන් කොට්ඨාශ අනුව දීම ගැන චෝදනා නගන්නට ඉඩ තිබෙන බව පෙනී ගිය නිසා—ඒ අදහස ක්‍රියාත්මක කළේ නැහැ.

මේ කාරණය නිරාකරණය කර ගැනීම සඳහා මා ගරු ඇමතිතුමාට එක්තරා යෝජනාවක් ඉදිරිපත් කළා. පළාත් පාලන ආයතනවලට ආධාර මුදල් දීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය සම්බන්ධයෙන් යම්කිසි ප්‍රතිපත්ති මාලාවක් සකස් කර ගැනීම සඳහා දෙපක්ෂයේම ගරු මන්ත්‍රීවරුන්ගෙන් යුත් විශේෂ කාරක සභාවක්—Select Committee—පත් කර මේ ගැන සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කිරීමට ඉඩ දුන්නොත් එවිට ඒ වාර්තාව අනුව අවශ්‍ය පරිදි අඩුවෙන් හෝ වැඩියෙන් ආධාර මුදල් බෙදා දීමට වැඩ පිළිවෙළක් යෙදීම සුදුසුයයි මා ප්‍රකාශ කළා. ගරු ඇමතිතුමා එය හොඳ අදහසකැයි පිළිගත්තා. මා ඉදිරිපත් කළ ඒ අදහස පිළිගත් ගරු ඇමතිතුමා එය ආණ්ඩුවට නිර්දේශ කරන්නට කැමති වුණා. ඒ අනුව, එවැනි කාරක සභාවක් පත් කර—මේ ගැන උනන්දුවක් දක්වන දෙපක්ෂයේම ගරු මන්ත්‍රීවරුන්ගෙන් සැදුම් ලත් කාරක සභාවක් පත් කර—අදහස් විමසා වැඩ පිළිවෙළක් ඇති කර ගන්නට පුළුවන් වෙතැයි මා කල්පනා කරනවා.

තවත් වැදගත් පියවරවල් කිහිපයක්ම ගත වූ කාලය ඇතුළත ගත්තා. හැම ගම් කාර්ය සභාවකටම කාර්යාලයක් තිබිය යුතු බව නොපිළිගන්න කෙනෙක් නැහැ. දැනට කාර්යාලයක් නැතිව වැඩ කරගෙන යන හැම ගම්කාර්ය සභාවකටම එක් කාර්යාලයක් බැගින් ලබා දීමට ආණ්ඩුව තීරණය කළා. අපට ලැබුණු ඉතාම බර පතළ චෝදනාව—පැමිණිල්ල—සමහර ගම් කාර්ය සභාවල කාර්යාලය වශයෙන් නියම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

ස්ථානයක් නැතිකම ගැනයි. සමහර ගම්කාර්ය සභාවල කාර්යාලය වශයෙන් පෞද්ගලික නිවාස පාවිච්චි කරන බව අපට දැනගන්නට ලැබුණා. ඇතැම්විට ගම්කාර්ය සභාවේ සභාපතිතුමාගේ නිවසේ කොටසක් කාර්යාලය වශයෙන් යොදා ගත් අතර තවත් සමහර තැන්වල කාර්යාලය වශයෙන් වෙනත් කෙනකුගේ නිවාසයක කොටසක් පාවිච්චි කරනවා. මෙය ඉතාමත් අසතුටුදායක තත්ත්වයක් බව අපට පිළිගන්නට සිදු වෙනවා. ඒ ක්‍රමය වෙනස් කළ යුතු බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. ආධාර මුදල් දීමේදී විශේෂ සැලකිල්ලක් දක්වන්නට සිදු වුණේ හැම ගම්කාර්ය සභාවකටම තමන්ගේ සභා කාර්යාලයක් ඇති කර ගැනීමට ආධාර මුදල් දීම සඳහා බව ප්‍රකාශ කරන්නට පුළුවනි.

පළාත් පාලන ඉතිහාසයේ ප්‍රථමවරට මේ ආණ්ඩුව බලයට පත් වීමෙන් පසු, ආධාර මුදල් ප්‍රමාණය රුපියල් අසූ ලක්ෂය දක්වා වැඩි කර තිබෙනවා. ඊට කලින් ආධාර මුදල් වශයෙන් දුන් වැඩිම මුදල පණස් ලක්ෂයයි. එය අසූ ලක්ෂය දක්වා වැඩි කර තිබෙන බව තමුන්නාන්සේට මතක් කරන්නට කැමතියි.

අප විසින් ගන්නා ලද ඊළඟ වැදගත් පියවර ජල සම්පාදන යෝජනා ක්‍රම සම්බන්ධයෙනුයි. ලංකාවේ නොයෙක් ප්‍රදේශවල ප්‍රධාන ජල සම්පාදන යෝජනා ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කරන ලද බව තමුන්නාන්සේ දන්නවා. දකුණු කොළඹ ජලසම්පාදන යෝජනා ක්‍රමය ගැන බලමු. එහි දෙවැනි පියවර සඳහා 1965-66 ඇස්තමේන්තුවෙන් රුපියල් 18,64,585ක් වෙන් කළා. මහනුවරට 1965-66 ඇස්තමේන්තු වෙන් රුපියල් 14,27,184 ක් වෙන් කළා. කෑගල්ලේ ජලසම්පාදන යෝජනා ක්‍රමයට රුපියල් 11,29,598 කුත්, මන්නාරම ජල සම්පාදන යෝජනා ක්‍රමයට රුපියල් 2,88,671 කුත් වෙන් කළා. මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ මේ ප්‍රධාන ජල සම්පාදන යෝජනා ක්‍රමවල වැඩ කට යුතු අවසන් කරන්නට ක්‍රියා කර තිබෙනවා. 1966-67 වර්ෂයේදී කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන නගරවල ජලසම්පාදන යෝජනා ක්‍රම සඳහා 1967 ජූනි මාසය අවසන් වන තුරු කළ දේ බලනුවෙන් රුපියල් 2,67,000 ක් වැය කර තිබෙනවා. කඩුගන්නාව ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා රුපියල් 3,16,743 ක් වෙන් කර තිබෙනවා. මා මේවා කියවන්නේ විශේෂයෙන්ම යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) උතුරටත් නැගෙනහිරටත් පමණක් බරව මුදල් වැය කරන බවක් කියා සිටි නිසා ඒ වැරදි වැට හීම නැති කිරීම සඳහායි.

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*
(Mr. Hemachandra Sirisena)

කොයි තරම් මුදල් වෙන් කළත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීන් විසින් නියෝජනය කරනු ලබන තැන්වල මුදල් කපා හරිනවා. [බාධා කිරීම්]

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

කරුණාකර ගරු පාර්ලිමේන්තු ලේකම් තුමාට කථාව කරගෙන යාමට ඉඩ දී නිශ්ශබ්ද වන්න. ගරු මන්ත්‍රීතුමන්ලාට තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්නට ඉඩ ලැබුණා.

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*
(Mr. Hemachandra Sirisena)

කාරක සභා අවස්ථාවේදී කථා කරන්නට ඉඩක් නැත්නම් වෙන කවදා කියන්නට ද ?

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

කඩුගන්නාවට වෙන් කරන ලද මුදල රුපියල් 3,16,743 ක් බව මා කිව්වා. කුලියාපිටියට රුපියල් 5,22,500 යි. මේ යෝජනා ක්‍රමය අවසානයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු මන්ත්‍රීන් විසින් නියෝජනය කරනු ලබන ප්‍රදේශවලට කියා විශේෂයක් කරන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් පසුගිය අයවැය විවාදයේදී මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මයා.) සැක හිතුවා. එහෙත් මා එදා එවැන්නක් ඇති නොකරන ලෙස කිව්වා. මැදවච්චියට රු. 2,15,100 යි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කුරුණෑගලට රු. 3,87,000 යි. අනුරාධපුරය—අනුරාධපුරය නියෝජනය කරන්නේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් ද ?—එහි දෙවැනි පියවර අවසන් කළා. අනුරාධපුරයේ ජල යෝජනා ක්‍රමය සඳහා රුපියල් 4,81,867 ක් වෙන් කර තිබෙනවා. කැළණියේ සුද්ධ නගරයට රු. 40,000 යි. කෑගල්ලට රු. 4,54,660 යි.

**ටී. බී. ඉලංගරත්න මයා.** (කොලොන්නාව)
*(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலன்னுவ)*
(Mr. T. B. Ilangaratne—Kolonnawa)
1963 දී මා මුදල් ඇමති වශයෙන් 75 ලක්ෂයක් වෙන් කළා දෙවැනි පියවර සඳහා. දැන් ඒවා වෙනත් තැන්වලට ගෙන ගොස් තිබෙනවා.

අ. භා. 2.30

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
ඉහත කී ප්‍රධාන ජල යෝජනා ක්‍රම හැරුණු විට ඊළඟට විශේෂ සැලකිල්ලක් දක්වන්නේ ග්‍රාමීය ජල යෝජනා ක්‍රම ගැනයි. මේ සම්බන්ධයෙන් ගරු යටියන්තොට මන්ත්‍රීතුමාට (ආචාර්ය එන්. එම්. පෙරේරා මයා.) කවුදෝ දී තිබෙන තොරතුරු ටිකක් වැරදියි. ඒ වැරදි හරිගස්සන්නටයි මා බලාපොරොත්තු වන්නේ. ග්‍රාමීය ජල යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සම්බන්ධව මා පෞද්ගලිකව ක්‍රියා කළ නිසා නිවැරදි තොරතුරු මා දන්නවා. මේ කටයුතු සම්බන්ධයෙන් අපට කිසිම චෝදනාවක් එල්ල වන්නට මා ඉඩ තැබුවේ නැහැ. රටේ නියම සංවර්ධනයක් ඇතිවීමට නම් ජල සම්පාදනයටත් විදුලි බල සම්පාදනයටත් ප්‍රමුඛස්ථානයක් දීම අවශ්‍ය බව අප පිළිගන්නා නිසා මගේ විශේෂ නිර්දේශයත් වුවමනාවත් උඩ මේ ග්‍රාමීය ජල යෝජනා ක්‍රමවලට මුල් තැනක් දී කටයුතු කිරීම දැන් ආරම්භ කර තිබෙනවා. තුරිනීලවානී, නයිපඩිමුනෝ යන ස්ථාන දෙකේ ජල යෝජනා ක්‍රම 1966/67 අවුරුද්දේ පටන් ගත් ඒවායයි යටියන්තොට ගරු මන්ත්‍රීතුමා කී කථාව ඇත්ත. ඒවාගේම, අපේ රජය බලයට පත් වුණාට පසු 1965/66 අවුරුද්දේ නිකවැරටියේ ජල යෝජනා ක්‍රමයක් ආරම්භ කළා. මොණරාගලත් දඹුල්ලෙත් ජල යෝජනා ක්‍රමවල වැඩ සම්පූර්ණ කළා. දැන් අකුරණ පළමුවැනි ගරු මන්ත්‍රීතුමා (හේමචන්ද්‍ර සිරිසේන මයා.) මේ ගැන මොකද කියන්නේ ?

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிறிசேன)*
(Mr. Hemachandra Sirisena)
අකුරණ කොට්ඨාශයේ මන්ත්‍රීවරුන් දෙදෙනාට අතරෙන් තවත් අමතර මන්ත්‍රීවරුන් සිටිනවා. විශෙෂයෙන්ම පරාජිත අපේක්ෂකයාගේ කීම අනුවයි වැඩ කෙරෙන්නේ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
ඔය කියන පරාජිත අපේක්ෂකයා කවදාවත් මා හමු වෙන්න ඇවිත් නැහැ.

මොණරාගලත් දඹුල්ලෙත් ජල යෝජනා ක්‍රම අවසාන කළා. දඹුල්ලේ ජල යෝජනා ක්‍රමයේ කිසියම් අඩුපාඩුවක් තිබෙන බවට පැමිණිල්ලක් මට ලැබුණා. ඒ ගැන සොයා බලන ලෙස මා නියෝග කරනවා.

අප මේ අවුරුද්දේ පමණක් ජල යෝජනා ක්‍රම 12 ක් ආරම්භ කරන්නට කටයුතු කිරීම පළාත් පාලන ඉතිහාසයේ ප්‍රථමවරට ඇති වන සිහිකටයුතු සිද්ධියක් වශයෙන් සඳහන් කරන්නට පුළුවනි. ජල යෝජනා ක්‍රම පටන් ගත් ස්ථාන 2 ක් මා කලින් සඳහන් කළා. ඉතිරි 10 මේවායි : කල්පිටිය, කරවාඩි, කාක්කපල්ලිය, මාහෝ, හෙට්ටිපොල, මරදන්කඩවල, ගොඩකවෙල, ගලගෙදර, උඩුනුවර හා යටිනුවර.

**ගරු ඊ. එල්. බී. හුරුල්ලේ (ප්‍රවාහණ ඇමති)**
*(கௌரவ ஈ. எல். பி. ஹுருல்ல—போக்குவரத்து அமைச்சர்)*
(The Hon. E. L. B. Hurulle—Minister of Communications)
අපට නෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

ප්‍රවාහණ ඇමතිතුමාට නැතිලු. අප මේ කටයුතු ආරම්භ කළේ එක් එක් මන්ත්‍රීවරයාගේ දේශපාලන පක්ෂ දෙස බලා ගෙන නොවෙයි. ආරම්භ කිරීමට වැඩ කටයුතු සකස් කර තිබුණු යෝජනා ක්‍රම සියල්ලක්ම පටන් ගැනීමට නියෝග කළා. එසේ නොකළා නම් ඒ මුදල් ආපසු භාණ්ඩාගාරයට යනවා. ඒ නිසා ඉහත කී ලැයිස්තුවෙහි සඳහන් යෝජනා ක්‍රම සියල්ලම සැප්තැම්බර් 30 වැනිදාට පෙර ආරම්භ කරන්නට නියෝග කළා. මෙය ඉතා සාධාරණවූත් වැදගත් වූත් වැඩ පිළිවෙළක් බව ගරු මන්ත්‍රීවරුන් පිළිගන්නවා ඇති. ලබන අවුරුද්දෙත් මෙවැනි තත්ත්වයක් ඇති කරන්නට අප බලා පොරොත්තු වෙනවා.

ඊළඟට පාළම් සම්බන්ධව කරුණු කීපයක් සඳහන් කළ යුතුව තිබෙනවා. රටක සංවර්ධනයට ජලය විදුලි බලය පාරවල් හා පාළම් ඉතාමත් අවශ්‍ය බව අප කවුරුනුත් දන්නවා. ජල සම්පාදන යෝජනා ක්‍රම රාශියක් ආරම්භ කරන්නට යන බව පත්තරවල පළ වී තිබුණත් ඒ සම්බන්ධ කටයුතුවලදී දකුණු පළාත් අමතක කර තිබෙනවායයි හක්මන ගරු මන්ත්‍රීතුමා (හෙට්ටිගේ මයා.) කිව්වා. ලබන අවුරුද්දේ ආරම්භ කරන්නට යන යෝජනා ක්‍රමවලින් එකක් වීරකැටියේ බව එතුමාට මා මතක් කරනවා. එය එතුමාගේ කොට්ඨාශය නොවෙයි. වීරකැටිය අයත් වන්නේ මුල්කිරිගල මන්ත්‍රීතුමාගේ (ජෝර්ජ් රාජපක්ෂ මයා.) කොට්ඨාශයටයි. අපේ රජය බලයට පත් වුණාට පසු ප්‍රධාන පාළම් කීපයක වැඩ කටයුතු දැන් නොනවත්වා කරගෙන යනවා.

හම්බන්තොට, වීරකැටිය ගම් සභා ප්‍රදේශයේ, මහඔය පාළම; මාතලේ, උඩුසියපත්තුව ගම් සභා ප්‍රදේශයේ, උඩුගොඩ, පල්ලෙපොල පාළම; රත්නපුරේ, නවදුන් කෝරළේ, දෙනවක පාළම යන පාළම් තුනේ වැඩ කටයුතු 1966-67 වර්ෂයේ දිගටම කරගෙන ගියා. ඒ හැරෙන්නට පොළොන්නරුවේ, සිංහල පත්තු ගම් සභා ප්‍රදේශයේ, මින්නේරි ඔය පාළම; බදුල්ලේ, ලොග්ගල් ඔය, මීගහකිවුල පාළම යන පාළම්වල කටයුතුත් ආරම්භ කර තිබෙනවා. මාතර, තිහගොඩ ගම් සභා ප්‍රදේශයේ වැල්ලේතොට පාළම ඉදි කිරීම සඳහා දැනට ටෙන්ඩර් පත්‍ර කැඳවා තිබෙනවා. ඒ බව අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) දන්නවා ඇති. එහෙත් එතැන තිබෙන අමාරුව නම් කවුරුන්වත් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් නොකිරීමයි. මා ඒ ප්‍රදේශයට ගිය අවස්ථාවේ ඒ පාළම ඉදි කෙරෙන ප්‍රදේශය බැලුවා. ඇත්ත වශයෙන්ම එය ඉතා අවශ්‍ය පාළමක්. ඒ පාළම නිසා විශාල ප්‍රදේශයක් විවෘත වෙනවා. ඒ සඳහා රුපියල් 3,00,000 ක විතර මුදලක් වෙන් කර තිබෙනවා. එහෙත් ඒ පාළම සෑදීම සඳහා කොන්ත්‍රාත්කරුවන් ලබා ගැනීමයි, දැනට තිබෙන අමාරුව.

දැනට මූලික කටයුතු සියල්ලම අවසාන කර ටෙන්ඩර් පත්‍ර කැඳවන්නට ලැස්ති කර තිබෙනවා පහත සඳහන් පාළම් සම්බන්ධයෙන් : විපක්ෂ නායිකාවගේ කොට්ඨාශයේ, බෙම්මුල්ල ගම් සභා ප්‍රදේශයේ, අත්තනගලු ඔය පාළම ; රත්නපුරේ, මාරපොන ගම් සභා ප්‍රදේශයට අයත් මාරපොන පාළම ; කෑගලු දිස්ත්‍රික්කයේ ගුරුගොඩ ඔය පාළම.

ඒ හැරෙන්නට දැනටමත් සැලැස්ම සහ ඇස්තමේන්තු සකස් කර තිබෙනවා, පහත සඳහන් පාළම් සම්බන්ධයෙන් : හෝමාගම කොට්ඨාශයේ, උඩගහපත්තු ගම් සභා ප්‍රදේශයේ, දියගම ඇළ පාළම ; අනුරාධපුර, මහපොතාන ගම් සභා ප්‍රදේශයේ, යාන් ඔය පාළම. අම්පාරේ, අක්කරෙයිපත්තු ගම් සභා ප්‍රදේශයේ, කෝනවත්ත පාළම තැනීම සම්බන්ධයෙන් දැනට සැලැසුම් සකස් කරගෙන යනවා. කලුතර දිස්ත්‍රික්කයේ, මුන්වත්තබාංගෙපත්තු ගම් සභා ප්‍රදේශයේ, කපු ඇළ හරහා පාළමක් බැඳීම සඳහා දැනට පරීක්ෂණ පවත්වා ගෙන යනවා.

මේ අනුව බලන විට තමුන්නාන්සේට පෙනී යනවා ඇති, පසුගිය වර්ෂ 2 1/2 තුළ රටේ සංවර්ධනයට අවශ්‍ය වැඩ පිළිවෙළවල් කීපයක් සඳහාම පළාත් පාලන අමාත්‍යාංශය මගින් අවශ්‍ය පියවර තබා තිබෙන බව. එම නිසා, පළාත් පාලන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අමාත්‍යාංශයෙන් කිසිම වැඩක් කෙරෙන්නේ නැතැයි යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) කළ චෝදනාව සාධාරණයැයි මා හිතන්නෙ නැහැ. යමක් අවබෝධ කර දුන්නොත් එය පිළිගන්නට තරම් එතුමා සාධාරණ මන්ත්‍රීතුවරයකු බව මා දන්නා නිසයි, කාලය ගියත් මේ කරුණු ගැන එතුමාගේ අවධානය යොමු කරන්නට මා කල්පනා කළේ.

දේශීය ණය අරමුදලින් මුදල් දීමේදීත් නියම විධියට ක්‍රියා කර නැතැයි එතුමා කීවා. මා පෞද්ගලිකව විටින් විට ඒ ගැනත් සොයා බලන නිසා මට පුළුවන්කම තිබෙනවා, ඒ සම්බන්ධයෙන් එතුමා හිතන තරම් නරක තත්ත්වයක් නැති බව කියන්නට. මෙන්න මේ පළාත් පාලන ආයතනවලට, 1966-67 අවුරුද්දේ පමණක් දේශීය ණය අරමුදලින් මුදල් ලබා ගන්නට වැඩ පිළිවෙළවල් යොදා තිබෙනවා: අප කොයි තරම් සාධාරණ විධියට කටයුතු කරනවාදැයි කීවොත් විදුලි බලය සඳහා අකුරැස්සේ සුළු නගර සභාවට රුපියල් 1,64,000 ක් දී තිබෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති)**

*(கௌரவ எம். டீ. பண்டா—விவசாய, உணவு அமைச்சர்)*

(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

ආලෝකය දෙනවා.

**ප්‍රේමදාස මයා.**

*(திரு. பிரேமதாச)*

(Mr. Premadasa)

ඔව්, අප ඔවුන්ටත් ආලෝකය දෙනවා. ඒ වාගේම, විදුලි බලය සඳහා චුන්නාකම් සුළු නගර සභාවට රුපියල් 1,00,000 ක් දී තිබෙනවා. නෙල්ලිඅඩි සුළු නගර සභාවට රුපියල් 1,87,900 ක් දී තිබෙනවා. කයිට්ස් සුළු නගර සභාවට රුපියල් 2,16,000 කුත්, මාවනැල්ල සුළු නගර සභාවට රුපියල් 96,900 කුත්, තිස්සමහාරාම සුළු නගර සභාවට රුපියල් 40,000 කුත්, උතුරු කරවාහු ගම් සභාවට රුපියල් 2,07,100 කුත්, උඩුගම්පහ ගම් සභාවට රුපියල් 1,74,000 කුත් දී තිබෙනවා. ඒ හැරෙන්නට එතුමාම සඳහන් කළ බෝපේ ගම් සභාවට රුපියල් 2,10,500 කුත්, පල්ලෙගම්පහ ගම් සභාවට රුපියල් 1,17,700 කුත්, ඉබ්බාගමුව ගම් සභාවට රුපියල් 92,100 කුත්, නිකවැරටිය ගම් සභාවට රුපියල් 98,000 කුත් දී තිබෙනවා.

ජල සම්පාදනය සඳහා දේශීය ණය අරමුදලින් සභාපතිතුමාගේ කොට්ඨාශයට—හලාවත, පළාත් ආණ්ඩු සභාවට—රුපියල් 1,50,000 කුත්, තිස්සමහාරාමයේ සුළු නගර සභාවට රුපියල් 25,000 කුත් දී තිබෙනවා.

ප්‍රසිද්ධ වෙළඳ පොළවල් සඳහා මැදගම්පත්තු ගම් සභාවට රුපියල් 16,500 ක් දී තිබෙනවා. අවිස්සාවේල්ලේ පළාත් ආණ්ඩු සභාවට රුපියල් 35,000 යි. එවාගේම නිවාස යෝජනා ක්‍රමයක් සඳහා අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාවට රුපියල් 6,000 ක් වෙන්කර තිබෙනවා. රත්නපුර පළාත් ආණ්ඩු සභාවට ට්‍රැක්ටර් යන්ත්‍රයක් ගැනීම සඳහා රුපියල් 25,000 ක් වෙන් කර තිබෙනවා. එම කාර්යය සඳහාම අම්බලංගොඩ පළාත් ආණ්ඩු සභාවටත් රුපියල් 25,000 ක් වෙන් කර තිබෙනවා. මේ හැර තවත් පළාත් පාලන ආයතන ගණනාවකටම මුදල් ලබා දීමට මෙම වර්ෂයේදී නිර්දේශ කර තිබෙනවා. එහෙත් ඒවා මෙතෙක් සම්මත වී නොමැති හෙයින් මෙම අවස්ථාවේදී ඉදිරිපත් කරන්නේ නැහැ. දැන් තමුන්නාන්සේලාට පෙනී යනවා ඇති අප කොතෙක් සාධාරණ අන්දමට ක්‍රියා කරනවාද කියා.

මුඩුක්කු සංහාරය—slum clearance—සඳහා මුදල් දුන් ආකාරය ගැන කියන්නට පුළුවන්දැයි යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ප්‍රශ්න කළා. ඒ සඳහා රුපියල් 8 ලක්ෂයක් වෙන් කළා. එක් මහ නගර සභාවකටත්, පළාත් ආණ්ඩු සභා 10 කටත් සුළු නගර සභා 19 කටත් ගම්සභා 10 කටත් මෙම මුදල් වෙන් කළා. මෙම මුදල් වෙන් කළේ සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන්ගේ නිර්දේශවලට අනුවයි. මාතලේ මහ නගර සභාවට රුපියල් 27,000 ක් දුන්නා. අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාවට රුපියල් 27,000 ක්ද, කුලියාපිටිය පළාත් ආණ්ඩු සභාවට රුපියල් 18,000 ක්ද, හපුතලේ පළාත් ආණ්ඩු සභාවට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

රුපියල් 18,000 ක්ද, හැටන්-දික්ඔය පළාත් ආණ්ඩු සභාවට රුපියල් 22,500ක්ද, නාවලපිටිය පළාත් ආණ්ඩු සභාවට රුපියල් 22,500 ක්ද, කළුතර පළාත් ආණ්ඩු සභාවට රුපියල් 27,000 ක්ද, තංගල්ල පළාත් ආණ්ඩු සභාවට රුපියල් 18,000ක්ද, හලාවත පළාත් ආණ්ඩු සභාවට රුපියල් 27,000 ක්ද, අම්බලංගොඩ පළාත් ආණ්ඩු සභාවට රුපියල් 27,000 ක්ද, ජාඇල පළාත් ආණ්ඩු සභාවට රුපියල් 18,000 ක්ද කඳාන සුළු නගර සභාවට රුපියල් 18,000 ක්ද, රඹුක්කන සුළු නගර සභාවට රුපියල් 18,000 ක්ද, හික්කඩුව සුළු නගර සභාවට රුපියල් 18,000 ක්ද, මන්නාරම සුළු නගර සභාවට රුපියල් 18,000 ක්ද, කින්නියා සුළු නගර සභාවට රුපියල් 18,000 ක්ද, මුත්තූර් සුළු නගර සභාවට රුපියල් 18,000 ක්ද, මුලතිව් සුළු නගර සභාවට රුපියල් 18,000 ක්ද, වැල්වෙටිතුරෙයි සුළු නගර සභාවට රුපියල් 22,500 ක්ද, කන්කසන්තුරෙයි සුළු නගර සභාවට රුපියල් 18,000 ක්ද, බලපිටිය සුළු නගර සභාවට රුපියල් 18,000 ක්ද, එරාවූර් සුළු නගර සභාවට රුපියල් 18,000 ක්ද, පස්සර සුළු නගර සභාවට රුපියල් 18,000 ක්ද, පැල්මඩුල්ල සුළු නගර සභාවට රුපියල් 18,000 ක්ද, දෙහිඕවිට සුළු නගර සභාවට රුපියල් 18,000 ක්ද, වරකාපොල සුළු නගර සභාවට රුපියල් 18,000 ක්ද, කල්පිටිය සුළු නගර සභාවට රුපියල් 18,000 ක්ද, කොච්චිකඩේ සුළු නගර සභාවට රුපියල් 18,000 ක්ද, බත්තරමුල්ල-තලංගම සුළු නගර සභාවට රුපියල් 18,000 ක්ද, අකුරැස්ස සුළු නගර සභාවට රුපියල් 18,000 ක්ද, යනාදී වශයෙන් මුදල් වෙන් කර තිබෙනවා. බලන්න, කොතරම් සාධාරණ අන්දමට අප ක්‍රියා කරනවාද කියා. ඊළඟට ගම්සභා ගැන සඳහන් වෙනවා. පේසාලෙයි ගම්සභාවට රුපියල් 13,500 ක්ද, අදිකාරිපත්තු ගම්සභාවට රුපියල් 18,000 ක්ද, දුම්මලසූරිය ගම්සභාවට රුපියල් 18,000 ක්ද, කුරුවිට ගම්සභාවට රුපියල් 18,000 ක්ද, පල්ලේපත්තු-කුරුවිට (ඇහැලියගොඩ නගරය) ගම්සභාවට රුපියල් 18,000 ක්ද, වැල්ලවාය ගම්සභාවට රුපියල් 18,000 ක්ද, නුවරඑළිය (කඩවත් සතර) ගම්සභාවට රුපියල් 27,000 ක්ද, කඳුපිට පත්තු (කෑගල්ල දිස්ත්‍රික්කය) ගම්සභාවට රුපියල් 9,000 ක්ද, කඳපිට-වලකඩ (මාතර දිස්ත්‍රික්කය) ගම්සභාවට රුපියල් 9,000 ක්ද කුච්චවෙලි ගම්සභාවට රුපියල් 13,500 ක්ද වෙන් වෙන් කර තිබෙනවා.

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා බොහොම වේගවත් ලෙස පළාත් පාලන ඇමතිතුමා විවේචනය කළා. එහි දේශපාලනමය තේරුම පිළිබඳව වචනයක්වත් කතා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැත්තේ, වඩ්ඩුක්කොඩෙයි ගරු මන්ත්‍රීතුමා (ඒ. අමිර්තලිංගම් මයා.) ඒ සඳහා වේගවත් පිළිතුරක් දී තිබෙන නිසායි. එහෙත් එතුමාට වචනයක් ප්‍රකාශ කරන්නට සතුටුයි. අවුරුදු දෙක හමාරක පමණ කාලයක් තිස්සේ මා මෙම ඇමතිතුමාත් සමග එකට කටයුතු කරනවා. එතුමා සමග එකට කටයුතු කරන්නට යෙදුණාට පසුවයි, මා එතුමා පිළිබඳව හොඳින් හඳුනා ගත්තේ. එතුමා අසාධාරණ අන්දමින් ක්‍රියා කරන්නට උත්සාහ දරන පුද්ගලයකු ලෙස මට කුමන අවසථාවකදීවත් පෙනී ගොස් නැහැ. මා එතුමාත් සමග නොයෙකුත් කරුණු පිළිබඳව ඉතා කිට්ටුවෙන් සාකච්ඡා කොට තිබෙනවා. ඒ හැම අවස්ථාවකදීම එතුමා ඉතා සාධාරණ අන්දමින් ක්‍රියා කරන හෙයින් එතුමා සමග සහයෝගයෙන් කටයුතු කරන්නට මට පුළුවන් වුණා. එතුමා එවැනි ගරු ඇමතිවරයකු බව මා අවධාරණයෙන්ම ප්‍රකාශ කර සිටිනවා. පෘථග්ජන පුද්ගලයන් වශයෙන් යම් යම් තීරණ ගනු ලබන විට අප කා අතිනුත් නොයෙකුත් අඩුපාඩුකම් සිදු වන්නට පුළුවනි. යම් යම් තීරණවල එවැනි අඩුපාඩුකම් පෙනෙන්නට තිබුණත් ඒවායේ යම් යම් වැරදි තිබුණත් එවා ද්වේශ සහගත හැඟීමෙන් ගන්නා ලද තීරණ නොවන බවයි, කියන්නට තියෙන්නේ. යම් යම් පළාත් පාලන ආයතන සම්බන්ධව ක්‍රියා කිරීමේදී පළාත් පාලන ඇමතිතුමා ද්වේශ සහගත අන්දමින් හා දේශපාලන පලිගැනීම්වලට තුඩුදෙන පරිදි ක්‍රියා කළාදෝ යන සැකය මෙම ගරු සභාව ඉදිරියෙහි ප්‍රකාශ වු නිසයි, මා මෙම කරුණු සඳහන් කරන්නට කල්පනා කළේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 2.45

නගරසභා ආඥාපනතෙන්, පළාත් ආණ්ඩු සභා ආඥාපනතෙන්, සුළු නගර සභා ආඥාපනතෙන් හා ගම්කාර්ය සභා ආඥාපනතෙන් ගරු ඇමතිතුමාට පැවරී තිබෙන විශාල බලතල ගැන කල්පනා කරන විට, ඒ පදවියට පත් වන කවුරු හෝ වේවා ඇත්තවශයෙන්ම ඉතා සාධාරණ ලෙස කටයුතු කළ යුතු බව අපි සියලු දෙනාම පිළිගන්නවා. මන්ද, මහජන ඡන්දයෙන් තේරී පත්වන ආයතන විසුරුවා හැරීමේ බලය යම් පුද්ගලයෙකුට යම් ආඥාපනතක් මගින් පැවරී තිබෙනවා නම් ඒ පුද්ගලයා සුප්‍රීම් උසාවියේ නඩුකාරයෙකුටත් වඩා ප්‍රවේසමෙන්, ඉතාමත් සාධාරණ ලෙස ක්‍රියා කිරීමේ අවශ්‍යතාව අපි පිළිගෙන තිබෙන කාරණයක්. අපි මේවායින් බැට කා තිබෙන අයයි. කොළඹ නගර සභාව හිටි අඩියේ විසුරුවා හැරි අවස්ථාවේදී අපි නඩු මාර්ගයට ගිය බව යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට (ආචාර්ය එන්. එම්. පෙරේරා) මතක ඇති. නගර සභාවෙන් හෝ නගරාධිපතිගෙන් කරුණු නොවිමසා එවකට තිබුණු ආණ්ඩුව විසින් එකපාරටම අපේ නගර සභාව විසුරුවා හැරියා. ඒ අවස්ථාවේ දේශපාලන භේදයක් නැතිව යටියන්තොට ගරු මන්ත්‍රීතුමා ඇතුළු විරුද්ධ පාර්ශ්වයේ අයත්, එක්සත් ජාතික පක්ෂයේ අයත් එකට එකතුවෙලා ඒ ගැන උද්ඝෝෂණය කළා, එය වැරදි පියවරක් හැටියට. අපි නඩු මාර්ගයට ගිය අවස්ථාවේ සුප්‍රීම් උසාවිය ඒ පිළිබඳව තීරණයක් දුන්න. ඒ තීරණය නීතිගත වෙලා තිබුණා. එවිට යම් ඇමතිවරයෙකු මේ බල තල අනුව ක්‍රියා කරනවා නම්, ඒ අවස්ථාවේ නීතිගත වී තිබෙන ධර්මාධිකරණයේ තීරණය පදනමක් කොට ගැනීම පුදුමයක් නොවෙයි. යාපනයේ නගර සභාව විසුරුවා හැරීමේදීත් අපේ ඇමතිතුමා පදනම් කොට ගත්තේ කොළඹ නගර සභාව විසුරුවා හැරීම සම්බන්ධයෙන් එදා අධිකරණය විසින් දී තිබුණු තීරණය බවට මගේ කිසිම සැකයක් නැහැ.

මම මේ අවස්ථාවේදී යටියන්තොට ගරු මන්ත්‍රීතුමාගේ විශේෂ අවධානය යොමු කරවන්ට කැමතියි, එක කාරණයක් සම්බන්ධයෙන්. එතුමාට දැනගන්ට ලැබී ඇති කරුණු අනුව එතුමා කිව්වා, යාපනයේ නගර සභාව ගැන පරීක්ෂණය පැවැත්වූ පළාත් පාලන කොමසාරිස්තුමාගේ වාර්තාව ඉදිරිපත් කළේ ඇමතිවරයා නගර සභාව විසුරුවා හරින්ට තීරණය කළාට පසුවය කියා. ඒකෙ වරදක් තිබෙනවා. මම ඒක හරිගස්සන්ට කැමතියි. පළාත් පාලන කොමසාරිස්තුමා මේ පරීක්ෂණය පවත්වා ඇවිත් පළමුවෙන්ම ඇමතිතුමාට වාර්තා කළා. මොන විධියේ වාර්තාවක්ද ඉදිරිපත් කළේ? දැනට යාපනය නගර සභාවේ පවතින තත්ත්වය අනුව වහාම මේ ගැන ක්‍රියා කළ යුතුය කියායි. ඊට පසුවත් වාර්තාවක් ඉදිරිපත් කළා. වාර්තා දෙකක්.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

පළමුවෙනි එක කට වචනයෙන් කළ වාර්තාවක්.

**ප්‍රේමදාස මයා.**
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

පළමුවෙනි එකත් ලියවිල්ලක් සහිත වාර්තාවක්; දෙවෙනි එකත් ලියවිල්ලක් සහිත වාර්තාවක්. මම එක කරුණක් පැහැදිලි කරන්ට බලාපොරොත්තු වෙනව. යාපනය නගර සභාව විසුරුවා හැරීමේ තීරණය කළේ පළාත් පාලන කොමසාරිස්තුමාගේ පරීක්ෂණයේ ප්‍රතිඵල කට වචනයෙන් පමණක් නොව වාර්තාවක් වශයෙනුත් ඉදිරිපත් වුණායින් පසුව බව පැහැදිලි වශයෙන් කියන්ට ඕනෑ. ඊට පසුව තවත් වාර්තාවක් ඉදිරිපත් කළා. යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට අහුවෙල තියෙන්නෙ ඒකයි.

ගරු සභාපතිතුමනි, යාපනය නගර සභාව විසුරුවා හැරීම සාධාරණද, අසාධාරණද කියන ප්‍රශ්නය ගැන තර්ක කරන්ට නොවෙයි, මා මේ අවස්ථාවේදී කථා කරන්නෙ; ඉදිරිපත් කළ කාරණයේ හරි වැරදි පෙන්වා දීමටයි. යාපනය නගර සභාව විසුරුවා හැරීම සම්බන්ධයෙන් රාජාධිකරණයෙන් දුන්න නඩු තීන්දුව වඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමා (අමිර්තලිංගම් මයා.) මේ ගරු සභාවේදී කියවන්ට යෙදුනා. එය කියවා බලන ඕනෑම කෙනෙකුට පෙනී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

යනවා ඇති, මෙතෙක් මේ රටේ අධිකරණය මගින් පිළිගෙන තිබුණු තීරණයක් පවා එයින් වෙනස් වන බව. කොළඹ නගර සභාව විසුරුවා හැරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය මගින් දී තිබුණු තීන්දුව නීති පොතට ඇතුළත්ව තිබුණා. යම් පළාත් පාලන ආයතනයකට ඊට පැවරී තිබෙන කාර්යයන් ඉටු කරන්ට ශක්තියක් නැත, එය දුර්වල තත්ත්වයක තිබෙනවාය කියා යම් පළාත් පාලන ඇමතිවරයෙකුට ඒත්තු ගියොත් එය විසුරුවා හැරීම නිත්‍යානුකූල බවයි, ඒ තීරණයෙන් ප්‍රකාශ වී තිබුණේ. එසේ නම් එය විසුරුවා හැරීම නීත්‍යානුකූලය යන තීරණයයි මේ යාපනේ නගර සභාව විසුරුවා හරින අවස්ථාව වන විට අපේ නීති පොතට ඇතුළත්ව තිබුණේ. නමුත් යාපනේ නගර සභාව විසුරුවා හැරීම පිළිබඳ ප්‍රශ්නය රාජාධිකරණයට ගියාට පසුව රාජාධිකරණයෙන් දුන් ඒ තීන්දුව අනුව දැන් අළුත් පදනමක් වැටී තිබෙනවා. මින් ඉදිරියට යම් ඇමතිවරයකු ක්‍රියා කරනවා නම් ඒ තීන්දුව පදනම් කොට ගෙන ක්‍රියා කළ යුතුය කියා තීරණයක් ගෙන තිබෙනවා. මොකක්ද ඒ තීරණය ?

ඇමතිවරයා සෑහීමට පත් වෙන්නට පෙර එය හරි හෝ වේවා වැරදි හෝ වේවා විග උත්තරකාර පක්ෂයට පිළිතුරු දෙන්නට අවස්ථාවක් දිය යුතුය යන්නයි. රාජාධිකරණයේ තීන්දුවෙන් පසු දැන් ඒ පදනම වැටී තිබෙනවා. යාපනේ නගර සභාවට එවැනි අවස්ථාවක් දී නැත කියා රාජාධිකරණයේ තීන්දුවේ සඳහන් වෙනවා. නමුත් ඇමතිවරයා ගත් තීරණය වෙනස් නොකරන්නේ පිළිසරණය ඉල්විය යුතු නියම පුද්ගලයා දුරයප්පා මහත්මයා නොවන නිසාය කියනවා. පිළිසරණය ඉල් විය යුත්තේ නගර සභාවය කියනවා. එහෙත් මේ අවස්ථාවේදී නගරාධිපතිවරයා වූ ඇල්ෆ්‍රඩ් දුරයප්පා පිළිසරණය ඉල්ලා සිටින නිසා සහනය නොදෙනවාය කියනවා. නගරාධිපති ඇතුළුව නගර සභාවම පිළිසරණය ඉල්විය යුතුය යන පදනම රාජාධිකරණය පිළිගෙන තිබෙනවා. නමුත් ගරු ඇමතිතුමා යාපනේ නගර සභාව විසුරුවා හරින අවස්ථාවේදී පිළිගෙන තිබුණු පදනම ඒක නොවෙයි. කොළඹ නගර සභාව විසුරුවා හැරීම පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දී තිබුණු තීන්දුවක් පදනම් කරගෙනයි ඒ අවස්ථාවේදී ක්‍රියා කළේ. ඒ අවස්ථාවේදී යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) පළාත් පාලන ඇමතිවරයා වශයෙන් සිටියා නම් එතුමා කුමන ආකාරයකට ක්‍රියා කරනවාද කියා මා ප්‍රශ්න කරන්නට සතුටුයි.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

ඔව එකක්වත් මං විශ්වාස කරන්නේ නැහැ.

සභාපති
(அக்கிராசனர்)
(The Chaïrman)

The hon. Parliamentary Secretary will have to finish by 3 P.M.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

I have to reply to the serious charges that were made.

සභාපති
(அக்கிராசனர்)
(The Chaïrman)

I am sorry.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

You have given other Ministers half an hour more.

සභාපති
(அக்கிராசனர்)
(The Chaïrman)

I told you in time that you will be given only one hour. There are some forty-eight Members to speak under the next Ministry.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

You have to pardon me. Very serious charges were made against this Ministry and I must reply to them.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

I shall give you ten more minutes.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

In fairness to my Minister I must say that he is not in this House to answer and therefore I have to reply to the charges made. I am in the privileged position here of having to appear for a Q.C.!

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

I cannot give you more than ten minutes.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

You are doing better than the Q.C. anyhow!

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

මේ දිවුරුම් පෙත්සම දිගයි. මේක කිය වන්නට යන කාලය ගණින් ගන්නේ නැතිව විනාඩි 10 ක් දෙන්න. මේක ඉතා මත්ම වැදගත් දිවුරුම් පෙත්සමක්.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

If you like you can refer to the salient points and then table the document.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

You are allowing this to be tabled?

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Yes.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

එසේ නම් මා එකඟ වෙනවා. නමුත් යටියන් තොට ගරු මන්ත්‍රීතුමාට මේක ඒත්තු ගන්වන්නට පුළුවන් ද කියා බලන්නට මට ලොකු ආශාවක් තිබෙනවා.

"I, Wattage Johanis Fernando, being a Buddhist do solemnly, sincerely and truly declare and affirm as follows:—

1. I am the Commissioner of Local Government."

මේ පරීක්ෂණයට ගිහින් පරීක්ෂණය පවත්වා එතුමා ඇවිත් ඉදිරිපත් කළ වාර්තාවෙන් උපුටා ගත් වැදගත් කොටස් මා කියවන්නෙ.

"6. I state that the following are amongst the illegal and/or undesirable acts of the said Council—

(a) The disbandment of the Standing Committee of the said Council which had been elected at the beginning of the year 1966, under the provisions of Section 26 (1) of the Municipal Councils Ordinance and the election of fresh Committees without warrant in law.

(b) The regular practice of bringing up before the meetings of the said Council and passing of resolutions dealing with important matters many of them involving the expenditure of the said Council's funds, without notice of the business to be transacted at the said meetings as required by Section 19 of the Municipal Councils Ordinance being given but with the permission of the House. Out of 19 items discussed and decided upon at three meetings of the said Council the members received the required statutory notice only in respect of 7 items.

(c) The wholesale delegation by the Council of all its powers under Sections 229 (*c*) and 229 (*d*) of the said Ordinance which is calculated to nullify the statutory safeguards against corruption and waste of the said Council's funds.

(d) The authority given to the Finance Committee to sub-delegate the powers under Sections 229 (c) and 229 (d) already delegated which is still further calculated to nullify even more the statutory safeguards against corruption and waste.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(e) The decision to dispense with procedure prescribed by Sections 227, 228 and 229 of the said Ordinance.

(f) The consequent entrustment of all powers of the Council to enter into contracts, to the Mayor.

(g) The decision to give the power to the Mayor to create new posts and fill them on temporary or permanent basis without prior monetary provision for them.

(h) The act of the Mayor in engaging labourers and masons and thereby increasing their cadres without prior financial provision and prior sanction of the said Council.

(i) The decision to permit the Mayor to allot new unused open sheds (Market stalls) at the Grand Bazaar at his discretion without calling for tenders.

(j) The suppression of the post of Works Engineer, a post listed in the first schedule of the Local Government Service Ordinance and creation of the post of Superintendent of Works, Grade I."

මේ විධියට ඉතාමත්ම බරපතළ කරුණු රාශියක් ගැන පළාත් පාලන කොමසාරිස් වරයා සඳහන් කර තිබෙනවා.

"The entire procedure was teeming with irregularities—

1. Tenders were not called for
2. Deviation from tender procedure was not approved by the Council.
3. Orders were placed with one firm not for items in the estimate, but for items available with the firm.

When the pipes so purchased from the said Messrs. Vaithilingam and Sons were installed, it was found that these pipes were not the ones used for water distribution but meant only for sewerage purposes and hence cannot stand the pressure of water. The pipes burst in several places and the Municipal Commissioner noted on his inspection that 'the leakages were found tied with strings' and 'workmen were covering some leakages with large quantity of cement'.

All this waste of public funds was occasioned by the Mayor undertaking jobs without the benefit of suitable technical advice, or of tender procedure, which gives the Council a chance to penalise a contractor, and recover damages from him if the work is bad.

The said Council has budgeted for a deficit for the last two years in succession without finding any source of additional revenue. It declined to increase the rate levied by it which is only 12 per centum of the annual value of properties situated within its area. Even when my predecessor in office suggested to the said Council that an additional rate of six per centum on the annual values should be levied for areas served by water supply the said Council decided only on a two per centum increase.

The arrears in property rates alone left uncollected by the said Council in 1966 amounted to about a million rupees.

Upon the Auditor-General's certificate of surcharge dated 8th June, 1962, there is now due from the Mayor and eight others, two of whom were until the dissolution of the said Council members of the Finance Committee, Rs. 29,850/74 for negligence or misconduct in authorizing by resolution No. 52 of 13th March, 1959, fruitless expenditure the details of which are stated in the said certificate."

මේ විධියට චෝදනා මහත් රාශියක් තිබෙනවා. කියවන්නට කාලය මදි නිසා මෙය සභාගත කරනවා.* මේ විධියට සඳහන් කරන පළාත් පාලන කොමසාරිස් වරයා වහාම පියවර ගන්නා ලෙසද කියා තිබෙනවා.

"Going through the minutes of the meetings of the present council from its inception covering the terms of office of four Mayors within a period of 2½ years, I came across many instances where the council's decisions savoured of irresponsibility, incompetence, misconduct and abuse of authority. Scheduled posts in the council appeared to have been suppressed either to by-pass the authority of the L. G. S. C. or to get rid of the present holders of these posts. Labourers appear to have been appointed above the cadre without even financial provision. I shall be making a detailed report regarding those matters."

---

* ඉදිරිපත් කරන ලද දිවුරුම් පෙත්සම මෙදින වැඩ කටයුතු අවසානයේ පරිශිෂ්ට අංක III වශයෙන් පළ කරනු ලැබේ.

*ஆணைப்பத்திரம், இன்றைய நிகழ்ச்சித் தொடரின் முதலாம் பகுதியில் அநுபந்தம் இல. III ஆ தரப் பட்டுள்ளது.

* *The Affidavit is reproduced as an Appendix No. III at the end of this Day's Proceedings.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3

That is the detailed report the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) was referring to. This was the first report:

"But the minutes of the last two or three meetings of the council revealed a most unhealthy, unsatisfactory and even alarming trend of events. I therefore hasten to send this interim report, so that immediate action may be taken."

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

What is the date of that report?

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

29th May 1966. It was on the very day that the council was dissolved. As I said earlier, a further report was submitted to the Minister by the Commissioner of Local Government.

ගරු සභාපතිතුමනි, දැන් මේ කාරණය සම්බන්ධයෙන් යටියන්තොට ගරු මන්ත්‍රීතුමාගේ හිත හැදෙන්නට ඇතැයි මා කල්පනා කරනවා. පළාත් පාලන කොමසාරිස්තුමා මේ විධියේ වාර්තාවක් ඉදිරිපත් කොට එහි සඳහන් කාරණා ගැන අප්‍රමාදව පියවර ගන්නා ලෙස කියා තිබියදී වගකිව යුතු ඇමතිවරයකු වශයෙන් නිශ්ශබ්දව සිටිය හැකිද? කොළඹ නගර සභාව ගැන අධිකරණයෙන් ලැබුණු තීරණය ගැන සැලකිල්ල යොමු කරන විට මේ අවස්ථාවේදී මෙම පියවර හැර වෙන පියවරක් ගන්නට නැති බව පෙනී යනවා. ඒ නිසා යටියන්තොට ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද චෝදනාව සාධාරණ නොවන බව මතක් කරන්නට කැමතියි.

අතුරුගිරියේ ගම්කාර්ය සභාව විසුරුවා හැරීමේ ප්‍රශ්නය ගැනත් යටියන්තොට ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන්නට යෙදුණා. අතුරුගිරියේ ගම්සභාව විසුරුවා හැරියේ "සර්චාර්ජ්" ප්‍රශ්නයක්—වැරදි ලෙස වියදම් කළ මුදලක් ගෙවන්නය කියා නියම කිරීමේ ප්‍රශ්නයක්—උඩ යයි කිව්වා. එය සම්පූර්ණයෙන්ම වැරදියි. "සර්චාර්ජ්" ප්‍රශ්නයක් කොහෙත්ම ඇත්තේ නැහැ.

On 26.9.66 the Chairman and the members of the Aturugiriya Village Council were called upon to show cause. Why the village council should not be dissolved on the grounds set out in the annexed charge sheet:

ගරු සභාපතිතුමනි, චෝදනා පත්‍රය මා ළඟ තිබෙනවා. ඒ චෝදනා පත්‍රයේ තිබෙන්නේ මෙන්න මෙහෙමයි:

"1966.3.11 දින පවත්වන්නට යෙදුණු අතුරුගිරිය ගම්සභා රැස්වීමේදී පසුගිය සභා රැස්වීමේ වාර්තාව අනුමත කිරීම සභිකයින් 9 දෙනෙකු විපක්ෂවත්, 6 දෙනෙකු පක්ෂවත් ඡන්දය දීම නිසා ප්‍රතික්ෂෙප වූයෙන් එම රැස්වීමට පැමිණි සභිකයින් වැඩි දෙනෙකුගේ කැමැත්ත ලබා නොගෙන ගම්සභා ආඥපනතේ 52 වන වගන්තිය යටතේ පනවන ලද ව්‍යවස්ථාව XII වන කාණ්ඩයේ 3(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් යථෝක්ත රැස්වීම කල් දැමීමට ගම්සභාවේ සභිකයකු වශයෙන් ඔබ එකඟ වීම"

ඔය විධියට චෝදනා කීපයක්ම තිබෙනවා. තවත් චෝදනාවක් මෙන්න:

රැස්වීම්වලදී ඇති වන අර්බුද හේතුවෙන් ගම්සභාවේ මාසික රැස්වීම් අතරමග නවතා දැමීමට සිදුවීම නිසා ගම්සභා ප්‍රදේශය තුළ පදිංචිකරුවන් හට සතුටුදායක සේවයක් ඉටු කිරීමට බැරි තත්ත්වයකට ගම්සභාව පත් කර තිබීම.
යන මේ කරුණු අනුව,

(අ) අදක්ෂතාවය හා නොමනා පාලනය.

(ආ) ගම්සභා ආඥපනතින් පැවරී ඇති රාජකාරී ඉටු කිරීම නිරතුරුවම ප්‍රතික්ෂෙප කිරීම හෝ ඕනෑකමින් පැහැර හැරීම.

(ඉ) රාජකාරි ඉටු කිරීමේදී විෂමාචාරයෙන් යුක්ත වීම සහ

(ඊ) ගම්සභා ආඥපනතින් පැවරී ඇති බලතල අයථා අන්දමින් පරිහරණය කිරීම."

ඔන්න ඔය විධියට චෝදනා 7ක් තිබෙනවා. එය විසුරුවා හැරියේ "සර්චාර්ජ්" ප්‍රශ්නයක් සම්බන්ධව නොවෙයි. මෙයත් යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට (ආචාර්ය එන්. එම්. පෙරේරා) කියවීම සඳහා සභාගත කරනවා.

මෙන්න මේ චෝදනා පත්‍රය ඉදිරිපත් කළා.

They were called upon to show cause why the V. C. should not be dissolved on the grounds set out in the charge sheet that was annexed.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

On receipt of the explanations of the Chairman and the members, the Deputy Commissioner of Local Government, Mr. S. W. Gunawardena, was appointed to inquire into the charges. At this inquiry the members expressed the view that a deadlock was adversely affecting the services that could be rendered to the inhabitants of the area. The deadlock was caused by the fact that the V. C. was divided with 8 members for the Chairman, including himself, and 10 members against. In fact, the Chairman too had agreed that dissolution was the best course. Having considered the report of the Deputy Commissioner of Local Government and the circumstance that there was a deadlock in the council which rendered it unable to discharge the statutory duties to the ratepayers, the Minister ordered the dissolution of the V. C. and the appointment of the Assistant Commissioner of Local Government of the Colombo Region as Special Commissioner. The order dated 21.2.67 was published in the Gazette of 23.2.67.

ඇල්බට් විතානච්චි කියන ආදායම් පාලක නිලධාරියෙක් සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ලියමනක් අරගෙන ඇමතිතුමා හමුවන්නට ගියාය, ඒ තැනැත්තාම විශේෂ කොමසාරිස් හැටියට පත් වුණාය කියා යටියන්තොට ගරු මන්ත්‍රීතුමා කිව්වා. ඒ මෙම ගම්සභාව විසුරුවා හරින්නටත් කලිනුයි. විසුරුවා හරින්නටත් කලින් විශේෂ කොමසාරිස්වරයකු පත් වන්නේ කොහොමද ? විශේෂ කොමසාරිස් පත් කළේ විසුරුවා හැරියාට පසුවයි. එහෙත් එසේ පත් කළේ ඔය කියන ඇල්බට් විතානච්චි මහත්මයා නොවෙයි. ඒ සඳහා පත් කළේ කොළඹ ප්‍රදේශයේ සහකාර කොමසාරිස්තුමායි. ඒ කරුණ ඉදිරිපත් කරන ගමන් යටියන්තොට ගරු මන්ත්‍රීතුමා ලැයිස්තුවක් ඉදිරිපත් කර ඇසුවා "සර්චාර්ජ්" ප්‍රශ්නයක් උඩ අතුරුගිරිය ගම්සභාව විසුරවා හැරියා නම් උතුරේ සහ නැගෙනහිරේ—මඩකලපු දිස්ත්‍රික්කයේ, මන්නාරම් දිස්ත්‍රික්කයේ හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ—තිබෙන මෙන්න මේ ලැයිස්තුවේ සඳහන් පළාත් පාලන ආයතන විසුරුවා නොහරින්නේ ඇයි, කියා. එම ලැයිස්තුවේ fපයින් ඔf්ප් සර්චර්ජ් කියන ශීර්ෂය යටතේ "සර්චාර්ජ්" මුදල් සඳහන් කර තිබුණා. ඒවා විසුරුවා නොහරින්නේ ඇයි කියා එතුමා ප්‍රශ්න කළා. ඒ අවස්ථාවේදී යටියන්තොට ගරු මන්ත්‍රීතුමාගෙන් ඒ ලැයිස්තුව මා ඉල්ලා ගත්තා. එය දැන් මා ළඟ තිබෙනවා. එය බැලූ හැටියේම මට පෙනී ගියා, එයත් ටයිප් කර තිබෙන්නේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේම බව. [බාධාකිරීමක්] එය ලබාගත්තාට වරදක් නැහැ. එතුමාට එය ලැබීම ගැන මගේ විරුද්ධත්වයක් නැහැ. අපත් විරුද්ධ පක්ෂයේ සිටින විට අපටත් මෙවැනි ලියවිලි ලබාගන්නට පුළුවන් වුණා.

ඒ ගැන දොස් පවරන්නේ නැහැ. විවේචනය කිරීම ගැන මා සන්තෝෂ වෙනවා. මගේ ප්‍රයෝජනය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ටයිප් කරවා ගත් ලියවිල්ලක් මා ළඟ තිබෙනවා. මා ළඟ තිබෙන මේ කඩදාසියත් ගරු මන්ත්‍රීතුමාගෙන් මා ලබා ගත් ඒ කඩදාසියත් දෙකම එකම වර්ගයේ ඒවා බව මට කියන්නට පුළුවනි. ඒ වාගේම මේ ලියුම් දෙකම ටයිප් කරන ලද්දේත් එකම යතුරු ලියනයේ බව පෙනෙනවා. මට එක වරම හැඟී ගියේ ඒ කාරණයයි. ගරු මන්ත්‍රීතුමාට ඒ ලැයිස්තුව ටයිප් කර දුන්නේ කවුරුන් හෝ වේවා, හරියට කරුණු අවබෝධ කර ගන්නේ නැතිවයි එය කර තිබෙන්නේ. හරියාකාර කරුණු අවබෝධ කර නොගෙන අපට චෝදනා කරන්නේ ඇයි ?

යටියන්තොට ගරු මන්ත්‍රීතුමාගේ තර්කය වූයේ ද්‍රවිඩ පළාත් පාලන ඇමතිවරයෙක් පැමිණ ද්‍රවිඩ පළාත්වලට වැඩි සැලකිල්ලක් දක්වා වැඩ කරගෙන යනවා මිස සෙසු ප්‍රදේශවලට ඒ තරම් සැලකිල්ලක් දක්වන්නේ නැත යන්නයි. සිංහල ප්‍රදේශවල ගම්කාර්ය සභා විසුරුවා හරිනවා යයි චෝදනා කරමින්, සිංහල ප්‍රදේශවලට සැලකිල්ලක් නොදක්වනවායයි චෝදනා කරමින්, එතුමා ඉදිරිපත් කළ නිදර්ශනය අතුරුගිරිය ගම්කාර්ය සභාව විසුරුවා හැරීම ගැනයි. මේ ගැන කර තිබෙන්නේ මොනවාදැයි මා සොයා බැලුවා. මට ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ලැබී තිබෙනවා. මා ඒ ගැන නිකම් සිටියේ නැහැ. පුළුවන් තරම් ඒ ගැන ක්‍රියා කර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විස්තර සහිතව, කරුණු ඉදිරිපත් කරන්නට පුළුවනි, කාල වේලාව තිබෙනවා නම්, දැනට නඩු පවරා තිබෙනවා. සමහර පුද්ගලයන්ගෙන් අය කර ගන්නට තිබෙන මුදල් අය කර ගන්නට පුළුවන්කමක් නැහැ. කරුණු සොයා බලන විට පෙනී ගියේ ඔවුන් කිසිම ආදායමක් හෝ කිසිම වත්කමක් හෝ නැති අය බවයි. අය කර ගන්නට ක්‍රියා නොකර සිටියේ නැහැ. කොතෙක් ක්‍රියා කර තිබුණත් ඒ අය ගෙන් අයකර ගන්නට වත්කමක් නැත් නම් එය කෙසේ කරන්නටද?

උඩුගම්පළ ගම්කාර්ය සභාව සම්බන්ධයෙන් යටියන්තොට ගරු මන්ත්‍රීතුමා මගෙන් ඇහුවා. චෝදනා පත්‍රය උඩුගම්පළ ගම්කාර්ය සභාවට පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් යවා නැති බව එතුමාට කියන්නට සතුටුයි. ගම්කාර්ය සභාවේ සභාපතිවරයාට එම චෝදනා පත්‍රය යවා නැති නමුත් පරීක්ෂණයක් කළ බව ඇත්තයි. ඒ පරීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් පළාත් පාලන කොමසාරිස්තුමා අමාත්‍යාංශයට මේ විධියට නිර්දේශ කර තිබෙනනවා:

"I suggested that the V. C. be controlled by not applying V. C. section 47 (1) to this V. C. and exercising greater care over its affairs by sending an Investigating Officer once a quarter for review of their activities. The Chairman may also be given a warning to put his affairs in order, e.g., as set out in the Charges. These must be rectified by the Chairman V. C.

The Permanent Secretary in turn minuted to the Hon. Minister as follows:

'The finances of this V. C. may be controlled under section 47 (2) and action taken as suggested at (X) by the S. A. S.'

Accordingly, the Hon. Minister approved the control as suggested by the Permanent Secretary."

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Has there been a fraud?

ප්‍රේමදාස මයා.
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

There has not been a fraud. There was a certain amount of mess.

ඒ ගැන දීර්ඝ ලෙස කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. රත්නපුරය ගැන කියන්නට තිබෙන්නේ, දෙහිඕවිට ගරු මන්ත්‍රීතුමා රත්නපුර මන්ත්‍රීවරයා වශයෙන් පසුගිය කාලයක සේවය කරද්දී එවකට පැවති ආණ්ඩුවටත් කරුණු ඉදිරිපත් කළ බවයි. එතුමාගෙන් අසා බැලුවොත් එතුමා ඒ බව කියාවි. මේ ආණ්ඩුව බලයට පත් වූ පසුත් එතුමා පෞද්ගලිකව මේ ගැන කියා තිබෙනවා. රත්නපුරය මහා නගර සභාවක් බවට පරිවර්තනය කරනවා නම් එහි සීමාවන් ඇති කිරීමේ ප්‍රශ්නය ගැන ලොකු මතභේද පවතින බව අපටත් දැන ගන්නට ලැබුණා. එහි පාලනයේ යම් යම් අදක්ෂකම් සහ දුර්වලකම් තිබෙන බව දැනගන්නට ලැබුණා. ඒවා නවත්වන්නට වැඩ පිළිවෙළක් යොදන්නට ඕනෑ. රත්නපුර ගරු මන්ත්‍රීතුමා රත්නපුර පළාත් පාලන ආයතනය නගර සභාවක් බවට පත් කිරීම ගැන තදින්ම විරුද්ධව සිටි කෙනෙක්. එහි ඒ සඳහා අවශ්‍ය තරම් ශක්තිමත් සංවිධානයක් ඇති වෙලා නැහැ. මේ විධියේ අසතුටුදායක තත්ත්වයක් පවතිද්දී රත්නපුර පළාත් ආණ්ඩු සභාව නගර සභාවක් බවට පත් කිරීම බඳු ගෙවන්නන්ට කරන හිරිහැරයක් සහ කරදරයක් බව කියා සිටියා. එහෙත් ඒ අදහස ගරු ඇමතිතුමා පිළිගත්තෙ නැහැ. ඒ අනුව කටයුතු කරගෙන ගියා. මායිම් නියම කිරීමේ ප්‍රශ්නය සම්බන්ධයෙනුත් විශාල වශයෙන් උද්ඝෝෂණ කර තිබෙනවා. මායිම් නියම කිරීම වැරදි ලෙස කර තිබෙනවාය, අඩුපාඩුකම් ගුගක් තිබෙනවාය, ස්වාභාවික මායිම් නොසලකා හැර තිබෙනවාය, යනාදි වශයෙන් පැමිණිලි කර තිබෙනවා. ඔය විධියේ කරුණු රාශියක් නිසා මේ මැතිවරණය කල් දමන්නට අපට සිදු වුණා. ඒ අනුව 1968 මාර්තු මාසය වන තුරු මේ නගර සභාව කල් දමා තිබෙන නමුත් ඒ නියමිත අවස්ථාව වන විට නැවත එය ඇති කරන්නට ක්‍රියා කරන බව යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට මා මතක් කරන්නට කැමතියි. මහරගමත් මොරටුවේත් නගර සභා සම්බන්ධයෙන් සොයා බලන්නට මට අවස්ථාවක් ලැබුණේ නැහැ. එහෙත් මට එක පොරොන්දුවක් දෙන්නට පුළුවනි. කිසිම දේශපාලන හැඟීමක් උඩ විසුරුවා හැරීමක් හෝ කිසිවකුට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

දඩුවම් දීමක් හෝ කෙරෙන්නේ නැහැ. ඒ සමගම, මට ඊයේ දැන ගන්නට ලැබුණු කරුණකුත් මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ. ඊයේ පෙරෙයිදා ඇති වුණු ලුනාවේ සිද්ධිය අප කවුරුනුත් දන්නවා. එය සිදු වුණු ලුනාවේ තානායම පාලනය කරන්නේ මොරටුවේ පළාත් ආණ්ඩු සභාවයි. මේ තානායම්කරු තානායම් නීති රීති උල්ලංඝණය කර තිබෙන බව දැන් පැහැදිලියි. එය දැන් කවුරුනුත් පිළිගෙන තිබෙන දෙයක්. එම නිසා වහාම මෙම තානායම්කරුගේ වැඩ තහනම් කිරීමට මොරටු පළාත් ආණ්ඩු සභාවේ—ශ්‍රී ලංකා නිදහස් පාක්ෂික—සභාපතිවරයාට යුතුකමක් තිබුණා. එහෙත් ඔහු ඒ යුතුකම ඉෂ්ට කෙළේ නැහැ. පළාත් පාලන කොමිෂන් සභාව මෙම සභාපතිවරයා කැඳවා, ලුනාවේ තානායමෙහි ඇති වී තිබෙන මේ සිද්ධිය නිසා තානායම්කරු නීත්‍යානුකූලව කටයුතු නොකරන බවත් වහාම ඔහුගේ වැඩ තහනම් කළ යුතු බවත් දන්වා තිබෙනවා. එහෙත් ඔහු එය කෙළේ නැහැ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)

කවදාද ? ඒ සිද්ධියට පස්සේද ?

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ඔව්. ඉස්සෙල්ලා කියන්නට වුවමනාවක් නැහැනේ.

"Consequent to the raid, the Chairman of the Moratuwa U. C. was invited to appear before the L. G. S. C. and was told that the L. G. S. C. would back him fully if he made an order interdicting the Rest House Keeper. Subsequently on 29.8.67 he was summoned by the Hon. Minister of Local Government and he has told the Hon. Minister that he wants direction to interdict the Rest House Keeper. Since he had failed to interdict the Rest House Keeper a registered letter was sent on 31st August 1967 by me as Senior Assistant Secretary and Commissioner of Local Government requesting him to interdict Mr. M. A. T. Perera, Rest House Keeper, Lunawa, and to write to the L. G. S. C. seeking approval of the interdiction. Up to date there has been no reply to this letter."

අ. භා. 3.15

අපේ රජය බලයට පත් වුණාට පසු ලුනාවේ සිද්ධිය වැනි දේවලුත් මේ රටේ සිදු වෙනවා යයි ගරු විපක්ෂ නායිකාව ප්‍රසිද්ධ රැස්වීමකදී කියා තිබෙනු මා දැක්කා. දැන් එතුමිය මෙහි සිටියා නම් මා එතුමියට කියන්නට අදහස් කරගෙන සිටියේ, වහාම මේ තානායම්කරුගේ වැඩ තහනම් කිරීමේ පියවර ගන්නා ලෙස ඇගේ පක්ෂයේ කෙනකු වන මොරටු පළාත් ආණ්ඩු සභාපතිවරයාට දැනුම් දෙන ලෙසයි.

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ මට නියමිත කාලයටත් වැඩිපුර වේලාව දී තිබෙන නිසා මගේ කථාව අවසාන කරන්නට පෙර තව එක් කරුණක් පමණක් කියන්නට අදහස් කරනවා. නල්ලූර් හි ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාදන්) ඇසූ ප්‍රශ්නයට පිළිතුරක් නොදුන්නොත් එතුමා මා සමග අමනාප වන්නට පුළුවන් බව තමුන්නාන්සේත් පිළිගන්නවා ඇති. කොළඹ නගර සභාවේ තක්සේරු නිළධාරි තනතුර සුදුසුකම් ඇති අයට ලබා ගන්නට ඉඩ නොදී ක්‍රියා කරන්නේ දැනට සිටින සුදුස්සා මුස්ලිම් ජාතිකයකු නිසා දැයි එතුමා ඇසුවා. අප ජාති භේද වාදී ප්‍රතිපත්ති උඩ ක්‍රියා නොකරන බව මා එතුමාට පළමුවෙන්ම මතක් කරන්නට කැමතියි. එම තනතුර පිළිබඳව තත්ත්වය මෙයයි : කොළඹ නගර සභාවේ දැනට සිටින තක්සේරු නිළධාරි නැන නගර සභාවේම වුවමනාව පිට නැවත සේවයට කැඳවා තිබෙනවා. එහෙත්, 1968 මාර්තු මාසයෙන් එහාට එතුමාගෙ සේවය දීර්ඝ නොකරන ලෙස ගරු ඇමතිතුමා නියෝගයක් කර තිබෙනවා. ඒ දිනයෙන් පසු නියමිත පරිදි ඉල්ලුම් පත්‍ර කැඳවා තෝරා ගනු ලබන කෙනකුට එම තනතුර දෙනවා ඇත.

මගේ අමාත්‍යාංශයේ කටයුතු ගෙන යාමට සහයෝගය දීම ගැනත් එහි අඩු පාඩු පෙන්වා දෙමින් විවේචනයන් ඉදිරිපත් කිරීම ගැනත් සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මා ස්තුතිවන්ත වෙනවා. ඒවාගේම, අමාත්‍යාංශයේ කටයුතු කරගෙන යාමට මට ආධාර කරන සියලුම නිළධාරීන්ටත් මා ස්තුති කරනවා. මට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සඳහන් කරන්නට බැරි වුණු එක් කරුණක් තිබෙනවා. එනම්, සුද්ධ නගර ප්‍රතිසංවිධානයයි. කතරගම, කැළණිය, මහියංගනය යන සුද්ධ නගර සංවර්ධනය කිරීමේ කට යුතු දැන් ඉතා සීග්‍රාකාරයෙන් කරගෙන යන බව සඳහන් කරමින් මගේ කථාව අවසාන කරනවා. වැඩි කල් යාමට මත්තෙන් මේ සුද්ධ භූමි සහ නව නගර තිසි පරිදි නිර්මානයට පත් වීමෙන් මෙම කට යුතු අවසන් කෙරෙනවා ඇති.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)
Is the hon. Member for Yatiyantota pressing his amendment ?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
No, Sir.

"125 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 42,87,058 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

125 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"125 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம், ரூபா 42,87,058 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

125 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 4,287,058 for Head 125, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.*

*Head 125, Vote 1, ordered to stand part of the Schedule.*

**2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 4,20,38,630**

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூபா 4,20,38,630

*Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 42,038,630*

"125 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 4,20,38,630 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

125 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"125 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 4,20,38,630 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

125 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 42,038,630 for Head 125, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.*

*Head 125, Vote 2, ordered to stand part of the Schedule.*

**3 වන සම්මතය.—පාලන ගාස්තු—මූලධන වියදම, රු. 12,25,010**

வாக்குப்பணம் இல. 3.—பரிபாலனச் செலவுகள்—ஆக்கப்பெருட் செலவு, ரூபா 12,25,010

*Vote No. 3.—Administration Charges—Capital Expenditure, Rs. 1,225,010*

"125 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය සඳහා රු. 12,25,010 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

125 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

125 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் ரூபா 12,25,010 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

125 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 1,225,010 for Head 125, Vote No. 3, be inserted in the Schedule", put, and agreed to.*

*Head 125, Vote 3, ordered to stand part of the Schedule.*

**4 වන සම්මතය.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම, රු. 37,27,000**

வாக்குப்பணம் இல. 4.—திணைக்களத்தால் அளிக்கப்படும் சேவைகள்—மீண்டு வருஞ்செலவு, ரூ. 37,27,000

*Vote No. 4.—Services provided by the Department—Recurrent Expenditure, Rs. 3,727,000*

"125 වන ශීර්ෂයෙහි 4 වන සම්මතය සඳහා රු. 37,27,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

125 වන ශීර්ෂයෙහි 4 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

" 125 ஆம் தலைப்பு, 4 ஆம் வாக்குப்பணம் ரூபா 37,27,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக " எனும் வினு விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

125 ஆம் தலைப்பு, 4 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 3,727,000 for Head 125, Vote No. 4, be inserted in the Schedule", put, and agreed to.*

*Head 125, Vote 4, ordered to stand part of the Schedule.*

5 වන සම්මතය.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම, රු. 2,40,47,270

வாக்குப்பணம் இல. 5.—திணைக்களத்தால் அளிக்கப்படும் சேவைகள்—ஆக்கப்பொருட் செலவு, ரூபா 2,40,47,270

*Vote No. 5.—Services provided by the Department—Capital Expenditure, Rs. 24,047,270*

" 125 වන ශීර්ෂයෙහි 5 වන සම්මතය සඳහා රු. 2,40,47,270 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

125 වන ශීර්ෂයෙහි 5 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

" 125 ஆம் தலைப்பு, 5 ஆம் வாக்குப்பணம் ரூபா 2,40,47,270 அட்டவணையிற் சேர்க்கப்படுமாக " எனும் வினு விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

125 ஆம் தலைப்பு, 5 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 24,047,270 for Head 125, Vote No. 5, be inserted in the Schedule", put, and agreed to.*

*Head 125, Vote 5, ordered to stand part of the Schedule.*

6 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම, රු. 3,07,000

வாக்குப்பணம் இல. 6.—பொருளாதார அபிவிருத்தி—மீண்டுவருஞ் செலவு, ரூபா 3,07,000

*Vote No. 6.—Economic Development—Recurrent Expenditure, Rs. 307,000*

" 125 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය සඳහා රු. 3,07,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

125 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

" 125 ஆம் தலைப்பு, 6 ஆம் வாக்குப்பணம் ரூபா 3,07,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக " எனும் வினு விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

125 ஆம் தலைப்பு, 6 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 307,000 for Head 125, Vote No. 6, be inserted in the Schedule", put, and agreed to.*

*Head 125, Vote 6, ordered to stand part of the Schedule.*

7 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම, රු. 4,00,000

வாக்குப்பணம், இல.7.—பொருளாதார அபிவிருத்தி—ஆக்கப்பொருட் செலவு, ரூபா 4,00,000

*Vote No. 7.—Economic Development—Capital Expenditure, Rs. 400,000*

" 125 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය සඳහා රු. 4,00,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

125 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

" 125 ஆம் தலைப்பு, 7 ஆம் வாக்குப்பணம் ரூபா 4,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக " எனும் வினு விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

125 ஆம் தலைப்பு, 7 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 400,000 for Head 125, Vote No. 7, be inserted in the Schedule", put, and agreed to.*

*Head 125, Vote 7, ordered to stand part of the Schedule.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**134 වන ශීර්ෂය.—කෘෂිකර්ම හා ආහාර අමාත්‍යවරයා**

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 4,73,969**

*134 ஆம் தலைப்பு.—உணவு விவசாய அமைச்சர்*

வாக்குப்பணம், இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூ. 4,73,969

HEAD 134.—MINISTER OF AGRICULTURE AND FOOD

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 473,969*

සභාපති
*(அக்கிராசனர்)*
(The Chairman)

I would remind hon. Members that there are 47 Members who have sent in their names.

We have only 7½ hours available and the Hon. Minister will want at least 1½ hours. So, I would request the co-operation of hon. Members and ask that each Member takes if possible, ten minutes.

රත්නායක මයා.
*(திரு. ரத்நாயக்க)*
(Mr. Ratnayake)

"වැය සම්මතය රුපියල් 10කින් අඩු කළ යුතුය" කියා මා යෝජනා කරනවා.

කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව කතා කරනන්ටත් මත්තෙන් ගරු සභාපතිතුමාගෙන් අසන්නට ලැබුණා, අපේ කථා හැකි පමණ කෙටි කළ යුතුය කියා. මා එතුමාගේ නියෝගය අනුව ක්‍රියා කරන්නට බලාපොරොත්තු වෙනවා.

මෙම අමාත්‍යාංශය යටතේ කරුණු රාශියක් කියන්නට තිබෙතත් මගේ කථාවේදී ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වන්නේ කෘෂිකර්මයට අදාල කරුණු පමණයි. විශෙෂයෙන් ගරු අගමැතිතුමාත් කෘෂිකර්ම ඇමතිතුමාත් මේ රටේ ආහාර නිෂ්පාදනය පිළිබඳව විශාල සටනක යෙදී සිටින බව පෙනී යනවා. මෙම ආහාර නිෂ්පාදනය පිළිබඳව කතා කරන විට ඇතැම් දෙනා වැරදි හැඟීම් ඇති කරගෙන විරුද්ධ පාර්ශ්වයේ උදවිය වෙත චෝදනා එල්ල කරන බව පෙනී යනවා. විශෙෂයෙන් මෑතදී සිදු වන්නට යන බණ්ඩාරගම අතුරු මැතිවරණ කටයුතුවල යෙදී සිටින උදවිය එම රැස්වීම්වලදී මේ පිළිබඳව කතා කර තිබෙන බව පෙනී යනවා. ඇතැම් ගරු ඇමතිවරුන් පවා ප්‍රකාශ කර තිබෙනවා, ආහාර නිෂ්පාදනය පිළිබඳව ගරු අගමැතිතුමා ගෙන යන වැඩ පිළිවෙළ සාර්ථක වුව හොත් විරුද්ධ පාර්ශ්වයේ අයට මතුවට තැනක් ලැබෙන්නේ නැති නිසා එම වැඩ පිළිවෙළ කඩාකප්පල් කරන්නට ඒ උදවිය වැඩ කරනවාය යනුවෙන්. කුමන පැත්තක සිටියත් අප අවිවාදයෙන්ම පිළිගන්නවා, කෘෂිකර්ම රටක් වන ලංකාව නගා සිටුවන්නට නම් කෘෂිකර්මය දියුණු කරන්නට වුවමනා බව. එම වැඩ පිළිවෙළට අපගේ සහයෝගය ලැබෙන බව මෙම අවස්ථාවේදී මා ප්‍රකාශ කර සිටිනවා.

කෘෂිකර්ම කටයුතු දියුණු කිරීම සඳහා වැඩ කරගෙන යන බව පෙනෙන මෙම අවස්ථාවේදී කෘෂිකර්ම ප්‍රදේශයක මන්ත්‍රීවරයකු වශයෙන් උතුරු මැද පළාතට දැනට මුහුණ පාන්නට සිදු වී තිබෙන ප්‍රශ්න කීපයක් පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට මා කැමතියි. විශෙෂයෙන් වයඹ හා උතුරු මැද පළාත් පිළිබඳව ගරු ඇමතිතුමාටත් අව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නායක මයා.]

බෝධයක් තිබෙනවායැයි මා සිතනවා. විශේෂයෙන් එම ප්‍රදේශයේ කෘෂිකර්ම කටයුතු නගා සිටුවන්නට උත්සාහ දරන උදවියට විඳින්නට සිදු වී තිබෙන කරදර හිරිහැර පිළිබඳව වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට ඕනෑ. මගේ හැඟීමේ හැටියට කෘෂිකර්මය නගා සිටුවීම සඳහා ගරු අගමැතිතුමාත් කෘෂිකර්ම ඇමතිතුමාත් ගෙන යන වැඩ පිළිවෙළට යම් බාධාවක් තිබෙනවා නම් එම බාධාව තියෙන්නේ විරුද්ධ පාර්ශ්වයේ සිටින අපෙන් නොව එතුමාගේම පක්ෂයේ සිටින වාරිමාර්ග කටයුතු භාර ගරු ඇමතිතුමාගෙන් බවයි, කියන්නට තිබෙන්නේ. ගරු අගමැතිතුමාත් කෘෂිකර්ම ඇමතිතුමාත් කොතෙක් දුරට ප්‍රයත්න දැරුවත් එතුමන්ලා බලාපොරොත්තු වන ඉලක්කය කරා කවදාවත් යන්නට ලැබෙන්නේ නැහැ, මේ රටේ වාරිමාර්ග ප්‍රශ්න විසඳන තුරු. ඒ බව මා ගිය අවුරුද්දේ මෙන්ම මේ අවුරුද්දේත් කියා සිටිනවා.

උතුරුමැද පළාතේ අක්කර ලක්ෂ ගණනක්ම තිබෙන්නේ මහ ජනපද ව්‍යාපාර—major colonization schemes—යටතේ බවයි, කියන්නට තිබෙන්නේ. එම නිසා ඒ ව්‍යාපාරවල වාරිමාර්ග ප්‍රශ්න නිසිපරිදි නිරාකරණය කිරීම සඳහා රජයේ අවධානය යෙදිය යුතු බව මා තරයේම කියා සිටිනවා. ඒවාගේම සුළු වාරිමාර්ග ව්‍යාපාර අද පවතින්නේ කෘෂිකර්ම ඇමතිතුමා භාරයේ තිබෙන ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව යටතේයි. උතුරු මැද පළාතේ මෙම සුළු වාරිමාර්ග ක්‍රම—වැව් යනාදිය—සිය ගණනක් තිබෙනවා. ඒවායේ පවතින්නේ ඉතාම කනගාටුදායක, දුර්වල තත්ත්වයක්. දැන් වැව් කණ්ඩි නියම විධියට නඩත්තු කරන්නේ නැහැ. එක වැවකින් අනෙක් වැවට එන ජලය අපතේ නොයන විධියට ක්‍රියා කරන්නේ නැති බව සඳහන් කළ යුතුව තිබෙනවා. ඊට හේතුව සමහර විට ගොවීන්ගේ වැරදි වන්නට පුළුවනි.

ඉස්සර කාලයේ පැවති රාජකාරි ක්‍රමය යටතේ සුළු වැව් නඩත්තු කිරීම සම්බන්ධයෙන් වර්ෂයක් වර්ෂයක් පාසා ගොවීන් විසින් කැළෑ සුද්ධ කිරීම සහ පස් වැඩ කිරීම කළ යුතුව තිබෙනවා. එහෙත් දැන් ඒවා නිසියාකාරව කෙරෙන්නේ නැහැ. ඊට හේතුවක් තිබෙනවා. වාරිමාර්ග දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් සාකච්ඡා කරන අවස්ථාවේදී මා කීවාක් මෙන්, මේ වාරිමාර්ග ප්‍රශ්නය නිරාකරණය කර ගොවිතැන සාර්ථක කරන්නට නම් වාරිමාර්ග නීතිරීති—"ඉරිගේෂන් ඕඩිනන්ස්"—නැවතත් සකස් කරන්නට සිදු වී තිබෙනවා. හුඟ දෙනකු ඒ වාරිමාර්ග නීතිරීති උල්ලංඝනය කරන බව අපට පෙනී ගොස් තිබෙනවා. ඒ ඒ කන්නයට නියම විධියට වැඩ නොකරන්නට දැන් ගොවීන් පුරුදු වී තිබෙනවා. ඊට හේතු රාශියක් තිබෙනවා. ඒ හේතු පසුවට ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. එම නිසා මාස් කන්නයේ ඒ ඒ කාල සීමාවටත්, යල් කන්නයේ ඒ ඒ කාල සීමාවටත් වැඩ කරන්නට ගොවීන්ට පුළුවන් තරම් අත-හිත දිය යුතු බව මතක් කරන්නට කැමතියි.

අළුතින් ඉඩම් සංවර්ධනය කිරීම උදෙසා සමහර විට ගොවීන් තුන් හතර දෙනා එකතු වී, තමන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා සුළු සුළු වැව් දියුණු කිරීම නිසා අක්කර 80-90 තිබෙන අවුරුදු සිය ගණනක සිට පැවත එන වැව් වලට බාධා ඇති වී තිබෙනවා. එම නිසා ඇමතිතුමා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට තරයේම අවවාද කරන්නට ඕනෑ, වැඩ කරන යම්කිසි වැවකට වතුර ලබා ගන්නා උඩින් තිබෙන වැවකට අතරතුර තිබෙන වැව් දියුණු කරන්නට එපාය කියා. සමහර අය ඒ වැව් දියුණු කරන නිසා,

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

රජයේ වැව් ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**රත්නායක මයා.**

*(திரு. ரத்நாயக்க)*

(Mr. Ratnayake)

රජයේ වැව්. විශාල වර්ෂාවක් ඇවිත් පොඩි වැව කඩාගෙන ඒ ජල පාර එක පාරටම පහතින් තිබෙන පුරාළ වැවට එන විට පුරාළ වැවත් කඩාගෙන යනවා. එම නිසා වැව් නඩත්තු කිරීම සම්බන්ධයෙන් විශේෂයෙන් කටයුතු කරන්නට ඕනෑ.

ගොවීන්ගේ තවත් සිරිතක් තිබෙනවා. එනම් වාන් හරස් කිරීමයි. එයත් සම්පූර්ණයෙන්ම නවත්වන්නට ඕනෑ. වාරි මාර්ග දෙපාර්තමේන්තුවෙන් "ලෙවල්" අරගෙන වාන් ඇති කර තිබෙන්නේ ඉඩම් ප්‍රමාණයට ප්‍රමාණවත් වතුර රඳවා ගෙන, වැඩි වතුර වාන් මඟින් යැවීමටයි. ඒ වාන් හරස් කළාම ඒ ඒ වැවට හානි වෙනවා පමණක් නොව, ඒ ඒ වැවට උඩින් පොඩි වැව් තිබෙන ඉඩම් ප්‍රමාණය පවා සම්පූර්ණයෙන් ජලයෙන් යට වෙනවා. එම නිසා, වැව් නඩත්තු කිරීම සම්බන්ධයෙන් මීට වඩා දැඩි පියවරක් ගැනීම සඳහා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට කැමතියි.

ගම් සභා උසාවිවල නඩුකාරයන් නිසා මේ වැව් නඩත්තු කිරීමේදී ගොවි මණ්ඩල වලට විශාල හිස රදයක් ඇති වී තිබෙන බව, කෘෂිකර්ම රැස්වීමේදීත් මා කී බව ඇමතිතුමාට මතක ඇති. මා ඒ නඩුකාර යන්ට පෞද්ගලික දෝෂාරෝපණයක් කරනවා නොවෙයි. නීතිය ගැන කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. ගම් සභා උසාවිවල ඉන්නා නඩුකාර මහතුන් සාමාන්‍යයෙන් නීතිය ගැනම බලනවා මිසක්; ඒ ප්‍රදේශයේ තත්ත්වය, ගොවීන්ගේ සිරිත්-විරිත් ආදිය ගැන කොහෙත්ම කල්පනා කරන්නේ නැහැ. කුඹුරු පනත යටතේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මඟින් පත් කර තිබෙන ගොවි මණ්ඩලවලට, වැව් නඩත්තු කිරීම සම්බන්ධයෙන් ගොවීන් විසින් කළ යුතු සුළු වැඩ හෝ පස් වැඩ හෝ නොකරන අවස්ථාවලදී ගොවීන්ට විරුද්ධව නඩු දමන්නට සිදු වෙනවා. ඒ නඩු කලට වේලාවට අහන්නේ නැති නිසා, නඩු තීන්දු නොලැබෙන නිසා ගොවි මණ්ඩලවල නියෝජිත මහතුන්ට විශාල හිස රදයක් ඇති වී තිබෙනවා.

ගොවි මණ්ඩලවල නියෝජිත මහතුන්ගේ කාල සීමාව අවුරුදු 3යි. ගොවි මණ්ඩල මඟින් ගොවීන්ට විරුද්ධව පවරා තිබෙන නඩු සමහර ගම් සභා උසාවිවලින් අසන්නට පටන් ගන්නේ, ඒ ගොවි මණ්ඩලවල නියෝජිත මහතුන්ගේ කාල සීමාව අවසාන වුණාටත් පසුවයි. ඒ නිසා නඩුව ඔප්පු කරන්නටත් අමාරු වෙනවා. එම නිසා ඒ සම්බන්ධයෙන් දැඩි පියවරක් ගෙන, කලින් කීවා වාගේ වාරිමාර්ග නීතිරීති සකස් කරන අවස්ථාවේදී, සුළු වැඩ හෝ පස් වැඩ හෝ නොකරන අය සම්බන්ධයෙනුත්, ඒ මුදල් ගොවීන්ගෙන් ලබා ගැනීම සම්බන්ධයෙනුත් ගම් සභා උසාවි වලට නොගොස් අවශ්‍ය කටයුතු කිරීම ගොවිජන සේවා සහකාර කොමසාරිස් වරුන්ටම පවරනවා නම් හොඳ බවයි, මගේ හැඟීම. ඒ ගැන ගරු ඇමතිතුමා සළකා බලන්ට ඕනෑ.

ඊළඟට ගොවිතැන ගැන වචනයක් දෙකක් කියා මගේ කථාව අවසාන කරන්ටයි, බලාපොරොත්තු වෙන්නෙ. වතුර ප්‍රශ්න ගැන මම කිව්වා. ගොවිතැන් කිරීමට අවශ්‍ය මූලික කරුණු රාශියක් තිබෙනව. වතුර ලැබුණායින් පසුව කුඹුරු කරන්ට ගියාම දැන් උතුරු මැද පළාතේ අපට විශාල හිසරදයක්ව තිබෙන්නෙ සීසෑමට අවශ්‍ය මීහරකුන් නැති කමයි. සීසෑමට සිටි හරකුන් කළු මස්කඩකාරයන් හොරෙන් ගෙන ගොස් විකිණීම නිසා අපට අද සී සාගන්න විධියක් නැතිව ගොස් තිබෙනව. සාමාන්‍යයෙන් සීසාන ගවයන් හීළෑ කීකරු සතුන් නිසා—වැඩි දඟකාරයින් නොවෙයි —උන් අල්ලා ගැනීමත් ලෙහෙසියි. දවල් තිස් පැයේ කුඹුරු වැඩ කරල, රෑ තිස් පැයේ පාරබඩ හෝ වැවක කකා ඉන්න කොට ලොරිකාරයන් වැව්වල තිබෙන හුඹ හකට ලොරි රිවර්ස් කරල උන් පටවාගෙන යනව, එම නිසා ඒ කාරණය ගැන මේ ගරු සභාවේත්, ඇමතිතුමාගේත් අවධානය යොමු කරමින්, ගොවිතැන් කටයුතු සඳහා යොදවා ගන්න මීහරකුන් මසට විකිණීම සම්පූර්ණයෙන්ම තහනම් කරන අතර, මේ හරකුන් ලොරිවලින් එක් ප්‍රදේශයක සිට වෙනත් ප්‍රදේශයකට ගෙන යාමත් තහනම් කරන ලෙස ඉල්ලා මා පෞද්ගලික



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නායක මයා.]

යෝජනාවක් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. ඒ ගැන දන් ඇමතිතුමා ක්‍රියා කර ගෙන යන බව කෘෂිකර්ම කමිටුවෙදි කිව්ව. ඒ සම්බන්ධයෙන් යම් යම් අවහිරතාම් තිබෙන්න පුළුවන්. ඒවා ඉක්මණින් මග හැරගෙන මේ කටයුත්ත ඉක්මණින් කර නවා නම් හොඳය කියා මා අදහස් කරනව.

ඊළඟට ට්‍රැක්ටර් ප්‍රශ්නය උතුරු මැද පළාතට විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනව. මේ රජය ප්‍රතිපත්තියක් වශයෙන් පෞද් ගලික ආයතනවලට ට්‍රැක්ටර් ගෙන්වීමේ බලය දී තිබෙනව. ඒ ගැන අපි විරුද්ධ වෙන්නෙ නැහැ. එහෙත් පෞද්ගලික ආයතනවලට මේ බලය දෙන අතරම රජ යේ ට්‍රැක්ටර් මධ්‍යස්ථාන බඩ ගින්නේ තබන්ට එපා කියායි මම ඉල්ලා සිටින්නෙ. පෞද්ගලික සමාගම්වලට රුපියල් ලක්ෂ ගණන් විදේශ විනිමය වෙන් කරදී, ට්‍රැක් ටර් ගෙන්වන අතර රජයේ ට්‍රැක්ටර් ආයතනවලට ට්‍රැක්ටර් ගෙන්වීම සම්පූර්ණ යෙන්ම අතපසු කර තිබෙන බව පෙනී යනව. මගේ හැඟීමේ හැටියට අපි දනට පාවිච්චි කරන්නෙ ට්‍රැක්ටර් වර්ග තුනයි. "ෆෝඩ්සන්" වර්ගය එයින් එකක්. අපේ සෙනෙට් මන්ත්‍රී එන්. එම්. අප්පුහාමි මහත්මයාගේ සමාගම; "සත්‍යවාදී මෝටර්ස්" තමයි, මා හිතන්නේ ඒකෙ ඒජන්තවරු. තවත් "ඉන්ටර්නැෂනල්" කියන වර්ගයත්, බ්‍රවුන් සමාගම ගෙන්වන "පර්ගියුසන්" වර්ගයත් යන තුන් වර්ගය තමයි, අපේ රටේ වැඩි වශයෙන් භාවිත වෙන්නෙ. සාමාන්‍යයෙන් රජයේ ආයතන යක ට්‍රැක්ටරයකින් කුඹුරු අක්කරයක් දෙවරක් සෑමට අපි වියදම් කළේ රුපියල් 54 යි. එහෙත් පෞද්ගලික ආයතනවල ට්‍රැක්ටරයකට ඒ සඳහා රුපියල් 70 ක් විතර ගෙවන්නට සිදු වෙනව. එම නිසා ට්‍රැක්ටර් ගාස්තු සම්බන්ධයෙන් රජය යම් කිසි නියමයක් කරනවා නම් ඉතාමත් යෝග්‍ය බව මා කියනව.

අ. භා. 3.30

ට්‍රැක්ටරයක් මෙරටට ගෙන්වීමේදී වැඩිම වුණොත් රුපියල් 7,000 කට 8,000කට වඩා මිළ වෙන්නෙ නැහැ. එහෙත් විකුණන්නෙ රුපියල් 15,000; නැත්නම් 16,000 යි. එක ට්‍රැක්ටරයකින් රුපියල් 8,000 ක තරම ලාභයක් ඒවා ගෙන්වන සමාගම්වලට තිබෙනව. කෘෂිකර්මය නගා සිටුවීම සඳහා රජයේ විශේෂ වරප්‍රසාද යටතේ ගෙන්වනු ලබන මෙම ට්‍රැක්ටර්වලින් එකකින් රුපියල් 8,000 ක තරම විශාල ලාභයක් කොම් පැනිවලට නොලැබෙන අන්දමට ඔවුන්ට රුපියල් දෙතුන් දහක ලාභයක් පමණක් ලබා ගැනීමට හැකිවන අන්දමේ වැඩ පිළි වෙළක් යොදන්න බැරිද කියා මා කෘෂිකර්ම ඇමතිතුමාගෙන් අහනව. එසේ නැත්නම් කෙලින්ම රජය මගින් ගෙන්වා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් බෙදා හැරී මේ වැඩ පිළිවෙළක් හෝ විවිධ සේවා සමුපකාර සමිති මගින් බෙදා හැරීමේ වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස මා ඉල්ලා සිටිනව. එසේත් නැතිනම් මේ ට්‍රැක්ටර් ගෙන්වා සාධාරණ ලෙස බෙදා හැරිය හැකි යම්කිසි පුද්ගලයකු සිටිනවා යයි තමුන් නාන්සේට වැටහෙනවා නම්, ඔහුට මේ වැඩය භාර දෙන්න කියන එකයි, මගේ ඉල්ලීම.

ඊළඟ කාරණය, මේ ට්‍රැක්ටර් ලබා ගැනී මේ වරප්‍රසාදය තමුන්නාන්සේගෙන් ලබා ගත් ඇතැම් පුද්ගලයින් මේ ට්‍රැක්ටර් කුඹුරු වැඩට යොදන්නෙ නැතිව බඩු ඇදීම සඳහා පාරවලට දමන බව මතක් කරන්ට ඕනෑ. ඒ නිසා මා යෝජනාවක් ඉදිරිපත් කරනවා. එය ක්‍රියාත්මක කරන්නට පුළු වන්ද බැරිද කියා මා දන්නේ නැහැ. නොයෙක් නොයෙක් වරප්‍රසාද යටතේ කෘෂිකර්මය උදෙසාම ගෙන්වන ට්‍රැක්ටර් ඇතුළු වෙනත් යන්ත්‍ර හා රථවාහනවලට විශේෂ අංක දීමේ ක්‍රමයක් ආරම්භ කරන් න. එසේ විශේෂ අංක දුන්නොත් කෘෂි කර්මය උදෙසා ගෙන්වූ මේ රථවාහන වෙනත් කටයුතුවලට යොදවන විට දන ගන්නට පුළුවන් වෙනවා. එවිට දෙපාර්ත මේන්තුවේ නිලධාරීන්ට ඒ රථවාහන හිමි යන්ට විරුද්ධව කටයුතු කරන්නට පුළු වන් වෙනවා. එවැනි වැඩ පිළිවෙළක් සකස් කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

ට්‍රැක්ටර් මේ රටට ඉතාම අවශ්‍යයි. ආහාර නිෂ්පාදනය වැඩි කරන්නට රජය මගින් ගොවියාට නොයෙකුත් පහසුකම් සලසා දී තිබෙනවා. මුදලාලිලාට යට නොවී වැඩ කරන්නට ගොවියාට රජයෙන් පහසු වට ණය මුදල් දෙනවා. වල් නෙලීමේ වැඩ කරන්නට උගන්වනවා. ඒ වාගේම නෙලා සිටුවීමේ ක්‍රමය උගන්වනවා. නවීන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ක්‍රමානුකූලව පිරිසිදු බිත්තර වී, පොහොර, යනාදිය පාවිච්චි කරන්නට උගන්වනවා. ඔය ආදී වශයෙන් රජයෙන් ගොවියාට නොයෙකුත් ආධාර හා පහසුකම් සලසා දී තිබෙනවා. හැම ආණ්ඩුවකින්ම ගොවියාට ඒ සහනය සැලසුණා. මේ ආණ්ඩුවත් ගොවියාට එපරිද්දෙන් ආධාර කරනවා. නමුත් මා වරක් සඳහන් කළ අන්දමට සීසෑම නියම විධියට නොකළොත්, බලාපොරොත්තු වන අස්වැන්න ලබා ගන්නට පුළුවන් වන්නේ නැහැ. එම නිසා ආහාර වගා කිරීමේදී පළමුවෙන්ම ඒ කාරණය ගැන සැලකිලිමත් විය යුතුව තිබෙනවා. ගොවිතැනට ජලය සැපයීමත්, ජලය සැපයුවාට පසුව නියම විධියට සීසෑමත් යන දෙකරුණ ගැන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අවධානය යොමු කළ යුතුයි.

ඊළඟට, කුඹුරු පනත යටතේ අද ගොවියාට මුහුණ පාන්නට සිදුව තිබෙන ප්‍රශ්නයක් දෙකක් ගැන මා කථා කරන්නට අදහස් කරනවා. කුඹුරු පනතින් අදහස් කළේ අද ගොවියාට යහපතක් සැලසීමයි. නමුත් අද කුඹුරු පනතින් ගොවියාට යහපතක් වෙනුවට අයහපතක් සැලසී තිබෙන බවයි පෙනෙන්නෙ. සමහරු අපට මේ තත්ත්වය ගැන දෙස් පවරනවා. කුඹුරු පනත ඇති කළේ බණ්ඩාරනායක ආණ්ඩුව තිබුණු කාලයේ දීයි. කුඹුරු පනත නොමනා විධියට පාවිච්චි කරමින් අද ඉඩම් හිමියන් අද ගොවීන්ට කරදර කරනවා. ඒ පිළිබඳව මේ අවස්ථාවේදී උදාහරණයක් දෙකක් පෙන්වන්නට මා අදහස් කරනවා.

කුඹුරු පනතේ හැටියට යම්කිසි අද ගොවියකු තමා වැඩ කරගෙන යන ඉඩමෙන් ඉඩම් හිමියා විසින් දොට්ට දමනු ලැබුවහොත් විභාගයක් පවත්වා ඒ පිළිබඳව අවසාන තීරණයකට එළඹෙන තුරු ගොවි ජන සේවා කොමසාරිස්තුමා ඒ ඉඩමේ මුලින් වැඩ කළ අද ගොවියාටම දිගටම වැඩ කරගෙන යන්නට ඉඩ සලසා දිය යුතුය යනු මගේ හැඟීමයි. 1963-64 මාස් කන්නයේදී තිසාවැව මඩහොරුව යටතේ කුඹුරු වැඩ කළ එච්. එම්. ඩී. ඩිංගිරි බණ්ඩා නම් ගොවි මහත්මයෙක් නඩරාජා නම් මහත්මියකට අයත් කුඹුරකින් බලහත්කාරයෙන් දොට්ට දමනු ලැබුවා. එහෙත් ඒ ගොවි මහත්මයා අවුරුදු ගණනාවක් තිස්සේ ඒ කුඹුර වැඩ කරගෙන ආවා. 1963-64 මාස් කන්නයේදී ඩිංගිරි බණ්ඩා මහත්මයා දොට්ට දැමුවා. එදා සිටම මේ ගොවි මහතා රජයට කරුණු ඉදිරිපත් කරනවා. දැන් මේ මහත්මයා අවුරුදු 60 ක පමණ මහල්ලෙකු වී සිටිනවා. දැන් අවුරුදු ගණනාවක් තිස්සේම මේ නඩුව පවතිනවා. එහෙත් ගොවි ජන සේවා සහකාර කොමසාරිස්තුමාටවත් ප්‍රධාන කාර්යාලයේ කොමසාරිස්තුමාටවත් ඒ කාරණය පිළිබඳව මේ දක්වා කිසිම දෙයක් කරන්නට නුපුළුවන් වී තිබෙනවා. දැන් අවුරුදු ගණනාවක් ගත වී තිබෙනවා. ඒ මනුෂ්‍යයා ගිය සතියේත් මා හමු වන්නට පැමිණියා. මෙවැනි කරුණුවලට ගරු ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු විය යුතුයි.

ඒ මනුෂ්‍යයා දිගටම ඒ කුඹුරේ වැඩ කරගෙන ආ බව කවුරුත් දන්නවා. මේ ඉඩම දියුණු කළෙත් ඒ මනුෂ්‍යයායි. නමුත් අද ඔහුට තැනක් නැහැ. ඔහු පන්නා දමා දැන් මේ ඉඩම කන්නයෙන් කන්නය නොයෙක් නොයෙක් පුද්ගලයන්ට භාර දී බලහත්කාරයෙන් වැඩ කරගෙන යනවා. මේ පිළිබඳව ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවට මේ දක්වා කිසිවක් කරන්නට නොහැකි වී තිබෙනවා.

තවත් එවැනි සිද්ධියක් ගැන මා මතක් කරනවා. ඒ කුඹුරත් තිසාවැව මඩහොරුව යටතේ වැඩ කරන කුඹුරක්. දාවිත් සිල්වා නමැති මහත්මයකුට අයිති මේ කුඹුර එස්. පොන්නයියා නමැති ගොවි මහතා අවුරුදු ගණනාවක් තිස්සේ වැඩ කරගෙන ආවා. මේ මාස් කන්නයේදී ඒ කුඹුරේ බදුකාරයා වෙනස් වුණා. දාවිත් සිල්වා මුදාලාලිගෙන් කුමාරස්වාමි නමැති තැපැල් කන්තෝරුවේ නිලධාරියකු ඒ කුඹුර බද්දට ගෙන පොන්නයියා ඉවත් කොට බලහත්කාරයෙන් එය හෑවා. පොන්නයියා මට මේ ගැන අවුත් කී විට මා සහකාර ගොවිජන සේවා කොමසාරිස්තුමා මුණ ගැසී කුඹුරු පනත යටතේ ක්‍රියා කරන ලෙස මතක් කළා. කුඹුරු පනතේ නීති රීති යටතේ පොන්නයියාට මෙම කුඹුර වැඩ කරන්නට ඉඩ දෙන්නැයි මතක් කළා. එවිට ඒ සහකාර කොමසාරිස්තුමා ඒ ගැන පොලීසියට ලිපියක් යැව්වත්,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නායක මයා.]

දැන් පොලීසිය ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්නේ නැතැයි කියමින් නිශ්ශබ්දව සිටිනවා. කුමාරස්වාමි මහතා බලහත්කාරයෙන් සී සා වැඩ කරන ලද මෙම කුඹුරෙහි අස්වනු කපා ගන්නටත් දැන් කිව්වුයි. මේ වාගේ කරුණු රාශියක් තිබෙනවා. මේ ටික මතක් කෙළේ උදාහරණ වශයෙන් පමණයි. මේවා ගැන දැඩි පියවරක් ගත යුතුයි. කුඹුරු පනත යටතේ ක්‍රියා කරන ලෙස ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට නියෝග කරන්න. අනුරාධපුරයේ කුමාරස්වාමි, පොන්නයියා හබය අවසන් වනතුරු ඒ කුඹුරේ අස්වැන්න සහකාර ගොවිජන සේවා කොමසාරිස්තුමා භාරයේ තබා ගන්නා ලෙසද නියෝගයක් කරන්නට ඕනෑ.

කෘෂිකර්ම ප්‍රශ්න ගැන කථා කරන්නට නම් කරුණු රාශියක් තිබෙනවා. එහෙත් කථිකයන් බොහෝ දෙනකු කථා කරන්නට සිටින නිසා මගේ කථාව මීට වඩා දීර්ඝ කරන්නට අදහස් කරන්නේ නැහැ. කෘෂිකර්මය නගා සිටුවීම සඳහා ගරු ඇමතිතුමා ගන්නා පියවරවලට අපේ සහාය ලැබෙනවා. ඒ නිසා මේ සඳහන් කරන ලද කාරණා ගැන අවධානය යොමු කොට මේවා ගැන ක්‍රියා කරන ලෙස අනුරාධපුරයේ සිටින නිලධාරීන්ට නියෝග කරන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**එස්. එම්. මානික්කරාජා මයා.** (ත්‍රිකුණාමලය)

*(திரு. எஸ். எம். மாணிக்கராஜா—திருகோணமலை)*

(Mr. S. M. Manickarajah—Trincomalee)

Today we are dealing with the Votes of a Ministry that means very much to the country. The Hon. Minister has been working very hard and has been initiating the food drive with great vigour in order that we may produce more food in this country.

I must say with satisfaction that the food drive in my area, in the Trincomalee District, is extremely satisfactory. In the last cultivation season, the quantity of paddy purchased was six times more than was anticipated, and with the Government Agent taking a keen interest and with the help of the Assistant Government Agent, the land development officers and the district revenue officers, who are all very energetic officers, the Maha crop is expected to be a great success.

The work of food production can be made even a greater success if the Hon. Minister could take the Irrigation Department under his wing. Irrigation facilities provided to most of the farmers are not satisfactory. I will give one instance in support of what I say. Educated youth were asked to cultivate a piece of land. The tank had not been restored. No channels had been cut. From 1963 up to now the tank has not been restored. Despite that the farmers have attempted to cultivate the land depending solely on rain water, and they have failed. The paddy fields on one side of the tank failed completely because the water rushed from the tank and washed away all the crops just at the time they were ripe for harvesting. I earnestly ask the Hon. Minister to issue instructions that the Mudaliyarkulam be restored forthwith and see that the channels are cut so that these educated youths could cultivate the land.

Repeated failures at paddy cultivation might drive these educated youths to do dry-farming, but here again they have no capital to do so. It is very necessary therefore that the work of the food drive should be co-ordinated with the work of the Irrigation Department. Without proper irrigation, nothing can become a success. There are a large number of tanks to be restored in my area, and action should be taken to restore these.

Rural development societies, one by one, are coming forward to try to restore these tanks, and I hope that very soon, with the drive that the Government Agent and his officers are putting into their work, we will be able to achieve great success.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Just as much as I say that the Irrigation Department should come under the purview of the Hon. Minister so that he could make a greater success of the food drive, I must earnestly ask him to give over the Department of Co-operative Undertakings to some other Ministry. He will remember that on the Floor of this House he said last year that he would take immediate steps to rectify the malpractices in the co-operative societies. Now one year has passed. Both sides of the House are having numerous grievances about the management of co-operative societies. In my area a number of societies have failed and lakhs and lakhs of rupees are outstanding to the unions, but nothing is happening. They are not being liquidated.

The members of the societies continue to exercise their vote, and they vote their favourites into the committee. The same state of affairs as existed is still prevailing today. In the co-operative union we have three members who are strictly not eligible to be members of the committee. The Assistant Commissioner of Co-operative Development has reported that matter to the Commissioner of Co-operative Development. He has taken no action whatsoever to see that those three members are removed.

Take the co-operative bank. The secretary of the co-operative bank owes the society Rs. 53,000. No action has been taken to recover that amount. He is still a member. For the last four years no annual general meeting has been held in the co-operative bank, and the same board is still managing the affairs of the bank.

Not only that, that particular secretary, who is an ex-chairman of a village committee, has misappropriated a sum of Rs. 11,000. The Commissioner of Local Government is taking steps to recover that. And this is the man who is the secretary of the co-operative bank. This is the man to whose care the agricultural credit scheme will be entrusted. Nearly Rs. 8 million will be handled by the co-operative board consisting of people of this type.

Last year there was a strike which lasted over two months. The Minister of Labour has been kind enough to settle that.

ප. භා. 3.45

Did the Co-operative Department see to it that the findings were implemented ? No. They had to go to courts and even today the cases are pending. The co-operative bank has already spent more than Rs. 20,000 on lawyers' fees. Here is a body which comes to an agreement with the Minister of Labour and refuses to carry it out. Surely the Co-operative Department must take steps to rectify this state of affairs. What is happening today ? For the last 53 days that bank is on strike and no settlement has been brought about. I have before me the report of the A. C. C. D. of that place. In the final paragraph of his report he says :

> "In my opinion there is sufficient justification for the interdiction of the Manager M. Pathmanathan for the loss of keys and falsification of accounts and fraudulent manipulation of the books of account of the Bank and three cheques drawn in May, 1967 referred to at page 2 of the People's Bank report."

This manager is keeping at bay the workers there and ruling them like a monster. He is not afraid of any authority because neither the Minister nor the Co-operative Department is taking any steps whatsoever. I am credibly informed that the lack of interest in seeing that justice is done is entirely due to certain pressures exercised by certain senior members of his party who are taking sides with the board of management.

I regret to say that if this state of affairs is allowed to continue, very soon there will be chaos in the bank.

I also wish to ask you, how are you going to run the credit scheme through the co-operative bank when 99 per cent. of the personnel are on strike ? Are you going to allow this

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මානික්කරාජා මයා.]

board, having as its secretary this person whom I have described to handle this big sum of money with temporary clerks employed ? Do you think that the money will reach the cultivators at the proper time or the money will reach them at all ? It is a great responsibility that you have to shoulder. I am asking you to take immediate steps in regard to this matter.

I understand from the Minister of Labour that you have recommended a certain course of action to be taken by the Commissioner of Co-operative Development. But so far nothing has been done. As soon as possible this strike must be settled and the money must be given to the co-operative bank to distribute it to the farmers at the proper time.

As I said before, in regard to the granting of loans or overdrafts to the different societies, I have a list here with me : Abeypura M.P.C.S. Union—Rs. 14,000 ; Port Workers' Union Rs. 175,000 ; Credit Societies Rs. 80,000 ; Trinco Builders Rs. 150,000 ; and the Kantalai M.P.C.S. Union Rs. 120,000. All these monies have been given for the sole purpose of getting votes and in order to be elected as members of the board or as chairman of the board. These amounts are not recoverable ; all these are losses sustained by the bank due to no fault of the members of the co-operative. This is because no proper supervision has been exercised by the Co-operative Department.

සභාපති

(அக்கிராசனர்)

(The Chairman)

I might remind the hon. Member that at the beginning I said there were 47 Members to speak, and I would like his co-operation in not speaking for more than ten minutes.

මානික්කරාජා මයා.

(திரு. மாணிக்கராஜா)

(Mr. Manickarajah)

There is another defect in the co-operative movement in Trincomalee. It is a case of father and son or father and uncle or uncle and uncle in these different boards, and no less a person than Hon. Dr. H. W. Thambiah, Q.C., in a case from Trincomalee, made these observations in one of his judgments:

"The practice whereby directors of co-operative establishments appoint their relatives as managers and other employees in these establishments should be changed. It is due to this practice that today we are having the unfortunate situation where the co-operative movement is full of rackets and corruption.

I therefore recommend to the Ministry concerned to bring in speedy legislation so that this movement would be made the property of the public instead of it being made the sole monopoly of certain families.

You may say that these people were democratically elected to different boards and associations, but they were not democratically elected because while you are having societies with so much of defalcations in their hands, you are yet giving facilities to them to vote at these elections. If proper steps are taken to see that these societies are liquidated and fresh societies are formed in their place, surely this state of affairs will not occur.

I hope the Hon. Minister will take immediate steps to see that some sort of settlement is brought about and that this strike is called off.

I am very anxious that this co-operative bank should handle the credit scheme and that it should not be handed over to the People's Bank. If these things cannot be settled, there is no alternative but that the money should be handed over to the People's Bank.

I hope the Hon. Minister will take immediate steps to see that this strike is settled.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා.** (හපුතලේ)
(திரு. டபிள்யூ. பீ. ஜீ. ஆரியதாச—ஹப்புத்தளை)
(Mr. W. P. G. Ariyadasa—Haputale)

ගරු සභාපතිතුමනි, අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමා (කේ. බී. රත්නායක මයා.) කීවාක් මෙන් කෘෂිකර්ම ව්‍යාප්ත කටයුතු සඳහා මෙම රජයට අපගේද සහයෝගය ලැබෙන බව මාද මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමතියි. අපේ ප්‍රධාන ආහාරය බත් වන නිසා හාල් අතින් මෙම රට ස්වයංපෝෂිත කිරීම සඳහා මෙම රජය ගෙන යන වැඩ පිළිවෙළ ගැන කල්පනා කරන විට අපට යම් යම් කරුණු සිහියට නැඟෙනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අනුව දැනට අක්කර නව ලක්ෂයක පමණ වී වගා කර තිබෙනවා. අලුතෙන් වගා වීගෙන යන කුඹුරු ගැනත් සලකා බලන විට දැනට අක්කර නව ලක්ෂයකටත් වැඩි ප්‍රමාණයක වී වගා කර තිබෙන බව පෙනී යනවා. මීට පෙර මෙම අංශය භාරව සිටියේ ඉඩම් ඇමතිතුමාමයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ ඉඩම් ඇමතිතුමාගේ සංඛ්‍යා ලේඛන දෙස බලන විට ඒවායේ සත්‍යතාවක් තිබෙනවාදැයි සමහර විට සැකයක්ද ඇති වෙනවා. ඉඩම් ඇමතිතුමාගේ සංඛ්‍යා ලේඛන දෙස බලන විට දැනටම මෙම රටට වුවමනා කරන හාල් මෙහිම නිපදවෙන බව කල්පනා වෙනවා. මා විශ්වාස කරන අන්දමට නම් ඒ කල්පනාවේ සත්‍යයක් තිබෙනවා. අපේ රටට වුවමනා කරන හාල්වලින් සියයට 54ක් දැනට මේ රටෙහිම නිෂ්පාදනය වන බව කියවෙතත් ඇත්තෙන්ම මේ රටට වුවමනා කරන මුළු හාල් ප්‍රමාණය නිෂ්පාදනය කර ගැනීමට අවශ්‍ය වී දැනට මේ රටේම තිබෙනවා යයි අපට හිතන්නට පුළුවනි. කුඹුරු අක්කර නව ලක්ෂයක් වගා වී තිබෙනවා නම් එය සැලකිය යුතු කාරණයක්. සමහර ප්‍රදේශවල කුඹුරු අක්කරයකින් බුසල් සියයක් ලැබුණු බව ද ප්‍රකාශ වී තිබෙනවා. සාමාන්‍යයෙන් අක්කරයකින් එයින් හතරෙන් පංගුවක තරම් අස්වැන්නක් ලබාගත හැකි වුණත් මේ වන විට රට වී නිෂ්පාදනය අතින් ස්වයංපෝෂිත වන්නට ඕනෑ. මේ රටේ ඇත්තේ එක්කෝටි දශලක්ෂයක ජන ගහණයක්. එයින් බත් බුදින්නන් කෝටියක් පමණ ඇති. ඒ කෝටියට පිරිමැසෙන හාල් දැනට මේ රටේම නිෂ්පාදනය වෙතැයි අපට හිතා ගන්නට පුළුවනි. 3,65,00,000 ක පමණ ධනයක් මේ රටෙන් ඉන්දියාවට පිට වෙනවාය කියා මීට දින කීපයකට උඩ දී පුවත්පත් මාර්ගයෙන් ප්‍රකාශයට පත් වී තිබෙනවා මා දැක්කා. එයින් වැඩිම ප්‍රමාණය වී කියන එකත් සඳහන් වී තිබුණා. මේ රටෙන් ඉන්දියාවට යන හාල් ප්‍රමාණයත් වී ප්‍රමාණයත් අඩු කිරීමට ආහාර අමාත්‍යාංශය වැඩ පිළිවෙළක් අරගෙන යනවාය කියලත් ඒ පත්‍රයේම පළ වී තිබුණා. මේ කරුණ සම්බන්ධව මේ ගරු සභාවේදී අවුරුදු ගණනාවක් තිස්සේ අප විසින් කරුණු ඉදිරිපත් කර තිබෙනවා. මේ රටේ නිපදවන හාල් ප්‍රමාණය ඉන්දියාවට නොයවනවා නම් හාල්වලින් මේ රට ස්වයංපෝෂිත වී හුඟ කලක් වෙනවා. කෙසේ වුවත් රජය ගෙන යන මේ ව්‍යාපාරයට අපේ සම්පූර්ණ සහයෝගය අප දෙනවා. ඒ අතරම මේ රටින් ඉන්දියාවට යන හාල් ප්‍රමාණය එසේ යැවීම වළක්වා ගත්තොත් මේ රටේ නිපදවන හාල් ප්‍රමාණය මේ රටට ප්‍රමාණවත් වන බව මා කියනවා.

කෘෂිකර්ම ව්‍යාප්තිය ගැන කථා කරන මේ අවස්ථාවේදී තවත් කරුණක් මතක් කළ යුතුව තිබෙනවා. බින්තැන්න වැනි ප්‍රදේශවලට නම් ට්‍රැක්ටර්වලින් විශාල ප්‍රයෝජනයක් සිදු වෙනවා. එමෙන්ම ඒ ප්‍රදේශවල ගොවිතැන කරන්නේත් ට්‍රැක්ටර්වලිනුයි. එහෙත් අපේ කඳුකර ප්‍රදේශවලට මෙවැනි විශාල ට්‍රැක්ටර්වලින් ප්‍රයෝජනයක් නැහැ. ගරු ඇමතිතුමා මේ පිළිබඳව කාර්මික උපදෙස් ජපානය වැනි රටකින් ලබා ගන්නවා නම් විශාල ප්‍රයෝජනයක් අපේ ප්‍රදේශවලටත් සැලසෙනවා. කඳුකර ප්‍රදේශවල පාවිච්චිය සඳහා සුදුසු ට්‍රැක්ටර් වර්ගයක් ජපානයේ නිපදවා තිබෙනවා. ලංකාවෙත් ඇතැම් ප්‍රදේශවල පාවිච්චිය සඳහා ඒවා ගෙන්වා තිබුණා. විශේෂයෙන්ම යෝජනාවක් වශයෙන් මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමා වෙත කරුණක් ඉදිරිපත් කරන්නට කැමතියි. පෞද්ගලික අංශය මගින් හෝ සමුපකාර තොග වෙළඳ ආයතනය මගින් හෝ අද ජපන් රටේ කඳුකර ප්‍රදේශවල ගොවිතැන සඳහා උපයෝගිකර ගන්නා කුඩා ට්‍රැක්ටර්—ඒවාට ව්රැක්ටර් කියන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආරියදාස මයා.]

බැහැ. කුඩා යන්ත්‍ර විශේෂයක්—ගෙන්වා ගත්තොත් එය අපේ කඳුකර ප්‍රදේශවලට විශාල සේවයක් වෙනවා ඇති. ඒවා රාත්තල් පනහකට හෝ හැටකට වඩා බර නැහැ. එමෙන්ම ලියද්දෙන් ලියද්දට උස්සාගෙන යන්නත් පුළුවන්.

අ. භා. 4

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

Does the House agree to give the hon. Member five minutes out of the tea interval ?

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)

Aye !

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

එමෙන්ම සුළු වාරිමාර්ග කටයුතු සම්බන්ධවත් කලින් කථා කළ ගරු මන්ත්‍රීවරුන් විසින් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට යෙදුණා. විශාල වාරිමාර්ග යෝජනා ක්‍රම සම්බන්ධව කල්පනා කරනවාට වඩා සුළු වාරිමාර්ග ක්‍රම ගැන කල්පනා කිරීම වැදගත් යයි මා කියනවා. ඊට නිදර්ශනයක් දෙකක් පෙන්වන්නම්. මොනරාගල ඡන්දදායක කොට්ඨාශයටත් හපුතලේ ඡන්දදායක කොට්ඨාශයටත් අයිති හම්බෙගමුව කියා ප්‍රදේශයක් තිබෙනවා. වැල්ලවායේ සිට හම්බෙගමුව දක්වා වූ එම ප්‍රදේශයේ කුඩා වැව් 117 ක් පමණ තිබෙනවා. එයින් සමහරක් සුද්ධ කර තිබෙනවා. මේ සුළු වැව් ප්‍රතිසංස්කරණය කර ගත්තොත් මේ රටට වුවමනා කරන හාල් ටික මේ රටේම නිපදවා ගැනීමට පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ.

ගරු සභාපතිතුමනි, කරුණු කීපයක් ගැන කථා කිරීමට මා අදහස් කර ගෙන සිටි නමුත් කාලය සීමා කර තිබෙන නිසා තවත් එක කරුණක් ගැන පමණයි මා කථා කිරීමට අදහස් කරන්නේ. කෘෂිකර්මය ගැන කල්පනා කළත් රට ස්වයංපෝෂිත කිරීම ගැන කල්පනා කළත් යම් කිසි රජයක් කල්පනා කළ යුත්තේ ආත්මාර්ථකාමිත්වයෙන් තොරව යයි මා කල්පනා කරනවා. මේ රජය ආත්මාර්ථකාමිත්වයෙන් යුතුව ක්‍රියා කිරීමට බලාපොරොත්තු වෙනවාය කියා ප්‍රකාශ කිරීමක් මා එයින් අදහස් කළේ නැහැ. මා එයින් අදහස් කරන්නේ මේකයි. අපට හාල් ඉතාම අවශ්‍ය දෙයක්. විදේශ විනිමය අමාරු නිසාත්, හාල් මහජනයාට ඉතාම අත්‍යාවශ්‍ය දෙයක් නිසාත් හාල් වලට වැදගත් තැනක්දී කටයුතු කරනවා. නිදර්ශනයක් වශයෙන් එක කරුණක් පෙන්වන්නම්. එනම් උක් වගාව ගැනයි. එය මගේ ඡන්දදායක කොට්ඨාශයට බලපාන කරුණක් නිසා සඳහන් කළ යුතුව තිබෙනවා. මගේ ඡන්දදායක කොට්ඨාශයේ කිරවනාගම, හොරගුනේ, රන්වන් ගුහාව ආදී නම් වලින් හඳුන්වනු ලබන ගම්මානවල් කීපයක්ම තිබෙනවා. ඒ ප්‍රදේශවල අය සම්පූර්ණයෙන්ම ජීවනෝපාය කරගෙන යන්නේ මේ උක් වගාවෙනුයි.

මේ රටින් පිටරටවලට අවුරුදු පතා ඇදී යන මුදලින් විශාල ප්‍රමාණයක් මේ රටේම රඳවා ගන්නට පුළුවන්කමක් උක් වගාව නිසා අපට ලැබී ඇතැයි මා හිතනවා. මා එසේ කියන්නේ ඇයි? උක් වගාව කරන ප්‍රදේශවල උදවිය තමන්ට වුවමනා කරන හකුරු ප්‍රමාණය තමන් විසින්ම හදා ගන්නවා. සීනි වෙනුවට ඒ උදවිය හකුරු පාවිච්චි කරනවා. එය ඉතාම වැදගත් කාරණයක් හැටිය සඳහන් කරන්නට කැමතියි.

ආණ්ඩුවක් ආත්මාර්ථකාමිත්වයෙන් තොරව ක්‍රියා කළ යුතුව තිබෙනවා. පෞද්ගලික උක් වගාවන් පිළිබඳව ආණ්ඩුව කොයි තරම් දුරට සහනයන් දී තිබෙනවාද කියාත්, සහනයන් දීමට ක්‍රියා කර තිබෙනවාද කියාත් අහන්නට මා කැමතියි. එහෙම සහනයක් මගේ නම් දැනුමේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හැටියට ලැබී නැහැ. මේ දක්වාම එවැනි සහනයක් ලැබී නැති බව මට කියන්නට පුළුවනි. ඒ නිසා යම් විධියකින් පෞද්ගලිකව උක් වගා කරන්නන්ට පොහොර ලබා දීම පිළිබඳව සහ උපකරණ ලබා දීම පිළිබඳවත් කල්පනා කර යමක් කරන්නට පුළුවන් නම් එය ඉතා වැදගත් දෙයක් හැටියට විස්තර කරන්නට පුළුවනි. ගොවීන්ට වුවමනා කරන යන්ත්‍රෝපකරණ ලබා දීම ඉතා වැදගත් දෙයක් බව මතක් කරන්නට කැමතියි. අපට උවමනා යන්ත්‍රෝපකරණ බොහොමයක් ගෙන්වා ගන්නේ පිටරටවලිනුයි. උපකරණ ලබා ගැනීමට ඔවුන්ට පුළුවන්කමක් ලැබී නැහැ. මේ ප්‍රදේශයේ උක් වගාවෙන් යැපෙන උදවියටත් යම්කිසි විධියකින් ලංකාවේ වෙනත් ප්‍රදේශවල අයගේ යන්ත්‍රෝපකරණ ලබා දීමට පහසුකම් සලස්වනවා නම් බොහොම හොඳයි. ඒ ගැනත් ගරු ඇමතිතුමා සලකා බලනු ඇතැයි ඉතා ඕනෑකමින් අපේක්ෂා කරනවා.

ගරු ඇමතිතුමා හමු වන්නට නියෝජිත පිරිසක් ආවා. ඒ අවස්ථාවේ මට ඒ උදවිය සමග එන්නට පුළුවන්කමක් ඇති වුණේ නැහැ. දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හමු වී ඒ උදවිය යන්නට ඇතැයි මා කල්පනා කරනවා. ඒ ගැනත් කල්පනා කරන ලෙස මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

The Sitting is suspended till 4.30 P.M. On resumption the hon. Member for Ratgama will speak.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.***

*அதன்படி அமர்வு இடை நிறுத்தப்பட்டு மீண்டும் பி.ப. 4.30 மணிக்கு ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed.*

**ඩී. ඊ. තිලකරත්න මයා.** (රත්ගම)
*(திரு. டி. ஈ. திலகரத்ன—ரத்கம)*
(Mr. D. E. Tillekeratne—Ratgama)

ගරු සභාපතිතුමනි, ආහාර අමාත්‍යාංශය සම්බන්ධ වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට මටත් අවස්ථාවක් ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. මවගෙන් කිරි ඉල්ලා අඬන ළදරුවකු මෙන් රජයෙන් ආහාර ද්‍රව්‍ය ඉල්ලා සිටින ජනතාවට ඒවා පුළුවන් අන්දමින් සැපයිය යුතු බව රජය කල්පනාවට ගත යුතුයි. කවර රජයක වුවත් ආශාව, තම ජනතාව බඩගින්නේ නොතබා ඔවුන්ට වුවමනා ආහාර ද්‍රව්‍ය සපයා දීමයි. තම රටේම නිෂ්පාදනය කර හෝ එසේ නොහැකිනම් පිටරටවලින් ගෙන්වා හෝ තම ජනතාවට ආහාර ද්‍රව්‍ය සැපයීමටයි හැම රජයක්ම මහන්සි ගන්නේ.

අද මේ රටේ ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් පවතින තත්ත්වය ගැන අප විශේෂයෙන්ම කල්පනා කර බලන්නට ඕනෑ. වැවිලිකරු මහත්වරුන් කීප දෙනකුගෙන්ම මා මේ ගැන අදහස් විමසා බැලුවා. ආහාර වගා කිරීම සම්බන්ධයෙන් නොයෙක් අඩුපාඩුකම් තිබෙන බවත්, විශේෂයෙන්ම පැළ වර්ග හා බීජ වර්ග ලබා ගැනීමේ දුෂ්කරතාවක් තිබෙන බවත් මට ඒ අයගෙන් දැනගන්නට ලැබුණා. වැඩි වැඩියෙන් ආහාර වගා කළයුතුය නිෂ්පාදනය කළ යුතුය කියමින් රජය කොපමණ ප්‍රචාරය කළත් කැගැසුවත් වගාවන් සඳහා වුවමනා කරන ඇට වර්ග, පැළ වර්ග ලබා ගැනීමට වගාකරුවන්ට පහසුකම් නැත්නම් රජයේ ඒ ප්‍රචාරය සාර්ථක වන්නේ නැහැ. වගාකරුවන්ට අවශ්‍ය ඒ පැළ වර්ගත් බීජ වර්ගත් රජයෙන්ම බෙදා දීමේ වැඩ පිළිවෙළක් යොදතොත් දැනට වඩා මේ ආහාර වගා කිරීමේ ව්‍යාපාරය සාර්ථක කර ගන්නට පුළුවන් බව මා කියන්නට කැමතියි. අද ඉරිඟු ඇට සපයා ගැනීම අමාරුයි. ඒවාගේම නියම මිරිස් ඇට ලබා ගැනීමත් අපහසුයි. මේවා රජය විසින් බෙදා නොදීම විශාල පාඩුවක්. එම නිසා මේ සම්බන්ධව නිසි වැඩ පිළිවෙළක් යොදන ලෙස මා ගරු ඇමතිතුමාට මතක් කරනවා.

එළඹු වගාව ගැන මා වචනයක් කිව යුතුයි. අද මේ රටේ එළඹු වගාව පරම්පරාවකින් එන දෙයක් මෙන් යාපනේ සහෝදරයින්ට පමණක් පවරා තිබෙනවා. එළඹු වගාව කරන්නට පුළුවන්කම තිබෙන්නේ යාපනයේ පමණක්ය යන වැරදි මතයක් අප අතරේ තිබෙනවා. මගේ ඡන්ද දායක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තිලකරත්න මයා.]

කොට්ඨාශයේ මූදු කෑමේ තර්ජනයට මුහුණ පෑ පවුල් 50 ක් පමණ කිරිඉබ්බන්ආර, සූරියවැව යන ප්‍රදේශවල පදිංචි කරවා සිටිනවා. ඔවුන් අක්කර 20 ක 25 ක පමණ ළූණු වගාවක් කළා. එහි මුල් වගාවටම ඔවුන්ට ටොන් ගණනක අස්වැන්නක් ලැබුණු බව මා ඉතාමත් සන්තෝෂයෙන් සඳහන් කරනවා. ඒ ළූණු කොතරම් හොඳ දැයි බලන්නය කියා මටත් එවා තිබුණා. කිරිඉබ්බන්ආර හා සූරියවැව යන ඒ ප්‍රදේශවල ළූණු වගා කිරීමට රජය මහන්සි ගන්නවා නම් පිටරටවලින් ළූණු ගෙන්වීම නතර කිරීමට පමණක් නොව මා හිතන හැටියට ඒවා පිටරට යැවීමටත් පුළුවන් වෙනවා ඇති.

අපේ රටේ නිපදවෙන ආහාර ද්‍රව්‍ය ඉතා විශාල වශයෙන් අවුරුදු පතා වැල්වෙට්ටිතුරේ යාපනේ ආදී ප්‍රදේශවලින් හොර රහසේ ඉන්දියාවට යැවෙන බව කියන ප්‍රවෘත්තියක් මා අද උදේ සිංහල පත්තර යක පළ වී තිබෙනු දැක්කා. එම ප්‍රවෘත්තියෙහි කියා තිබෙන තරමටම නැතත් සෑහෙන ප්‍රමාණයකින් ඒ වැඩේ කෙරෙන බව නම් අප කවුරුනුත් දන්නවා. මෙය යාපනේ, වැල්වෙට්ටිතුරේ ආදී ප්‍රදේශවල පමණක් සිදු වන දෙයක්යයි මා කීවොත් යාපනේ සහෝදරවරුන් මා සමග ගහ ගන්නට එයි. එම නිසා, ලංකාවෙන් නොයෙක් ද්‍රව්‍ය හොර රහසේ පිට කෙරෙනවායයි මා කියනවා. මෙය වැළැක්වීමට නියම පිළිවෙළක් යොදන්නට අපට තවම පුළුවන් වුණේ නැහැ. මොන බඩු මෙරටින් පිට කළත්, ආහාර ද්‍රව්‍ය පිට කිරීම තරම් හිතට අමාරුවක් නැහැ. විශේෂයෙන් පොඩි ළමයින්ගේ ආහාර ද්‍රව්‍ය වන කිරි පිටි මෙරටින් පිට නොවී වෙන මොන බඩු පිට වුණත් කමක් නැහැ. අපේ රටින් හොරෙන් බඩු පිට කරන්නන්ට විරුද්ධව මීට වඩා දැඩි ලෙස ක්‍රියා කළොත්, ඔවුන්ට තදබල දඬුවම්—එල්ලුම් ගස් යැවීම බැරි නම් හිස ගසා දැමීම වුණත්—නියම කළොත්, වැල්වැටිතුරේ ආදි ප්‍රදේශවලින් හොරෙන් පිට වන බඩු ප්‍රමාණය අඩු කරන්නටවත් පුළුවන්කම ලැබෙනවා. විදේශ විනිමය හිඟව තිබෙන මෙවැනි වකවානුවක බොහොම අමාරුවෙන් ගෙන්වන කිරි පිටි ටික පවා මෙරටින් හොරෙන් පිට කරන්නට ඉඩ දෙන්නේ ඇයිදැයි මා අහන්නට කැමතියි. එය නැවැත්වීම සඳහා නියම වැඩ පිළිවෙළක් ඇති නොකරනවා නම්, එයත් හොරෙන් බඩු පිට කිරීමට දෙන උදව්වක් වෙනවා. සමහර විට රජයට විරුද්ධ අය හොරෙන් බඩු පිට කරන්නට උදව් දෙනවා වෙන්නට පුළුවනි. ඒවාට උදව් දෙන, රජයට පක්ෂ අයත් ඉන්නට බැරිකමක් නැහැ. රටින් බඩු පිට කරන්නට උදව් දෙන නිලධාරීන් ඉන්නවා නම්—එවැනි නිලධාරීන් ඇතැයි මා හිතන්නේ නැහැ—ඒ අය ගැනත් සොයා බලා, මේ කූට ජාවාරම මඩින්නට ඕනෑ. කිරි පිටි විතරක් නොව අනෙක් බඩුත් හොරෙන් අපේ රටෙන් පිට යවනවා. පුළුවන් තරමින් මේ කූට ජාවාරම් මඩින හැටියට ගරු ඇමතිතුමාගෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ඊළඟට, මගේ ඡන්දදායක කොට්ඨාශයේ තිබෙන බූස්ස හාල් ගබඩාව ගැනත් වචනයක් දෙකක් කියන්නට ඕනෑ. බූස්සේ තිබෙන මේ හාල් ගබඩාව, දකුණු පළාතේ තිබෙන ලොකුම හාල් ගබඩාව බව තමුන්නාන්සේ දන්නවා ඇති. ඒ ගබඩාවේ කම්කරුවන් සිය ගණනක් වැඩ කරනවා. එහෙත් ඒ අයට වැඩ කිරීමට තරම් ප්‍රමාණවත් බඩු ප්‍රමාණයක් එම හාල් ගබඩාවට ලැබෙන්නේ නැති බව කණගාටුවෙන් කිව යුතුව තිබෙනවා. සමහර අවස්ථාවල ඒ කම්කරුවන්ට සතියකට දවස් දෙක තුනකට වඩා වැඩ ඇත්තේ නැහැ. බූස්සේ ගබඩාව පසු කරගෙන වෙනත් පළාත්වලට බඩු ගෙන ගොස්, නැවතත් ආපසු බූස්සටම නැත්නම් ගාල්ලට බඩු ගෙන එන අවස්ථාත් තිබෙනවා. බූස්ස මේ තරම් විශාල මධ්‍යස්ථානයක් වී තිබියදීත්, ඒ සියලුම බඩු බූස්සට ගෙන එන්නට බැරි ඇයිදැයි ප්‍රශ්න කරන අතර, ඒ පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නට කැමතියි.

ඊළඟට බූස්ස ගැනම නැවතත් වචනයක් දෙකක් කිව යුතුව තිබෙනවා. එම ගබඩාවේ සේවය කරන සේවකයන්ට ස්ථිර තත්ත්වයක් දෙන්නට බැරිද? සමුපකාර සමිති වශයෙන් හෝ වේවා වෙනත් විධියකට හෝ වේවා අවුරුදු ගණනාවක සිට වැඩ කරන මේ කම්කරුවන්ට ස්ථිර තත්ත්වයක් ප්‍රදානය කර, ඔවුනුත් රජයේ සේවකයන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හැටියට බඳවා ගන්නට සැලකිල්ල යොමු කරන ලෙසත් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ගොවිතැන දියුණු කිරීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා විශාල සටනක් ගෙන යනවා. මේ තරම් විදේශ විනිමය හිඟයක් තිබෙද්දීත් අපට වුවමනා කරන බඩු බොහොම අමාරුවෙන් වුණත් ලබා දීම ගැන, එම බඩු ලංකාවට ගෙන්වීම ගැන, අප එතුමාට ස්තුතිවන්ත විය යුතුයි. එහෙත් අවසාන වශයෙන් තමුන්නාන්සේ ගෙන් ඉල්ලා සිටින්නට කැමතියි, ගොවි පොළවලට ලබා දිය යුතු වී වේවා වෙනත් පැළ වර්ග වේවා ඇට වර්ග වේවා ඒ සියල් ලක්ම ප්‍රමාණවත් තරම් සපයන ලෙස. මගේ කථාව මීට වඩා දීර්ඝ කරන්නට මා අදහස් කරන්නේ නැහැ. සභාපතිතුමාත් මා දිහා බලාගෙන වාගේ ඉන්නවා. ඒ නිසා මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරැස්ස)
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குறஸ்ஸ)
(Dr. S. A. Wickremasinghe—Akuressa)

ගරු ඇමතිතුමා අයවැය විවාදයටවත් සහභාගි නොවූ නිසා ආහාර සම්බන්ධයෙන් එතුමා ගෙන යන වැඩ පිළිවෙළ කුමක්දැයි අප නොදන්නා බැවින් ඒ සම්බන්ධයෙන් අපේ අදහස් දැක්වීමට අපහසු වීම ගැන අප කණගාටු වෙනවා. එසේ වුවත් මා පළමු වෙන්ම මතක් කළ යුතුයි, ආහාර අතින් රට ස්වයංපෝෂිත කිරීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ගවලට අපේ සම්පූර්ණ සහයෝ ගය ලැබෙන බව. දේශපාලනමය තත්ත්වය තහවුරු කර ගැනීමටත් ආණ්ඩුව පරාජය කිරීමටත් අප උත්සාහ දරන්නේ එම වැඩ පිළිවෙළට විරුද්ධ වීමෙන් නොවන බව මෙම අවස්ථාවේදී මතක් කර දිය යුතුයි. ඒ තරම් ඥානවන්තකමක් අපට තිබෙන නිසා ඒ ගැන තමුන්නාන්සේ සිතන්නට වුවමනා නැහැ. ලෝක බැංකුව, ධනපති ආණ්ඩු, ලංකාව වැනි නොදියුණු රටවල් පිළිබඳව පවතින්නාවූ පිළිවෙළ ගැන එක්තරා ප්‍රචාරයක් තිබෙනවා. මේ රටේ අනාගතය රඳා පවත්නේ කෘෂිකර්මය අතින් ගනු ලබන වැදගත් පිළිවෙළ මත පමණය යන අදහස පළවෙනවා.

ආහාර අතින් රට ස්වයංපෝෂිත කිරීමට පමණක් නොව ආහාර අපන යනය කරන්නට හැකි තත්ත්වය කට පත් කර ගන්නටද උත්සාහ දැරිය යුතු අතරම මේ රට කාර්මික අතින්ද දියුණු තත්ත්වයකට පත් කළයුතු බවයි, අප කියන්නේ. රටක් නියම වශයෙන් කෘෂිකර්මය අතින් දියුණුවට පත් වන්නේ ඒ රට කාර්මික අතින්ද දියුණු වට පත් වූ විටයි. එම නිසා කෘෂිකර්ම දියුණුවටත් වඩා කාර්මික දියුණුව ඇති විය යුතුයි. අද එක්සත් ජනපද රාජ්‍යය වුවමනාවටත් වඩා ආහාර නිෂ්පාදනය අතින් දියුණු වී සිටින බව පෙනෙනවා. තිරිඟු පිටි යනාදිය නොයෙකුත් රටවලට දෙමින් ඒ රට ලෝකයේ නොයෙකුත් රට වල් තමන්ට යටපත් කර ගෙන සිටින බව පෙනෙනවා. ඔවුන්ගේ අධිරාජ්‍යවාදී ක්‍රමය තහවුරු කර ගැනීමටයි, ඒ මගින් උත්සාහ දරන්නේ. කාර්මික අතින් ඒ රට දියුණුවට පත්ව සිටින නිසායි, කෘෂිකර්ම යද බොහෝ දුරට වැඩි දියුණු කර ගෙන සිටින්නේ. ඒ අය එම දියුණුව, නොදියුණු රටවල් යටපත් කර ගැනීමේ ආයුධයක් කරගෙන සිටින බව පෙනෙනවා. ලෝක බැංකුව, අමෙරිකන් බැංකුව කෘෂිකර්මය අතින් නොදියුණු රටවලට මේ පිළිවෙළට අවවාද කරන්නේ එම නිසායි. මෙවැනි රටවල අනාගත දියුණුව ඇති වන්නේ කෘෂිකර්මය පිළිබඳ ප්‍රතිපත්ති උඩ පමණ කැයි ප්‍රකාශ කිරීමෙන් ඒ උදවිය බලා පොරොත්තු වන්නේ එම ප්‍රතිඵලයයි. අප සටන ගෙනයන්නේ ඊට විරුද්ධවයි. එසේ නැතුව අප කෘෂිකර්මයෙහි ඇති වටිනාකම නොදන්නා නිසා නොවෙයි. නැඟෙනහිර යුරෝපය වැනි සමාජවාදී රට වල කෘෂිකර්මය දියුණුයි. ඒ රටවලින් අදත් ලංකාවට අර්තාපල්, සීනි සහ පිටි යනාදිය ගෙන්වනවා. අද ශක්තිමත් ආර්ථික තත්ත්වයක් ඒ රට තුළ පවතින්නේ කාර්මික අතින් ලබා තිබෙන දියුණුව උඩයි. කාර්මික අතින් රටක් වැඩි දියුණු වන විට තිබුණාට වඩා තුන් ගුණය කින් කෘෂිකර්මය වැඩි දියුණු වන බව කියන්නට පුළුවනි. ලංකාව වැනි රටවලත් කාර්මික දියුණුවක් තිබිය යුතුයි. එවැනි දියුණුවක් ඇති කිරීම අවශ්‍යයයි. එය කරන්නටත් පුළුවනි. නවීන ලෝකයේ උසස් ජීවන තත්ත්වයක් ඇති කළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]
හැක්කේ ඉතා සීඝ්‍රාකාරයෙන් කාර්මික දියුණුවක් ඇති කළහොත් තමයි. ඒ පිළිබඳව කල්පනා නොකළහොත් විද්‍යාත්මක නොවූ පැරණි යුගයේ තත්ත්වයට නොදියුණු සමාජයක් හැටියට අපට පත් වන්නට සිදු වෙනවා.

මෑතදී ලංකාවේ කෘෂිකර්ම කටයුතු සම්බන්ධයෙන් විශෙෂ වෙනස් වීමක් සිදු වුණා. ධනපති ක්‍රමයට අනුව අක්කර 50 දහසක් පමණ වගා කරන්නට විශාල ධන වතුනට දී තිබෙනවා. වගාව පිණිස ඉඩම් දීමේදී මීට ප්‍රථම අනුගමනය කළේ ඉඩම් නැති ගොවීනට ඉඩම් ලබා දීමේ ප්‍රතිපත්තියයි. එහෙත් අද ඒ වෙනුවට විශාල ධනපතියනට ඉඩම් දී තිබෙනවා. මීට ප්‍රථම මේ ගැන අප විසින් කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ගරු ඇමතිතුමා බලාපොරොත්තු වුණු පරිදි අක්කර 50 දාහෙන් සියයක් වත් ආහාර වගාව සඳහා යොදවා නැතෙයි කියන ප්‍රකාශය අසන්නට ලැබී තිබෙනවා. පුද්ගලික වශයෙන් මා මේ පිළිබඳව දන්නේ නැහැ.

අ. භා. 4.45

එලවළු හැර වෙනත් අමතර ආහාර ද්‍රව්‍ය "subsidiary foods" නිෂ්පාදනය කිරීමට ඉතාමත්ම අසාර්ථක ප්‍රයත්නයක මේ උදවිය යෙදී සිටින බව වාර්තාවල කියා තිබෙනවා. ඒවා ඇත්තදැයි ගරු ඇමතිතුමා ප්‍රකාශ කරනවා ඇති. ඒ සම්බන්ධයෙන් ඇමතිතුමාගේ අනාගත ප්‍රතිපත්තිය කුමක් දැයි මා අහනවා. යන්තම් ජීවිතය රැක ගැනීමට උපයෝගී කර ගත් පැරණි ක්‍රම අළුතින් පිහිටුවන ගොවි ජනපදවල පතුරුවා හැරීම විනාශදායක, එමෙන්ම අර්ථයක් නැති, වැඩ පිළිවෙලක් නිසා ඒවායේ නවීන ක්‍රමයට යන්ත්‍රෝපකරණ යොදා ගොවිතැන් කිරීමට වැඩ පිළිවෙලක් යෙදිය යුතු යයි ලෝක බැංකුවේ ක්‍රම සම්පාදක අංශයේ වාර්තාවල සඳහන් වී තිබෙන නමුත්, ඒ නවීන ක්‍රම මොනවාද යන්න ගැන විස්තර කර නැහැ. මා විශේෂයෙන් මේ ප්‍රශ්නය අහන්නෙ ඒ නිසයි.

ගරු ඇමතිතුමා බලාපොරොත්තු වෙන්නෙ, ඇමෙරිකාවෙ සිටින විශාල ධනපතීන්ට අක්කර දහස් ගණින් බෙදා දී ආහාර වගාව දියුණු කරන්ටද, නැත්නම් සමුපකාර ව්‍යාපාර, සමූහ ගොවිපොළවල් ආදිය මගින් ආහාර නිෂ්පාදනය දියුණු කරන්ටද කියා මා අහනවා. දෙවෙනි ක්‍රමය අනුව කටයුතු කළොත් එක් අයෙකුට නිපදවන්ට පුළුවන් ප්‍රමාණය අද මෙන් පස් ගුණයකින් දහ ගුණයකින් තරම වැඩි කරන්ට පුළුවනි. මෙයින් එක ක්‍රමයක් අද ඇමෙරිකාවේ තිබෙන අතර අනික් ක්‍රමය සමාජවාදී රටවල තිබෙනවා. ලංකාව වැනි කුඩා රටවල් වන බල්ගේරියාව වැනි සමාජවාදී රටවල සමූහ ගොවිපොළවල් ක්‍රමය තිබෙනවා. එම නිසා මුසාජී කොමිෂන් සභාව... පැණියට අක්කර සිය ගණනක් දුන්නා වගේ ඇමෙරිකන් ක්‍රමයට මේ රටේ ආහාර නිෂ්පාදනය දියුණු කරන්ට ගරු ඇමතිතුමා බලාපොරොත්තු වෙනවද, නැත්නම් සමාජවාදී රටවල තිබෙන ක්‍රමයට මේ රටේ ආහාර නිෂ්පාදනය දියුණු කරන්ට ගරු ඇමතිතුමා අදහස් කරනවද, කියන ප්‍රශ්නයට පිළිතුරක් සපයන්නේ නම් යෙහෙකැයි මා විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, වියළි කලාපයේත් තෙත් කලාපයේත් ප්‍රදේශ අතර ප්‍රධාන වෙනස්කම් රාශියක් තිබෙනවා. වියළි කලාපයේ ප්‍රදේශ ගැන මා විස්තර කරන්ට යන්නෙ නැහැ. එහෙත් ලංකාවේ ජනගහනයෙන් 3/4 ක් ජීවත් වන භූමි ප්‍රමාණයෙන් 1/3 ක් පමණ වන තෙත් කලාපයේ ප්‍රශ්න ගැන මතක් කරන්ට මා බලාපොරොත්තු වෙනවා. මේ ප්‍රශ්න මාතර දිස්ත්‍රික්කයට මෙන්ම තෙත් කලාපයේ අනිකුත් කොටස්වලටත් සමානව බල පාන ප්‍රශ්නයි.

මාතර දිස්ත්‍රික්කයේ ගොවීන් 35,,000 ක් තරම සිටිනවා. ආණ්ඩුව මාර්ගයෙන් මේ වතාවේ ගොවීන්ට පහසු ණය ක්‍රම සලසන බවට විශාල ප්‍රචාරයක් තිබෙනවා. එහෙත් මේ ගොවීන් 35,000 න් ණය ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර තිබෙන්නෙ, ගොවීන් 5,000 ක් පමණයි. අනිකුත් අයවලුන් එය ඉල්ලන්න භයයි. ගොවිතැන් කරනවා කියන එක හරියට ආණ්ඩුවේ ස්වීප් ටිකට් එකක් ගන්නවා වගේ වැඩක්. දිනුමක් ඇදෙන්නෙ බොහොම කලාතුරකින්; පරාජය තමයි, වැඩි වශයෙන් සිද වන්නේ. ගොවිතැන සරුවීමත් ඉතා හදිසියෙයි සිදු වෙන්නෙ. වැඩි වශයෙන් පාළුවීම තමයි,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිදු වෙන්නෙ. එම නිසා මුදල් තිබෙන, වෙනත් ආදායම් මාර්ග තිබෙන උදවිය මේ ණය මුදල් භය නැතිව ලබාගන්නව. කුඩා රබර් වත්තක් හෝ වෙනත් ආදායම් මාර්ග යක් තිබෙන කෙනෙක් තමයි, වැඩි වශ යෙන් මේ ණය මුදල් ලබා ගන්නෙ. සාමාන්‍ය ගොවීන් 30,000 ක් තරම මේ ණය මුදල් ඉල්ලන්නට භයයි. ණය මුදල් ලබා ගත්තොත් ඔවුන් අමාරුවෙ වැටෙන්ට ඉඩ තිබෙනව. ඔවුන්ගේ ගොවිතැන් නිත රම පාළු වෙනව. දැන් තිබෙන රක්ෂණ ක්‍රමයත් ප්‍රමාණවත් මදි. හානි පරීක්ෂා කරල වන්දි ගෙවන්ට අවුරුදු තුන-හත රක් ගත වෙනව. ණය නැතිව ගොවීන්ට වැඩ කර ගන්ට බැහැ. එහෙත් අද තිබෙන මේ තත්ත්වය උඩ ණය ලබා ගන්න භයයි. ඒ ප්‍රශ්නය අද මාතර දිස්ත්‍රික්කයේ තදින් බල පාන බව ගරු ඇමතිතුමාට මතක් කරනව.

ඊළඟට කෙටි කාලීන ක්ෂණික ප්‍රතිඵල ලැබෙන වැඩපිළිවෙළවල් මගින් නිෂ්පාද නය වැඩි කර ගැනීමේ කාර්යයට ප්‍රමුඛත්වය දෙන අතර කෘෂිකර්ම අංශය දීර්ඝ කාලීන කටයුතු සම්බන්ධයෙන් වුවමනාවට වඩා අමතක කරන බවක් මට පෙනෙන්ට තිබෙනව. එමනිසා කෙටි කාලීන වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්නට නම් දීර්ඝ කාලීන වැඩ පිළිවෙළත් ඒ සමගම ගෙන යා යුතුය කියා මා ප්‍රකාශ කරනවා. එය මගේ අවංක හැඟීමයි. නිල්වලා ගඟ, ගිං ගඟ, කළු ගඟ ආදී ගංගා ආශ්‍රිත නිම්න භූමිවල ගොවිතැන් කරන්නට තිබෙන එකම බාධාව ගංවතුරෙන් හානි පැමිණීමයි. මේ ගංගාවල ගංවතුර ගැලීම වැළැක්වීමට ගෙන යන දීර්ඝ කාලීන වැඩ පිළිවෙළට කෙටි කාලීන වැඩ පිළිවෙළත් සම්බන්ධයි. ජලාශ බැඳීමෙන් ජල ගැල්ම බොහෝ සෙයින් අඩුවෙනවා. ඒ අනුව කල්පනා කර බලන විට දීර්ඝ කාලීන වැඩ පිළිවෙළත් සමගම කෙටි කාලීන වැඩ පිළිවෙළත් ක්‍රියාත්මක කරගෙන යා යුතු බව මා ප්‍රකාශ කරනවා. ඒ අනුව අවුරුද්දකින් දෙකකින් ගොවිතැන දියුණු කර අස්වැන්න ලබා ගන්නට බැරි වුණත් වැඩි කල් යන්නට මත්තෙන් ඒවායේ නියම පල ප්‍රයෝජන ලබා ගන්නට පුළුවන් වෙනවා.

තවත් කාරණයක් තිබෙනවා. සාමාන්‍ය යෙන් ගඟක් දෙපැත්තේ කඳු වැටි තිබෙනවා. ඒ කඳුවැටිවලින් ගලන ඇල දොළවල් තිබෙනවා. සමහර අවස්ථාවලදී ඒ ඇල දොළවල් නිසා කුඹුරු යට වෙනවා. එවැනි ඇල දොළවල් හරහා වේලි බඳිනවා නම් කරුණු දෙකක් ඉෂ්ට වෙනව. එවැනි බැම් බැඳීමෙන් එක අතකින් කුඹුරු වතුරට යට වීම වළක්වා ගන්නට පුළුවන් වෙනවා. අනික් අතින් කුඹුරුවලට වුවමනා අවස්ථාවට ජලය ලබා ගන්නට ජලාශයක් ඇති වෙනවා. අද මේ ඇල දොළවල් නිසා වර්ෂා කාලයට කුඹුරු විනාශ වෙනවා; කුඹුරු සෝදා ගෙන යනවා; වේලි කැඩී යනවා. එහෙත් මේවා හරහා බැම්මක් බඳිනවා නම් ඒ විනාශය වළක්වා ගන්නට පුළුවන් වෙනවා. වැලිගම ආසනයට අයිති හල්ලල එවැනි ආදර්ශ බැම්මක් තිබෙනවා. ඒ බැම්ම නිසා වර්ෂා කාලයට කුඹුරු විනාශ වීම වළක්වා ගන්නට පුළුවන් වී තිබෙනවා. ඒවාගේම වුවමනා අවස්ථාවට කුඹුරුවලට ජලය සපයා ගැනීමටත් පුළුවන් වී තිබෙනවා. අනික් ගංගා පිළිබඳවත් එවැනි වැඩ පිළිවෙළවල් යෙදීම අවශ්‍යයි. නිල්වලා ගංගා නිම්නයේ ගොවිතැන දියුණු කරන්නට නම් එවැනි බැම් 25 ක් පමණ බැඳීම අවශ්‍යයි

ඊළඟට කිරි මණ්ඩලය ගැනත් මා වචන ස්වල්පයක් කියන්නට අදහස් කරනවා. දැන් පොළොන්නරුවේ උතුරු කිරි කම්හලක් පිහිටුවීමේ කටයුතු කරගෙන යනවා. ඒ කම්හල පොළොන්නරුවට ගෙන ගොස් තිබෙන්නෙ අක්කර 75,000 ක් පමණ වූ අර විල්පු තණ බිම් නිසයි. ඒවාගේ සශ්‍රීක අන්දමින් තණ වවා කිරි පට්ටි දමන්නට බලාපොරොත්තු වෙනවා. නමුත් ඒ සමගම ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය මගින් ගෙන යන තවත් වැඩ පිළිවෙළක් තිබෙනවා. එනම් මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමයයි. මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමයෙන් අදහස් කරන්නේ ගංවතුරෙන් වන හානි වැළැක්වීමයි. අක්කර 3,00,000 ක පමණ පහත් ප්‍රදේශයක් අද ගංවතුරෙන් යට වෙනවා. කොත්මලේ සහ රන්දෙනිගල ජලාශ දෙකෙන් ඒ ගංවතුරෙන් වන හානිය වළක්වා ගැනීමට කටයුතු කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

ඒ සමගම වාරිමාර්ග පහසුකම් යොදා ඒ ප්‍රදේශයේ ගොවිතැන දියුණු කරන්නට බලාපොරොත්තු වෙනවා. දැන් මේ විල්ලු වල සශ්‍රීක ලෙස තණ බිම් වවන්නට නම් අවුරුදුපතා මාස තුනක පමණ කාලයක් මේ බිම් වතුරට යටවී තිබිය යුතුයි. එවැනි තත්ත්වයක් තිබුණොත් තමයි වියදමක් නැතිව සශ්‍රීක ලෙස තණ බිම් වවන්නට පුළුවන් වෙන්නෙ. නමුත් මහවැලි ගඟ ව්‍යාපාරය අනුව කරන්නට යන්නෙ මේ ප්‍රදේශවලට ගංවතුරෙන් වන හානිය වැළැක්වීමටයි. එමගින් තමන්කඩුව, බිංතැන්න ප්‍රදේශය ගොවිතැන් කටයුතු සඳහා දියුණු කරන්නටයි. එම නිසා දැන් ප්‍රශ්න දෙකක් මතුවී තිබෙනවා. උකු කිරි සෑදීමට අඩු වියදමින් විල්ලුවල තණ බිම් වැවීමට කටයුතු කරනවාද නැත්නම් ඒ ප්‍රදේශයට ගංවතුරෙන් වන හානිය වළක්වා ගොවිතැන් දියුණුවට කටයුතු කරනවාද යන ප්‍රශ්නය ගරු ඇමතිතුමා දැන්මම විසඳා ගත යුතුව තිබෙන බව මා මතක් කරනවා.

මට ආරංචි හැටියට තම කිරි මණ්ඩලය දවසකට කිරි පයින්ට් පණස්පන් දාහක් පමණ බෙදා හරිනවා. විකිණිය නොහැකි කොටසෙන් පයින්ට් දහ දාහක් පමණ පාඨශාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර නොමිළයේ බෙදා හරිනවා. එය අනුමත කරන අතරම ඒ ගැන ප්‍රශංසාද කරනවා. තවත් පයින්ට් දහ දාහක් පමණ එක්කෝ වැලිසර ඌරු පට්ටියට දෙන්නට හෝ එසේ නැතිනම් කාණුවල ගලාගෙන යන්නට සලස්වන්නට හෝ සිදු වී ඇති බවට ප්‍රකාශයක් කර තිබෙන බව ආරංචියි. එය ඇත්තක්ද නැත්තක්දැයි මා දන්නේ නැහැ. "ස්ටෙරිලයිස්ඩ් මිල්ක්" පයින්ට් ලක්ෂ පහක් පමණ ගබඩා වී තිබෙන බවත් ආරංචියි. ප්‍රමාණය හරියටම කෙතෙක්දැයි නොදන්නා නමුත් එම කිරි පයින්ට් ලක්ෂ පහක් පමණ ගබඩා වී තිබෙන බව ආරංචියි. හය මාසයකට පමණ පසුව ඒ කිරිවල රසය වෙනස් වෙනවා. අද ඒවා බෙදා හරින වාට වඩා ගබඩා වන තත්ත්වයක් පවතිනවා.

"පාස්චරයිස්ඩ් මිල්ක්" වෙනුවට කිරි මණ්ඩලය මගින් බෙදා හරිනු ලබන මෙම කිරිවල මිළ ශත දහයකින් වැඩියි. ඒ වගේම "පාස්චරයිසේෂන්" කරනවාට වඩා "ස්ටෙරිලයිසේෂන්" කරන විට වැඩි වියදමක් යනවා. හැබැයි, මාසයකට වුව මනා කරන තරම් කිරි එක වර ලබාගෙන ගබඩා කර ගන්නට පුළුවන් නම් හොඳයි. එහෙත් ඒක කරන්නේ නැහැ. දිනපතා බෙදා හරිනවා. [බාධා කිරීමක්] ගබඩා තිබුණත් දිනපතා බෙදා හරිනවා. "ස්ටෙරිලයිස්ඩ් මිල්ක්" මාස හයක් නැත්නම් අවුරුද්දක් තබා ගන්නට පුළුවන් නම් ඒවා බෝතල් භාගවලට පුරවා කඩවලට බෙදා හරින්නට බැරි ඇයි? නවසීලන්තයෙන් උකු කිරි ගෙන්වනවා වෙනුවට මේ "ස්ටෙරිලයිස්ඩ් මිල්ක්" මහජනයාට බෙදා දෙන්නට පුළුවන් නම් කොතරම් හොඳද? ශීලාචාර රටවල් උකු කිරි නිෂ්පාදනය කරතත් ඒවා පාවිච්චි නොකර අපනයනය කරනවා; අපට එවනවා. අප සීනි වැඩියෙන් දමන ලද උකු කිරි පාවිච්චි කරන්නට කැමැති නිසා ඒ රටවල් අපට ඒවා එවනවා යයි ඇමතිතුමා කියන්නට පුළුවනි. [බාධා කිරීමක්] අපේ ජනතාව ඒ තරම් මෝඩ නැහැ. "ස්ටෙරිලයිස්ඩ් මිල්ක්" දෙන්නට පුළුවන් නම් උකු කිරි වලට වඩා ඒවා හොඳ බව මහජනතාව දන්නවා.

සමුපකාර කටයුතු සම්බන්ධයෙන් අද විනාශදායක වැඩ පිළිවෙළක් ගෙන යනවා. මා පසුගියදා දූරංගල උස්බිම් තේ වගාව බලන්නට ගියා. සමුපකාර ක්‍රමය යටතේ ගෙන ගිය මෙහි ඇති ගබඩා වැවිලි සංස්ථාවට භාර දෙන ලෙසට නියෝගයක් ගොස් තිබෙනවා. සමුපකාර ක්‍රමය අනුව හොඳින් පවත්වාගෙන ගිය තේ වතු මේ අන්දමින් සම්පූර්ණයෙන්ම විනාශ කරගෙන යනවා. මොරවක් කෝරළේ සමුපකාර සමිති සංගමය දැන් සම්පූර්ණයෙන්ම විසුරුවා හැරලා. වැලිගම් කෝරළේ සමුපකාර සමිති සංගමයත් ඒ විධියේ ඉරණමකට මුහුණ පා තිබෙනවා. හදිසි නීති යටතේ දැන් ඒවා පාලනය කරන්නේ ආණ්ඩුවේ නිලධාරීන් බව කියන්නට සිදු වී තිබෙනවා. කලින් අපක්ෂපාත වාර්තාවක් ඉදිරිපත් කළත් ඊට පසුව නැවත සම්පූර්ණයෙන්ම අසත්‍ය වාර්තාවක් ලබාගෙන තිබෙනවා. රුපියල් පණස් දාහක් පමණ ලාභයක් ඇති සමුපකාර සමිතියෙහි රුපියල් හැට දාහක පමණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාඩුවක් ඇති බවට සම්පූර්ණයෙන්ම අසත්‍ය වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා.

අ. භා. 5

ඇමතිවරයා නොමඟ යවන එවැනි අසත්‍ය ප්‍රකාශ කිරීමට නොහැකි නිසා එහි සිටි කොමසාරිස්වරයා අස් වී තිබෙනවා. උන්නැහේ හොඳ බෞද්ධ උපාසකයෙක්. එවැනි විශාල බොරු උන්නැහේ ලවා කියවන්නට බැහැ. එතුමා බෞද්ධ සංස්කෘතියක ඇතිදැඩි වූ කොමසාරිස්වරයෙක්. උන්නැහේ අස් කර බොරු වාර්තා සපයා සමුපකාර ව්‍යාපාරය නියම ප්‍රතිපත්ති යටතේ වැඩ කිරීම වැලක්වීමට දැන් කටයුතු කර තිබෙනවා. මා විස්තර කියන්නට ඕනෑ නැහැ. වාර්තාව කියෙව්වාම ගරු ඇමතිතුමාට තේරේවි. මේ සමුපකාර සමිති සංගමය කාරක සභාව මගින් පාලනය කළ කාලයේ සිදු වූ අක්‍රමිකතාවයන් ගැන එහි කියනවා. එහෙත් ඒ කාලයේ එකම අක්‍රමිකතාවක්වත් තිබුණේ නැහැ. ඒවා සම්පූර්ණයෙන්ම බොරු. අක්‍රමිකතා සිදු වී තිබෙන්නේ නිලධාරීන් පැමිණියාට පසුවයි.

තමුන්නාන්සේ වේලාව නොදෙන නිසා ඒවා ගැන පසුව කියන්නම්. වැඩිපුර මිනිත්තු දෙකක් ගැනීම ගැන මා කණගාටු වෙනවා. මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

ඒ. පිලපිටිය මයා. (කලවාන)
*(திரு. எ. பிலப்பிற்றிய—கலவான)*
(Mr. A. Pilapitiya—Kalawana)

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය යටතේ ඇති මේ වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡා වන මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව දීම ගැන මා ස්තුතිවන්ත වෙනවා. ආහාර ගැන කථා කරන මේ අවස්ථාවේදී අපේ අගමැතිතුමා මේ රට ස්වයංපෝෂිත කිරීමට ගන්නා දැඩි මහන්සිය පිළිබඳව මුළු මහත් ලංකාවාසී ජනතාව වෙනුවෙන් මගේ ස්තුතිය එතුමාට මේ අවස්ථාවේදී පුද කිරීමට මා බලා පොරොත්තු වෙනවා.

ඊළඟට අපේ ආහාර ඇමතිතුමා ගැනත් වචන ස්වල්පයක් කියන්නට ඕනෑ. මේ නොබෝදා සංචාරයක් සඳහා අප තිදෙනෙක්—මන්ත්‍රීවරුන් තුන් දෙනෙක්—තායිවානයට ගියා. ඒ අවස්ථාවේදී අපට තිළිනයක් වශයෙන් මේ රටේ ගොවි ජනතාවගේ පාවිච්චිය සඳහා බිත්තර වී ටොන් දෙකක් ඒ රටින් එවන්නට යෙදුණා. ගරු ඇමතිතුමාගේ ඒකාධිපති බලය පාවිච්චි කර දුප්පත් ගොවි ජනතාවට එම වී ලබා ගැනීමට ඉඩ නොදීම ගැන මා කණගාටු වෙනවා. ඒ පිළිබඳව මගේ බලවත් විරෝධය මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරනවා. ඒ සමගම මේ තායිවාන් වී පිළිබඳව වචන ස්වල්පයක් තමුන්නාන්සේ ඉදිරියේ තබන්නට කැමතියි. මේ වී ගැන මා හොඳින් දන්නවා. මා විසින් කුඹුරක් අස්වද්දා තායිවාන් වී වපුරා හොඳ අස්වැන්නක් ලබාගෙන තිබෙනවා. එහෙත් අපේ ගරු ඇමතිතුමා ගත් අර පියවර නිසා අපේ ගොවි ජනතාවට එම අවස්ථාව නැති වී යෑම ගැන මා කණගාටු වෙනවා. එමෙන්ම රුපියල් 8,000 ක් පමණ වටිනා එම වී තොගය නිකරුණේ රේගුවේ විනාශ වී යන්නට ඉඩ හැරීම ගරු ඇමතිතුමා විසින් අපේ ගොවිජනතාවට ගැසූ පහරක් හැටියට මා සලකනවා. ඒ ගැන කියන්නේ එපමණයි.

හිටපු අග්‍ර විනිශ්චයකාර බස්නායක මහතා අපේ රටේ ගොවි ජනතාව වෙනුවෙන් දිවා රෑ වෙහෙස වී කුඹුරු හා වැව් ප්‍රතිසංස්කරණය කරමින් අපේ ගොවිතැන නගාසිටුවීම සඳහා ලොකු ප්‍රයත්නයක යෙදෙනවා. එතුමා විසින් බිත්තර වී ටොන් විශාල ගණනක් මේ රටට ගෙන්වීමට උදව් කර තිබෙනවා. එතුමා විසින් ගෙන්වීමට කටයුතු කළ එම වී ප්‍රමාණයත් මේ රටට ගෙන්වීමට ඉඩ නොදීම ගැන මගේ බලවත් විරෝධය මා ප්‍රකාශ කරනවා. ආහාර ඇමතිතුමා ගැන මා කියන්නේ එපමණයි. ගරු ආහාර ඇමතිතුමා අපේ ගොවි ජනතාවට විශාල අපරාධයක් කර තිබෙන බව මා නැවතත් කියා සිටිනවා.

මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාශයෙ පුරන් වූ කුඹුරු හෙවත් දෙණි අක්කර දහස් ගණනක් තිබෙනවා. ඒවා අස්වද්දා ගැනීමට ආණ්ඩුවෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පිලපිටිය මයා.]

දුප්පත් ජනතාවට යම් ආධාරයක් කර තොත් එය අධිරාජ්‍යවාදී යුගයේ සිට පැව තෙන තේ, රබර් සහ පොල් වගාවන් වෙනුවෙන් කරන ආධාරයට දෙවැනි නොවන ආකාරයට කළ යුතුයි. වී ගොවිතැනෙහි යෙදී සිටින ජනයාටත් තේ, රබර් සහ පොල් වගාවල නියුක්ත උදවියට දෙන ආධාරයට සමාන ආධාරයක් ලබා දීමට ගරු ඇමතිතුමා පියවරක් ගනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

මගේ කොට්ඨාශයේ කුඹුරු බොහොම යක් ඉතාමත් නිසරුයි. වැඩි හරියක අස් වනු ප්‍රමාණය බුසලකට බුසල් පහක්වත් නැහැ. ඒ කොයි හැටි වෙතත් ඒවායිනුත් රුපියල් හයක බද්දක් අය කරගෙන යන බවයි මට දැන ගන්නට තිබෙන්නේ. මා හිතන හැටියට ඒ බද්ද ඉතාමත් වැඩියි. ඒ නිසා ඒ බද්ද අඩු කර ගොවි ජනතාවට සහනයක් දෙන්නැයි ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

මගේ ආසනයට අයිති ප්‍රදේශය පුරා විහිදී තිබෙන කුඹුරු රාශියක් ගොවි ජනයා විසින් ප්‍රයෝජනයට ගනු ලබන අතර තවත් අක්කර දහසක් පමණ අලුතින් අස්වද්ද ගැනීමට පුළුවන්කම තිබෙනවා. ඒවා අස්වද්ද ගැනීම සඳහා රජයෙන් ආධාරයක් දෙනු ඇතැයි අප බලාපොරොත්තු වන බව ගරු ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි.

ගොවි උපකරණ ලබා ගැනීම දන් ඉතාමත් අපහසු දෙයක් වී තිබෙනවා. උදලු සහ අනෙකුත් ගොවි උපකරණ ලබා ගැනීම සම්බන්ධයෙන් ගොවීන්ට ඉමහත් දුෂ්කරතාවකට මුහුණ පාන්නට සිදු වෙනවා. අද රුපියල් 22 කටවත් උදල්ලක් ගන්නට බැරි තත්ත්වයක් ඇතැම් ප්‍රදේශවල තිබෙන නිසා ඒ ප්‍රදේශවල ගොවිජනතාවට නොයෙක් විධියේ හිරිහැර කරදරවලට මුහුණ පාන්නට සිදු වෙනවා. ගොවි උපකරණ සහ බිත්තර වී මෙන්ම පොහොර ආදී ගොවිතැනට අවශ්‍ය වෙනත් හැම දෙයක්ම ගොවි ජනතාවට කරදරයක් නැතිව නිකම් ලබා ගැනීමට වැඩ පිළිවෙළක් ගරු ඇමතිතුමා සකස් කරනු ඇතැයි අපේක්ෂා කරන බව ප්‍රකාශ කරනවා.

මගේ වචන සවල්පය අවසන් කිරීමට පෙර තවත් එක් කාරණයක් සඳහන් කරන්නට බලාපොරොත්තු වෙනවා. අපේ රටේ අනාගත දියුණුව ගැනත්, රට සවයංපෝෂිත කිරීම ගැනත් ගරු අගමැතිතුමා ගන්නා දැඩි පියවර ගැන අපට ආඩම්බර වෙන්නට පුළුවනි. ඒ ගැන මගේ බලවත් සතුට ප්‍රකාශ කරන්නට කැමතියි. ගරු අගමැතිතුමා සහ අපේ ගරු කෘෂිකම් ඇමතිතුමාත් මේ රටේ ජනතාවගේ සුභසිද්ධියට ගන්නා මේ ඉතා වැදගත් පියවරවල් ඉතාමත් ඉක්මණින් සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වී මේ රට සවයංපෝෂිත වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ සුළු කථාව අවසන් කරනවා.

ටී. බී. සුබසිංහ මයා. (කටුගම්පොළ)
(திரு. ரீ. பி. சுபசிங்க—கட்டுகம்பொல)
(Mr. T. B. Subasinghe—Katugampola)

ගරු සභාපතිතුමනි, මේ ආණ්ඩුවේ පැවැත්ම හෝ කඩා වැටීම හෝ රඳා පව තින්නේ මේ ආණ්ඩුව ගෙන යන ගොවි ප්‍රතිපත්තිය උඩයි. ඒ ප්‍රතිපත්තිය හරියාකාර ක්‍රියාත්මක වුණත් නූනත් මේ ආණ්ඩුව කඩා වැටෙන බව ඇත්තයි. ඒ ගැන කිසිම සැකයක් නැහැ. එය යථා කාලයේ සිදු වනු ඇතැයි මා සිතනවා. ගරු අගමැතිතුමාත්, ගරු ඇමති තුමාත්, අනෙකුත් ගරු ඇමතිතුමන්ලාත් මේ රටේ අනාගතය ගැන කල්පනා කරන විට, ඒ ගැන කථා කරන විට, ප්‍රකාශ වන හැඟීම්වලින් අප ඇතුළු ඕනෑම කෙනකුට පෙනී යන්නේ ගරු ගොවිකම් ඇමතිතුමාගේ ප්‍රතිපත්ති යම් තාක් දුරට සාර්ථක වෙනවාද, ආණ්ඩුවේ පැවැත්මටත් ඒ තාක් දුරට ඉඩක් ලැබෙනවාය යන්න එතුමන්ලා පිළිගෙන ඇති බවයි. යම් විධියකින් එය කඩාකප්පල් වුණොත් එදට ආණ්ඩුවේ වැටීමත් නියතයි. ඒ අදහස පිළිගෙන තමයි දන් එතුමන්ලා ක්‍රියා කරන්නේ. සාර්ථක වුණත්, නැතත් මේ ආණ්ඩුව බිඳ වැටෙන බවට මා තුළ නම් සැකයක් නැහැ. ගරු ඇමතිතුමා එතුමාගේ ප්‍රතිපත්ති ගැන කොයි තරම් දුරට විශ්වාසයක් තබාගෙන ඉන්නවාදැයි කියතොත් ඒ විශ්වාසයේ ප්‍රමාණය අප අසළ තිබෙන නිලධාරීන්ගේ කුටිය දෙස බලන විට පෙනී යනවා. මොන තරම් විශාල ගොවි හට හමුදාවක් මෙතැනට ගෙනැවිත් සිටිනවාදැයි බැලුවොත් ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බව පෙනෙනවා ඇති. ඒ පිරිස කොයි තරම් උනන්දුවකින් අපේ කථාවලට ඇහුම්කන් දීගෙන සිටිනවාදැයි අපට පෙනෙනවා.

ගොවිතැන දියුණු කර මේ රට ස්වයංපෝෂිත කරන්නට හැකියාවක් තිබෙන බව පළමුවෙන්ම කිව යුතුව තිබෙනවා. ඒ සඳහා ගතයුතු සෑම අඩියක්ම, සෑම පියවරක්ම ගත යුතුව තිබෙනවා. ඒ ගැන කිසිම විරුද්ධත්වයක් නැහැ. ඒ ගැන කිසිම මත භේදයක් නැහැ. මා මේ අවස්ථාවේදී බලාපොරොත්තු වන්නේ අද වැඩ කටයුතු කරගෙන යන ආකාරය සම්බන්ධව යමක් කියන්නටත් අපට පෙනී යන යම් යම් අඩුපාඩුකම් ගරු ඇමතිතුමාට පෙන්වා දෙන්නටත් බව සඳහන් කරන්නට කැමතියි. වැඩ පිළිවෙළේ තිබෙන වැරදි සම්බන්ධව මේ අවස්ථාවේදී කථා කරන්නට මා අදහස් කරන්නේ නැහැ. එහෙත් යම් යම් කාරණා අපේ පළාත් කෙරෙහි බලපාන්නේ කොයි ආකාරයටද යන්නත්, අපේ අත්හදා බැලීම් අනුව අපට දකින්නට ලැබුණු දේ මොනවාද යන්නත් මතු කර කරුණු ස්වල්පයක් ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, මගේ පළාතේ—මා ජීවත් වන පළාතේ—තිබෙන දේශගුණය ගැන කියතොත් ඇත්ත වශයෙන්ම හිරියාල හත්පත්තුව, දේවමැදි හත්පත්තුව වැනි ප්‍රදේශවල දේශගුණය පොළොන්නරුව සහ මින්නේරිය වැනි ප්‍රදේශවල දේශගුණයට වඩා වෙනස් බව තමුන්නාන්සේ දන්නවා. දේශගුණයේ පමණක් නොව පසේ තත්ත්වය ආදී වෙනත් බොහෝ කරුණු සම්බන්ධයෙන් අපේ පළාත වෙනත් බොහෝ පළාත්වලට වඩා බෙහෙවින් වෙනස් බව කියන්නට ඕනෑ. අපේ පළාතේ තිබෙන කුඹුරුවල ස්වභාවයත් ලංකාවේ වෙනත් ප්‍රදේශවල තිබෙන කුඹුරුවල ස්වභාවයට වඩා වෙනස්. අපේ පළාතේ තිබෙන කුඹුරුවලින් හුඟක් හරිය සුළු කුඹුරු හෙවත් පොඩි කුඹුරු. මා එයින් අදහස් කරන්නේ සුළු සුළු ඉඩම් ප්‍රමාණයන් අයිති කුඹුරු හිමියන් සිටින ප්‍රදේශයක් මා නියෝජනය කරන බවයි. අහිංසක, ඉතාමත් දුප්පත් ගැමි ගොවියන් අතිනුයි මේවායේ ගොවිතැන කෙරෙන්නේ. වැඩි දෙනා අද ගොවීන් හැටියටයි, මේ කුඹුරුවල වැඩ කරන්නේ. ඉඩම් හිමියන් වශයෙන් තම තමන්ගේ කුඹුරු ඉඩම් තම තමන් විසින්ම ගොවිතැන් කරගෙන ජීවත් වන, වැඩි පොහොසත්කමක් නැති සාමාන්‍ය පෙළේ ගමරාළලාට අයිති කුඹුරුත් එක්තරා ප්‍රමාණයක් මේ ප්‍රදේශයේ තිබෙනවා. මේ උදවියට මුහුණ පාන්නට සිද්ධ වන විශාලම ප්‍රශ්නය කුමක් ද?

ආර්ථික තත්ත්වයේ තිබෙන දුර්වලකම නිසා බොහොමයක් ගොවීන් හිරිහැර කරදර රාශියකට නිතර නිතර පාහේ මුහුණ පානවා. ඒ එක් පැත්තක් පමණයි. කුඹුරුවල වැඩ කරන ගොවියා සම්පූර්ණ කාලය වී ගොවිතැනට යොදා වැඩ කරන ගොවියෙක් නොවෙයි. ඒ නිසා ඔහු සම්පූර්ණ ගොවියෙකු නොව අර්ධ ගොවියකු හැටියටයි ජීවත් වන්නේ. එදිනෙදා ජීවිතයේ අවශ්‍යතාවන් සපුරා ගැනීමට වුවමනා මිල මුදල් උපයා ගැනීම සඳහා ඔහු බොහෝ විට අහල පහල තිබෙන වතුවලත්, පොල් මෝල්වලත් කුලියට වැඩ කරන්නට යනවා. එහෙත් ඒ අය පරම්පරා ගණනාවක් තිස්සේ කරගෙන ආ අන්දමට කුඹුරුවලට බැස නියම කාලයේදී වැඩ කරනවා. එහෙත් සාමාන්‍ය ගොවිරාළට ශක්තියක් නැහැ, ආණ්ඩුවෙන් බලාපොරොත්තු වන ආකාරයට ක්‍රමානුකූල, ශාස්ත්‍රානුකූල වැඩ පිළිවෙළක් අනුව වී ගොවිතැන කරගෙන යාම සඳහා අවශ්‍ය මුදල් වැය කිරීමට. ඔහු ආර්ථික තත්ත්වයෙන් බොහොම දුර්වලයි. ආර්ථික අතින් මුහුණ පා සිටින අබල දුබලකම නිසා අද කුඹුරු හිමියන්ටත් අවශ්‍ය උපකරණ ආදිය සපයා ගැනීමට තරම් ශක්තියක් නැහැ. පොහොර ආදි වෙනත් දේ සපයා ගැනීම අද ගොවියාට විශාල ප්‍රශ්නයක් වී තිබෙනවා. තව තවත් වැඩ කිරීමට උනන්දු වන්නට පුළුවන්කම තිබුණත් ඒ උනන්දුවෙන් පමණක් නිෂ්පාදනය වැඩි කරන්නට බැහැ. ඒ අයට යම් යම් අවහිරකම් තිබෙනවා. මේවා විසඳීමට මාර්ගයක් තවම ඉදිරිපත් කර තිබෙන බවක් මේ වැඩ පිළිවෙළ අනුව නම් අපට පෙනෙන්නේ නැහැ. මගේ අත්දැකීම් අනුව මට එක් කාරණයක් කියන්නට පුළුවනි. ගොවියාට සම්පූර්ණ බලය පැවරුවොත් ඔහු ලවා වැඩි උනන්දුවකින් වැඩ කරවා ගන්නට පුළුවනැයි මා කල්පනා කළා. කුඹුරු පණත පැනෙව්වාට පසු ඒ ආකාරයට ගොවියාට සම්පූර්ණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

බලය දී බිම් අදය පමණක් භාර ගන්නට මා කැමති වී සිටියා. එහෙත් තමන්ගේ ආර්ථික අබලදුබලකම නිසා එයිනුත් ප්‍රයෝජනයක් ගන්නට අපහසු තත්ත්වයක් තිබෙන බව මට පෙනී ගියා. තවම ඒ පිළිවෙළට වැඩ කරන්නට වුවත් ගොවීන් තුළ වැඩි කැමැත්තක් නැහැ.

බිත්තර වී, පොහොර සහ ට්‍රැක්ටර් ආදි දේවල් කෙසේ නමුත් ගොවියාට ලබා දිය යුතුව තිබෙනවා. ඒවා ලබා ගැනීමේදී ගොවීන් පෙළෙන ආර්ථික තත්ත්වය හුඟක් දුරට ලොකු බාධාවක් වෙලා තිබෙනවා. ගොවිතැන සාර්ථක ලෙස කරගෙන යාමට වුවමනා කරන හැම දේවල්ම සපයා ගැනීමට තරම් ආර්ථික ශක්තියක් තිබෙන ගොවිරාළලා ඉන්නවා නම් ඉන්නේ ඉතාමත් ස්වල්ප දෙනකු පමණක් බව මට කියන්නට පුළුවනි. බොහොම දෙනකුට ඒවා කර කියා ගන්නට බැහැ. ඒ ගැන සිත් යොමු කර යම්කිසි වැඩ පිළිවෙළක් යොදනවා නම් හොඳයි. එහෙත් එවැන්නක් කරතැයි සිතන්නට නම් මට පුළුවන්කමක් නැහැ. මට ඒ ගැන සැකයි.

ණය මුදල් සම්බන්ධව කල්පනා කර බලමු. ආණ්ඩුව විසින් දෙනු ලබන ණය මුදල් වෙනුවෙන් සියේට දොළහක පමණ පොලියක් අය කරන්නට තීරණය කළේ මොන කාරණයක් නිසාදැයි කියන්නට මා දන්නේ නැහැ. මේ ගැන අපේ පළාතේ සමුපකාර සමිති කිහිපයකිනුත්, වෙන වෙනම යම් යම් ගොවීන් විසිනුත් සිය විරුද්ධත්වය ප්‍රකාශ කර තිබෙන බව මට දැන ගන්නට ලැබී තිබෙනවා. ඇතැම් අය සිය විරුද්ධත්වය තරයේ ප්‍රකාශ කර තිබෙන බව මා දන්නවා. රැස්වීම්වලදී ආණ්ඩුවේ ඒජන්තවරුන් ඉදිරියේත් ගොවීන් සිය විරුද්ධත්වය අනේක වාරයක් ප්‍රකාශ කර තිබෙනවා. සියේට දොළහේ පොලියට මුදල් ණයට ගන්නට ගොවීන් බොහොම මැලියි. එසේ ගෙවීමේ පොරොන්දුවට මුදල් අරගෙන වැඩ කරන්නට යන උදවියට වුවත් ඒ මුදල පොලියත් සමග ආපසු ගෙවන්නට තරම් ශක්තියක් ලැබෙන්නේ නැහැ. මේ සම්බන්ධව ගරු ඇමතිතුමාගේ කල්පනාව යොමු කොට පොලිය අතින් සහනයක් සලස්වන ලෙස මා ඉල්ලා සිටිනවා.

අ. භා. 5.15

අනෙක් කාරණය මෙයයි: අද ගරු ආහාර ඇමතිතුමාට තෝරා බේරා ගන්නට සිදු වී තිබෙන්නේ, අපේ රටේ නියම තත්ත්වය තේරුම් ගෙන ඒ අනුව රටට ඔබින අන්දමේ වැඩ පිළිවෙළක් සකස් කරනවාද, එසේ නැත්නම් ලෝක බැංකුව කියන හැටියට නටලා විනාශයට මුහුණ පානවාද යන ප්‍රශ්න දෙකයි.

අස්වනු සංඛ්‍යා ලේඛන ගැන මා මේ අවස්ථාවේදී වචනයක් කිව යුතුයි. මහ කන්නයේ වගාවන් හුඟක් දුරට සාර්ථක වී විශාල අස්වැන්නක් ලැබුණායයි දැන් ප්‍රචාරය වී තිබෙන බව අප දන්නවා. මේ රට මුළාවේ නොදමන ලෙසත් ඇමතිතුමාත් රජයත් මුළාවේ නොවැටෙන ලෙසත් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අස්වනු සංඛ්‍යා ලේඛන සකස් කිරීම සම්බන්ධව බොහෝම පරීක්ෂාවෙන් කටයුතු කළ යුතුයි. ශාස්ත්‍රාචාර්ය පෝෂාන්ගේ "සාම්පල් ක්‍රොප් කටිං" ක්‍රමයේ තිබෙන අඩුපාඩුකම් මොනවාද යන වගත්, එය ක්‍රියාවෙහි යෙදවීමේදී ඒ සම්බන්ධව පළපුරුද්දක් පුහුණුවක් නැති අය අතින් සිදු වන අවාසි තත්ත්වය කුමක්ද යන වගත් අප දන්නවා. අද එක් එක් දිස්ත්‍රික්කයේ "සාම්පල්" ගැනීම සඳහා යොදා ගනු ලබන්නේ සීමාසහිත ප්‍රදේශයක් පමණයි. මා හිතන හැටියට, එක දිස්ත්‍රික්කයක 20 පොළක පමණ "සාම්පල්" ගන්නවා ඇති. එකම දිස්ත්‍රික්කය තුළ වුවත් නොයෙක් විධියේ වෙනස්කම් තිබෙන්නට පුළුවනි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහඔය, ඇඳුරු ඔය අවට ප්‍රදේශ හා නිකවැරටිය වැනි පළාත් ගැන බැලුවොත්, ඒ එක් එක් තැන්වල පසේ තත්ත්වය දේශගුණය ආදියේ වෙනස්කම් ඇති බව පෙනෙනවා ඇති. එවැනි දිස්ත්‍රික්කයක සීමා සහිත ප්‍රදේශයකින් ලබා ගන්නා "සාම්පල්" අනුව සකස් කරන සංඛ්‍යා ලේඛනවලින් අස්වැන්න පිළිබඳ නියම සත්‍යතාව අවබෝධ කර ගන්නට අමාරුයි.

මෙහි තවත් කරුණක් තිබෙනවා. අද මේ "සාම්පල්" ගැනීමේ කටයුත්ත භාර දී තිබෙන්නේ ගොවිකම් දෙපාර්තමේන්තුවේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උපදේශකවරුන්ටයි. එය වැරදියි. "සාම්පල්" ගැනීම සම්බන්ධව ඒ උපදේශකවරුන්ට විශේෂ පුහුණුවක් නැහැ. තමන් කරන වැඩ සාර්ථක බව ගරු ඇමතිතුමාට පෙන්නුම් කිරීම සඳහා පුළුවන් තරම් හොඳ ඉල්ක්කම් ඉදිරිපත් කිරීමේ විශේෂ අවශ්‍යතාවකුත් ඒ උපදේශකවරුන්ට තිබෙනවා. සෑම කෙනෙක්ම එක වගේ වංකයයි මා කියන්නේ නැහැ. එහෙත් ඇතැම් උපදේශකවරුන් නියම තත්ත්වයට වඩා පෙන්නුම් කිරීම සඳහා බොරු ඉලක්කම් යොදන බව මා දන්නවා. හිරියාල හත්පත්තුව, දේවමැදි හත්පත්තුව, ආදී ප්‍රදේශවල මෙවර යල් කන්නය සතුටුදායකයයි කියන්නට බැහැ. හිරියාලේ ගරු මන්ත්‍රීතුමා (එස්. බී. හේරත් මයා.) මේ ගැන මොනවා කියාවිදැයි මා දන්නේ නැහැ. මට ලැබී තිබෙන ආරංචියේ හැටියට නම් එය ඇත්තක්. [බාධා කිරීම්] මා කියන දේ අහගෙන සිටිනවා නම් මා ආරංචි ගෙනැත් දෙන්නම්. ළඟදී අස්වැන්න පහළ නොගිය තැන්වල ඉලක්කම්වලින් පමණක් එය වැඩි කර පෙන්වා තිබෙන බව මා නිර්භයවම ප්‍රකාශ කරනවා. ඒ ගැන සෝදිසි කර බලන්න.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
නැත කියන්න. අප සෝදිසි කර බලන්නම්.

**සුබසිංහ මයා.**
*(திரு. சுபசிங்க)*
(Mr. Subasinghe)
මා තමුන්නාන්සේට විස්තර කියන්නම්.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
දැන් බැරි නම් පස්සෙ කිව්වත් කමක් නැ. අප ඒවා ඇනගන්න ඕනැ.

**සුබසිංහ මයා.**
*(திரு. சுபசிங்க)*
(Mr. Subasinghe)
විස්තර දෙන්නම්.

ගරු සභාපතිතුමනි, අද ගොවිකම් දෙපාර්තමේන්තුව හේම බස්නායක මහත්මයාගේ තායිවාන් වී ගැන ලොකු ප්‍රචාරයක් ගෙන යනවා. තායිවාන් වී ගොවිතැන් කිරීම ගැන හේම බස්නායක මහත්මයාට කොයි තරම් පළපුරුද්දක් තිබෙනවාද යන වග හෝ එම වීවල තත්ත්වය කුමක්ද යන වග හෝ මා දන්නේ නැහැ. මේ රටේ වී ගොවිතැන ශාස්ත්‍රානුකූලව දියුණු කරන්නට රජය අදහස් කරතොත්, විෂ බීජ මේ රටට නොඑන පිළිවෙළට ක්‍රියා කිරීම රජයේ පරම යුතුකමක් නොවේදැයි මා අහනවා. පිටරටවලින් ගෙන්වනු ලබන බීජ වර්ග, මල් වර්ග මගින් මේ රටට විෂ බීජ ඒම වැළැක්වීමට රජය විසින් යොදා තිබෙන ආරක්ෂක මාර්ග මොනවාද? කටුනායක ගුවන් තොටුපොළේ ඒ සම්බන්ධයෙන් කිසිම පරීක්ෂණයක් කරන්නේ නැහැ. වරායේ මේ පරීක්ෂණ භාරව ඉන්නේ කවුද? මේ රෝග ගැන හොඳ අත්දැකීම් ඇති, පුහුණු පිරිසක් ඒවායේ නැහැ. ඉන්නේ සාමාන්‍ය ගොවිකම් උපදේශකයන් පමණයි. මෙවැනි තත්ත්වයක් තිබියදී, අප එක් පුද්ගලයකුට දොස් කීම වටින්නේ නැහැ. ඒ පුද්ගලයා මේ රටට යහපතක් කිරීමේ අදහසින්—හරි හෝ වේවා වැරදි හෝ වේවා—තායිවාන් වී ගෙන්වන විට, ඒ වීවලින් මෙරට ගොවිතැනට හානියක් නොවන විධියට කටයුතු කිරීමේ මූලික වගකීම තිබෙන්නේ ආණ්ඩුවටයි. එම රෝගවලින් මෙරට ගොවිතැන ආරක්ෂා කිරීම සඳහා සුදුසු කටයුතු නොකර, ඒ සඳහා සුදුසු නිලධාරීන් නොයොදවා, එම වී මෙරටට ගෙන්වන්නට ඉඩ හැර, දැන් ඒ පුද්ගලයාට දොස් නැඟීම ගොවිකම් දෙපාර්තමේන්තුවේ යුතුකමක් නොවෙයි. ඒ වී ගෙන්වීම නවත්වන්නට තිබුණේ මුලින්මයි.

කිව යුතු කරුණු රාශියක් ඇතත් කාල සීමාව ප්‍රමාණවත් නොවන නිසා ඒ හැම එකක්ම කියන්නට නොහැකි වීම ගැන මා කණගාටු වෙනවා. එහෙත් තවත් එක් කාරණයක් ගැන පමණක් මතක් කර, මගේ කථාව අවසාන කරන්නට බලාපොරොත්තු වෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ එක්තරා ස්කාගාරයක් තිබුණා. එය අයිතිව තිබුණේ බලවත් පුද්ගලයන් කීප දෙනකුටයි. හදිසියේම ඒ ස්කාගාරය සමුපකාර සමිතියකට පවරන්නට එම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

ස්කාගාරය අයිතිකරුවන්ට වුවමනා වුණා. එම ස්කාගාරයේ කම්කරුවනුත් තවත් අයත් එකතු වී සමුපකාර සමිතියක් පිහිටෙව්වා. බෙහොම අභාවයට ගොස් තිබුණු ඒ ස්කාගාරය එම සමුපකාර සමිතියට රුපියල් ලක්ෂ 4 කට භාර දිය යුතු යයි තක්සේරුවක් කර, එය එම සමුපකාර සමිතියට පවරන්නට කටයුතු කළා. මා දන්නා හැටියට, සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඊට විරුද්ධ වුණා.

කම්කරුවන්ට ඒ සමුපකාර සමිතියේ සාමාජිකත්වය දුන්නේ කොහොමද ? ඒ ස්කාගාරයේ අයිතිකරුවන් කම්කරුවන්ට මුදල් ගෙවීම් කරන්නට තිබුණා. ඒ ගෙවිය යුතු මුදල් වෙනුවෙන් කම්කරුවන්ට කොටස් පැවරුවා. ඒ ක්‍රමයට සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විරුද්ධ වුණා. එහෙත් යම් යම් බලපෑම් ඇති වුණා. එහි අද තත්ත්වය මොකක් දැයි මා දන්නේ නැහැ. අබලන් වුණු ස්කාගාරයක් අත්තිවාරමක් නැති පිළිවෙළට සමුපකාර සමිතියකට පවරන්නට නැත් කළේ, පරණ අයිතිකරුවන්ට විශාල ලාභයක් අත් කර දීමටයි. ඒ පිළිබඳව පරීක්ෂා කර බලන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලමින් මගේ වචන සවල්පය මෙයින් අවසාන කරනවා.

**සභාපති**

*(அக்கிராசனர்)*

(The Chairman)

The hon. Member for Paddiruppu will have to confine his speech to ten minutes.

**එස්. එම්. රාසමානික්කම් මයා.** (පදිරිප්පු)

*(திரு. எஸ். எம். இராசமாணிக்கம்—பட்டிருப்பு)*

(Mr. S. M. Rasamanickam—Paddiruppu)

You have allowed me only ten minutes to make my speech. I think you want me to be brief because you think the less we speak the better will be the results.

**සභාපති**

*(அக்கிராசனர்)*

(The Chairman)

I have to dam many a brook today.

**රාසමානික්කම් මයා.**

*(திரு. இராசமாணிக்கம்)*

(Mr. Rasamanickam)

I will give that advice to the Hon. Minister of Agriculture and Food because the less we speak the more we will be able to produce in our food production campaign.

I must congratulate the Hon. Prime Minister and the Minister of Agriculture for the tremendous efforts they are making in the food production campaign. Judging from the work done and the activities of the department I feel we are in for a grand success. Whatever it may be, an assessment can be done only at the end of the Maha season.

I shall confine myself to a few points in order that the Hon. Minister may be able to grasp the situation particularly in the Eastern Province. Sir, I come from the Eastern Province, one of the foremost agricultural areas in this Island, which produces a larger quantity of paddy than any other province in this country.

As far as the next Maha is concerned every effort is being made by the government agents of Batticaloa and Amparai districts to have a very good harvest. They are sparing no pains to make it a success.

There are one or two shortcomings that I want to bring to the notice of the Hon. Minister and I hope he will address his mind to them. I agree with the hon. Member for Anuradhapura (Mr. K. B. Ratnayake) and the hon. Member for Trincomalee (Mr. S. M. Manickarajah) that unless the subject of irrigation is brought under the Minister of Agriculture and Food there is likely to be this lack of co-ordination resulting in deadlock and this would undoubtedly be an obstacle in the matter of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

achieving quick results. I think that this is a matter for the Government to decide as a matter of policy because this lack of co-ordination in the sphere of agricultural work tends to be a source of hindrance to the development of agriculture at least in my part of the country. The irrigation works and the construction of anicuts started years ago still remain unfinished probably due to no fault of the Irrigation Department but due to the lack of necessary equipment and the other resources to do a quick job of work.

War-time conditions demand war-time efforts and in the same way in this extraordinary campaign that we are carrying on in regard to food production we must employ extraordinary methods in providing irrigation facilities and so on. I said that the Irrigation Department is unequal to the task of doing a quick job of work because of the lack of resources and machinery. Therefore, it would be worthwhile for the Government to consider the question of handing over major irrigation and construction work which must be done quickly to contractors and contracting companies or even an organization like the Gal Oya Development Board which has all the resources and man-power to undertake such work and then do it quickly. This is a matter which the Hon. Minister must consider.

As far as the Eastern Province is concerned there is another matter, and that is the question of agricultural roads. Now the lack of proper agricultural roads had been one of the impediments to the rapid development of agriculture in the Eastern Province. This has been pointed out from time to time, but very little attention has been paid by the Government to the development of agricultural roads. Large tracts of land perhaps running into thousands of acres, have no roads. The agriculturalists are handicapped by the difficulty of transporting to their fields their implements, seed paddy, manure, and whatever else is necessary for their agricultural purposes.

There is also the problem of transporting paddy to their homes or to the mills. Roads should be provided even as a short-term measure so that some kind of access will be available to the paddy fields. The provision of roads will promote the food production campaign which the Hon. Minister is pursuing.

One other problem that the agriculturalists in the Amparai and the Batticaloa districts are facing is the paucity of tractors to plough the fields.

The cattle population in these two districts has dwindled considerably in the recent past on account of the large-scale clearing done by the Gal Oya Development Board to provide high land and paddy land for the colonists in the area without making adequate provision for pasture land. As a result, the cattle population has been practically eliminated from those areas.

 අ. භා. 5.30

The problem of ploughing is causing anxiety. Unless an adequate number of tractors is provided at the proper time and at reasonable rates, farmers will find it difficult to plough their lands. The distribution of water should synchronize with the requirements of farmers so that the sowing will not get staggered and cultivation operations dislocated. So, it is very necessary to have tractor units in a number of places. I do not say that the Government should establish these tractor units. The Government can induce the private tractor owners to organize themselves into units and locate those units at reasonable distances so that farmers could hire the tractors to plough their fields in time. If this is done, farmers will not experience the difficulties they are in today. So, I hope the Hon. Minister will pay some attention to this matter.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාසමානික්කම් මයා.]

I have no time for all the matters I should like to raise, but I would touch upon the question of the proposed agricultural loans to farmers. The Ministry some time ago announced its new agricultural credit scheme which, it was said, would benefit the farmer. Certain pronouncements were made which gave great hopes to the farmer. It was said that, irrespective of whether a society was indebted to the Commissioner of Agrarian Services or not, irrespective of whether an individual was indebted to the society or not, agricultural credit would be extended to the society or individual ; that each individual would be given credit at the rate of Rs. 220 per acre up to a maximum of ten acres ; and that the bank would advance that credit in place of the Commissioner of Agrarian Services who had hitherto undertaken that job.

Of late, however, I find that the situation is slightly changing. There is doubt in the country as to whether these pronouncements are being implemented. I understand that representatives of the People's Bank visited Batticaloa recently and examined loan applications from various societies with a view to ascertaining their creditworthiness. They had rejected almost forty per cent of the applications made by societies on the ground that they were not creditworthy. If that is so, about 40 per cent of the people in the district are going to be denied agricultural loans. I would request the Hon. Minister to make a statement as to how the loan scheme would operate—whether due to some fault of somebody in the society or due to the society being indebted to the Commissioner of Agrarian Services on a past agricultural loan, that society will be denied the new credit facilities. If that is the position, I am afraid the farmer is not going to get even the credit that he got from the Commissioner of Agrarian Services. This is a matter which I should like the Hon. Minister to explain because the farmers, particularly those in the Eastern Province, are perturbed. If the bank refuses to give credit to these societies on the ground that they are not creditworthy, then. I say that the Government must revert to the old system of giving loans through the Commissioner of Agrarian Servces. Otherwise, the farmers will face the situation of being stranded in mid-ocean.

සභාපති
*(அக்கிராசனர்)*
(The Chairman)

The hon. Member has taken the 15 minutes allotted to him.

රාසමානික්කම් මයා.
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

I do not wish to test your patience, Sir. I hope the policies of the Hon. Minister will bear fruit and bring prosperity to the country. I also hope that the officers in the Department of Agriculture and in the Department of Agrarian Services will spare no pains to make the food production drive a success.

එල්. සි. ද සිල්වා මයා. (බලපිටිය)
*(திரு. எல். சி. த சில்வா—பலப்பிட்டிய)*
(Mr. L. C. de Silva—Balapitiya)

සභාපතිතුමනි, පදිරිප්පුවේ ගරු මන්ත්‍රීතුමා (එස්. එම්. රාසමානික්කම් මයා.) කීවා වගේ, ඇමතිතුමා විසින් මේ මාස් කන්නයේ සිට ක්‍රියාත්මක කර ඇති ණය ක්‍රමය ගැන රජය විශාල ඝෝෂාවක් කළ නමුත්, මේ ණය ක්‍රමය නිසා මෙතෙක් ණය වෙනුවෙන් ගොවියන් ගෙවූ පොලිය මෙන් තුන් ගුණයක පොලියක් ගෙවන්නට සිදු වී තිබෙන බව අපට පැහැදිලිවම පෙනී යනවා. අද ලංකා බැංකුවත් මහජන බැංකුවත් මාර්ගයෙන් ක්‍රියාත්මක කරන මේ ණය ක්‍රමය යටතේ සියයට 12 ක පොලියක් ගෙවන්නට ගොවියන්ට සිදු වී තිබෙනවා.

මේ ණය මුදල් සැපයීම බැංකුවලට භාර දුන්නේ කුමක් නිසාදැයි අපට තේරුම් ගන්නට බැහැ. මේ රටේ ධනපතියන්ට තේ කාර්මාන්තශාලා අළුතෙන් ඇති කිරීමට හා ඒවා අළුත්වැඩියා කිරීමටත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බැංකුවලින් දෙන ණය වෙනුවෙන් අය කරන පොළියෙන් හරි අඩක් සහනයක් වශයෙන් රජයෙන් ගෙවීමට වැඩ පිළිවෙළක් මේ ඇමතිතුමාම සකස් කළා නම්, එවැනි අමාත්‍යාංශයකින්, අසරණ ගොවියාට වී ගොවිතැන සඳහා දෙන ණය මුදලට අය කරනු ලබන පොළිය වැඩි කිරීමේ හේතුව මොකක්දැයි අප දැනගන්නට කැමතියි. නියම වෙලාවට ගෙව්වොත් පොළිය අඩු කරන බවට ඇමතිතුමා පත්‍ර මාර්ගයෙන් ප්‍රකාශයක් කර තිබෙනවා මා දැක්කා, එහෙත්, ණය දෙන ආයතනවල සාමාන්‍ය සිරිත යම්කිසි පොළියක් නියම කර, වෙලාවට මුදල් නොගෙව්වොත් දඩ පොළියක් අය කිරීමයැයි මා හිතනවා. මෙහි තිබෙන්නේ, පොළිය ඉහළ මට්ටමෙන් තබා, "වෙලාවට ගෙව්වොත් පොළිය අඩු කරනවා" කියන පොරොන්දුවක් පමණයි.

මේ ණය දෙන ක්‍රමය සම්බන්ධයෙන් ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කළ යුතු තවත් එක් ප්‍රශ්නයක් තිබෙනවා. බැංකුවෙන් සමුපකාර සමිතිවලින් බැඳුම්කරයක් ඉල්ලනවා දවස් 270 ක්—මාස නවයක්—අවසානයේදී ගොවියන්ගෙන් මුදල් අය වුණත් නැතත්, සමුපකාර සමිතියේ ජංගම ගිණුමෙන් හෝ බැංකුවේ තිබෙන වෙනත් ඕනෑම ගිණුමකින් හෝ ඒ මුදල අය කර ගැනීම සඳහා බලය පැවරෙන විධියට.

යම් විධියකින් ගොවීන්ගෙන් ණය ලබා ගැනීමට සමිතියකට බැරි වුණායැයි සිතමු. එවැනි අවස්ථාවකදී එම සමිතියේ මුදල් වලින් බැංකුව එම මුදල් කපා ගත්තොත් සලාක ද්‍රව්‍ය ටිකවත් ලබාගන්නට එම සමිතියට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. අද මෙම සමිති කීපයක්ම එක්තරා බියකින් පසු වන බව පෙනෙනවා. මෙම ණය මුදල ගන්නවාද, එම මුදල ගත්තොත් අපේ අනිකුත් ව්‍යාපාරවලටත් එය තර්ජනයක් බවට පත් වේද කියන විශාල බියයි, අද ඔවුනට තිබෙන්නෙ. මධ්‍යම බැංකුවට සියයට 75ක් ආපසු ගෙවීම සඳහා ඇපයක් දී තිබෙන බව අප දන්නවා. බැංකුව මෙතරම් දරදඬු අන්දමට ක්‍රියා කළ යුතු නැතැයි කියන අතරම, බැංකුවට මේ පිළිබඳව නිසි උපදෙස් දෙන ලෙස මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

සමුපකාර සමිති මාර්ගයෙන් මෙම ණය ක්‍රමය ක්‍රියාත්මක කරන විට පොහොර බෙදීමත් වී මිලට ගැනීමත් යනාදී කටයුතු ඒකාබද්ධ ආකාරයට සමුපකාර සමිති ව්‍යාපාරය මගින්ම කළයුතුය කියා තමුන්නාන්සේ පවා පිළිගන්නවා ඇති. එවැනි තත්ත්වයක් තිබියදී පොහොර බෙදා දීම පුද්ගලික වෙළෙන්දන්ට කරගෙන යන්නට ඉඩ දුනහොත් අනර්ථයක් සිදු වන්නට පුළුවනි. පුද්ගලික වෙළෙන්දා ගොවීනට ණය මුදල් යනාදිය දීමෙන් ඔවුන් නිපදවන වී ටිකත් තමන්ටම ලබා ගන්නට වැඩ කටයුතු යොදා ගන්නා බව පෙනෙනවා. එසේ වූ විට එම ගොවියාගෙන් අර ණය මුදල අය කර ගන්නට සමුපකාර සමිතියට බැරි වෙනවා. මෙතෙක් සමුපකාරය මගින් නිසියාකාර පොහොර බෙදා දීම කළා නම්, මෙම අවස්ථාවේදී එම කටයුත්ත පුද්ගලික වෙළෙන්දන්ට භාර දෙන්නට කිසිම යුතුකමක් ඇත්තේ නැහැ. මගේ දිස්ත්‍රික්කය භාරව සිටින දිසාපතිතුමාටත් මවිසින් මෙම කාරණය පෙන්වා දී තිබෙනවා. පුද්ගලික වෙළෙන්දන්ට පොහොර බෙදා දීමට ඉඩ දුනහොත් වී මිලට ගැනීමේදී සමුපකාර සමිතිවලට ලොකු අනවරයනට මුහුණ පාන්නට සිදු වෙනවා ඇති. මෙම කාරණය පිළිබඳව විශෙෂ අවධානය යොමු කරන ලෙසත් පුද්ගලික වෙළෙන්දන්ට පොහොර බෙදා දීම භාර නොදෙන හැටියටත් තමුන්නාන්සේගෙන් මා ඉල්ලා සිටිනවා.

වාරිමාර්ග පහසුකම් සම්බන්ධයෙන් අ වචන සවල්පයක් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. පසුගිය අවුරුදු කීපය තුළදීම මෙම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. සී. ද සිල්වා මයා.]

ඉල්ලීම මා තමුන්නාන්සේගෙන් කර තිබෙනවා. මොන සටනක් කර හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුව තමුන්නාන්සේ යටතට ගන්නය කියන එකයි, මා කියා සිටින්නේ. එය කිරීම දුෂ්කර බව අප දන්නවා. අතහරින්නේ නැති මිනිසකු අතෙයි, එම දෙපාර්තමේන්තුව තිබෙන්නේ. මේ රටේ ගොවියාට හෙන ගැහුවත් මේ රටේ ජනතාවට තණකොළ කන්නට සිදු වුවත් ඒ මනුස්සයාගේ අමාත්‍යාංශයෙන් පොඩ්ඩක්වත් වෙන කෙනෙකුට දෙන්නට සූදානම් නැහැ. එම නිසා අඩු වශයෙන් ලක්ෂයක් දක්වා ඇස්තමේන්තු කරන ලද වාරිමාර්ග ක්‍රමවත් තමුන්නාන්සේගේ අමාත්‍යාංශයට පවරා ගෙන ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මඟින් එම වැඩ පිළිවෙළ නිසියාකාර ක්‍රියාත්මක කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

අද තිබෙන පිළිවෙළේ හැටියට රුපියල් 15,000 ක මුදලක් පමණයි, එම දෙපාර්තමේන්තුවෙන් වැය කරන්නට පුළුවන්කම තිබෙන්නේ. ඒ මුදල කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ. මගේ ප්‍රදේශයේ ඇලවේල් ගණනාවක් පිළිබඳවම ප්‍රශ්න කරනු ලැබූ විට ඒ හැම අවස්ථාවකදීම මට කියා සිටියේ ඒ පිළිබඳව ක්‍රියා කරන්නට වාරිමාර්ග දෙපාර්තමේන්තුවට භාර දුන් බවයි. 1970 වන විට මෙම වැඩ පිළිවෙළේ යම්කිසි තත්ත්වයකට යන්නට තමුන්නාන්සේලා කල්පනා කර සිටින බව කියනවා. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැඩ පිළිවෙළ දෙස බලන විට 1970 නොවෙයි 2970 දී වත් එය කරන්නට පුළුවන්කමක් නොලැබෙන බවයි, පෙනෙන්නේ. මෙම ප්‍රශ්නයට තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්නේ නම් ජනතාවට විශාල සෙතක් සැලසෙනු නොඅනුමානයි.

ගරු ඇමතිතුමා විසින් ආරම්භ කරන ලද ආහාර වගා කිරීමේ ප්‍රතිපත්තියෙහි ප්‍රතිඵලයක් වශයෙන් එළවළු ගොවිතැනෙහි යෙදී සිටින ගැමි ජනතාව ලොකු අනතුරකට භාජනව සිටින බව කියන්නට ඕනෑ. තමුන්නාන්සේ ධනපතියන්ට බෙදා දුන්න අක්කර 57,000 වැඩි වශයෙන් වගා කර තිබෙන්නෙ සාමාන්‍යයෙන් ගැමි ගොවියන් වගා කරන එළවලු වර්ගයි. ඒ ධනවතුන්ට සැහෙන විදේශ විනිමයකුත් වෙන් කර දුන්න නිසා ඒ උදවියට පුළුවන් වුණා, අවශ්‍ය රථවාහන ගෙන්වාගෙන ඔවුන් වගා කරන ඒ එළවුළු කොළඹ වෙළඳපොලට ගෙනැවිත් අඩු මිළකට විකුණා ගන්න. එයින් සිදු වුණේ ගම්බද ප්‍රදේශවල ගැමි ගොවීන් මෙතෙක් කල් වගා කළ එළවුළු මිළයට ගැනීමට කොළඹින් ඒ ප්‍රදේශවලට ගිය වෙළෙඳුන් එහි නොයාමයි. මේ හේතුව නිසා අද ඒ ගොවියා ඉතා අසරණ තත්ත්වයකට පත්ව සිටිනව. ඔවුන්ගේ කැකිරි, පිපිඤ්ඤා, වැටකොළු, බණ්ඩක්කා, තක්කාලි ගොඩවල් අද පාර අයිනේ කුණු වෙමින් යනව.

තමුන්නාන්සේගේ යටතේ තිබෙන අළෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නම් මේ වගකීම ඉටු වෙන්නෙ නැහැ. ඇත්ත වශයෙන්ම අළෙවි කිරීමේ දෙපාර්තමේන්තුව තබා ගැනීම අවශ්‍යදැයි අපට තේරෙන්නෙ නැහැ. දැන් උදා වී තිබෙන තත්ත්වය උඩ අළෙවි කිරීමේ දෙපාර්තමේන්තුව සම්පූර්ණයෙන්ම අහෝසි කර දමන්ට ඕනෑ. මේ තරම් විශාල මුදලක් වැය කරමින් මේ දෙපාර්තමේන්තුව පවත්වාගෙන යෑම කිසිසෙත්ම යුක්තිසහගත නැහැ. ආරෝග්‍යශාලා කීපයකට කෑම සැපයීම හැරුණු කොට ඒ දෙපාර්තමේන්තුවෙන් කිසිම සේවයක් සිදු වෙනවා යයි අපට පිළිගන්නට බැහැ. ඒ ආරෝග්‍යශාලාවලට කෑම සැපයීමේ කටයුත්තත් අනික් ආරෝග්‍යශාලාවල කරන්නා වගේ කොන්ත්‍රාත්කරුවන්ට භාර දී හෝ සමුපකාරවලට භාර දීම හෝ කරන්ට බැරිකමක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම නිසා මේ අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවෙන් ප්‍රධාන වශයෙන්ම ඉටු විය යුතු වගකීම් ඉටු නොවන නිසා එය සම්පූර්ණයෙන්ම වසා ඇමීම ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වේවායි අපි ප්‍රාර්ථනා කරනව.

සමුපකාර ව්‍යාපාරයටත් මෑතක සිට සෙනසුරාගේ දශාව ලබා තිබෙන බව මා අවසාන වශයෙන් මතක් කරන්ට කැම තියි. ආහාර අමාත්‍යාංශය හදිසි නීති පාවිච්චි කරමින් සමුපකාර සමිති, සමුපකාර සංගම් ආදිය විසුරුවා හැරියා. දූෂිත සමුපකාර සමිති හා සමිති සංගම් තිබෙනව නම් ඒවා විසුරුවා හැරිය යුතුමයි. අප්‍රමාදව ඒවා විසුරුවා හැරිය යුතුයි. එහෙත් ඒවා නිලධාරි පාලනයට ගැනීම සමුපකාර ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් හෙළා දැකීමක් බව මතක් කළ යුතුයි. දූෂිත වැඩ පිළිවෙලක් නිසා යම්කිසි සමුපකාර සමිතියක් හෝ සමිති සංගමයක් විසුරුවා හැරියොත්, ඒ සමුපකාර සමිතියේ නැත්නම් සමිති සංගමයේ මහා සභා රැස්වීමක් කැඳවා යළිත් නව නිලධාරි මණ්ඩලයක් පත් කිරීමයි, තමුන්නාන්සේට කරන්ට තිබෙන්නෙ: සමිති විසුරුවා හැර නිලධාරියකුට භාර දීම නොවෙයි. ඇත්ත වශයෙන්ම මේ විසුරුවා හැරීම් පවා මොන ප්‍රතිපත්තියක් උඩ සිදු කරනවාදැයි මා නම් දන්නෙ නැහැ.

අ. භා. 5.45

තල්පෙ පත්තුවේ විවිධ සේවා සමුපකාර සමිති සංගමය විසුරුවා හැරීමට මා දන්න තරමින් නම් කිසිම හේතුවක් නැහැ. බදුල්ලෙ මන්ත්‍රීතුමා (බී. එච්. බණ්ඩාර මයා.) දන්නවා ඇති; අපි දන්නවා, බදුල්ල සමුපකාර සංගමයේ සභාපතිතුමා වානේ සංස්ථාවෙන් යකඩ ටොන් 15 ක් ලබාගෙන ඒවා කොළඹ දී විකුණා ගිය බවට බදුල්ල පළාතේ විශාල දෝංකාරයක් තිබෙන බව. යකඩ ටොන් 15 ක් ඒ අන්දමට කොළඹ දී වික්කා නම්, අද පාලන මිළත්, වෙළඳපොලේ පවතින මිළත් අතර පවතින පරතරය දෙස බලන විට ඒ ජාවාරමෙන් ඒ සභාපතිවරයා රුපියල් 12,000 ක් විතර හම්බ කර ගන්න ඇතැයි මට හිතෙනව. ඒ සංගමය විසුරුවා නොහරින්න තිබෙන එකම හේතුව තමයි, ඒ සභාපතිවරයා තමුන්නාන්සේලාගේ පක්ෂයෙන් බදුල්ලෙ ගරු මන්ත්‍රීතුමා සමඟ තරග කළ පුද්ගලයා වීම. ඒ නිසා වෙන්ට ඇති, ඒ සමුපකාර සමිති සංගමය විසුරුවා නොහැරියේ. හදිසි නීති යටතේ තමුන්නාන්සේ ඊට වඩා බොහොම සුළු වැරදිවලට ඇතැම් සමුපකාර සමිති, සංගම්, ආදිය විසුරුවා හැර තිබියදී, මෙතරම් බරපතළ වරදක් කළ සමුපකාර සංගමයක සභාපතිවරයා ඒ තනතුරෙන් ඉවත් නොකළේ ඇයි කියා සමුපකාර කොමසාරිස්තුමාගෙන් විමසන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව.

සමුපකාර සමිතිවල දූෂණ සිදු වෙනවා නම් ඒවා සුද්ධ කිරීම ඇමතිතුමාගේ වගකීමයි. ඒකට අපේ විරුද්ධත්වයක් නැහැ. එහෙත් නිලධාරි පාලනයට සමුපකාර පැවරීම මේ ව්‍යාපාරයට කරන ද්‍රෝහිකමක් බව මතක් කළ යුතුව තිබෙනව. අනික් කාරණය, තමුන්නාන්සේ කල්පනා කර බලන්න ඕනෑ, මේවායේ මෙතරම් දූෂණ සිදු වෙන්න හේතු මොනවාද කියා. බොහොමයක් සමිති නියමිත දිනයට මහා සභා රැස්වීම් නොපැවැත්වීම මීට ප්‍රධාන හේතුවයි. නිලධාරීන් හිඟකම නිසා කොමසාරිස්තුමාට තිබෙන බලතල යටතේවත් මේවායේ මහා සභා රැස්වීම් කැඳවන්න පුළුවන්කමක් නැහැ. මගේ ආසනයේත් එක සමුපකාර සමිති සංගමයක් තිබෙනව, ඒකෙත් මහා සභා රැස්වීමක් කැඳවන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. සී. ද සිල්වා මයා.]

කියා මා ගාල්ලේ සමුපකාර සහකාර කොමසාරිස්තුමාට ලියුම් ගණනාවක් යැව්ව. නමුත් මේ දක්වා බැරි වුණා. එතුමා මුණගැසුණු සෑම අවස්ථාවකදීම කියන්නේ නිලධාරීන් හිඟය කියායි. එය මා පිළිගන්නවා. ගාලු දිස්ත්‍රික්කයේ සමුපකාර ව්‍යාපාරය මෙතරම් නොදියුණු කාලයේ, සමිති 700 ක් පමණ තිබෙන කාලයේ, සහකාර කොමසාරිස්වරයකුත්, අතිරේක සහකාර කොමසාරිස්වරයකුත් ප්‍රධාන පරීක්ෂකවරුන් 5 දෙනෙකුත් සිටියා. නමුත් සමුපකාර සමිති 1,000 ක් පමණ තිබෙන අද ගාලු දිස්ත්‍රික්කයේ සිටින්නේ සහකාර කොමසාරිස්වරයකුත් ප්‍රධාන පරීක්ෂකවරුන් දෙදෙනෙකුත් පමණයි. නිලධාරීන්ගේ හිඟය නිසා නියමිත වේලාවට මේ සමුපකාර සමිති සංගම්වල අවශ්‍ය පරීක්ෂණාදිය කරන්නට නොහැකි වී තිබෙනවා. එම නිසා මේවායේ කාරක සභාවල සිටින අය තමන්ට මේවා පෞද්ගලික ව්‍යාපාර හැටියට දන් පවත්වාගෙන යන්නට පුළුවන්ය කියා කල්පනා කරනවා. සමුපකාර ව්‍යාපාරයේ දූෂණ නැති කරන්නට නම්, සෑහෙන නිලධාරි සංඛ්‍යාවක් පත් කිරීම අවශ්‍යයි. නිලධාරීන්ගේ හිඟයක් තිබෙනවා නම් අළුත් නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කරන්න.

අවසාන වශයෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. සමුපකාර ව්‍යාපාරයේ හොරුන් සිටිනවා නම් එළවන්න. සමුපකාර ව්‍යාපාරය පිරිසිදු කරන්න. සමුපකාර ව්‍යාපාරය කෙරෙහි මීට වඩා විශ්වාසයක් තබා ගෙන, සමුපකාර ව්‍යාපාරයට මීට වඩා වගකීම් භාර දී ක්‍රියා නොකළොත්, තමුන්නාන්සේලා බලාපොරොත්තු වන පරිදි ආහාරයෙන් මේ රට ස්වයංපෝෂිත කිරීමේ කටයුත්ත සාර්ථක නොවන බව මා මතක් කරනවා.

**පර්සි සමරවීර මයා.** (වැලිමඩ)
(*திரு. பேர்ஸி சமரவீர—வெலிமட*)
(Mr. Percy Samaraweera—Welimada)

ගරු සභාපතිතුමනි, කෘෂිකම් හා ආහාර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ වැදගත් කරුණු කීපයක් ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවීමට මා බලාපොරොත්තු වෙනවා. ඉහළ ඌව ප්‍රදේශයේ වී වගාව සම්බන්ධව මේ අවස්ථාවේදී යමක් කියන්නට වුවමනාය කියා මා අදහස් කරන්නේ නැහැ. එහෙත් බොහෝ කාලයක් තිස්සේ මේ සභා ගර්භය තුළ දීත් පිටතදීත් මතු කරන වැදගත් ප්‍රශ්නයක් තිබෙනවා. අපේ ප්‍රදේශවල ගොවි ජනතාවගේ ජීවනෝපාය එළවළු වගාවයි. අපේ ප්‍රදේශවල ජනතාව ප්‍රධාන වශයෙන් ම කරන වගාව එළවළු වගාවයි. එම නිසා එළවළු වගාව සම්බන්ධව මේ අවස්ථාවේ දී වචන ස්වල්පයක් කථා කරන්නට මා අදහස් කරනවා. එළවළු වගාව පිළිබඳව මීට ඉහතදීත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවා තිබෙනවා. එළවළු වගාව සම්බන්ධව මොන විධියේ ආධාර උපකාර ලබා දී තිබුණත්, ඒ ගොවි ජනතාව නිෂ්පාදනය කරන එළවළු ප්‍රමාණය නියම මිළකට අලෙවි කර ගැනීමට තවමත් නොහැකි වී තිබෙනවා. ඒ නිෂ්පාදනය කරන එළවළු නියම මිළකට අලෙවි කර ගන්නට බැරි නම් කවදාවත් ඒ ගොවි ජනතාව දැනට සිටින තත්ත්වයෙන් ගොඩ ගන්නට ලැබෙන්නේ නැහැ. කීප වතාවක්ම මේ කාරණය ගැන අප කරුණු ඉදිරිපත් කර තිබෙනවා. නමුත් අවුරුදු ගණනාවක් තිස්සේ පවතින ක්‍රමයෙහි වෙනසක් වී නැහැ. වැලිමඩ කොට්ඨාශයට පමණක් නොව තවත් කොට්ඨාශ කීපයකට බලපාන මේ ප්‍රශ්නය පිළිබඳව මීට වඩා උනන්දුවක් දක්වා ක්‍රියා කළ යුතු බව මා ප්‍රකාශ කරනවා.

ගරු සභාපතිතුමනි, අද තිබෙන ක්‍රමය අනුව ඒ ප්‍රදේශවල ගොවීන්ට සහනයක් ලබා දිය හැකිය කියා මා විශ්වාස කරන්නේ නැහැ. අපේ ප්‍රදේශවල ගොවි ජනතාව නිෂ්පාදනය කරන එළවළු සමුපකාර සමිතිවලින් එකතු කර බෙදා හරින ක්‍රමයක් දැනට තිබෙනවා. ඒ වාගේම නිපදවන්නන්ගේ සමිතියය කියා තවත් එකක් තිබෙනවා. ඒ නිපදවන්නන්ගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමිතිය මාර්ගයෙනුත් මේ එළවළු දිවයිනේ නොයෙක් නොයෙක් ප්‍රදේශවලට ගෙන ගොස් අලෙවි කිරීමේ සිරිතක් තිබෙනවා. නමුත් මේ නිපදවන්නන්ගේ සමිතියෙන් එහි සාමාජිකත්වය දරණ ගොවි මහතුන්ට කුමන සහනයක් ලැබෙනවාද කියා මා ප්‍රශ්න කරන්නට සතුටුයි. නිපදවන්නන්ගේ සංගමයේ ශාඛා ලංකාවේ කීප පොළකම පිහිටුවා තිබෙනවා. කුරුණෑගල පිහිටුවා ඇති ශාඛාව බැලීමට මා දවසක්දා ගියා. එදා එහි කළමනාකාර මහතා මට කීවේ, කුරුණෑගල සිටින පෞද්ගලික වෙළෙඳුන්ගෙන් එළවළු මිළයට ගෙන විකුණන්නට තමන්ට සිදු වී ඇති බවයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිපදවන්නන්ගේ සංගමයට විශාල මුදලක් දෙනවා. එහෙත් මෙම නිපදවන්නන්ගේ සංගමය කොතරම් ප්‍රබල වුණත්, රජයේ සහාය ඇතිව වැඩ කරගෙන යන්නට ඒ සංගමය නැත් කළත්, කොළඹ පිටකොටුවේ සිටින තුන්සියයක් පමණ වූ වෙළෙඳුන්ගේ බලයට යට වන්නට ඒ සංගමයට සිදුවී තිබෙනවා. ලංකාවට එක දවසකට එළවළු ටොන් එකසිය අසූවක් වුවමනායි. එයින් හතරෙන් තුන් පංගුවක් පමණ සපයන්නේ වැලිමඩ කොට්ඨාශයෙන් සහ ඒ අවට ඇති කොට්ඨාශවලිනුයි. ඒ තරම් එළවළු නිපදවන සමුපකාර සමිති තිබුණත්, ඒ වාගේම නිපදවන්නන්ගේ සංගමයක් තිබුණත්, එදා අපේ ගොවියා ජීවත් වූ තත්ත්වය හා අද ඔහු ජීවත් වන තත්ත්වය අතර වෙනසක් නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු බව මා මතක් කරන්නට කැමතියි.

ගරු ඇමතිතුමා මා නියෝජනය කරන ප්‍රදේශයට ගිය අවස්ථාවේදී එහි සිටින ගොවීන් විඳින දුක ඇක්කා. ඒ ගොවියන්ට සේවයක් කරන බවට එදා එතුමා පොරොන්දු වුණා. ඒ ගොවියන් නිපදවන දේ නියම මිළකට විකුණා දෙන්නට බැරි නම් ඒ ගොවියන් ඒ තත්ත්වයෙන් මුදවා ගන්නට බැරි බව මා මතක් කරන්නට ඕනෑ. ඒ ගොවියන් නිපදවන දේ නියම මිළකට අලෙවි කර දීම සඳහා මෙතෙක් වැඩ පිළිවෙළක් සකස් කරන්නට බැරි වී තිබෙනවා. කිසියම් මණ්ඩලයක් පිහිටුවා ඒ පළාතේ ගොවියන් නිපදවන එළවළු හැකි තරම් ඉක්මනින් ලංකාවේ හැම පළාතකටම බෙදා හැරීම අවශ්‍යයි. එසේ කළ හොත් පමණයි, ඒ ගොවියන්ට නියම සේවයක් ලබා ගන්නට පුළුවන් වන්නේ. මෙම මණ්ඩලය පත් කිරීම ගැන කීප වතාවක්ම මතක් කළා. දෙපාර්තමේන්තුවේ තිබෙන දුර්වලකම් නිසා අද එළවළු ගොවියන්ට නොයෙකුත් දුක් ගැහැට විඳින්නට සිදු වී තිබෙනවා. පෝර බෙදීම හරියට කෙරෙන්නේ නැත්නම්, අවශ්‍ය කාල සීමාවේදී එළවළු ඇට ලැබෙන්නේ නැත්නම්, එළවළු ඇට අවශ්‍ය ප්‍රමාණය සහ අවශ්‍ය වර්ගය ලැබෙන්නේ නැත්නම්, කවදාවත් එළවළු ගොවිතැන හරියාකාර කරන්නට අපහසුයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ එළවළු ඇට බෙදා හරින මධ්‍යස්ථානයක් වැලිමඩ තිබෙනවා. අසුවල් එළවළු ඇට වර්ගය තිබෙනවාදැයි ඒ මධ්‍යස්ථානයෙන් ඇසුවහොත්, හැමදාම ලැබෙන පිළිතුර "නැත" යන්නයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ එළවළු ඇට මධ්‍යස්ථානයෙහි ගොවියන්ට අවශ්‍ය එළවළු ඇට නැති වන විට සිදු වන්නේ පෞද්ගලික වෙළෙන්දා තර වීමයි. රුපියල් දෙකකට තුනකට ගන්නට පුළුවන් එළවළු ඇට අවුන්සයක් පෞද්ගලික වෙළෙන්දා ළඟ රුපියල් හතහමාරයි, නැත්නම් අටයි. ඒ ප්‍රදේශවල එළවළු වගා කරන ගොවියන්ට එළවළු ඇට විශාල ප්‍රමාණයක් වුවමනා වෙනවා. සමහර විට අවශ්‍ය එළවළු ඇට ගන්නට නැහැ. කැරට් විශාල ලෙස වගා කරනවා. එහෙත් කැරට් ඇට අවුන්සයක් ලබා ගන්නට බොහොම අමාරුයි. මාස ගණන් කැරට් ඇට නැහැ. එහෙත් නුවරඑළියේ එළවළු ඇට විකුණන මධ්‍යස්ථානවලින් ඕනෑ තරම් කැරට් ඇට ලබා ගන්නට පුළුවන්. කොහේ තිබෙනවාද, කොහෙන් ගෙනෙනවාද කියා කවුරුවත් දන්නේ නැහැ. මේ වැඩ පිළිවෙළ පවතින්නේ ඔන්න ඔය තත්ත්වයෙන්. ඒ නිසා යෝජනාවක් වශයෙන් ගරු ඇමතිතුමාට කරුණක් මතක් කරන්නට කැමතියි. එළවළු නිෂ්පාදනය හා බෙදා හැරීමත්, බීජ ඇට ගෙන්වීම හා බෙදා හැරීමත්, පෝර ගෙන්වීම හා බෙදා හැරීමත් ආදී දේවල් මණ්ඩලයක් යටතට පත්කර එළවළු ගොවීන්ට සහනයක් ලබා දෙන්නට ගරු ඇමතිතුමා කල්පනා කරනවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි සමරවීර මයා.]

නම් එළවලු වගා කරන අයට විශාල සේව යක් සිදු වෙනවා. එමෙන්ම ගරු ඇමති තුමා මතක තබා ගෙන ටිකක් සොයා බලන්නට ඕනෑ, මේ නිපදවන්නන්ගේ සංගමය මෙතරම් ව්‍යාප්ත ලෙස මේ කට යුත්ත කරගෙන යද්දීත් පිටකොටුවේ වෙළෙඳුන්ගේ බලයට යට නොවී බෙදා හැරීමට වැඩ පිළිවෙළක් යෙදීමට මේ සංග මයට නොහැකි වී ඇත්තේ මන්ද කියා. එළවලු වගාව ගැනත් අලෙවිය ගැනත් කියන්නට තිබෙන්නේ එපමණයි.

විශේෂයෙන්ම කිය යුතු තවත් කරු ණක් තිබෙනවා. මගේ ඡන්ද කොට්ඨාශය අර්තාපල් වගාව සම්බන්ධව හුඟක් ප්‍රසිද්ධයි. ඒ ගැන දැන් මොහොතකට කලින් හපුතලේ ගරු මන්ත්‍රීතුමා (ආරියදාස මයා.) විසිනුත් සඳහන් කළා. එතුමාගේ අර්තාපල් වැවිල්ලෙන් හොඳ අස්වැන්නක් ලැබුණාලු. එහෙත් සෑහෙන මිළකට විකුණා ගන්න බැරිලු. සත 50 ට ද 55 ට ද ඉල්ලූ වාය කියලයි එතුමා මතක් කළේ. ඒ තරම් ලාභයට අර්තාපල් ගන්නට පුළුවන්ය කියා මා නම් හිතන්නේ නැහැ. අද කොළඹ විකුණනු ලබන්නේ අර්තාපල් ටොන් එකක් රුපියල් 105 ත් 110 ත් අතර මිලකටයි.

අ. භා. 6

ඕස්ට්‍රේලියාවෙන් අපට ත්‍යාගයක් වශයෙන් ලැබුණු බීජ අර්තාපල් බෙදා හැරීමේ දී ගරු ඇමතිතුමා හමුවීමට නියෝජිත පිරිසක් පැමිණ කිව්වා ඒවා ගොවීන්ට සැපයූ මිල වැඩියි කියා. ඒවා ගොවීන්ට බෙදා දුන්නේ හොණ්ඩරය රුපියල් 50 සත 40 බැගින්. කොතරම් කරුණු ඉදිරිපත් කළත් එය වෙනස් කරවා ගන්නට බැරි වුණා. ගොවීන් හුඟදෙනකු බොහොම අමාරුවෙන් මුදල් ටිකක් හොයාගෙන කලින් රුපියල් 38 ට ලබාගත් බීජ අර්තාපල් හොණ්ඩරය රුපියල් 50.40 බැගින් අරගෙන වගා කළා. එහෙත් මොකක්ද වුණේ? ඕස්ට්‍රේලියාවෙන් ගෙන්වා බෙදා හරින ලද ඒ බීජ අර්තාපල් වලින් සියයට 90 ක් පමණම නරක් වුණා. අපට දුන්නේ තෑග්ගක් වශයෙන් නිසා මා ඕස්ට්‍රේලියාවට දොස් කියන්නේ නැහැ. ගෙන්වීමේදීම සියයට 20 ක් පමණ නරක් වුණා. ගොවීන් අතර බෙදා හැර ඉතිරි ඒවාත් නරක්වීම නිසා අද ගොවීන් කනස්සල්ලට පත් වී සිටිනවා. ඒ නිසා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි. මේවා බෙදා හැරියේ පෝරම කොළ පුරවා ලේඛන ගත කරලා ව්‍යාප්ති නිලධාරීන්ගේ මාර්ගයෙන් නිසා බීජ අර්තාපල් ලබාගත් අයගේ ලැයිස්තුවක් තිබෙනවා. ගොවීන්ට ඒ අර්තාපල්වලින් ලැබුණු පාඩුව ගැන දෙපාර්තමේන්තුවේ කාරුණික අවධානය යොමු කොට කලින් ගත් බීජ අල ප්‍රමාණයෙන් බාගයක්වත් මෙරට බීජ අලවලින් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. විශාල මුදලක් යොදා අර්තාපල් වගා කරන්නට ගොස් අමාරුවේ වැටීම නිසා අද හුඟ දෙනකු අධෛර්යයට පත්ව සිටිනවා. එම නිසා, ඒ ගොවීන්ට සුළු වශයෙන්වත් සහනයක් ලබා දෙන්නට ගරු ඇමතිතුමා බලාපොරොත්තු වෙනවා නම් ඕස්ට්‍රේලියාවෙන් ලබා ගත් බීජ අර්තාපල් ප්‍රමාණයෙන් භාගයක්වත් මේ රටේ බීජ අර්තාපල්වලින් නොමිළයේ ඔවුන්ට ලැබෙන්නට සලස්වන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඊළඟට සමුපකාර සමිති සම්බන්ධයෙන් වචන කීපයක් කථා කළ යුතුයි. ජාත්‍යන්තර කීර්තියක් උසුලන උඩුකිඳ සමුපකාර සමිති සංගමයත් උඩ පළාත ගොවි ද්‍රව්‍ය නිපදවීමේ හා අලෙවි කිරීමේ සමුපකාර සමිතියත් තිබෙන්නේ මගේ ඡන්ද කොට්ඨාශයෙයි. ඒ සමුපකාර සංගම් දෙකෙන් පළාතට විශාල සේවයක් කෙරෙන බව මා මේ අවස්ථාවේදී මතක් කර නවා. ඒවාගේම, අවුරුදු 7, 8, 9 තරම් දීර්ඝ කාලයකින් ගණන් හිලවු නොබැලූ, සමුපකාර දෙපාර්තමේන්තුවේ නිළධාරීන් පැමිණ ගණන් හිලවු පිළිබඳ වාර්තා පරීක්ෂා නොකළ සමුපකාර කඩ සමිති මගේ කොට්ඨාශයේ තිබෙනවා. සමුපකාර උප කොමසාරිස්තුමාගෙන් මේ ගැන ප්‍රශ්න කළ විට එතුමා කිව්වේ නිළධාරීන් හිඟකම නිසා මෙවැනි තත්ත්වයක් ඇති වී තිබෙන බවයි. එම නිසා, මේ සමුපකාර කඩ සමිතිවලින් මහජනතාවට නියම සේවයක් ලබා දීම සඳහා ඒවායේ ගණන් හිලවු හරියාකාර පරීක්ෂා කර, අඩපණ වී තිබෙන එම සමිති නැවත පණ ගන්වා ගැනීමට අවශ්‍ය නිළ ධාරීන් වහාම පත් කරන ලෙස ඉල්ලා සිටින අතර මට මේ සුළු කථාව කරන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවසථාව දීම ගැන ගරු සභාපතිතුමාට ස්තුති කරමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 6.5

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

**අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා [ශ්‍රීමත් රසීක් ෆරීඩ්, ඕ.බී.ඊ.] මූලාසනාරූඪ විය.**

*அதன்பிறகு, உபசபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, குழுக்களின் உப அக்கிராசனர் [ஸ்ரீமான் ரசிக் பரீத், ஓ.பி.ஈ.] தலைமை தாங்கினார்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [SIR RAZIK FAREED, O.B.E.] *took the Chair.*

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊයේ මා පළාත් පාලන ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ කථා කරන්නට නැගී සිටි අවස්ථාවේදීත් තමුන්නාන්සේ මූලාසනය ගත්තා. අද කෘෂිකර්ම ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ මා කථා කරන්නට සූදානම් වන විටත් තමුන්නාන්සේ මූලාසනය ගත්තා. මෙහි මොකක් හෝ ලොකු සම්බන්ධකමක් ඇති. එම නිසා මට ටිකක් වැඩිපුර වෙලාව තමුන්නාන්සේගෙන් ලැබෙනවා ඇතැයි මා කල්පනා කරනවා.

අද රටේ කෘෂිකර්මය අතින් යම් කිසි දියුණුවක් ඇති වී තිබේ නම් ඒ ගැනත් රට ආහාර අතින් ස්වයංපෝෂිත කිරීම සම්බන්ධව කිසියම් පියවරක් ගෙන තිබේ නම් ඒ ගැනත් අපගේ සම්පූර්ණ කෘතඥතාව හිමි විය යුත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවටත් ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවටත් බව මා පළමුවෙන් සඳහන් කරන්නට කැමතියි. රට ස්වයංපෝෂිත කර ගැනීමේ පරමාර්ථය ඉෂ්ට කර ගැනීමට ගරු ආහාර ඇමතිතුමාත් උප ඇමතිතුමාත් කොයි තරම් උත්සාහ ගත්තත් ඒ අමාත්‍යාංශයටම තවත් වැදගත් කොටසක් එක් වනතුරු එතුමන්ලාගේ අදහස් සාර්ථක වන්නේ නැහැ. කෘෂිකර්ම අමාත්‍යාංශය කොයි තරම් මහන්සි වුණත් ගොවිතැන් කටයුතුවලට අවශ්‍ය වතුර ටික නිසි වේලාවට අවශ්‍ය තැන්වලට ලබෙන්නේ නැත්නම්, ජල ගැලීම් වළක්වා ගැනීමේ සාර්ථක ක්‍රම ක්‍රියාවේ යෙදෙන්නේ නැත්නම් ඒ උත්සාහයේ නියම ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන් වන්නේ නැහැ. කෘෂිකර්ම ඇමතිතුමාගේ අදහස ඉෂ්ට කර ගන්නට නම් වාරිමාර්ග කටයුතුත් එතුමාගේ අමාත්‍යාංශයටම එක් විය යුතුයි. අද මාතර දිස්ත්‍රික්කයේ වී වගාවෙන් යම් කිසි ප්‍රමාණයක අස්වැන්නක් ලබා ගන්නට පුළුවන් වී තිබෙනවා නම් ඒ ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවේ සුළු වාරිමාර්ග කටයුතුවල වැදගත්කම නිසා බව මා මතක් කරන්නට ඕනෑ. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තිබෙන ඇලි මැලි දුබල ගතිය නිසා මේ අනෙක් දෙපාර්තමේන්තු දෙකේත් කටයුතු හරියාකාර කර ගන්නට බැරි වී තිබෙනවා. එම නිසා ඒ අංශයත් කෘෂිකර්ම අමාත්‍යාංශයට භාර ගන්නා හැටියට මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

භාර දෙන්නේ නැහැ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ඒ වගක් මා දන්නේ නැහැ. එය එතුමන්ලා භාර ගන්නට ඕනෑ. අප කියන්නේ රටට ප්‍රයෝජනයක් ලැබෙන විධියක්.

දැනට කරගෙන යන වැඩ පිළිවෙළ සතුටුදායක නම් එහි අමුතු වෙනසක් ඇති කිරීම නරකයි. පසුගිය කාලයේ මාතර දිස්ත්‍රික්කයේ ගොවි කාරක සභා එක්තරා ක්‍රමයකට බෙදාගෙන වැඩ කරගෙන ගියා. දැන් එය වෙනස් කර තිබෙනවා. ආසන අනුව එම ගොවි කාරක සභා වෙනස් කරලත් නැහැ. පත්තු අනුව හෝ කෝරළ අනුව වෙනස් කරලත් නැහැ. කලින්, හක්මණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

ආසනයේ ගොවි කාරක සභා එක නිලධාරියකුට භාර දී තිබුණා. කඹුරුපිටියේ දිස්ත්‍රික් නිලධාරියාට තවත් කොටසක් භාර දී තිබුණා. කඹුරුපිටිය ආසනය තුළ තිබෙන ගොවි කාරක සභා එක් නිලධාරියකුටත්, හක්මණ ආසනය තුළ තිබෙන ගොවි කාරක සභා තවත් නිලධාරියකුටත් භාර දෙනවා නම් එය වෙනම දෙයක්. එහෙත් දැන් ඇති කර තිබෙන අළුත් ක්‍රමය අනුව හක්මණ ආසනයේ සමහර ගොවි කාරක සභා කඹුරුපිටියේ නිලධාරියාටත්, කඹුරුපිටිය ආසනයේ සමහර ඒවා හක්මණ නිලධාරියාටත් භාර දී තිබීම නිසා මහා පටලැවිල්ලක් ඇති වී තිබෙනවා. එම නිසා හක්මණ ගරු මන්ත්‍රීතුමාටත් (හෙට්ටිගේ මයා.), කඹුරුපිටියේ මන්ත්‍රීවරයා වශයෙන් මටත් පැමිණිලි රාශියක් ලැබී තිබෙනවා. ගොවි කාරක සභාවලින් තමයි, ගොවියන්ගේ කටයුතු නැත්නම් ගොවිතැන පිළිබඳ කට යුතු සම්බන්ධයෙන් උනන්දුවෙන් කට යුතු කෙරෙන්නේ. එම නිසා එම ගොවි කාරක සභාවල වැඩ පිළිවෙළ අවුල් නොකර, ඒවායේ ලේකම්වරුන් වැනි අයට දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පහසු වෙන් හමු විය හැකි අන්දමට වැඩ පිළිවෙළක් සකස් කිරීම සඳහා, මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර සුදුසු කටයුතු කරන ලෙස ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මෙතෙක් කල් ඒ විධියේ හොඳ වැඩ පිළිවෙළක් තිබුණා. දැන් ඒ වැඩ පිළිවෙළේ වෙනසක් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඇමතිතුමා පරීක්ෂණයක් පවත්වනවා ඇතැයි මා විශ්වාස කරනවා.

'දැන් විවිධ සේවා සමුපකාර සමිති බොහොම හරියක් වහන්නට සිදු වී තිබෙනවා. ඊට හේතුව මොකක්ද? විවිධ සේවා සමුපකාර සමිති බොහොමයක් පවත්වාගෙන ගියේ වී වෙළෙඳාමෙන්. දැන් හාල් සේරුව නිකම් දෙන නිසා හාල් වෙළෙඳාමෙන් ලාභයකුත් නැහැ. මංචාඩි ගණනට, අවුන්ස ගණනට ඵෑනු, මිරිස්, පරිප්පු ලැබෙන නිසා ඒවායෙන් ලාභයක් ලැබෙන්නේත් නැහැ.

සමුපකාර සමිතිවලට වී වෙළෙඳාම කරන්නට අද පුළුවන්කමක් නැහැ. ඒ මන්ද, වී ගන්නා පිටස්තර වෙළෙන්දන් ඉන්නවා. පිටස්තර වෙළෙන්දන් වී වැඩි මිළට ගන්නවා නම් කමක් නැහ. පිටස්තර වෙළෙන්දන් වී බුසල ගන්නේත් රුපියල් 12 බැගිනුයි. [බාධා කිරීම්] මා කියන්නේ, මගේ ප්‍රදේශය ගැනයි. එහෙත් තමන්ගේ වී පිට වෙළෙඳුන්ට විකුණන්ට ගොවීන් කැමතියි. ඔවුන් ළඟට වී ගෙන ගිය හැටියේ ඕනෑම එකක් ගන්නවා සමුපකාර සමිතියේ වගේ නීතිරීති, සුද්ධබුද්ධ කිරීම් මොකවත් නැහැ. එම නිසා ලෙහෙසිය තකා ගොවීන් තමන්ගේ වී පිටස්තර වෙළෙන්දන්ට විකුණනවා. අද එච් 4 වී බුසලක් රුපියල් 12 යි. එච් 8 වී බුසලක් රුපියල් 14 යි. පිටස්තර වෙළෙන්දන් දෙතුන් දෙනකු එකතු වී ගොවීන් ගෙන් ඒ වී සම්පූර්ණයෙන්ම ගන්නවා. පිට වෙළෙන්දන් සමඟ තරඟ කිරීමට සමුපකාර සමිති කැමති නම්, ඒවාට මුදල් තිබෙනවා නම්, සමුපකාර සමිතිවලට එසේ පිට වෙළෙන්දන් සමඟ තරඟ කර වී වෙළෙඳාම කරන්නට ඉඩ දුන්නම ඇති වරද මොකක්දැයි මා අහන්නට කැමතියි. වී බුසල රුපියල් 12 ගණනේ ගැනීමට සූදානම් සමුපකාර සමිති කීපයක්ම තිබෙනවා. එහෙත් දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා අවසර දෙන්නේ නැහැ. සමුපකාර සමිතියට ඒ වී අරගෙන ආණ්ඩුවට දෙන්නට බැහැ. ඒ සමිතිවලට සිදු වී තිබෙන්නේ එම වී අනෙකුත් පෞද්ගලික වෙළෙන්දන් වාගේම කොළඹ කොමිෂන් ඒජන්ට්ස්ලාට එවන්නටයි.

විවිධ සේවා සමුපකාර සමිති වෙළෙඳ ව්‍යාපාරයක් වශයෙන් පවත්වාගෙන යාමට නම්, ඒ විධියේ සහනයක්වත් එම සමිතිවලට ලැබෙන්නට ඕනෑ. එහෙම නැත්නම් ඒ සමිති වැහෙනවා. ඒ සමිතිවල වැඩ කරන මැනේජර්ලාට පඩි ගෙවන්නට ඕනෑ. ඒ වගේම ගෙවල් කුලී ගෙවන්නටත් ඕනෑ. එම නිසා ඇමතිතුමාගේ අවධානය ඒ සම්බන්ධයෙන් යොමු කරන්නට කැමතියි.

අද වී මිළ ඉහල යන්නේ නැත්තේ ඇයි? තමුන්නාන්සේලා හාල් සේරුවක් කැපුවා. ඒ මඟින් වී මිළ වැඩි වී, ගොවියාගේ තත්ත්වය උසස් වේයැයි තමුන්නාන්සේලා බලාපොරෙත්තු වුණා. එහෙත් රුපියල් 12 කට වඩා මිල ඉහළ නොනගින්නේ ඇයි? ලංකාවේ එතරම්ම විශාල වී තොග තිබෙනවාද? නැහැ. එහෙත් රුපියල් 12 කට වැඩියෙන් වී මිල ඉහළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යන්නේ නැහැ. මේ රටේ වී මිල කොන්ට්‍රෝල් කරන එක්තරා පිරිසක් සිටිනවා. එනම්, වී මෝල් හිමියෝයි. ඔවුන් තමයි වී කොටා, කෙටුම් කුලිය පැත්තකට තබා, හාල් සේරුවක් මෙන්න මේ ගණනට විකුණන්නට ඕනෑය කියා ගණන හදා ගන්නේ. මාත් ඉස්සර මෝල් කාරයෙක් තමයි. මේකේ කෙරුවාව මාත් දන්නවා. [බාධා කිරීමක්] ඔව්, ඒ දවස්වල හම්බ කළා. මා නැතෙයි කියනවා නොවෙයි. එහෙත් මා පාර්ලිමේන්තුවට ආවේ වී මෝල් විකුණලායි. මෝල් හිමියන් තමයි, අද වී මිල නියම කරන්නේ. ඒ ගැන සොයා බලන්නට ඕනෑ. අද Rice Millers' Association එකක් තියෙනවා. ඒකෙන් නේද, පත්‍රයට හාල්වල මිල ගණන් දමන්නේ ? ඒ අනුව තමයි, වී මිල නියම වන්නේ.

රට සවයංපෝෂිත කිරීමට නම් ගොවියාගේ තත්ත්වය උසස් කළ යුතුයි. ඒ සඳහා වීවලට හොඳ මිලක් දිය යුතුයි. රුපියල් 12 ට වැඩි මිලකුයි, ගොවියා බලාපොරොත්තුව සිටියේ, හාල් සේරුව කැපූ වෙලාවේ. නමුත් එය සිදු වී නැහැ. රුපියල් 12 ටත් අඩු වේද කියන බියයි, අද තිබෙන්නේ. මේ අන්දමට පුද්ගලික ව්‍යාපාරිකයන් ලංකාවේ වී මිල සහ හාල් මිල පාලනය කරන බව පෙනෙනවා. ඊට ඉඩ තැබීම නුසුදුසුයි. මා මෙම කරුණු ඉදිරිපත් කරන්නේ මට ලැබෙන ආරංචිවලට අනුවයි. කරුණාකර මේ ගැන සොයා බලන්නට ඕනෑ.

අද මාතර දිස්ත්‍රීකයේ නොයෙකුත් අන්දමට වී වර්ග පිළිබඳව අත්හදා බලා තිබෙනවා. එච්. 4 සහ එච්. 8 දරණ වී වර්ග දෙකෙන් හොඳ අස්වැන්නක් ලැබෙන බව කියනවා.

අ. භා. 6.15

**ගරු මන්ත්‍රීවරයෙක්**

*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*

(An hon. Member)

තායිවානයේ ඒවා ?

**පර්සි වික්‍රමසිංහ මයා.**

*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*

(Mr. Percy Wickremasinghe)

ඒවා තියා ගන්නවා. මා කරන්නේ වැදගත් කතාවක්. නමුන්නාන්සේලා දන්නේ නැහැ, එහි තිබෙන වැදගත්කම. අප එන්නේ ගොවි ජනතාව වෙසෙන ප්‍රදේශයක ඉඳලයි. මෙවැනි වැදගත් කතාවක් කරන විට බූරුවා වාගේ කතා නොකර නිකම් ඉන්නවා. [බාධා කිරීමක්] අපට ලැබී තිබෙන සුළු කාලය තුළ අප කතා කරන්නට ඕනෑ. එච්. 4 දරණ වී වර්ගය පයින් පාගන්න බැහැ. ඒකට ට්‍රැක්ටර් ඕනෑමයි. 501 දරණ වී නම් පයින් පාගන්නට පුළුවනි. අද මුළු ප්‍රදේශයේම ට්‍රැක්ටර් හිමියන් ගොවි ජනතාව ගසා කන බවයි පෙනෙන්නේ. අද වැඩි දෙනා ට්‍රැක්ටර් පාවිච්චි කොට තමයි, ගොවිතැන් කටයුතු කරන්නේ. දැන් හී දෙකම හාන්නේ ට්‍රැක්ටර්වලිනුයි. එම නිසා අද ට්‍රැක්ටර්වල අවශ්‍යතාවය බොහොම තදින් බල පවතිනවා. එහෙත් පුද්ගලයන් කීප දෙනකු ළඟ ට්‍රැක්ටර් තබාගෙන ගොවි ජනතාව ගසා කන බව පෙනෙනවා. අද ඒවායේ කුලිය අක්කරයකට රුපියල් 60යි ; 70 යි. රුපියල් 80 යි කීවත් ගන්නට වෙනවා. කුමන ක්‍රමයකින් හෝ අඩු මිලට ට්‍රැක්ටර් ලබා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා. එක එක අන්දමේ යායවල් තිබෙන බව අප දන්නවා. අක්කර 200 යේ 300යේ යායවල් තිබෙනවා. ට්‍රැක්ටර්වලින් වැඩ කරන යායවල් මොනවාද යන්න කෘෂිකර්ම දෙපාර්තමේන්තුව දන්නවා.

ගොවීනට අඩු මිලට ට්‍රැක්ටර් ලබා ගැනීමට වැඩ පිළිවෙළ යෙදීම අවශ්‍යයි. පසුගිය දිනවල අපේ පාර්ලිමේන්තු ලේකම්තුමාගේ වැදගත් අදහසක් තිබුණා. සෑම ප්‍රදේශයකටම ට්‍රැක්ටර් මධ්‍යස්ථානයක් බැගින් ඇති කිරීමයි, එම අදහස. විදේශ විනිමය වැය කරමින් ට්‍රැක්ටර් ගෙන්වන්නට පුද්ගලික ධනපතියනට ඉඩ දෙන්නට එපා. මුදලාලීලාට මේවා දෙන්නට එපා. [බාධා කිරීම්] ඔවුන්ස්ලා වැනි උදවියට. පුද්ගලයන්ට නොව යම් යම් සංවිධානවලටයි, මේවා දිය යුත්තේ. එතකොට එම සංවිධානවලට පුළුවනි, රජයත් සමග යම්කිසි සම්බන්ධතාවයක් ඇතුව වැඩ කරන්නට. පළාතේ ගම්සභාවලට, ශක්තිමත් විවිධ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

සේවා සමිතිවලට, ශක්තිමත් ගොවි කාරක සභාවලට රජයේ උපදෙස් පරිදි ට්‍රැක්ටර් මධ්‍යස්ථාන තබාගෙන ක්‍රියා කරන්නට ඉඩ දිය හැකියි. එසේ කළ විට රජය විසින් නියම කරනු ලබන අන්දමට ගොවීන්ගෙන් ට්‍රැක්ටර් ගාස්තුව අය කර ගෙන සුදුසු පරිදි කටයුතු කරන්නට පුළුවනි. එසේ වූ විට විශාල සහනයක් අනාගතයේදී ලැබෙනවා ඇති. මාතර දිස්ත්‍රික්කයේ ගොවියන් ට්‍රැක්ටර් හිමියන්ගෙන් බේරා ගැනීමේ ප්‍රශ්නය අද ඒ පළාතේ විශාල වශයෙන් බලපාන ප්‍රශ්නයක්. ඒ විධියේ වැඩ පිළිවෙලක් ඇති වෙනව නම් දැනට වඩා වැඩියෙන් අස්වැන්න නිපදවීමට ගොවියා විශාල උනන්දුවකින් කටයුතු කරනවා ඇති. මේ හාල් හිඟය ඇති වුණායින් පසුව අද ගොවි ජනතාව ඉතාමත් උනන්දුවෙන් ආහාර නිෂ්පාදනය කිරීමට මහන්සි ගන්නව. අප අතර දේශපාලන මත භේද කොයි තරම් තිබුණත් රට ස්වයංපෝෂිත කිරීමේ ප්‍රශ්නයේදී අපි සැම දෙනාම එක්සත්. රට ස්වයංපෝෂිත කිරීමේ ව්‍යාපාරය කඩාකප්පල් කරන්ට මාන බලන යම් කෙනෙක් සිටිනව නම්, ඔහු රටේ ජාතියේ ද්‍රෝහියකු හැටියට අප හංවඩු ගහනව. රට ස්වයංපෝෂිත වන තුරු මේ රටේ අනිකුත් ප්‍රශ්න විසඳිය නොහැකි බව අප පිළිගෙන තිබෙනව. එම නිසා ආහාර ඇමතිතුමා භාර ගෙන තිබෙන්නෙ ඉතා භාරදූර කාර්යයක් බව මතක් කරන්ට කැමතියි.

ආහාර වගාව දියුණු කිරීමට රජයේ තිබෙන උනන්දුව නිසා ආහාර වගා කිරීමේ මුවාවෙන් ; ඒ වෙස් මුහුණ දාගෙන ඇතැම් පුද්ගලයින් මෙයින් අනිසි ප්‍රයෝජන ලබා ගන්නව. මේ මුවාවෙන් ඇතැම් අය ලොරි, ජීප්, මිනි-මොක්, ට්‍රැක්ටර් ආදිය ලබා ගත් බව තමුන්නාන්සේ දන්නව. අද තමුන්නාන්සේ යම්කිසි කමිටුවක් මගින් හෝ කොමිසමක් මගින් හෝ කරුණු සොයා බැලුවොත් පෙනී යයි, ඒ වාහන ආහාර වගා කිරීමට යොදවනවාද කියා.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

මන්ත්‍රීතුමා තව කොයිතරම් වෙලාවක් ගන්නවද? කථාව නම් වැදගත් තමයි, නමුත් කාලය ටිකයි, තිබෙන්නෙ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේ කියනව නම් මම වාඩි වෙන්නම්; කිසිම තර්කයක් කරන්නෙ නැහැ. [බාධා කිරීමක්] බද්දේගම ගරු මන්ත්‍රීතුමාගේ (නීල් ද අල්විස් මයා.) කාලයත් මට දුන්නනෙ.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

හොඳයි, තව විනාඩි 5 කින්වත් ඉවර කරන්න.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

මේ ජීප්, මිනි-මෝක් ආදිය පාවිච්චි කරන්නෙ මොනවටද? හැන්දෑවට මේවා සින් කොල්ලුපිටියේ මාර්කට් එකට එනව, එලවුළු ගන්න ; බයස්කෝප් බලන්න යනව ; ටැප්‍රොබේන් හෝටලයට යනව ; ළමයින් ඉස්කෝලවලට යවනව. ටික දෙනෙක් මේවා ආහාර වගා කිරීමේ කටයුතු සඳහා පාවිච්චි කරනව ඇති. මගෙන් කීප දෙනකු ඇවිත් ඇහුව, මන්ත්‍රීතුමනි, මම හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් අක්කර 50 ක් ලබා ගත්තොත් මටත් ලොරියක් ගන්න පුළුවන්වෙයිද කියා. කොහොමද වැඩේ? මේ ගොල්ල තමයි රට කන්නෙ ; රට විනාශ කරන්නෙ. තමුන්නාන්සේලාත් මුලා කරල, රජයේ නිලධාරීනුත් මුලා කරල, මේ සභාවත් මුලා කරල, "අපි ආහාර වගාවට අත දෙනවා" කියා යම් යම් පුද්ගලයන්ට මේ අන්දමට ජීප්, ලොරි ආදිය ලබාගෙන බඩ වඩා ගන්ට තවදුරටත් ඉඩ නොදෙන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අද මන්ත්‍රීවරුන් හැටියට අපට යන්න කාර් එකක් නැහැ. ඇමතිවරයාට තිබෙන් නෙත් සීඑන් නොම්මරය දරන හුවු හුවු කාර්එකක්.

**නීල් ද අල්විස් මයා.** (බද්දේගම)
*(திரு. நீல் டி அல்விஸ்—பத்தேகம)*
**(Mr. Neal de Alwis—Baddegama)**
ඇමතිවරයාට ආණ්ඩුවේ කාර් තියෙනව.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ)*
**(Mr. Percy Wickremasinghe)**

ආණ්ඩුවෙ කාර් පාවිච්චි කරන එක වෙනම දෙයක්. ඇමතිවරයාට තිබෙන්නෙ, සීඑන් කාර් එකක්. මට තියෙන්නෙ Z නොම්මරයක් දරන කාර් එකක්. ඒ නිසා මට තමුන්නාන්සේගේ ආහාර වගාව පරීක්ෂා කර බලන්න යන්න විධියක්වත් නැහැ. මන්ත්‍රීවරයෙකුටවත්, අත්‍යාවශ්‍ය සේවයක යෙදී සිටින දිසාපතිවරයෙකුට වත්, අධ්‍යක්ෂවරයෙකුටවත්, සුප්‍රීම් උසාවියේ නඩුකාරයෙකුටවත් වාහනයක් ලබා ගන්ට විදියක් නැහැ. මේ කොහේවත් ඉන්න බඩ මහත මුදලාලිලා ආහාර නිෂ්පාදන කටයුතු සඳහා කියා වාහන ලබා ගෙන ජිවාරම් කර ගන්නව. ඒ නිසා මේ පුද්ගලයින්ට රථවාහන මේ අන්දමට ලබා ගන්න ඉඩ නොතබා වගා කටයුතුවල යෙදී සිටින ගොවින්ට පුළුවන් තරම් ආධාර කරන ලෙස මා ඉල්ලා සිටිනව.

ගොවීන් තමයි, වගා දියුණුවට විශාල සේවයක් කරන්නෙ. එහෙත් ඔවුන්ට කිසිම සහනයක් ලැබෙන්නෙ නැහැ. ඔවුන්ට ස්ට්‍රයික් කරන්ට විධියක්වත් නැහැ. මොකද, ස්ට්‍රයික් කරන්ට සිද්ධ වෙන්නෙ කුඹුර සමගයි. එම නිසා ගොවි ජනතාව වෙනුවෙන් මීට වඩා මුදල් වෙන් කර පහසුකම් සලසා දී මේ කටයුත්ත සාර්ථක කර ගැනීමට ආහාර අමාත්‍යාංශය ක්‍රියා කරනවා ඇතැයි විශ්වාස කරමින් සමුපකාර සමිති සංගම් ආදිය ගැනත් වචනයක් කියා මගේ කථාව අවසාන කරන්ට මා බලාපොරොත්තු වෙනව. දැන් මාතර දිස්ත්‍රික්කයේ සමුපකාර සංගම් එකකට වඩා නැහැ. අනික් සියලුම සමුපකාර සංගම් විසුරුවා හැර තිබෙනවා. හක්මන වලකඩ සමුපකාර සංගමය පමණයි තිබෙන්නෙ. වැරදි පාලනය නිසා මේ සංගම් විසුරුවා හැරියා නම් යම්කිසි කාලසීමාවක් තුළදී සාමාජික භවතුන්ට නැවතත් කාරක සභාවක් තෝරා පත් කරගෙන ඒ වැඩ කටයුතු කරගෙන යන්නට ඉඩ දෙන්නට ඕනෑ. දූෂිත වැඩ කළ අයට අවුරුදු ගණනාවකට ඒ සංගම්වලට කිට්ටු වෙන්නට නොහැකි වන විධියට කටයුතු කරන්නට පුළුවනි. ඔවුන්ගේ ඡන්ද බලය අහිමි කරන්නට පුළුවනි. කෙසේ වෙතත් නිලධාරි පාලනය අවසන් කර නැවතත් ඒ සංගම් වල සාමාජිකයන්ට ඒවායේ කටයුතු කර ගෙන යන්නට ඉඩ දෙන්නට ඕනෑ. අද බලන්න තිබෙන තත්ත්වය. මුළු මාතර දිස්ත්‍රික්කයටම තිබෙන්නෙ එකම සමුපකාර සංගමයයි. අනිත් සියලුම සංගම් විසුරුවා හැර තිබෙනවා. ඒවා නිලධාරීන්ගේ පාලනය යටතේයි තිබෙන්නේ. එක නිලධාරියකුට සංගම් දෙකක් භාර දී තිබෙනවා. නව ටික දවසක් ගත වන විට ඒ මනුෂ්‍යයා මොන උගුලක වැටේවිද කියා දන්නේ නැහැ. හොඳයි, නිලධාරීන් යටතේ මේවායේ පාලනය කෙරෙනවාය කියා නේස්ප්‍රේ, අර කුරලෝන්, වූහලෝන් කියන රෙදි එහෙම මහජනතාවට ලැබෙන වාද? නැහැ. ඒවා සියල්ලක්ම යන්නේ අර ගරු මන්ත්‍රීතුමකු සඳහන් කළ ජාතික පොළවල්වලටයි. එම නිසා මේ සමුපකාර සංගම්වල බලය නැවතත් මහජනතාවට දෙන මෙන් මා ඉල්ලා සිටිනවා. නිලධාරීන්ට මේ විධියට ඒකාධිපති බලතල දෙන්නට එපා. දැන් බලන්න, වෙහෙරගොඩ හිටපු ආදායම් පාලක නිලධාරියකුට මේ සංගම් දෙකක් භාර දී තිබෙනවා. සංගම් දෙකේම සභාපති ඔහුයි. කොයි තරම් බලයක්ද? මේ විධියට එක් පුද්ගලයකුට ඒ තරම් බලතල දෙන්නට එපා. මෙසේ බලතල පැවරීමෙන් ඒ අයත් යම් යම් වැරදි වැඩවලට පෙළඹෙන්නට ඉඩ තිබෙනවා. එම නිසා ඒ අයත් ආරක්ෂා කරගෙන, සමුපකාර ව්‍යාපාරයත් ආරක්ෂා කරගෙන කටයුතු කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

**ඩී. එම්. ටී. බණ්ඩාර මයා.** (වාරියපොළ)
*(திரு. டீ. எம். ரீ. பண்டா—வாரியப்பொல)*
**(Mr. D. M. T. Bandara—Wariyapola)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වයඹ පළාතේ පොල් වතු ගැන තමුන්නාන්සේ දන්නවා. පොල් නැවත වගා කිරීම සඳහා


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. එම්. ටී. බණ්ඩාර මයා.]

සුළු පොල් වතු හිමියන්ට ආධාර මුදලක් දිය යුතුය කියා 1965-66 අයවැය විවාදයේ දීත් මා කියා සිටියා. එහෙත් එම ඉල්ලීම මේ දක්වා ඉෂ්ට වී නැහැ. සියයට 86 ක් පමණ සුළු පොල් වතු හිමියන් තමයි ලංකාවෙ සිටින්නේ. වැඩි වශයෙන්ම පොල් නිෂ්පාදනය කරන්නේ වයඹ පළාතේ යි. වයඹ පළාතේ කොට්ඨාශයක් නියෝජනය කරන නිසා ගරු ඇමතිතුමා මේවා ගැන දන්නවා. විශේෂයෙන්ම වයඹ පළාතේ ගොවීන්ගේ ආදායම රැඳී පව තින්නේ කුඹුරුවලින් ලැබෙන ආදායමත් පොල්වලින් ලැබෙන ආදායමත් මතයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාව දෙස ටිකක් බලමු. පොල්වලින් 1965 දී අපට විදේශ විනිමය රුපියල් 27 කෝටි 50 ලක්ෂ යක් ලැබී තිබෙනවා. 1966 දී රුපියල් 19 කෝටි 60 ලක්ෂයක විදේශ විනිමය මුදලක් ලැබී තිබෙනවා. ඒ අවුරුද්දේ ආදායම අඩුවීමට හේතුව නියඟයයි. ඒවා ගේම රබර්වලින් 1965 අවුරුද්දේදී රුපි යල් 37 කෝටි 40 ලක්ෂයක විදේශ විනි මය ආදායමක් ලැබී තිබෙනවා. 1966 දී රබර්වලින් රුපියල් 33 කෝටි 70 ලක්ෂ යක විදේශ විනිමය ආදායමක් ලැබී තිබෙ නවා. නමුත් පොල් වගා කිරීම සඳහා සුළු පොල් වතු හිමියන්ට ආධාර දීමට මේ වර අයවැය ලේඛනයෙන්වත් වැඩ පිළිවෙළක් සලසා නැහැ. රබර් නැවත වගා කිරීම සඳහා නම් රුපියල් 2 කෝටි 20 ලක්ෂයක් වෙන් කර තිබෙනවා. නමුත් රබර්වලින් ලැබෙන ආදායමට කිට්ටු ආදායමක් පොල් වලිනුත් ලැබෙනවා. පරතරය බොහොම ටිකයි. රබර්වතුවලින් සියයට 60 ක් පමණ අයිති විදේශිකයන්ටයි. ඒවාගේම තේ නැවත වගා කිරීමටත් රජයෙන් ආධාර දෙනවා. නමුත් සියයට 86 ක් පමණ වූ සුළු පොල් වතු හිමියන්ට කිසිම පිළිසර ණක් නැහැ. මේ සුළු පොල් වතු හිමියන්ට බැංකුවලින් මුදල් ලබා ගැනීමටත් පුළු වන්කමක් නැහැ. ඒවාගේම මේ පොල් ඉඩම් උගසට බැඳ මුදල් ලබා ගැනීමටත් පුළුවන්කමක් නැහැ. අද ඒ ප්‍රදේශයේ පොල් ගස් කණාවූ වී තිබෙනවා. ඒවායේ නැවත පොල් වගා කරන්නට ඒවා අයිති කරුවන්ට ශක්තියක් නැහැ. පොල්වලින් "සෙස්" බද්දක් අය කරනවා. නමුත් එයින් ලැබෙන්නේ පොහොර පමණයි. සුළු පොල් වතු හිමියන් කවුරුවත් පොහොර දමන්නේ නැහැ. මක්නිසාද, වියදම එන්න එන්නම ඉහළ යන නිසයි. ගිය අවුරුද්දේ අයවැය ලේඛන විවාදයේ දීත් මා මේ කාරණය මතක් කළා. පොල් වතු තිබෙන කොට්ඨාශයක් නියෝජනය කරන ගරු ඇමතිතුමා මේ සුළු පොල් වතු හිමියන් ආරක්ෂා කරන්නට කටයුතු සල සන්නට ඕනෑ. මේ පොල්වලින් ලංකාවට විශාල විදෙශ විනිමය ආදායමක් ලැබෙනව. තේවලට අනාගතයක් නැති බවත්, ඒ වාගේම රබර්වලට අනාගතයක් නැති බවත් දැනට ප්‍රකාශව ඇති බව අප දන් නවා. තේ සහ රබර්වලින් ප්‍රයෝජනයක් ලබන්නට බැරි වුණත් පොල්වලින් නම් අපට හැමදාම ප්‍රයෝජන ලබන්නට පුළු වනි. අඩු ගණනනේ කුරුම්බා කන්නට වත් පුළුවනි. 1936 තරමේදී මේ රටේ ඇති වුණු දුර්භික්ෂයේදී එවකට වයඹ පළාතේ සිටි සුදු දිසාපතිතුමා දේවමැදි හත්පත් තුවටත්, ගිරියාල හත්පත්තුවටත්, දඹ දෙණි හත්පත්තුවටත් ආධාර නොදුන්නේ ඒ ප්‍රදේශයේ ජනතාවට කුරුම්බා කා ජීවත් වන්නට පුළුවන් නිසයි.

තේ වතු නැවත වගා කිරීමටත් රබර් වතු නැවත වගා කිරීමටත් රුපියල් කෝටි ගණන් වියදම් කරනවා. හැම රජයක් ම ඒ විධියේ වැඩ පිළිවෙළක් ක්‍රියාවේ යෙදෙ ව්වා. ඒ හැම රජයක්ම බලයට පත් වුණේ වයඹ පළාතේ වැඩි ආසන ගණන දිනා ගැනීමෙන් බවත් මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. 1947 පැවැත්වුණු මැති වරණයේදී ඩී. එස්. සේනානායක මහතා ගේ ආණ්ඩුව බලයට පත් වුණේත්, 1956 බණ්ඩාරනායක මහතාගේ ආණ්ඩුව බල යට පත් වුණේත්, 1960 දී සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ ආණ්ඩුව බලයට පත් වුණේත්, 1965 දී මෙම ජාතික ආණ්ඩුව බලයට පත් වුණේත් වයඹ පළාතේ වැඩි ආසන ගණන දිනා ගැනීමෙනුයි. ඒ හැම ආණ්ඩුවක්ම බලයට පත් කිරීම සඳහා ආධාර දෙන ලද වයඹ පළාතේ සුළු පොල් වතු හිමියන් ආරක්ෂා කිරීම යුතුකමක්ව තිබුණා; යුතුකමක්ව තිබෙනවා.

ඒ අතර වයඹ පළාතේ කුඹුරු වැඩි ගණ නක් වගා කරන්නට සිදු වී ඇත්තේ අහස් ජලයෙන් බව අප කල්පනා කරන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නට ඕනෑ. මා නියෝජනය කරන කොට්ඨාශයේ ඇති කුඹුරු අක්කර විසිපන්දාහෙන් දොළොස් දාහක් පමණි, වාරිමාර්ග ක්‍රම යටතේ වගා කරන්නේ. අනෙක් දහතුන්දාහම අහස් ජලයෙන් වගා කරනවා. එහි සිටින ගොවියන්ගේ කුඹුරු නියඟට අසු වුණාම ඔවුන් රැකෙන්නේ පොල් ගෙඩිය නිසයි. පොල් ගෙඩිය නැත්නම් ඔවුන්ට දුරු මිරිස් ටිකවත් ලබා ගන්නට බැහැ. ඇත්තෙන්ම පොල් ගෙඩිය නැත්නම් ඒ ප්‍රදේශයේ දුප්පත් මිනිසුන්ට ජීවත් වන්නට ක්‍රමයක් නැහැ. ඒ ප්‍රදේශයේ ජනතාවට තේ වතුවල රබර් වතුවල වැඩ නැහැ. ඒ වගේම පොල් වතුවලද වැඩ ඇත්තේ ඉතා ටික කාලයකටයි. පෝර දමන කාලයට සහ පොල් කැඩෙන කාලයට පමණයි, පොල් වතුවල වැඩ තිබෙන්නේ. ඒ පොල් වතු ටික හෝ ආරක්ෂා කර ගැනීමට අතිරේක වැය ශීර්ෂයක් මඟින්වත් මුදල් වෙන් කර ආධාර දෙන හැටියට මා ඉල්ලා සිටිනවා. තේ වතු සහ රබර් වතු නැවත වගා කිරීම සඳහා රුපියල් කෝටි ගණන් වියදම් කරතත් පොල් වතු වැවීම සඳහා ශතයක්වත් වියදම් කරන්නේ නැහැ. සුළු පොල් වතු හිමියන්ගේ පොල් වතු ටික වවා ගැනීම සඳහාවත් ආධාර මුදලක් දිය යුතු බව මා මතක් කරනවා.

අ. භා. 6.30

කුඹුරුවලට යොදවන පෝර ගැනීම ආදී කටයුතු සඳහා ගොවියන්ට දෙන ණයමුදල්වලට සියයට දොළහක පොළියක් අය කරනවා. මේ පිළිබඳව මා නියෝජනය කරන කොට්ඨාශයෙහි සිටින ගොවියන් අතර විශාල අප්‍රසාදයක් පවතිනවා. පෝර ආදිය ආනයනය කරන ව්‍යාපාරිකයන්ට, කර්මාන්තකාරයන්ට නොයෙකුත් බදු සහනයන් දෙනවා. එහෙත් ගොවියාට දෙන ණය මුදලේ පොළිය වැඩි කර තිබෙනවා. පොළිය වැඩි කිරීමෙන් ගොවිතැන් කටයුතු සඳහා ගොවියන් ධෛර්යමත් වන්නේ කොහොමද? දැන් ගෙන යන මෙම වැඩ පිළිවෙළ ගොවියාගේ සැකයට භාජන වී තිබෙනවා. ගොවියා මහන්සි වී උපයා ගන්නා මුදලින් වැඩි පොළියක් ගෙවන්නට ඔහු කැමති නැහැ. ගොවියන්ට දෙන ණයවල පොලිය වැඩි කිරීමට ගරු ඇමතිතුමාට උපදෙස් දුන්නේ කවුරුන් දැයි අප දන්නේ නැහැ. ඒ උපදෙස් දුන් නැනැත්තා කවුරුන් වුවද, ඔහු එසේ උපදෙස් දෙන්නට ඇත්තේ මෙම රජයේ කෘෂිකාර්මික වැඩ පිළිවෙළට අකුල් හෙළීමට විය හැකියි. එසේ හෙයින් මේ පොළී මුදල අඩු කර ගොවියන්ට සහනයක් සලසන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඊළඟට රක්ෂණ ක්‍රමය ගැනත් වචනයක් කියන්නට කැමතියි. ගිය අවුරුද්දේත් මේ ගැන මතක් කළා. සමහර ගොවි මණ්ඩල රක්ෂණ ක්‍රමයට යටත් වන අතර තවත් ඒවා යටත් නැහැ. රක්ෂණ ක්‍රමයක් තිබෙනවා නම් එය හැම ගොවි මණ්ඩලයකම ක්‍රියාත්මක කරන්නට ඕනෑ. රක්ෂණ ක්‍රමය ඒ අන්දමට ක්‍රියාත්මක කරන අතරම රක්ෂණය කළ කුඹුරක් පාළු වූ වහාම එම කුඹුර හිමියාට මුදල් ගෙවීමට වැඩ පිළිවෙළ සකස් වන්නටත් ඕනෑ. දැන් කටයුතු කෙරෙන හැටියට නම් 1965 අවුරුද්දේ පාළු වූ කුඹුරට මුදල් ලැබෙන්නේ 1967 අවුරුද්දේයි. එම මුදල ලැබෙන විට සමහර විට කුඹුර අයිති ගොවියා මිය ගොස් සිටින්නත් පුළුවන්. ප්‍රමාදය ගැන සහකාර ගොවිජන සේවා කොමසාරිස්තුමාගෙන් ප්‍රශ්න කළාම එතුමා කියන්නේ අවශ්‍ය නිලධාරීන් නැහැ කියලයි. එහෙම නම් දෙපාර්තමේන්තුවෙන් වැඩක් නැහැ. දෙපාර්තමේන්තුවක් පිහිටුවනවා නම් එය අංග සම්පූර්ණ කර පිහිටුවන්නට ඕනෑ. යම් කන්නයක කුඹුරු පාළු වුණා නම් ඒ කන්නය ඉවර වන්නට පෙර මුදල් ගෙවන්නට ඕනෑ. මේ ප්‍රමාදය නිසා මන්ත්‍රීවරුන් වශයෙන් අපට නොයෙකුත් චෝදනා එනවා. නිලධාරීන් නැත කීවාට ගොවීන් ඒවාට කන් දෙන්නේ නැහැ. නැහැ කියන එක නොවෙයි කරන්නට තිබෙන්නේ; අවශ්‍ය නිලධාරීන් ගන්නට ඕනෑ. අවශ්‍ය නිලධාරීන් අරගෙන කුඹුරු පාළු වූ වහාම රක්ෂණ මුදල් ගෙවීමේ වැඩ පිළිවෙළක් ඇති කරන්නට ඕනෑ.

ඊළඟට තවත් කරුණක් මතක් කරන්නට ඕනෑ. වැව් යටතට වැටෙන අක්කර 12,000 ක පමණ ප්‍රමාණයක් මගේ ආසනයේ තිබෙනවා. එක වැවකට අක්කර 100ක්, 150ක් හෝ 200ක් අයිති වෙනවා. එහෙත් එවැනි වැවක අල්ලන්නේ අක්කර 20 ක පමණ ප්‍රමාණයකට සෑහෙන ජලයයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. එම්. ටී. බණ්ඩාර මයා.]

ගරු ඇමතිතුමාගේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අස්වැන්න වැඩිපුර ලබා ගැනීමට කොතරම් කටයුතු සැලැස්සුවත් මේ වැව් ගැඹුර කරන තුරු එයින් ප්‍රයෝජන ලැබෙන්නේ නැහැ. දීර්ඝ කාලයක් වැව් තාවලු වැඩ කිරීම නිසා ඒවා සේදී විත් දැන් ඒ වැව් ගොඩවෙලා. දැන් එම වැව් වලට ජලය අල්ලන්නේ බොහොම සුළු ප්‍රමාණයක්. ඒ නිසා ඒ වැව් ගැඹුර කරන තුරු ගම්බද සුළු වැව් යටතේ තිබෙන කුඹුරුවලින් නියම ප්‍රයෝජන ලබන්නට බැහැ. ඒ නිසා කෙසේ හෝ ඒ වැව් ගැඹුර කරන්නට ඕනෑ බව මා මතක් කර සිටිනවා. රාජකාරි ක්‍රමය පැවති කාලයේ වෙල්විදාන මහත්වරුන් සිටින විට නම් එක්තරා ක්‍රමයක් තිබුණා. එහෙත් අවුරුදු 10 කට පමණ කලින් කුඹුරු පනත ආවාට පසුව ඒ ක්‍රමය නැති වුණා. කට්ටි කපා වැව් ගැඹුර කරන්නත්, අක්කර බද්ද රුපියල් 6 ක් ගෙවන්නත්, රක්ෂණ බද්ද 6 ක් ගෙවන්නත්, යනාදී වශයෙන් හැම එකක්ම කරන්න ගොවීන්ට බැහැ. ගොවියා දුප්පත්. වැව්වල කට්ටි කපා ඔවුන්ට ජීවත් වෙන්න බැහැ. කුඹුරු වැඩ නොකරන කාලවලදී කුමක් හෝ කුලී වැඩක් කරගෙන හාල් තුනපහ ටික ගන්නට මුදල් උපයා ගන්නට ඕනෑ. ඒ නිසා මේ රට හාල් අතින් ස්වයංපෝෂිත කරන්නට ඕනෑ නම් අලුත් යෝජනා ක්‍රම අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් රුපියල් කෝටි ගණන් වියදම් කර විශාල වරිමාර්ග යෝජනා ක්‍රම ආරම්භ කරනවා වෙනුවට ගම්වල තිබෙන සුළු වැව් ගැඹුර කර සුළු කුඹුරු හිමියන්ට ජල පහසුව ලබා දෙන්ට ඕනෑ. 1947 දී අප නිදහස ලබා ගෙන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක් පිහිටුවන විට වයඹ පළාතේ පොල් අතු පැලේ හෝ පිදුරු වහළ යට හෝ ජීවත් වූ ගොවියා අදත් සිටින්නේ ඒ තත්ත්වයේ මයි. කිසිම වෙනසක් සිදු වී නැහැ. හැම රජයක් විසින්ම කොළනිවල නම් විශාල මුදල් වියදම් කර ගෙවල් හදා දී කුඹුරු අස්වද්දාදී මිනිසුන් පදිංචි කරනවා. හැම ආණ්ඩුවක්ම ඒ අන්දමට අලුත් ගොවීන් ඇති කරනවා. එහෙත් අවුරුදු දහස් ගණනක් මේ රටේ ගොවීන් හැටියට ජීවත් වූ පාරම්පරික ගොවීන්ට කිසිම සහනයක් නැහැ. මේ ගොවීන් අක්කර බද්දට යටත් වෙනවා. එහෙත් කොළනිවල සිටින ගොවීන් එයට යටත් නැහැ. ඒ නිසා මේ පාරම්පරික ගොවීන්ගේ යහපත සැලසීම පිණිස ගම්වල තිබෙන සුළු වැව් ගැඹුර කර වාරිමාර්ග ක්‍රම ඇති කර ඒ ගොවීන්ටත් යල මහ දෙක වැඩ කර ගැනීමට කටයුතු සැලැස්වූවාට පසුව නම් රජයෙන් දෙන ණය සඳහා සියයට 12 හේ පොළිය වෙනුවට සියයට 20 ක පොළියක් ගත්තත් වරදක් නැහැ. ඒ නිසා හැකි තරම් ඉක්මණින් මේ වැව් ගැඹුර කිරීමට කටයුතු සකස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. ගොවීන් ලවා කට්ටි කප්පවන ලෙස ගොවි මණ්ඩල මගින් නියම කරවන්නේ නැතිව ඒ කටයුත්ත රජයෙන් කර දෙන්නට ඕනෑ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ඇයි බස්නායක මහත්මයා වැව් හදාගෙන යනවානේ.

**ඩී. එම්. ටී. බණ්ඩාර මයා.**
*(திரு. டீ. எம். ரீ. பண்டார)*
(Mr. D. M. T. Bandara)

අපේ පළාත්වල නම් හදා නැහැ. උන්නැහේ වැව් හදන්නේ පත්තරවලින්. ඊළඟට රුපියල් 12 හේ සහතික මිල ක්‍රමය ගැනත් වචනයක් කියන්නට ඕනෑ. වී බුසලක සහතික මිල රුපියල් 14 දක්වාවත් වැඩි කරන ලෙස මා ඉල්ලා සිටිනවා. එසේ කළොත් ගොවියා මීට වඩා උනන්දුවක් දක්වාවි. දැනට එකට තිහක් හෝ තිස් පහක අස්වැන්නක් ලබා ගන්නා ගොවියා වී බුසලක සහතික මිල රුපියල් 14 දක්වා වැඩි කළොත් අස්වැන්නත් එකට 50 දක්වා වත් වැඩි කර ගැනීමට උනන්දු වේවි. වී බුසලක සහතික මිල රුපියල් 12 කළේ මීට අවුරුදු 15කට පමණ උඩ දී; එනම් 1952 දීයි.

1952 සිට මේ දක්වාම වී බුසලකට රුපියල් දොළහක් බැගින් පමණයි වී මිලයට ගැනීමේ සහතික යෝජනා ක්‍රමයෙන් ගෙවන්නේ. 1952 දී තිබුණු තත්ත්වයට වඩා දැන් ජීවන වියදම වැඩි වී තිබෙන බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. ගත වූ පහළොස් අවුරුද්ද තුළ ජීවන වියදම ඉතා ශීඝ්‍ර ලෙස වැඩි වේගන ඇවිත් තිබෙන නිසා ගොවියා උනන්දු කරවීම සඳහා රුපියල් 14 ක සහතික මිල ක්‍රමයක් ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්නැයි මා කියා සිටිනවා. ඒ අනුව කට යුතු කළොත් ගොවියා තව තවත් උනන්දු වන බවට මා තුළ නම් කිසිම සැකයක් නැහැ. සහතික මිල ක්‍රමය රුපියල් 14 කිරීම නිසා සමහර විට පෞද්ගලික වෙළෙඳපොළේ හාල් මිල දැනට තිබෙන වාට වඩා සුළු ප්‍රමාණයකින් වැඩි වන්නට ඉඩ තිබෙන නමුත් එයින් යහපතක් සිද්ධ වන්නේ ගොවියාට නිසා, ආණ්ඩුවේ ඉලක්කය මේ රට ආහාරයෙන් ස්වයං පෝෂිත කිරීමට නම් ගොවියා උනන්දු කර වීම ඉතාමත් අවශ්‍ය බව සලකා එය ක්‍රියාත්මක කරන මෙන් මා ඉල්ලා සිටි නවා.

වී මෝල් හිමියන් සඳහා මහජන බැංකු වෙන් සියේට තුනක පොලියට මුදල් දෙනවා. දැනටමත් මෝල් හිමියන් විසින් "මෝල් හිමියන්ගේ සීමා සහිත සංගමය" නමින් සමිතියක් පිහිටුවාගෙන තිබෙනවා. මේ අය මහජන බැංකුවට ඇප දෙනවා. මේ සංගමයට හැම මෝල් හිමියෙක්ම බැඳී නැහැ. මෝල් හිමියන් කීප දෙනකු බැඳී සිටින මේ සංගමය සියේට 2 ක පොලියක් ලබාගෙන ඇප දෙන්නට ඉදිරිපත් වෙනවා. කෙලින්ම දුන්නොත් සියේට තුනක පොලියක් ලබා ගන්න අතර බ්‍රෝකර් කෙනකු ඇපයට අත්සන් කළාම තවත් සියේට දෙකක් ගෙවන්නට සිදු වෙනවා. මේය පසුගිය ආණ්ඩුවෙන් ඇති කරන ලද්දකැයි මා කල්පනා කරනවා. පසුගිය ආණ්ඩුවේ කෘෂිකර්ම ඇමතිතුමා මෙය අනුමත කර තිබෙන බව පෙනෙනවා. ඒ නිසා මහජන බැංකුවෙන් ණයට මුදල් දෙන විට අනුගමනය කරන මේ වැඩ පිළි වෙළ වෙනස් කරන මෙන් ඉල්ලා සිටිනවා.

**එම්. තෙන්නකෝන් මයා.** (නිකවැරටිය)
(*திரு. எம். தென்னக்கோன்—நிக்கவெரட்டிய*)
(Mr. M. Tennakoon—Nikaweratiya)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අප රටේ ආර්ථික තත්ත්වය ආරක්ෂා කර ගැනීමේ ස්ථිර පියවරක් ගැන බලාපොරොත්තු වෙනවා නම් එය සම්පූර්ණයෙන්ම රඳා පව තින්නේ අපේ ගොවිකම් ඇමතිතුමා අතේ බව මට කියන්නට පුළුවනි. ඒ සම් බන්ධයෙන් ගරු ඇමතිතුමා අවංක උත් සාහයක් ගැනීම අපේ සන්තෝෂයට කරුණක් බව මතක් කරන්නට කැමතියි. එහෙත් එතුමාගේ අවංක අදහස කොයි තරම් දුරට පරමාර්ථය කරා යාමට සමර්ථ වී ඇද්ද යන්නත්, සමර්ථ වීමට ඉඩ ඇද්ද යන්නත් මෙවැනි අවස්ථාවක පරීක්ෂා කාරිව බලන්නට ඕනෑ. මෙහිදී වැඩි වශ යෙන්ම අපේ සැලකිල්ල යොමු විය යුත්තේ වී නිපදවීම ගැනයි. වී නිපදවීම ගැන විශාල බලාපොරොත්තුවක් ඇතිව කටයුතු කරන්නට පටන් ගැනීම ගැන අප සන්තෝෂ වෙනවා. විශේෂ බලා පොරොත්තු ඇතිව යම් යම් ප්‍රකාශ කර තිබෙන බව අපට දකින්නට ලැබෙනවා. 1970 වන විට මේ රට ස්වයංපෝෂිත කරන්නට ඕනෑයයිද, එය කළ හැකියයිද මේ ආණ්ඩුව නොයෙක් වර ප්‍රකාශ කර තිබෙනවා. ආණ්ඩුව එවැනි බලාපොරොත්තු ඇති කරගෙන තිබෙන්නේ තමන් වෙත ලැබෙන සංඛ්‍යාලේඛන අනුව වෙන්නට ඇතැයි මට හිතෙනවා. සංඛ්‍යා ලේඛනවලින් මුලාවට පත් වුණොත් අවංක පරමාර්ථයන් වුවත් නොමගට වැටෙන්නට ඉඩ තිබෙන බව මෙහිදී කරුණාවෙන් මතක් කරන්නට කැමතියි. ආණ්ඩුව සංඛ්‍යාලේඛනවලින් මුලාවට පත් වී වැරදි පාරක ගියොත් එයින් අමා රුවේ වැටෙන්නේ ජනතාවයි.

අද අක්කරයකින් නිපදවනු ලබන වී ප්‍රමාණය බුසල් අනූවටත් සියයටත් අතර ගණනකැයි කියන්නන් සිටින බව අපට පෙනී ගොස් තිබෙනවා. ඒ කොයි හැටි වෙතත් ඒවා වැරදියි. අපට නියම සංඛ්‍යා ලේඛන ලැබෙන්නට ඕනෑ, නියම තත්ත් වය දකින්නට නම්. වී ගොවිතැනින් ලැබෙන නියම අස්වැන්න ප්‍රමාණය කොතෙක්දැයි පෙන්වන නිවැරදි සංඛ්‍යා ලේඛන මගින් අපේ අස්වනුවල යථා තත්ත්වය බලාගන්නට ඕනෑ. සංඛ්‍යා ලේඛන නියම ක්‍රමයට විග්‍රහ කර ඒ අනුව දැනට පවතින තත්ත්වය තක්සේරු කර යථා තත්ත්වය තේරුම් ගෙන ඒ අනුව අපේ ලයිස්තු නැවතත් සකස් කර ගැනීම වී ගොවිතැනේ දියුණුවට තබන වැදගත් මූලික පියවරක් හැටියටයි මා සලකන්නේ. අක්කරයකින් ලැබෙන අස්වනු ප්‍රමාණය ඒ ඒ ප්‍රදේශවලට අනුවත්, ඒ ඒ ක්‍රියා මාර්ගයන් අනුවත්, කොතෙක්දැයි දැන ගෙන ඒවා තව දුරටත් වැඩි කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා කටයුතු කිරීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

දැන් අපට වෙනදාටත් වඩා අවශ්‍ය වී තිබෙනවා. යම් යම් අවස්ථාවල කොයි කොයි අන්දමට සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරමින් මොන මොන ආකාරයට විග්‍රහ කර පෙන්නුවත් අපේ පළාතේ නම් තවමත් අක්කරයකට වී බුසල් හතළිහකට වඩා ලැබෙන්නේ නැති බව මා නිර්භයවම කිය නවා. එම නිසා සංඛ්‍යා ලේඛනවල වරදක් තිබෙන බවට කිසිම සැකයක් නැහැ.

අද අපේ රටේ වී බුසලක් නිපදවීමට කොපමණ විදේශ විනිමයක් වැය වෙන වාද යන කාරණය අප පරීක්ෂා කර බැලිය යුතුයි. අපේ ගොවිතැන දැන් සකස් වී තිබෙන පිළිවෙළ අනුව වී බුසලක් නිපද වීමට විශාල ප්‍රමාණයක විදේශ විනිමයක් වැය වන බව මා විශ්වාස කරනවා. 1966 වර්ෂයේදී අපට වුවමනා කරන හාල් තොගයෙන් සියයට 50ක් පමණ පිටරට වලින් ගෙන්වා තිබෙනවා. ඒ සඳහා රුපි යල් 24 කෝටියක් වැය වී තිබෙනවා. ඒවාගේම, එම වර්ෂයේදී මේ රටේ වී නිෂ්පාදනය සඳහා අවශ්‍ය ට්‍රැක්ටර් ආදී යන්ත්‍ර සූත්‍ර ගෙන්වීම සඳහා රුපියල් 3 කෝටියක් වැය වී තිබෙනවා. හාල් ගෙන් වීමට වැය වූ මුදලෙන් අටෙන් එකක් ට්‍රැක්ටර් ආදිය සඳහා වැය වී තිබෙන බව මෙයින් පෙනෙනවා. විදේශ විනිමය ඉතිරි කර ගැනීමත් අපට ලැබෙන ආදායම් පිට රටවලට ඇදී යාම වළක්වා ගැනීමත් සඳහා කිසියම් ස්ථිර ක්‍රියා මාර්ගයක් ගත යුතුව තිබෙන බව ඒ අනුව පැහැදිලියි. ට්‍රැක්ටර් යන්ත්‍ර පාවිච්චියත් කෘත්‍රිම පොහොර යෙදීමත් නිසා වැය වන විදේශ විනිමය අඩු කර ගැනීම ඒ සඳහා යෙදිය හැකි ප්‍රතිකාරයක් බව මා මතක් කරන් නට සතුටුයි. විශේෂයෙන්ම, ට්‍රැක්ටර් පාවිච්චිය හා මේ කෘත්‍රිම පොහොර යෙදීම සම්බන්ධව ආහාර අමාත්‍යාංශයට ලැබී තිබෙන විශේෂඥ මත මොනවාද යන වග ගරු ඇමතිතුමාගෙන් මා දැන ගන්නට කැමතියි. ඒ වාගේම, ඒ මත අනුව, අනා ගතයේදී මේ රටේ වී නිෂ්පාදනය වැඩි දියුණු කර ගැනීමට ගරු ඇමතිතුමා දරන ප්‍රයත්නයන් මොනවාද යන බවත් දැන ගන්නට කැමතියි. කුඹුරුවල ට්‍රැක්ටර් යන්ත්‍ර යෙදීම සම්පූර්ණයෙන් අසාර්ථක වී තිබෙන බව අපේ පළාත්වල නම් දැන් ඔප්පුවී තිබෙනවා. කෘත්‍රිම පොහොර යෙදී මත් අසතුටුදායක වී තිබෙන බව දැන් පැහැදිලි වේගෙන එනවා. මේ පිළිවෙළ දිග ටම ක්‍රියාවේ යෙදුණොත් වැඩි කල් යන් නට පෙර මේ රටේ වී නිෂ්පාදනය සම් පූර්ණයෙන් ඇණ හිටින තත්ත්වයක් ඇති වීමට ඉඩ තිබෙනවා. මේ නිසායි, මා විශේෂ යෙන්ම මේ කරුණු සම්බන්ධව ඇති විශෙෂඥ මත මොනවා දැයි දැන ගන් නට කැමති බව ප්‍රකාශ කෙළේ.

අ. භා. 6.45

වී බුසලක් නිපදවීම සඳහා විශාල මුද ලක් වැය කරන්නට අද ගොවියාට සිදු වී තිබෙන නිසා එය ආර්ථික අතින් පවා ගොවියාට අසතුටුදායක තත්ත්වයක් වී තිබෙනවා. කලට වේලාවට කුඹුරු සකස් කර ගැනීමට ඔහුට අද හරක් නැහැ. ඒ වෙනුවට යන්ත්‍ර සූත්‍ර සඳහා මුදල් වැය කරන්නට ඔහුට සිදු වී තිබෙනවා. ඒ මදි වාට කෘත්‍රිම පෝර සඳහාත් මුදල් වැය කළ යුතුව තිබෙනවා. මේ අනුව, ඔහු වී බුසල කින් ලබා ගන්නා ආදායමෙන් වැඩි කොටසක් වී බුසලක් නිපදවීම සඳහා වැය කරන්නට ඔහුට සිදු වී තිබෙනවා. වී ගොවි තැන සඳහා ට්‍රැක්ටර් යෙදීම අසාර්ථක පිළිවෙළක් බව ප්‍රකාශ කරන විශෙෂඥයකු ගේ මතයක් අයවැය දෙවැනි වර කියවීමේ විවාදයේදී මා පෙන්වා දුන්නා. කෘත්‍රිම පොහොර යෙදීමත් ට්‍රැක්ටර් පාවිච්චියත් සම්පූර්ණයෙන්ම අසාර්ථක බව ග්‍රිස්ට් නමැති ඒ විශෙෂඥයා කරුණු සහිතව පෙන්වා දී තිබෙනවා. කුඹුරු ගොවිතැන් කෙරෙන සෑම රටක් පිළිබඳවම වාගේ පරීක්ෂණ පැවැත්වූ විශෙෂඥයකුගේ මත යක් ඒ. ඒ පොත පුස්තකාලයේ තිබෙ නවා. ඕනෑ නම් ඇමතිතුමාට පෙන්වන් නට පුළුවනි. ගොම පෝර වී ගොවිතැන සඳහා ඉතාමත් සාර්ථක පෝර බව උන් නැහේ කියනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
හොයාගන්නට අමාරුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
**(Mr. M. Tennakoon)**

හොයාගන්නට අමාරුකම තමා ප්‍රශ්නය. මා මේ කියන්නට යන දේ ඇමතිතුමා දන්නවා දැයි මා දන්නේ නැහැ. අපේ පැරණි ගොවියන් ගොයම් කපා, පාගා, බැත ගෙදර අරන් යන විට කරන පළමු වැනි කාරිය තමා වක්කඩට පිඩැලි දමා යෑම. ඒ කාලයේ ගම්වල ගවයන්, මී හරකුන් හුඟාක් හිටියා. ගොයම් කැපුවාට පසුව ඉතිරි වන ඉපනැල්ල—ඉපනැල්ල කියන එක ඇමතිතුමා දන්නවා දැයි මා දන්නේ නැහැ, ගොයම් කපා ඉතුරු වන කොටස්—කන්න ගමේ හරකුන් යනවා. ගමේ ඉන්නා හරක් ප්‍රමාණය අනුව, සති දෙකක් තුනක් පමණම ඉපනැලි කෑමට කුඹුරුවලට හරකුන් එන නිසා කුඹුර ස්වාභාවිකව පෝර වෙනවා. වක්කඩට පිඩැලි දමා යන්නේ පළමු වැනි වර්ෂා වෙන්ම ඒ ස්වාභාවික පෝර ටික හෝදා ගෙන යාවි කියන භයටයි. ඒ අනුව පළමු වැනි වර්ෂා පතනය ලැබුණාට පසුව ඒ කුඹුරු හැමෙන් ස්වාභාවික පෝර වීමක් ඇති කර ගන්නවා; හීය පරණ කරගන්නවා; නියම කාලවේලාවට වතුර පාවිච්චි කර, වී ඉහිනවා. ඒ හේතුවෙන් අස්වැන්න වැඩි වෙනවා.

අද වැඩ කටයුතු කෙරෙන්නේ ඊට සම්පූර්ණයෙන්ම වෙනස් ක්‍රමයකටයි. නවීන ක්‍රම යොදා ගත යුතු දේවලුත් තිබෙනවා. එහෙත් කුඹුරු ගොවිතැන සඳහා අද අප යොදන නවීන ක්‍රම සම්පූර්ණයෙන්ම වැරදියි. එම නිසා ඒ ගැන යම් පරීක්ෂණයක් කළ යුතුව තිබෙනවා.

ජ්‍යෙෂ්ඨ සමතුන් ගොවිතැනෙහි යෙදිය යුතු බවට මතයක් තිබෙනවා. එම නිසාම ඒ ජ්‍යෙෂ්ඨ සමතුන්ට ට්‍රැක්ටර් සපයා ඔවුන් ගොවියන් බවට පරිවර්තනය කරවන්නට ලැස්ති වෙනවා. එයින් ගොවිතැන දියුණු කරන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. සමහර විට නගුල නැත්නම් මී ගොන් බාන පස්සේ යන්නට අකමැති තරුණයන්ට ට්‍රැක්ටර් සැපයීමෙන් ගොවිතැනට උනන්දුවක් ඇති කර, ඒ මාර්ගයෙන් ඔවුන්ට රැකීරක්ෂා සපයන්නට නම් පුළුවන්කමක් ලැබේවි. එහෙත් එයින් කුඹුරු ගොවිතැන සාර්ථක වන්නේ නැහැ. කුඹුරු ගොවිතැන සාර්ථක කරගන්නට නම්, ගොවියන්ට වුවමනා අන්දමට මේ රටේ ඉන්නා හරක් ප්‍රයෝජනයට ගැනීම සඳහා ක්‍රම සවිධානය කරන්නට ඕනෑ. එහෙම නැත්නම්, "මේ රටේ විදේශ විනිමය ආරක්ෂා කරගනිමින් අපට වුවමනා හාල් මේ රටේ නිෂ්පාදනය කරන්නට පුළුවන්" කියන බලාපොරොත්තුව සාර්ථක වන්නේ නැහැ. ට්‍රැක්ටර් සඳහා වැය කරන විදේශ විනිමය දවසින් දවසම වැඩි වෙනවා. එම නිසා අපේ හාල් බුසලේ මිළ දවසින් දවසම වැඩි වෙනවා. හාල් ගෙන්වීම සඳහා අපේ විදේශ විනිමය වැය නොකළත්, අපට වුවමනා කරන හාල් මේ රටේ නිපදවීම සඳහා අවශ්‍ය උපකරණ වෙනුවෙන් විදේශ විනිමය වැය කළොත්, අප බලාපොරොත්තු වන පරමාර්ථය ඉෂ්ට වන්නේ නැහැ. එම නිසා ඒ සම්බන්ධයෙන් යම් පරීක්ෂණයක් කරන ලෙස ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

වාරියපොළ ගරු මන්ත්‍රීතුමා (ඩී. එම්. ඩී. බණ්ඩාර මයා.) වැව් දියුණු කිරීම ගැන කිව්වා. ඒ කියමන මාත් පිළිගන්නවා. වැව් ගැඹුරු කිරීම අත්‍යවශ්‍යයි. එහෙත් කෙරෙනවා මදි.

අනෙක, සහතික මිළ ක්‍රමය හෙවත් "ගරන්ටීඩ් ප්‍රයිස් ස්කීම්" ගැනත් ඇමතිතුමාගේ අවධානය යොමු විය යුතුයි. සහතික මිළ ක්‍රමය පටන් ගත් දා සිට අද වන තුරුත් එහි කොපමණ අඩුපාඩුකම් තිබුණත්, දුර්වලකම් තිබුණත්, ඒ පිළිබඳව නියම සංශෝධනයක් කවුරුන් විසින්වත් කර නැහැ. මේ ක්‍රමය පරණ වුණා වැඩියි. මේ රටේ ඉතා ඉක්මණින් පෝසත් වන උදවිය කවුරුන්දැයි සඛ්‍යා ලේඛන ගෙන බැලුවොත්, කොයි විධියෙන් හෝ සහතික මිළ ක්‍රමයට සම්බන්ධකම් ඇති උදවිය ඉක්මණින් පෝසත් වන බව පෙනී යනවා. [බාධා කිරීම්] සමුපකාරයයි, සහතික මිළ ක්‍රමයයි යන දෙකට සම්බන්ධ වන අය තරම් ඉක්මණින් පෝසත් වන අය අද ලංකාවේ ඇත්තේ නැහැ.

**ගරු. එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
**(The Hon. M. D. Banda)**

එහි රහස මොකක්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

එහි රහස කුමක්ද යන්න තමා, අපටත් හොයා ගන්නට වුවමනා වී තිබෙන්නේ, ඒ කාර්යය ඇමතිතුමාට භාරයි. සහතික මිළ ක්‍රමය පරණ වැඩියි, යල් පැනලා. ඒ නිසා එහි වෙනසක් කළ යුතුයි.

සැල්වීනියා වඳ කිරීම ගැන හැමෝම කියනවා; කරනවා. එහෙත් ප්‍රතිඵලයක් නැහැ. එන්න එන්නම සැල්වීනියා වැඩි වෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

ඒක නම් ඇත්ත.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

කොපමණවත් කියනවා, කොපමණවත් කරනවා. එහෙත් ප්‍රතිඵල අසාර්ථකයි.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

ඒක ඇත්තක්.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

එම නිසා කරුණාකර, සැල්වීනියා මැඩලීමට ස්ථිර පියවරක් ගන්න. මා යෝජනා කළා, මේ පිළිබඳව එක්තරා වැඩ පිළිවෙළක්. මා විශ්වාස කරනවා ඇතැම් නිලධාරීන් පවා මෙම මතය දරනවාය කියා. යම් කිසි කාලයක් තුළ සැල්වීනියා මිලට ගැනීමේ වැඩ පිළිවෙළක් යොදන්නට ඕනෑ. එම වැඩ පිළිවෙළ එක්තරා ක්‍රමයකට සකස් කර ගත්තොත් ඒ තරම් දුරට සැල්වීනියා වැවෙන එකක් නැහැ. මාස දෙකක් පමණ කාලයක් තුළ ඒ ඒ ප්‍රදේශවල සැල්වීනියා මිළ දී ලබා ගත්තොත් බොහෝ ප්‍රමාණයක් සැල්වීනියා ගලා එන්නට වේවි. එයින් පසු සැල්වීනියා මිල දී ගන්නට එපා. යම් යම් උදවිය සැල්වීනියා වවනවාදැයි පරීක්ෂා කර බලන්නටත් පුළුවනි. සැල්වීනියා වඳ කිරීම සඳහා මාස කීපයක් තිස්සේ ඒවා ගැළවීම කරගෙන යන්නට ඕනෑ. එසේ කළ විට සැල්වීනියා සම්පූර්ණයෙන්ම වඳ කර දමන්නට අපට පුළුවන් වෙනවා. එම නිසා සැල්වීනියා වඳ කිරීම පිළිබඳව ස්ථිර පියවරක් ගන්නා හැටියට මා ඉල්ලා සිටිනවා. දැන් ක්‍රම ක්‍රමයෙන් බොහෝ ප්‍රදේශවල සැල්වීනියා පැතිර ගොස් තිබෙනවා. කුඹුරුවලට, වාරි මාර්ග ව්‍යාපාරවලට එහෙම සැල්වීනියා බෝ වූ විට විශාල කරදරයකටයි, මුහුණ දෙන්නට සිදු වන්නේ. සැල්වීනියා වඳ කිරීමේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්නා මෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**එස්. හෙට්ටිගේ මයා. (හක්මන)**
*(திரு. எஸ். ஹெற்றிகே—ஹக்மன)*
(Mr. S. Hettige—Hakmana)

අද ලංකාවේ බොහෝ දෙනාගේ ගතත් සිතත් යොමු වී තිබෙන කෘෂිකර්ම ව්‍යාපාරය පිළිබඳව වචන දෙක තුනක් කතා කිරීමට අවස්ථාව සලසා දීම ගැන මං පළමුකොටම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ ආණ්ඩුවේ වැටීම හෝ නැගීම රඳා පවත්නේ මෙම ප්‍රශ්නය උඩ බව කටුගම්පොල ගරු මන්ත්‍රීතුමා (සුබසිංහ මයා.) ප්‍රකාශ කරන්නට යෙදුණා. එතුමාටත් පොදු ජනතාවටත් දැනගැනීම සඳහා මා එක කාරණයක් මතක් කරන්නට කැමතියි. යම්කිසි රජයක රැඳී සිටීම හෝ වැටීම නොවෙයි, මෙම ප්‍රශ්නය උඩ පිහිටා තිබෙන්නේ. අප නිරාහාරයෙන් මැරේවිද, ජීවත් වේවිද කියන ප්‍රශ්නයයි, මේ කෘෂිකර්ම දියුණුව උඩ රඳා පවත්නේ. මේ රට ස්වයංපෝෂිත කිරීම ගැන දේශපාලන වාසිය ලාබගෙන සමහර උදවිය විරුද්ධ වෙනවා ඇති. එහෙත් අප සන්තෝෂ වෙනවා, විපක්ෂයේ නායිකාව තම කොට්ඨාශයේත් වෙන තැන්වලත් පලතුරු වගාව දියුණු කිරීමෙන් වත් මෙම ව්‍යාපාරය සඳහා අපට ධෛර්‍යය දීම ගැන.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.** (අත්තනගල්ල)
*(திருமதி சிறிமாவோ ஆர். டீ. பண்டாரநாயக்க—அத்தனகல்ல)*
(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)

කනාගාටුයි කියන්න, මට නම් ලැබුණේ නැහැ ආණ්ඩුවේ සහයෝගය. [බාධා කිරීමක්] අපට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ආධාර ලැබුණේ නැහැ. [බාධාකිරීමක්] කඩාකප්පල්කාරයන් කවුද කියා අප දන්නවා.

**හෙට්ටිගේ මයා.**
*(திரு. ஹெற்றிகே)*
(Mr. Hettige)

ලංකාවේ වී නිෂ්පාදනය අතින් 8 වන තැන ගන්නේ මාතර දිස්ත්‍රික්කයයි. එහෙත් අපට ලැබෙන සැලකිල්ල නම් 8 වන තැනට නොවෙයි, 16 වන තැනටවත් වත් තබන්නට බැහැ. මාතර දිස්ත්‍රික්කයේ අක්කර 49 දහසක් කුඹුරු තිබෙනවා. එහෙත් මාතර දිස්ත්‍රික්කයේ වාරිමාර්ග කටයුතු සඳහා සිටින්නේ එකම කාර්මික සහකාර—technical assistant නිලධාරියකු පමණයි. ගොවි ජන සේවා කොමසාරිස් කායඹ්ලයට මෙම නිලධාරීන් මදි. එම නිසා සුළු වාරිමාර්ග ව්‍යාපාරවලට වෙන් වන මුදල් සම්පූර්ණයෙන් වැය නොකර ආපසු යවන්නට සිදු වන බව පෙනෙනවා. නිසි පරිදි කටයුතු කරන්නට බැරි නිසයි, එසේ වන්නේ.

මාතර දිසාපතිතුමාටත් උප දිසාපතිතුමාටත් මෙම අවස්ථාවේදී මා විසින් ස්තුති කළ යුතුව තිබෙනවා, කිසි කලෙක නැති අන්දමට වී වලින් මෙදා ආදායම් ලැබී තිබීම ගැන. ඒ ප්‍රදේශයේ අක්කරයකට බුසල් 29යි, මින් පෙර ලැබුණේ. ඒ ප්‍රමාණය බුසල් 40 දක්වා නැග තිබෙනවා. එතුමන්ලාගේත් ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවේත් උනන්දුව නිසයි, එසේ වී තිබෙන්නේ. මෙම අවස්ථාවේදී ඒ ගැන මා ප්‍රශංසා කරනවා.

තවත් මන්ත්‍රීවරුන් කීවාක් මෙන් මෑද අනුමත කරනවා, එක්තරා මූලික ප්‍රතිපත්තියක නොපිහිටා කටයුතු කර තිබීම ගැන. එනම්, වතුර නිසියාකාර ලබා දීමේ ප්‍රතිපත්තියයි. කුඹුරු ගොවිතැනින් විශාල ලෙස රට දියුණු කරන්නට තමුන්නාන්සේ කල්පනා කළත්, ඒ සඳහා කලට වේලාවට වතුර ටික ලැබෙන්නේ නැති නම් කවදාවත් ගොවිතැන් සාර්ථක අන්දමට පත් වන්නේ නැහැ. වාරිමාර්ග වැඩ නොකෙරෙනවා නම් කවදාවත් තමුන්නාන්සේගේ ගොවිකම් අංශයේ වැඩ කෙරෙන්නෙ නැහැ. එම නිසා ආහාර අමාත්‍යාංශයට සෑහෙන මුදලක් වාරිමාර්ග කටයුතු සඳහා වියදම් කරන්ට මොන පිළිවෙලකින් හෝ අයිතිවාසිකමක් තිබෙන්ට ඕනෑ. දැනට වියදම් කරන්ට පුළුවන්කම තිබෙන්නෙ රුපියල් 15,000ක් පමණයි. එය කොහෙත්ම ප්‍රමාණවත් නැහැ.

**ගරු ෂෙල්ටන් ජයසිංහ (වැඩබලන කර්මාන්ත හා ධීවර ඇමති)**
*(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ—பதில் கைத்தொழில், கடற்றொழில் அமைச்சர்)*
(The Hon. Shelton Jayasinghe—Acting Minister of Industries and Fisheries)

ලක්ෂයක් කරන්න ඕනෑ.

**හෙට්ටිගේ මයා.**
*(திரு. ஹெற்றிகே)*
(Mr. Hettige)

ඔව්; ලක්ෂයක් තරම් නැතිව තමුන්නාන්සේට මේ වැඩය කරන්ට අමාරුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම එක කාරණයක් ගැන කථා කරන්ටමයි, බලාපොරොත්තු වුණේ. එනම්, කුරුඳු කර්මාන්තය ගැනයි. කුරුඳු වගාව සම්බන්ධයෙන් මම මීට අවුරුද්දකට කලින් ගරු ඇමතිතුමාට ලියවිල්ලක් ඉදිරිපත් කර ඇති. තේ රබර් පොල් ආදි විශාල වගාවන්ගෙන් තමයි, විදේශ විනිමය ලබා ගන්ට අපි බලාපොරොත්තු වුණේ. එහෙත් දැන් පවතින තත්ත්වයේ හැටියට වැඩි මිළක් ලැබෙන සුළු වගාවන්ගෙන් විදේශ විනිමය ලබා ගැනීමට අප මහන්සි ගත යුතුව තිබෙනව. දැන් අවුරුදු තුන-හතරක සිට ලංකාවේ කුරුඳුවලට හොඳ මිළක් ලැබෙමින් තිබෙනව. තේ රබර් ආදියට මෙන් අළුතෙන් කුරුඳු වගා කිරීමටත් ආධාර ක්‍රමයක් ඇති කරන්ට කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිය. හක්මන, කඹුරුපිටිය, දෙවිනුවර, අම්බලන්ගොඩ, අකුරැස්ස, බලපිටිය, අක්මීමන, බෙන්තර-ඇල්පිටිය ආදී ආසන ගණනාවකට මේ කුරුඳු වගාව බලපානව. මුඩුබිම්, කැලෑ බවට පත්වුණු පැහිරි ඉඩම් සහ කිසිම වගාවකට යොදා නැති ඉඩම් මේ ප්‍රදේශවල තිබෙන නිසා මා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටියා, කුරුඳු අළුතෙන් වගා කිරීම සඳහා අක්කරයේ සිට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හෙට්ටිගේ මයා.]

අක්කර පහ දක්වා අක්කරයකට රුපියල් 500 ක හෝ 600 ක තරම් මුදලක් අවුරුදු 3 ක් තුළදී ආධාර මුදලක් වශයෙන් ලබා දීමේ ක්‍රමයක් සකස් කරන්න කියා. මට ආරංචියි, මේ සම්බන්ධයෙන් තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කීප දෙනකු පරීක්ෂණයක් පැවැත් වූ බව. එහෙත් තවම මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළේ නැහැ. කුරුඳුවලින් දැනට වටිනා විදේශ විනිමය ප්‍රමාණයක්, රුපියල් කෝටි 2½ තරම විදේශ විනිමය ප්‍රමාණයක් ලැබෙන නිසා මෙය දෙගුණ කර ගැනීමට කුරුඳු වගාව සම්බන්ධයෙන් ක්‍රමවත් වැඩ පිළිවෙලක් ඇති කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව. එසේ කිරීමෙන් ගම්බදව ජීවත්වන දුප්පත් ජනතාවට විශාල සෙතක් වන බවත් මා මෙහිදී මතක් කළ යුතුයි. අපට මේ සම්බන්ධයෙන් විදේශ විනිමය වැය වෙන්නෙ නැහැ ; මේ කුරුඳු කපල වෙළඳපොලට යවන තෙක් අපට වුවමනා කරන්නෙ පොඩි පිහියක් පමණයි. එම නිසා මේ කුරුඳු වගාව සම්බන්ධයෙන් උනන්දුවෙන් කල්පනා කර බලා කුරුඳු වවන දුප්පත් ජනතාවට සහන යක් ලබා දීමට ඔබතුමාගේ අවධානය යොමු වේවායි මා ප්‍රාර්ථනා කරනව. වැඩි පුර විදේශ විනිමය සොයා ගත හැකි සුළු වගාවන් මොනවාදැයි ක්‍රම සම්පාදක අමාත්‍යාංශය මගින් සොයාගෙන යන බව මට ආරංචියි. දැනට පවතින තත්ත්වය අනුව කුරුඳු වගාව තරම් විදේශ විනිමයක් ලබා ගන්ට පුළුවන් වෙනත් හොඳ වැවිල්ලක් නැත කියා මට හිතෙනව.

අ. භා. 7

අවසාන වශයෙන් තවත් කාරණයක් මතක් කරන්ට තිබෙනව. තේ නැවත වගා කිරීමට අක්කරයකට රුපියල් 3,000 ක ආධාරයකුත්, රබර් නැවත වගා කිරීමට රුපියල් 1,000 ක ආධාරයකුත් ගෙවන නමුත් කුඹුරු අස්වැද්දීමට රජයේ ආධාර මුදලක් ලැබෙන්නෙ නැහැ. මා පාලනය කරන වතුයායේ අයිතිකරු වන නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමා (ඩොනල්ඩ් ජේ. රණවීර මයා.) සමග මා ඊයෙ-පෙරේද ඒ වත්තේ ඇවිදින අවස්ථාවේ එහි අක්කර 66 ක රබර් ඉඩමක් දෙනියක තිබෙන බව නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමා දැක්ක. නැවත රබර් වගා කිරීම සඳහා අක්කරයකට ලැබෙන ඒ රුපියල් 1,200 ආධාර මුදල බලාපොරොත්තු නොවී ඒ අක්කර 66 කුඹුරු කර අස්වද්දන්නය කියා මට නියෝග කළා. ඒ අක්කර 66 කුඹුරු බවට පත් කිරීම ලෙහෙසියෙන්ම කරන්නට පුළුවනි. ඒ සඳහා එකම දෙයයි කරන්නට තිබෙන්නෙ. ඒ කටයුත්ත කෙරෙන්නට ඕනෑ රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙනුයි. ගොවි ජන සේවා කොමසාරිස්තුමාත් උනන්දු කරවා මේ කාර්‍ය්‍යය ඉටු කර දෙන මෙන් මා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මාතර-මුලටියන පාරේ 3/17 දරන බෝක්කුව අඩි දෙකක් පමණ පහත් කිරීමයි කරන්නට තිබෙන්නෙ. මේ බෝක්කුව අඩි දෙකක් පමණ පහත් කළොත් වතුර නිසියාකාරව බැස යනවා. ඒ අන්දමට වතුර නිසියාකාව බැස ගියොත් මා සඳහන් කළ ඒ අක්කර 66 පමණක් නොවෙයි තවත් අක්කර 100 ක් පමණ අස්වද්දන්නට පුළුවන්කම ලැබෙනවා. වතුර බස්වා ගැනීමට නුපුළුවන්වීම නිසා මේ ප්‍රදේශයේ අක්කර 100 ක් පමණ දැන් පාළු වී තිබෙනවා. බෝක්කුව පහත් කළොත් මේ අක්කර 166 ම අස්වද්දන්නට පුළුවන් වෙනවා. මේ බෝක්කුව පහත් කිරීමේ කාර්යය රුපියල් හත් අට දහසකින් පමණ කරන්නට පුළුවනි. එය කර දෙන මෙන් ඉල්ලා සිටින අතර තමුන්නාන්සේ මේ ගෙන යන ව්‍යාපාරයෙන් රට ස්වයංපෝෂිත වේවායි මා ප්‍රාර්ථනා කරනවා.

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*
(Mr. Hemachandra Sirisena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතා මත් කෙටියෙන් අදහස් රාශියක් ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

කුමන ආණ්ඩුවක් තිබුණත් අප සියලු දෙනාටම කන්නට ආහාර ඕනෑ කරනවා. ආහාර නිෂ්පාදනය කරන කුමන ආණ්ඩුවකට වුණත් අප සියලු දෙනාගේම ආධාරය ලැබෙනවා. අප කරන විවේචන සැළකිල්ලට භාජන කළොත් තමුන්නාන්සේලාගේ ව්‍යාපාරය සාර්ථක වෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ත්‍රිකුණාම ලේ ගරු මන්ත්‍රීතුමා (මානික්කරාජා මයා.) සමුපකාර සමිතිවලටත් අනෙකුත් ආයතන වලටත් නිලධාරීන් පත් කරන ආකාරය පිළිබඳව කථා කළා. මගේ ඉල්ලීමකට තමුන්නාන්සේගේ ස්ථිර ලේකම් අත්සන් කර මට එවා තිබෙන ලිපියක් මා ගරු සභාවට ඉදිරිපත් කරනවා. අකුරණ ඡන්ද දායක කොට්ඨාශයේ තුම්පනේ හාරිස් පත්තුව විවිධ සේවා සමුපකාර සමිතියේ ලිපිකරුවකු වශයෙන් සමුපකාර ප්‍රාදේශීය පරීක්‍ෂක නාරංගොඩ මහත්මයාගේ පුත්‍රයා පත් කර තිබෙනවා. ඒ ගැන මා විමසුවා. ඒ විමසීමට මට දෙපාර්තමේන්තුවෙන් ලැබුණු ලිපියයි මේ:

"සමුපකාර ප්‍රාදේශීය පරීක්ෂක ඩබ්ලිව්. එස්. නාරංගොඩ මහතා මෙම සංගමයේ පරිපාලක නිල ධාරී තැනය. ඔහුගේ පුතා සංගමයේ තාවකාලික සේවයට බඳවා ගෙන ඇති බැව් සැබෑය. මෙම පත්වීම සම්බන්ධව නාරංගොඩ මහතා විසින් කාරක සභිකයින් පෙළඹවීමක් කර නැත. එසේ වුවත් මෙම පත් කිරීම අයුක්තිසහගත යයි සැක කිරීමට මහජනයාට ඉඩ තිබේ.

මෙම කරුණ සම්බන්ධව නැවත සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමා අවශ්‍ය කටයුතු කර නවා ඇත."

මේ ලිපිය අත්සන් කර තිබෙන්නේ ස්ථිර ලේකම්තුමායි. 1967.5.7 දින දරණ මේ ලිපියේ අංකය එම්ඒ/2/67යි. සමුප කාර පරීක්ෂකතුමා මේ පත්වීම සම්බන්ධ ව පෙළඹවීමක් නොකළ බව ඇත්තයි. නමුත් සංගමයේ නිලධාරීන් කල්පනා කරන්නේ එහෙම නොවෙයි. සමුපකාර පරීක්ෂකවරයාගේ පුතා පත් කර ගත් තොත් සමුපකාර පරීක්ෂකවරයාගේ ඇඟිලිගැසීම්වලින් තොරව අපේ වැඩ කට යුතු අපට ඕනෑ හැටියට ගෙන යන්නට පුළුවන් වෙයි යන හැඟීමෙන් තමයි මේ පත්වීම කර තිබෙන්නෙ. ඒකයි පරමාර්ථය. තමුන්නාන්සේ නැත කියනවාද? මේ සමුපකාර පරීක්ෂකතුමා ඒ කොට්ඨාශ යේ කෙනෙකුවත් නොවෙයි. අකුරණ ඡන්දදායක කොට්ඨාශයේ 1 ලක්ෂ 50 දහසක ජනගහණයක් සිටිනවා. 40,000 ක් පමණ ජ්‍යෙෂ්ඨ සමතුන් සිටිනවා. 20,000ක් පමණ විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගය සමත් වූවන් සිටිනවා. 5,000 ක් පමණ උපාධි ලැබූවන් සිටිනවා. එසේ නම් ලිපිකරු තනතුරට පිට ප්‍රදේශයකින් පැමිණි සමු පකාර පරීක්ෂකතුමාගේ පුත්‍රයාම පත් කළේ ඇයි? දැන් තමුන්නාන්සේට කාරණය ඔප්පු වුණාද, නැද්ද?

ඊළඟට වාරිමාර්ග ගැන මතක් කරනවා. 1965 ජූලි මාසයේ 22 වන දින පොඩි අමු ණක් සාදා දීම සම්බන්ධයෙන් මා දෙපාර්ත මේන්තුවට ලියමනක් යැව්වා. ඒ සම් බන්ධයෙන් කුමක් කළාදැයි ප්‍රශ්න කර මින් 1966 අගෝස්තු මස 18 වැනි දිනද ලිපියක් යැව්වා. මේ ලියුම් දෙකින් එකක ටවත් උත්තරයක් ලැබුණේ නැහැ. අද 1967 සැප්තැම්බර් මස 5 වැනිදායි. මේ දක් වාම මේ ලියුම්වලට පිළිතුරු නැහැ. පොඩි අමුණක් සාදා දීමෙන් කුඹුරු අක්කර ගණනාවක්ම වැඩ කරන්නට පුළුවනි. එහෙත් ඒ සුළු වැඩේ කර දෙන්නටවත් නිලධාරීන් උනන්දු වන්නේ නැහැ. ඇමති තුමා උනන්දු වුණත්, නිලධාරීන් උනන්දු වන්නේ නැහැ.

තේ සහ රබර් නැවත වගා කිරීමට ආධාර දෙනවා. තේ රබර් පිටරට යවා අපට වුවමනා ආහාර ද්‍රව්‍ය මෙහි ගෙන්ව නවා. චීනයට රබර් යවා චීනයෙන් හාල් ගෙන්වා ගන්නවා. රබර් වගාවට ආධාර දෙනවා නම් කුඹුරු වපුරන්නට ගොවි යන්ට ආධාර නොදෙන්නේ ඇයි? ගොවි යන්ට ආධාර දෙනවා වෙනුවට ඔවුන් විසින් ගෙවිය යුතු අක්කර බද්ද යන්නම් හෝ පමා වුණොත් ඔවුන් උසාවියට ගෙන ගොස් දඩ ගසනවා. ගොවියාට රජකම දෙනවා යයි කියන මේ ආණ්ඩුව මෙතෙක් නම් ගොවියාට දී තිබෙන්නේ අමුඩය විත රයි. ඊට වඩා යමක් නැහැ. මැති ඇමති වරුන්, ධනේශ්වර පංක්තියේ උදවිය හා නිලධාරීන් බත් කන්නේ ගොවියා නිසයි. ගොවියා නැත්නම් සාගින්නේ ඉන්නට සිදු වෙනවා. ඉතින් ඒ විධියේ විශාල සේවයක් සිදු කරන ගොවියාට ආධාර දෙනවා වෙනුවට ඔහුට දඩ ගස නවා.

රජයේ සේවකයන්ට පඩි වැඩි කිරීම ගැන අප විරුද්ධ නැහැ. අප ඒ ගැන සතුටු වෙනවා. ඒ අතර වැඩිම වී අස් වැන්නක් ලබන ගොවියාට මාසයකට රුපි යල් දහය බැගින් ගෙවන්නට මෙම ආණ්ඩුව ක්‍රියා කරනවා නම් කොතරම් හොඳද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිරිසේන මයා.]

අක්කරයකින් වී බුසල් සියයක් ලබන ගොවියාට මාසයකට රුපියල් දහය බැගි නුත්, අක්කරයකට වී බුසල් හැත්තෑවක් ලබන ගොවියාට මාසයකට රුපියල් පහ බැගිනුත්, අක්කරයකට වී බුසල් පණහක් ලබන ගොවියාට මාසයකට රුපියල් දෙකයි ශත පණහ බැගිනුත් ගෙවන්නට පටන් ගත්තොත් තත්ත්වය කෙසේ වේද ? මේ විධියේ ක්‍රියා මාර්ගයක් අනුගමනය නො කර නිලධාරීන්ගේ බොරු වාර්තා අනුව ක්‍රියා කිරීමෙන් නම් වැඩක් නැහැ.

පසුපස ආසනවල සිටින ගරු මන්ත්‍රී වරුන් ඉදිරිපත් කරන කාරණා ගැන කැබි නට් මණ්ඩලය සලකන්නේ නැහැ. මෙම ආණ්ඩු ක්‍රමයේ ඇති ලොකුම වරද ඒකයි. ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රියාත්මක නොකළේ මන්දැයි ප්‍රශ්න කළ විට ලැබෙන පිළිතුර නම්, "උපදෙස් දෙන්නට තමුන්නාන්සේට අයිතිවාසිකම තිබෙනවා, එහෙත් ඒවා භාරගෙන ක්‍රියාවේ යොද වන්නට අප බැඳී නැහැ" යන්නයි. මේ තත්ත්වය ඇති වී තිබෙන්නේ ඇමති වරුන්ගේ වරද නිසා නොව ආණ්ඩු ක්‍රම යේ ඇති වරද නිසයි. ඉදිරිපත් කරන ලද මොකක් හෝ යෝජනාවක් ගැන නිල ධාරීන්ගෙන් ඇසූ විට ඔවුන් කියන්නේ එම යෝජනාව ක්‍රියාත්මක කිරීම නුසුදුසු බවයි. ඇත්තෙන්ම ඔවුන් එසේ කියන් නේ ඉදිරිපත් කරන ඒ යෝජනා ක්‍රියාත් මක කළහොත් ඔවුන්ට පහරක් වදින නිසා විය යුතුයි. ඒ වැඩ ක්‍රියාත්මක කළ හොත් නිලධාරීන්ට අලාභයි. ඒ නිසා ඒ වැඩ පිළිවෙළවල් වලක්වනවා. ඒවා කරන් නට දෙන්නේ නැහැ.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)
ඇත් හුගක් වෙලාව ගත්තා.

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமசந்திர சிறிசேன)*
(Mr. Hemachandra Sirisena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා සිටින මේ ආසන පේළියේ එකම ආසනයකවත් කවුරුවත් නැහැ. මා කථා කරන්නේ ඒ සියලුදෙනාම වෙනුවෙන්.

අපේ හිටපු අග්‍ර විනිශ්චයකාර හේම බස්නායක මහතා කෘෂිකර්මය පිළිබඳව විශාල උනන්දුවකින් වැඩ කරනවා. උන් නැහේ නිදහස් පුද්ගලයෙක්. හොඳ සෞඛ්‍ය තත්ත්වයක් හා ශරීර ශක්තියක් තිබෙනවා. එමෙන්ම දෙපැත්තකින් තුන් පැත්තකින් උන්නැහෙට ආදායම් එනවා. උන්නැහේ මේ ව්‍යාපාරයට නිදහස් පුද් ගලයෙක්. ඒ නිසා උන්නැහේ එය කර ගෙන යන බව අපට පෙනෙනවා. උන්නැ හේගේ යෝජනා මේ ආණ්ඩුව ක්‍රියාත් මක නොකරන එකයි වරද, උන්නැහේ ගන්නා උත්සාහය මා අගේකොට සලකනවා.

අ. භා. 7.15

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උන්නැ හේ මේ කටයුත්ත කරන්නේ කොයි ආකාරයටද ? මම කියන්නම්. ඔන්න උන් නැහේ ගම්මුන් ටිකකුත් එක්කරගෙන බින්තැන්නේ වැවකට යනවා. හැබැයි හාමුදුරුවරු දෙනමක් තුන්නමක් වරදින් නේ නැහැ. ඒ අයත් සමග වැව ළඟට ගිහින් බස්නායක උන්නැහේ අහනවා "කොහොමද මේ වැවේ දැන් වතුර ප්‍රමා ණය" කියා. එතකොට අර ගම්මු කියනවා "දෙයියෝ බුදුවන්ඩ හාමුදුරුවනේ, මේ වැවෙන් දැන් කුඹුරු අක්කරයක්වත් වැඩ කර ගන්න වතුර නැහැ; වැඩ කළත් වතුර නැතිකම නිසා ගොයම මැරෙණවා" කියලා. ඊළඟට උන්නැහේ අහනවා "පුරා ණයේ මේක තිබුණේ කොහොමද" කියා. එතකොට අර ගම්මු කියනවා "අනේ උත්ත මයෝ අපි කුඩා කාලයේ නම් ඇස්දිස්ටි යක් මානයේ වතුර තිබුණා" කියා. එවිට හේම බස්නායක මහත්මයා බස්තම දික් කර "අර ඈත පෙනෙන හරියටත් වතුර තිබුණාද" කියා අහනවා. හැබැයි අහන්නේ බස්තමෙන්. එසේ ඇසූ විට අර ගම්මු කිය නවා, "දේවයන් වහන්ස, අනේ උත්තම යෝ, අර එහා කෙළවරේ ඈත පෙනෙන මීහරකුන්ටත් එහා පැත්තෙන් වතුර තිබුණා" කියා. තවත් ඊට වඩා වයසක කෙනකුගෙන් ඊළඟට අහනවා "මේ කියන එක හැබෑවක්ද" කියලා. එත කොට ඒ නැනැත්තා "අනේ උත් තමයෝ, ඒ මීහරකුන්ට එහා පැත් තෙන් සිටින අර බූරුවන්ටත් එහා පැත්තෙන් වතුර තිබුණා" කියා අත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දික්කර පෙන්වනවා. හේම බස්නායක උන්නැහේ ඊළඟට "එහෙනම් අර ඈත කඳුවැටියේ කෙළවරටම වතුර තිබී තිබෙනවා" කියා බස්තම කරකවනවා. එතකොට ගම්මුත් "එහෙමයි බුදුවන්ඩ" කියනවා. ඊළඟට "දැන් මේ අපි සිටින පැත්ත කොහොමද" කියා බස්තමෙන් තට්ටු කර අහනවා. "අනේ උත්තමයෝ, මේක මහා මේරු පර්වතය වගෙයි. මෙතනින් නම් කැඩෙන්නේ නැහැ, කැඩෙනවා නම් කැඩෙන්නේ අන්න අර එහා කෙළවරෙන්" කියා අර ගම්මු කියනවා. ඔහොම කියා යන්නට ලැහැස්තිවී කෝක වුණත් කියා හේම බස්නායක උත්තමයා සොරොව්ව ළඟට ගිහින් ගොඩ සොරොව්වත් මඩ සොරොව්වත් දෙකටම බස්තමෙන් ඈන බලනවා. ඔය සොරොව්වලට ඈනලාම දැන් උන්නැහේගේ බස්තමත් ගෙවිලා. ඒ තරමටම උන්නැහේ බස්තමෙන් වැව් හදා තිබෙනවා. ඔන්න ඔය විධියටයි හේම බස්නායක උන්නැහේ වැව් හදන්නේ.

දුම්කොළ වගාවත් කෘෂිකර්මය යටතට වැටෙනවා. මේ රටට බීඩි දුම්කොළ ගෙන්වීම තහනම් කර තිබෙනවා. එය කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක ඇමතිවරයකු වශයෙන් සිටි අපේ ආර්. ජී. සේනානායක උත්තමයා. ඒ උත්තමයා ඒ වැඩේ කළ නිසා විශාල විදේශ විනිමයක් ඉතිරි වුණා. ඊට පසුව දැන් දුම්කොළ වගා කරනවා. ඒවා දැන් විකුණා ගන්නත් බැරි වී තිබෙනවා. දැන් බීඩි දුම්කොළ ගෙන්වන්නෙත් නැහැ. බීඩි සමුපකාර සමිතියක් තිබෙනවා. යම්කිසි මිලකට මේ දුම්කොළ ගන්නය කියා ආණ්ඩුවෙන් නියම කර තිබෙනවා. ඇනට රුපියල් දශ ලක්ෂ ගණනක බීඩි දුම්කොළ ගබඩා කර තිබෙනවා. ස්වදේශ කටයුතු ඇමතිතුමා දැන් නියෝගයක් කර තිබෙනවා බීඩි දුම්කොළ ගන්නට බල කරන්නට එපාය මගේ ඡන්ද දායකයින්ට ආධාර පිණිස කොළ පමණක් දීපල්ලා කියා. එතකොට බීඩි දුම්කොළ ව්‍යාපාරයෙන් ගොවීන්ට සහනයක් ලැබේද? කළ යුත්තේ ඒක නොවෙයි. බීඩි කොළ රාත්තල් මෙපමණ ප්‍රමාණයකට බීඩි දුම්කොළ රාත්තල් මෙපමණ ප්‍රමාණයක් ගන්නට ඕනෑය කියා නියමයක් කරන්නට ඕනෑ. එසේ කළොත් බීඩි දුම්කොළ වවන ගොවීන්ට ප්‍රයෝජනයක් වෙනවා. එසේ නොකළොත් එම ගොවීන් ඒ ව්‍යාපාරය අතහැර දමාවී. දැන් සමාගමත් බීඩි දුම්කොළ ගන්නේ නැහැ. ඒ නිසා ධනපති මුදලාලිලා ගොස් 1.25 ට හෝ 1.50 ට හෝ ඒවා ලබාගන්නවා. අර ගොවීන් අමාරුවේ වැටිලා. වියදම් කළ මුදලවත් ලබා ගන්නට බැහැ. මොකක්ද මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය? එක් ඇමතිවරයෙක් එක් විධියක හිතුවක්කාරකමකුත් තවත් ඇමතිවරයෙක් තවත් විධියක හිතුවක්කාරකමකුත් කරතොත් වැඩ කරන්නේ කොහොමද? ඒ විධියට වැඩ කිරීමෙන් මේ රට ස්වයංපෝෂිත කරන්නේ කොහොමද? මේ රටේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳා ජනතාවට සෙත් සලසන්නේ කොහොමද?

බීඩි කොළ වවන ලෙස මේ ආණ්ඩුව නියමයක් කර තිබෙනවා. එය කරන්නේ කොහොමද? ගරු ඇමතිතුමා නොදන්නා දෙයක් තිබෙනවා නම් මම කියා දෙන්නම්. නිලධාරීන්ගෙන් ඇහුවොත් ඒ අය ලංකාවේ බීඩි කොළ වවන්නට පුළුවනැයි කියන කතාවේ ඇත්තක් තිබෙනවායයි කියාවී. මම කියන්නම්. බීඩි කොළ වවන්නට මේ රටේ අමාරුයි. ඉන්දියාවේ බීඩිකොළ වවනවා. අක්කරයකින් කොළ රාත්තල් සියයක් තරම විතරයි ඉන්දියාවෙත් නිපදවන්නේ. අක්කර සියයක් පමණ වැව්වත් ඔය ප්‍රමාණයටයි ලැබෙන්නේ. ඒ රට විශාල නිසා එය ඒ තරම් දුරට බල පාන්නේ නැහැ. අපේ රට කුඩා එකක්. ඉන්දියාවේ තරම් විශාල ලෙස අපට මෙය කරන්නට අමාරුයි. අපේ රටේ සියයක් උපදවන්නටත් බැහැ, පණහයි හැටයි මේ රටේ ලැබෙන්නේ. බීඩි කොළ වවන්නට අක්කර අසූදාහක් දැනටමත් වෙන් කර තිබෙනවාලු. මේ රටේ ඉඩම් හුඟක් තිබෙන නිසා ඒ තරම් විශාල ප්‍රමාණයක් බීඩි කොළ වවන්නට වෙන් කළාද? එතකොට කොහොමද අනෙකුත් ආහාර ද්‍රව්‍ය වගා කරන්නේ? ඔය වැඩෙන් කම්කරුවන් කිහිප දෙනකුට පමණයි රක්ෂාව ලැබෙන්නේ. කොළ රාත්තල් සියයක් හමාරක් පමණයි වැඩිම වුණොත් ලැබෙන්නේ. ඔය වැඩ ටික මේ විධියට කරන්නට එපා. විනිමය ආරක්ෂා කර ගන්නටත්, මීට වඩා ආහාර ද්‍රව්‍ය වගා කරන්නටත් වුවමනා කරන උපදෙස් මම දෙන්නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හේමචන්ද්‍ර සිරිසේන මයා.]

විදේශ විනිමය අනුමත කර තිබෙන කර්මාන්ත හිමියන් විශාල ගණනක් මේ රටේ ඉන්නවා. ඒ අයට රටේ දියුණුවට යමක් කරන ලෙස නීත්‍යානුකූලව බල කරන්නට ඕනෑ. පණතක් ඉදිරිපත් කර ඒ මගින් අවශ්‍ය බලතල ලබා ගන්නට ඕනෑ. රුපියල් දහදාහක විදේශ විනිමයක් ලබා ගැනීමට බලාපොරොත්තු වන කර්මාන්ත හිමියකු වෙතොත් ඔහු එය ලබා ගැනීම සඳහා මෙපමණ මිරිස් රාත්තල් ගණනක් නැත්නම් හොණ්ඩර ගණනක් වගා කරන්නට ඕනෑයයි නියම කරන්නට අවශ්‍ය බලතල ලබා ගත යුතුයි. යම් කර්මාන්තයක් සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය පිටරටින් ගෙන්වා ගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා මේ තරම් දේවල් නිෂ්පාදනය කළ යුතුය යනුවෙන් නියමයක් ඇති කරන්නට බලය තිබෙන්නට ඕනෑ. රුපියල් දහදාහක විදේශ විනිමයක් යන අමු ද්‍රව්‍ය මේ රටට ගෙන්වා ගැනීමට නම් අක්කර පණහක නැත්නම් සියයක අල හෝ කොත්තමල්ලි හෝ පරිප්පු වැනි වෙනත් දෙයක් හෝ වගා කර මේ තරම් ප්‍රමාණයක් නිෂ්පාදනය කළ යුතුයයි නියමයක් කළොත් එය ලබා ගැනීම සඳහා කර්මාන්ත හිමියන් ගොවිතැනට උනන්දු වෙනවා ඇති. බීඩි කොළ ඉන්දියාවෙන් ගෙන්වීමට දැන් තිබෙන ඔය සැලැස්ම නවත්වන්නට එපා. එය ඉන්දියාවෙන්ම ගෙන්වා ගැනීම වඩා හොඳයි. බීඩි කොළ සඳහා රුපියල් අසූ ලක්ෂයක් විදේශ විනිමයක් වැය වෙනවා නම් මා ඉදිරිපත් කළ යෝජනාව යටතේ පරිප්පු, දුරුමිරිස් වැනි දේ වගා කරන්නැයි නියම කළාම වැය වන විදේශ විනිමයට සමාන විනිමය ප්‍රමාණයක් පරිප්පු, දුරුමිරිස් වැනි දේවල් තව දුරටත් පිටරටවලින් ගෙන්වන්නට නොසිදු වීමෙන් මෙහි ඉතිරි වෙනවා. බීඩි කොළ මේ රටේ වවන්නට පුළුවන්කමක් නැහැ. එය සාර්ථක වන්නේ නැහැ. මෙවැනි තවත් වැඩ පිළිවෙළවල් තිබෙනවා. ඔය විධියට තමන්ගේ වැඩ පිළිවෙළ සකස් කර ගැනීම හොඳ බව මා කියා සිටිනවා.

නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා (එම්. තෙන්නකෝන් මයා.) කිව්වා වාගේ පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේ ට්‍රැක්ටර්වලින්ද කුඹුරුවල සීසෑම කළේ? ඒ කාලයේ මී හරකුන් ලවා නොවෙයිද අපේ කුඹුරුවල වැඩ කරවා ගත්තේ? දැන් අපේ රටේ මුදල් ට්‍රැක්ටර් සඳහාත් රට පෝර සඳහාත් කොයි තරම් විශාල ප්‍රමාණයක් වැය වෙනවා දැයි බැලුවොත් ඒ මුදල් ප්‍රමාණය කෙලින්ම සහල් ගෙන්වා ගැනීම සඳහා වැය කිරීම වඩා හොඳයයි කෙනකුට හිතුනොත් එය වරදකැයි කියන්නට බැහැ. ඒ තරම් විශාල මුදල් සම්භාරයක් ට්‍රැක්ටර් ආදිය සඳහා ඇදී යනවා. ට්‍රැක්ටර්වලින් ප්‍රයෝජනයක් ලැබෙන්නේ ජාවාරම්කාරයින්ට පමණයි. චීනයේ කුඹුරු වැඩ කරන්නේ ට්‍රැක්ටර්වලින් නොවෙයි. ඒ රටේ ට්‍රැක්ටර් සාදන්නේ ඒ රටේ ප්‍රයෝජනයට නොව මේ රටේ මෝඩයින්ට විකුණා මුදල් ලබා ගන්නටයි. චීනයේ කුඹුරු හාන්නේ මී හරකාගෙනුයි. අපේ රටේ වාගේ මී හරකුන් දෙන්නකු ඈදා ගෙන නොවෙයි, එක හරකාගෙනුයි ඒ රටේ කුඹුරු හාන්නේ. ඒ රටෙත් මී හරක් ඉන්නවා. මේ රටෙත් මී හරක් ඉන්නවා. ඔය පැත්තේ සිටින මීහරකුන්ට වඩා හොඳ ශක්ති සම්පන්න මීහරක් චීනයෙහි සිටින බව මා මතක් කරන්න කැමතියි. කෝටුවකින් තලන්නේවත් නැතිව උන්ගෙන් වැඩ ගන්නට පුළුවනි. [බාධා කිරීම්] අප මෙවැනි දෙයක් කිව්වහම එක් එක්කෙනාට රිදෙන්නට කථා කළායයි අපට චෝදනා කරනවා. අප කියන දේවලින් සමහර අයට රිදෙනවා ඇති. එහෙම රිදෙන්නේ අප කියන දේ ක්‍රියාත්මක නොකරන නිසායි. කාට රිදුණත් ඇත්ත නොකියා ඉන්නට මට නම් බැහැ. රෝයල් විද්‍යාලයේ සෙන්තෝමස් විද්‍යාලයෙ ඉගෙන ගෙන ඇවිත් කලිසම ඇඳගෙන දනිස්ස ළඟට එන තෙක් සපත්තු දාගෙන බස්තමත් අරගෙන ගිහින් නියර උඩට වෙලා පොත බලාගෙන "ඕක ඔහොම නොවෙයි කරන්නට ඕනෑ මෙහෙමයි" කියන එකද ගොවිතැන? මීහරක් බානක් ඇති කරන එකම නිලධාරියෙක්වත් කෘෂිකර්ම අමාත්‍යාංශයෙ සිටිනවාද? ගෙදර මැස්සේ විය ගහකුත් නගුලකුත් තිබෙන්නේ කොයි නිලධාරියාගේ ගෙදරද? කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරට පොළොන්නරුවෙන් හෝ පදවියෙන් හෝ ගොවියකු තෝරා ගන්න. තමුන්නාන්සේගේ කෘෂිකර්ම වැඩ පිළිවෙළ සාර්ථක වන්නේ එදාටයි. මේ විධියට බොරුවෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මූලාවෙන් රට රවටලා විකාර කරලා ලැයිස්තු ඉදිරිපත් කළාට කවදාවත් මේ වැඩේ හරි යන්නේ නැහැ.

ඊළඟට මා අස්වනු ගැන ගණන් හිලව් හදන සංඛ්‍යා ලේඛන නිලධාරීන් ගැන වචනයක් කියන්නට ඕනෑ. මේ නිලධාරීන් ගණන් හිලවු හදන හැටි මා පොඩි කතන්දරයකින් පෙන්වා දෙන්නම්. එක මඟුල් ගෙදරක් තිබුණා. හුඟ දෙනකුට ඊට ආරාධනා කර තිබුණු නමුත් මඟුල් ගෙදරට ආවේ අවුරුදු 10 ක කොල්ලෙකුත් අවුරුදු 70 ක මහල්ලෙකුත් පමණයි. මඟුල් ගේ අයිති උදවියට මේක මහ මදි කමක්. විශාල පිරිසක් ආ බව රටට කියන්නට ඔවුන් උපායක් කල්පනා කළා. නම් බුව ආරක්ෂා කර ගන්නට මොකක් හෝ උපායක් යොදන ලෙස මඟුල් කපුවාට කිව්වා. මඟුල් කපුවා මේ විධියට ගණන් හැදුවා. මඟුල් ගෙදරට ආවේ අවුරුදු 10 කොලුවයි, අවුරුදු 70 මහල්ලයි පමණයි. 70 යි 10 යි එකතු කළා. එතකොට 80 යි. ආරාධනා ලැබූ අයගෙන් සියයට 80 ක් මඟුල් ගෙදරට ආවායයි ගණන් හැදුවා. ඊළඟට 80 දෙකට බෙදුවා. එතකොට 40යි. වයස 40 අය සියයට 70 ක් ආවායයි ගණන් හැදුවා. මේ විධියට ගණන් හදා පත්තරේට දැන්වීමක් දැම්මා. කෘෂිකර්ම අමාත්‍යාංශයේ සංඛ්‍යා ලේඛන නිලධාරීන් අස්වනු සංඛ්‍යා ලේඛන හදන්නෙත් ඔය විධියටයි.

මේ වැය ශීර්ෂය යටතේ කියන්නට කරුණු රාශියක් තිබෙන නමුත් ඊට කාලයක් නැති නිසා මා දීර්ඝ වශයෙන් කථා කරන්නෙ නැහැ. කෘෂිකර්ම අමාත්‍යාංශය ගැන කථා කරන්නට වෙනත් අවස්ථාවක් ඇති වුණොත් මට මීට වඩා වේලාවක් ලැබේයයි මා බලාපොරොත්තු වෙනවා. මීට වඩා විස්තර ඉක්මනින් ලබා ගන්නට ගරු ඇමතිතුමා අදහස් කරතොත් එතුමාගේ නිලධාරීනුත් ඉදිරිපිට සාකච්ඡාවක් පැවැත්වීම සඳහා මා ඇමති කාර්යාලයට කැඳවන්නේ නම් හොඳ හොඳ කරුණු මා ඉදිරිපත් කරන්නම්. තමුන්නාන්සේගේ කෘෂිකම් වැඩ පිළිවෙළ සාර්ථක වන්නේ ඒ කරුණු අනුව කටයුතු කළොත් පමණයි. දැනට ගරු ඇමතිතුමා ගෙන යන වැඩ පිළිවෙළ අප අගය කොට සලකනවා. අප ආණ්ඩු පක්ෂයේ සිටියත් විරුද්ධ පක්ෂයේ සිටියත්, අපට පක්ෂ විපක්ෂ ඡන්ද දායකයින් දෙපසකට බෙදී සිටියත් අප සියලුදෙනාම බත් හා වෙනත් කෑම් බීම් කන්න බොන්න ඕනෑ. හොඳට කා බී පෝෂණය වෙලා මිළඟ මැතිවරණයෙන් ජයග්‍රහණය කොට අප ඔය පැත්තට ආවහම තමුන්නාන්සේගේ වැඩ පිළිවෙළ තවත් ඉදිරියට ගෙන යන්නට අපට පුළුවන් වෙනවා. අන්න රාජ්‍ය ඇමතිතුමා එනවා. එතුමා ආවහම මට ආයෙමත් "ස්ටාට්" වෙනවා. එක මිනිහෙක් තමුන්නාන්සේලාට තට්ටු කරලා රටිනුත් පිටුවී ගිය බව පත්තරේක තිබුණා. ධනපති කොම්පැනි කාරයින්ට මේ විධියට විදේශ විනිමය දෙන්නට ගියොත් තවත් ඔවැනි දේවල් සිදු වෙයි. කර්මාන්ත අමාත්‍යාංශයෙන් විදේශ විනිමය අනුමත කරවා ගන්නා ධනපතියනට කොළඹින් ගෙවල් ගන්නටවත් මහනුවරින් ලොකු ගොඩනැගිලි ගන්නටවත් ඉඩ තියන්නට එපා. ඔවුන්ට විශාල තේ වතු අක්කර ගණන් ගනන්ට, කුඹුරු යායවල් ගන්නට, පොල් වතු ගන්නට නීතියෙන් ඉඩ දෙන්න එපා. විදේශ විනිමය ලබාගෙන කර්මාන්ත අංශයෙන් හම්බ කරන උදවියට කියන්න, "මිරිස් හොණ්ඩර 10 බැගින්, පරිප්පු හොණ්ඩර 20 බැගින්, අල හොණ්ඩර 100 බැගින් නිෂ්පාදනය කර දුන්නොත් විතරයි තමුසෙලාට විදේශ විනිමය දෙන්නේ" කියා. මටත් සුළු ප්‍රමාණයක විදේශ විනිමයක් වෙන් වෙනවා. මා එය යොදවා සාර්ථක ප්‍රතිඵල පෙන්නා තිබෙන නිසයි, ආඩම්බරයෙන් කථා කරන්නේ. [බාධා කිරීම්] මීට වඩා කථා කරන්නට මා අදහස් කරන්නේ නැහැ. මගේ ඉල්ලීම ගරු ඇමතිතුමා විසින් පිළිගන්නවා ඇතැයි විශ්වාස කරමින්, මෙතෙක් වේලා කථා කරන්නට ඉඩ දුන්නාට නියෝජ්‍ය සභාපතිතුමාට ස්තුති කරමින්, මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 7.30

**එස්. බී. හේරත් මයා. (හිරියාල)**

*(திரு. எஸ். பி. ஹேரத்—ஹிரியால)*

**(Mr. S. B. Herat—Hiriyala)**

නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කරන්නට ඉඩ දීම ගැන ප්‍රථමයෙන්ම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. අකුරණ පළමු වැනි ගරු මන්ත්‍රීතුමාගේ (හේමචන්ද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. බී. හේරත් මයා.]

සිරිසේන මයා.) කථාවට පසුව මට කථා කරන්නට ඉඩ ලැබීම ගැන මං වඩාත් සන්තෝෂ වෙනවා. මක්නිසාද, කීවොත් සිනමා නළුවකුගේ රූකඩ නැටුමක් දැක අප විනෝද වී තිබෙන අවස්ථාවක මටත් වචන ස්වල්පයක් ප්‍රීතියෙන් ප්‍රකාශ කරන්නට පුළුවන් නිසයි.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.** (දොම්පෙ)
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க—தொம்பே)*
(Mr. F. R. Dias Bandaranaike—Dompe)

දැන් හරි බැණා.

**එස්. බී. හේරත් මයා.**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herat)

එසේම ඊට ප්‍රථමයෙන් කථා කළ කටුගම්පොළ ගරු මන්ත්‍රීතුමා (සුබසිංහ මයා.) නවත් කණ්ඩායමක් සමග ඊයේ-පෙරේදා හිරියාල ඡන්දදායක කොට්ඨාශයට ගිහින්, තුන් හතර පොළක වාගේ රැස් වී, බඩු වගයක් හොයා තිබෙනවාලු. "අරවා නැහැ; මේවා නැහැ" කියමින් බඩු හෙව්වාලු. ඒ පළාතට ගිහින් මොනවා හෙව්වාදැයි මා දන්නේ නැහැ. අල, ළූනු ආදිය නම් ඒ පැත්තේ ඕනෑ තරම් තිබෙනවා. එහෙත් මා හිතන්නේ, ඒ ගරු මන්ත්‍රීතුමා සමග ගිය කණ්ඩායම කොළඹ අවට—මොරටුව, මීගමුව නැත්නම් ලුනාව පැත්තේ—බඩු හොයාගන්නට නැතිව—[බාධා කිරීම්]

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*
(Mr. Hemachandra Sirisena)

නියෝජ්‍ය සභාපතිතුමනි, එහෙම නම් මා කථා කළේ හුළඟටද? ඒවායේ අල්ලා ගන්නට දෙයක් නැද්ද? මගේ කථාව හිරියාලේ ගරු මන්ත්‍රීතුමාට (එස්. බී. හේරත් මයා.) නොතේරුණාට, මගේ කථාවේ වැදගත්කම ආහාර ඇමතිතුමාටත්, රාජ්‍ය ඇමතිතුමාටත්, වැඩබලන කර්මාන්ත ඇමතිතුමාටත් තේරුම් ගිහින් ඇති. තමුන්නාන්සේ වගේ ඔය—

**එස්. බී. හේරත් මයා.**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herat)

තමුන්නාන්සේගේ කථාව ගැන නොවෙයි, මා කියන්නේ. [බාධා කිරීම්]

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*
(Mr. Hemachandra Sirisena)

තමුන්නාන්සේගේ ඔය නිහීන නින්දිත, දුර්වල ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්නට ඕනෑ. තමුන්නාන්සේ දන්නා කෙහෙල්මල් දේශපාලනයක් නැහැ; කෙහෙල්මල් කෘෂිකර්මයක් නැහැ. තමුන්නාන්සේට පුළුවන්ද, මාත් එක්ක ඇවිත් කුඹුරු හාන්න ?

**එස්. බී. හේරත් මයා.**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herat)

තමුන්නාන්සේ මොකද, ඔය තරම් කලබල ?

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*
(Mr. Hemachandra Sirisena)

සිනමා නළුවකු වගේ කියල මොකක්ද කීවේ ?

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

Order, please !

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*
(Mr. Hemachandra Sirisena)

තමුන්නාන්සේ මන්ත්‍රීවරයකුගේ කථාවක තිබෙන වැදගත්කම තේරුම්ගන්නට බැරි, නිහීන, නින්දිත මන්ත්‍රීවරයෙක්.

**එස්. බී. හේරත් මයා.**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herat)

තමුන්නාන්සේ කලබල වෙලා තිබෙන්නේ ඇයි ? ලුනාව ගැන කීවාමද කලබල වුණේ ? [බාධා කිරීම්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)
Order, please! I would request the hon. Member to continue his speech.

**එස්. බී. හේරත් මයා.**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herat)
නියෝජ්‍ය සභාපතිතුමනි, මෙවැනි ගරු මන්ත්‍රීවරුන් අදහස් අනෙක් පිට පෙරළා කීම ගැන මට පුදුමයි. ඒ අයගේ අඩුපාඩු කම් ගැන කල්පනා කර වෙන්නට ඇති, ඔවුන් මේ තරම් කලබල වී තිබෙන්නේ. විරුද්ධ පාර්ශ්වයේ නායිකාවගෙන් මා ඉතා ආදරයෙන් ඉල්ලා සිටිනවා, ඔය වගේ මන්ත්‍රීවරුන්, ඉතා උනන්දුවෙන් කටයුතු කරන ගොවි පිරිසක් ඉන්නා හිරියාල වැනි ලස්සණ ප්‍රදේශයකට බඩු හොයන්නට එවන්න එපාය කියා. [බාධා කිරීම්]

මට ප්‍රථම කථා කළ අකුරණ පළමු වැනි ගරු මන්ත්‍රීතුමා (හේමචන්ද්‍ර සිරිසේන මයා.) දැන් ටිකක් කලබල වුණා. මගේ කථාවේදී එතුමාගේ හිත රිදෙන වචනයක් කියැවුණා නම් මා ඒ ගැන කණගාටු වෙනවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු වචන ස්වල්පයක් කථා කරන සෑම අවස්ථාවකදීම පාහේ විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් කලබල වන බව, අප විවේචනයට ලක් කරන බව මා දන්නවා. [බාධා කිරීම්]

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
එහෙම පුරුද්දක් නැහැ. [බාධා කිරීම්]

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*
(Mr. Hemachandra Sirisena)
රුකඩයක් වගේ—[බාධා කිරීම්]

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)
Order, please!

**එස්. බී. හේරත් මයා.**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herat)
තමුන්නාන්සේට මා සමග කථා කරන්නට ඕනෑ නම්, පිට්ටනියකට පැනලා හරි වෙන වෙලාවක කථා කරමු.

මෙම අවස්ථාවේදී මා කතා කරන්නට නැගී සිටියේ කෘෂිකර්ම ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේයි. මේ රටේ කෘෂිකර්ම ඇමතිවරයකු වශයෙන් පවා කටයුතු කර තිබෙන ගරු අගමැතිතුමාගේත්, අද කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් කටයුතු කරන තමුන්නාන්සේගේත්, වැඩ කටයුතු පිළිබඳව ප්‍රශංසා මුඛයෙන් කථා කිරීමටයි, මා නැගී සිටියේ. අවුරුදු ගණනාවක පටන්ම විනාශ වෙමින් පැවති කෘෂිකර්ම කටයුතු නගා සිටුවීම සඳහා නැගී සිට ඉතා උනන්දුවෙන් ක්‍රියා කරගෙන යන තමුන්නාන්සේලාට—

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*
(Mr. Hemachandra Sirisena)
අර කතාව ඉල්ලා අස් කර ගන්නේ නැති නම් මම තවත් වචනයක් කියනවා. මට රුකඩ නටන්නට පුළුවන් වන්නේ තමුන්නාන්සේගේ ගෙදර විතරයි. වෙන කොහේවත් බැහැ, මට රුකඩ නටන්නට. [බාධා කිරීම්]

**එස්. බී. හේරත් මයා.**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herat)
මේ රටේ කෘෂිකර්ම ව්‍යාපාරය දියුණු කිරීම සඳහා සහයෝගය දෙන අපේ නිල ධාරි මහත්වරුන්ටත් මෙම අවස්ථාවේදී ඉතා ගෞරවයෙන් ස්තුතිවන්ත වෙනවා. හිටපු රජයේ නිලධාරියකු වශයෙන් මා දන්නවා, පසුගිය ආණ්ඩුවලින් කෘෂිකර්ම දියුණුව සඳහා කුමන අන්දමටද කටයුතු කළේ කියා. විරුද්ධ පාර්ශ්වයේ උදවිය ප්‍රකාශ කළා, අපේ කෘෂිකර්ම හා ආහාර ව්‍යාපාරවලට එතුමන්ලාගේ සහාය දෙන බව. අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමා (රත්නායක මයා.) සහ තවත් මන්ත්‍රී වරුන් විසින් ඒ බව කියන්නට යෙදුණා. මා ඒ උදවියට ස්තුතිවන්ත වෙනවා. පාලිර්මේන්තුව තුළදී පමණක් නොව තම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. බී. හේරත් මයා.]

ප්‍රදේශවලදීද මෙම කටයුතුවලට උදව් දෙන්නැයි මා එතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

කෘෂිකර්මයේ දියුණුව පිණිස අපට විශෙෂයෙන් වුවමනා කරන්නේ, ජලය බව සැම මන්ත්‍රීවරයකුම වාගේ ප්‍රකාශ කළා. කුඹුරු වැඩ කරන අවස්ථාවලදී නිසි පරිදි ජලය සපයා ගතහොත් අපට කුඹුරු වල වල් නෙළන්නට වුවමනා වන්නේ නැහැ. නිසියාකාර ජලය තිබෙනවා නම් වල් නගින්නේ නැති වන පරිදි වතුර හරවා ගොවිතැන් ආරක්ෂා කර ගත හැකියි. එසේ වූ විට වෙන වෙනත් අන වශ්‍ය ඇල වේලි ආදිය බඳින්නට වුවමනා වන්නේත් නැහැ. අපේ පළාත්වල පමණක් නොව ලංකාවේ සැම පළාත්වලම තත්ත්වය මෙසේයි. මෙම සුළු වාරිමාර්ග ක්‍රම දියුණු කරන හැටියට නිලධාරි මණ්ඩලවලට නියම කරන ලෙස මා මතක් කරනවා. දැනට වඩා විසි තිස් ගුණයකින් මෙම වැඩ කටයුතු ඉක්මන් කළ යුතුව තිබෙන බව පෙනී යනවා.

අද රටේ ට්‍රැක්ටර් වර්ග දෙකක් තිබෙනවා. ඒවාට අවශ්‍ය අමතර කොටස් අඩු වේගන යන බව පෙනෙනවා. එසේ වූ විට ඒවා අළුත්වැඩියා කර ගැනීම සඳහා විශාල මුදලක් වැය කරන්නට සිදු වෙනවා. මේවා ගැන සොයා බලා අඩුපාඩු සකස් කර දෙන මෙන් මා ඉල්ලා සිටිනවා. මේවායේ අමතර කොටස් හැකි තරම් අඩු මිලට ලබා දීම සඳහා කටයුතු යොදන මෙන් මා කියා සිටිනවා. අපේ දුප්පත් ගොවි මහත්වරුන්ගෙන් අක්කරයකින් එක කන්නයකට රුපියල් හයක් එකතු කරනවා. එසේ කරන්නේ ගොවි මණ්ඩල මගිනුයි. පැරණි කලයේදී වැව්වල කට්ටි කැපීමාදිය කළේ එම ගොවි මහතුන් විසින්මයි. එහෙත් දැන් එසේ කෙරෙන්නේ නැති නිසා ගොවි මණ්ඩල මගින් වත් එවැනි කටයුතු කරන්නටය කියා අණ කරන්නට ඕනැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නොයෙක් නොයෙක් වී වර්ග දැන් ලංකාවට ගෙනැවිත් තිබෙනව. ඒවායින් නොයෙක් රෝග බෝවෙන්ට ඉඩ තිබෙනව. පිටරටින් ගෙනෙන වී වර්ගවලට ඒ රෝග බෝ වුණේ නැතත්, ලංකාවේ වී වර්ගවලට බෝ වෙන්ට පුළුවන්. එම නිසා වී වර්ග ඉතා ප්‍රවේසමෙන් පාවිච්චි කරන ලෙස මා මතක් කරන්ට කැමතියි.

බිත්තර වී සපයන බතලගොඩ ව්‍යාපාරය තිබෙන්නේ මගේ හිරියාල ආසනයේයි. එහි සේවය කළ නිලධාරියකු තමයි, මේ "එච්-4" නමැති බිත්තර වී වර්ගය හදා ගත්තෙ. ඒ නිලධාරියා ගැන හුග දෙනෙක් නොදන්නවා ඇති. ඒ නිලධාරියා වැඩිදුර පුහුණුවීම සඳහා පිටරට යවා තිබෙන බව මට ආරංචියි. ඒ ගැන මා සන්තෝෂ වෙනව.

බතලගොඩ ඇළ යටතේ දැන් කුඹුරු අක්කර 10,000 කට වැඩි ප්‍රමාණයක් අස්වද්දාගෙන යනව. අවශ්‍ය පෝර ටිකත් වතුරත් සපයා දුන්නොත් අවුරුද්දේ සැම කන්නයකම වැඩ කර අපට නිෂ්පාදනය වැඩි කර ගන්න පුළුවන් බව ගරු ඇමතිතුමාට මතක් කරන්ට කැමතියි. අද තිබෙන තත්ත්වයේ හැටියට යල් කන්නයේදී අඩු ගණනේ අක්කර 5,000 ක තරමත්, මාස් කන්නයේදී අක්කර 1,000 ක තරමත්, කුඹුරුවල ගොයම වතුර නැතිකමින් මැරී යනව. එම නිසා වතුර සපයා දීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් දැනට ලොකු ව්‍යාපාරයක් ගෙන යනව. වතුර බෙදා දීමේ අංශය භාරව තිබෙන්නේ ආහාර ඇමති අංශයටයි. ඒ වතුර බෙදා දීම ඉතා ඉක්මනින් ප්‍රවේසමෙන් කරන ලෙස අණ කරන්න කියා ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව.

අපේ හිරියාල ආසනයේ කෘෂිකර්ම ප්‍රදේශවලට ළඟා වෙන්ට තිබෙන පාරවල් ඉතා දුෂ්කරයි. ඒවා හැකි තරම් ආධාර දී ඉක්මනින් දියුණු කර ගත යුතුයි. නිකවගම්පහ කෝරලේ, දිල් ගම් දහය කෝරලේ, ඉහළ ඕතොට කෝරලේ, යන ප්‍රදේශ හිරියාල ආසනයේ ඉතා දුෂ්කර කෝරල තුනක්. මේවාට වතුර සපයා දුන්නොත් ඒ ප්‍රදේශයේ ගොවි ජනතාව මේ ගොවි සටනේදී, මේ යුද්ධයේදී, අපේ ශ්‍රී ලංකාවට ජයග්‍රහණය ලබා දෙනවාමයි. අවසාන වශයෙන් ගරු ඇමතිතුමාටත් එතුමාගේ අමාත්‍යාංශයටත් ස්තුති කරමින්, මට මේ අවස්ථාවේදී මේ වචන ස්වල්පය කථා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්ට අවස්ථාව ලබා දුන් නියෝජ්‍ය සභාපතිතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව නවත්වනව.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට ප්‍රථම යෙන් කථා කළ හිරියාල මන්ත්‍රීතුමා (එස්. බී. හේරත් මයා.) එතුමාගේ කථාවේදී සඳහන් කළා, අකුරණ ගරු පළමුවෙනි මන්ත්‍රීතුමා (හේමචන්ද්‍ර සිරිසේන මයා.) රූකඩයක් හැටියට. අධිරාජ්‍යවාදි ප්‍රති පත්ති ඔස්සේ ගමන් කරන හිරියාල මන්ත්‍රීතුමා වැනි අයට, අකුරණ ගරු පළමු වෙනි මන්ත්‍රීතුමා වැනි සිංහල කථා කරන, රෙද්ද බැනියම අඳින, සිංහල සිරිතට විරි තට අනුව හැඩ ගැසුණු, ඒ පරිසරයේ ජීවත් වන කෙනෙකු රූකඩයක් හැටියට පෙනීම ගැන මා පුදුම වෙන්නෙ නැහැ. 1956 බණ්ඩාරනායක ආණ්ඩුව මේ රටේ බලයට පත් වුණාට පසුවත් ඔය විධියට කථා කළ පුද්ගලයෙකු හිටිය: සර් ජෝන් කොතලාවල මහත්මයා. කොතලාවල මහත් මයා ගස් බඩගාන උදවිය ඉන්න පාර්ලිමේන් තුවේ ඉන්න ලැජ්ජයි කියා අස්වෙලා ගියා. [බාධාකිරීමක්] ඒත් හිරියාලෙ මන්ත්‍රී පද විය දැරූ කෙනෙක්. ඒ පරම්පරාවේ ජීවත් වන හිරියාල මන්ත්‍රීතුමා වැනි උදවිය අකුරණ ආසනයේ ජනතාව තමන්ගේ කොට්ඨාශයේ පළමුවෙනි මන්ත්‍රීවරයා හැටියට තෝරා පත් කළ මන්ත්‍රීතුමා—තමුන්නාන්සේලාට ලැබුණේ දෙවැනි තැනයි—රූකඩයක් හැටියට හැඳින්වීම ගැන මගේ බලවත් කනගාටුව පළමුවෙන් ප්‍රකාශ කරමින් මගේ කථාව ආරම්භ කරනව.

ඇත්ත වශයෙන්ම විරුද්ධ පාර්ශ්වයේ අපි හිටියත්, විරුද්ධ පක්ෂයත් මේ රටේ වගකීමක් ඇති පිරිසක් නිසා, ගරු ආහාර ඇමතිතුමාගේ වගා වැඩ පිළිවෙල කඩා කප්පල් කරන්ට අප තුළ අදහසක් නැති බව මතක් කරන්ට කැමතියි. ඒ වගේම අපි දන්නව ඊළඟට ආණ්ඩුව පිහිටුවන්ට ලැබෙන්නෙ කාටද කියන එකත්.

**හෙට්ටිගේ මයා.**
*(திரு. ஹெற்றிகே)*
(Mr. Hettige)

හීනයක්.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

තමුන්නාන්සෙට හීන. තමුන්නාන්සේ කොහෙන්දෝ හුළඟට ගහගෙන ඇවිත් වැරදි තැනකයි ජීවත් වෙන්නෙ. ආණ්ඩුවේ වගා ව්‍යාපාරය දියුණු වුණොත් විරුද්ධ පක්ෂයට තැනක් නැත කියා බණ්ඩාරගම අතුරු මැතිවරණ රැස්වීම්වලදී තමුන්නාන් සේලා කියා ගෙන යනවා. රට ආහාරයෙන් ස්වයංපෝෂිත වෙනවා නම් ඇත්ත වශ යෙන්ම අපට තැනක් නැති වුණත් කමක් නැහැ. අපට අමුතු බලයක් නැති වුණත් කමක් නැහැ. රට ස්වයංපෝෂිත කරනවා නම් අපේ සම්පූර්ණ සහයෝගය දෙන්නට ලෑස්තියි. අප කවදාවත් එවැනි ව්‍යාපාරය කට විරුද්ධකමක් දක්වා නැහැ. තමුන් ගුවන් විදුලියෙන් වගා කරන්නට පුළු වන්ය කියා තමුන්නාන්සේලා සිතාගෙන ඉන්නවා. ඒ වාගේම ගොවි හමුදාව සම් බන්ධව හොරොව්පොතානේදී යම් සිද්ධි යක් ඇති වී තිබෙන බවත් අප දන්නවා. මෙවැනි තත්ත්වයකින් රට ආහාරයෙන් ස්වයංපෝෂිත කළ හැකිය කියා තමුන් නාන්සේලා කල්පනා කරනවා නම්, ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේලා සිටින්නේ වැරදි තැනකයි. ඒ ගැන අප කණගාටු වෙනවා.

මේ ව්‍යාපාරය සාර්ථක කර ගැනීම සඳහා ආහාර ඇමතිතුමා විශාල උත්සාහයක් දරණ බව මා පෞද්ගලික වශයෙනුත් දන් නවා. මා විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයකු වුණත්, ආහාර වගා කරන්නට තමුන් නාන්සේලා අවංකවම වැඩ කරනවා නම්, අපේ කොට්ඨාශවල තිබෙන තත්ත්වයන් අනුව අපේ කොට්ඨාශවල කෘෂිකර්මය දියුණු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් දීමට අප නිතරම සූදානමින් සිටින බව මා මතක් කරනවා. එම නිසා ආහාර වගා කිරීම පිළිබඳව විරුද්ධ පක්ෂය නිතරම ආධාර දෙන්නට මිස විරුද්ධකම් පාන් නට සූදානමින් නො සිටින බව මා මතක් කරනවා. මේ රටේ මහජනතාවට බල පාන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

ප්‍රධානම ප්‍රශ්නය ආහාර ප්‍රශ්නයයි. අප එය පිළිගන්නවා. කොයි ආණ්ඩුවකින් නමුත් ඒ ප්‍රශ්නය විසඳන්නට කටයුතු කරන්නට ඕනෑ. එම නිසා විරුද්ධ පක්ෂයේ සිටියත්, මහජනතාවට හිතවත් අන්දමට තමුන්නාන්සේලා වැඩ කරනවා නම් අප තමුන්නාන්සේලාට සහයෝගය දෙන්නට ඕනෑ. අපේ කොට්ඨාශවල තිබෙන තත්ත්වයන් අනුව, විශේෂයෙන්ම වී ගොවිතැන පිළිබඳව, තමුන්නාන්සේලාට අවශ්‍ය උපදෙස් දෙන්නට අප ලෑස්තියි.

ගල්ඔය, වලවේ, වැනි විශාල වාරිමාර්ග යෝජනා ක්‍රම ඉඩම් ඇමතිතුමා කරගෙන ගියාවේ. නමුත් කෘෂිකර්ම ඇමතිතුමාට ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව මගින් සුළු වාරිමාර්ග වැඩ කරගෙන යන්නට පුළුවනි. අපේ කොට්ඨාශවල තිබෙන අමුණු ටික බැඳ දෙන්නට තමුන්නාන්සේට පුළුවන්. යල, මහ, කියා කන්න දෙකක් තිබෙනවා. වර්ෂාපතනය ලැබෙන නිසා මහ කන්නයේදී කුඹුරු සියයට සියයක්ම ගොවිතැන් කරනවා. නමුත් ජලය හිඟකම නිසා යල කන්නයේදී කුඹුරුවලින් සියයට 90 ක් ම වැඩ කරන්නට ලැබෙන්නේ නැහැ. එම නිසා ගොවි ජන සේවා කොමසාරිස් දෙපාර්තමේන්තුව මාර්ගයෙන් සුළු වාරිමාර්ග දියුණු කරන්නට කටයුතු කළහොත්, මහ කන්නයේදී වාගේම යල කන්නයේදීත් සාර්ථක ලෙස කුඹුරු ගොවිතැන කරන්නට පුළුවන් වෙනවා. මහ කන්නයේදී වාගේම යල කන්නයේදීත් කුඹුරු අස්වද්දන්නට පුළුවන් වුණොත් දැනට වඩා විශාල අස්වැන්නක් ලැබෙනවා.

අමුණක්, ඇලක්, බඳින්නට යන්නේ රුපියල් තුන් හාර දහසක පමණ සුළු මුදලක්. ගොවි ජන සේවා කොමසාරිස් දෙපාතීමේන්තුව මාගීයෙන් ඒවා කරන්නට පුළුවනි. එසේ කටයුතු කරනවා නම් අපේ කොට්ඨාශවල වැඩි දියුණු කළ යුතුව තිබෙන අමුණු මොනවාද කියා සොයා බලා අවශ්‍ය උපදෙස් දෙන්නට අප නිතරම ලෑස්තියි. සුළු අමුණු බැඳ අවශ්‍ය ජලය සැපයීමට කටයුතු සංවිධානය කළහොත් ඇත්ත වශයෙන්ම වැඩි වැඩියෙන් වී වගාව කරන්නට පුළුවන් වෙනවා.

නිලධාරීන් ගරු ඇමතිතුමාට නොයෙක් විධියේ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන බව අප දන්නවා. නිලධාරීන් නිතරම උත්සාහ කරන්නේ ඇමතිතුමා සතුටු කරවීමටයි. එම නිසා තිබෙන ප්‍රමාණයටත් වැඩියෙන් ඉලක්කම් ඇතුළු කර සංඛ්‍යා ලේඛන පිළියෙළ කරන සිරිතක් තිබෙනවා. ගරු ඇමතිතුමා මේ සංඛ්‍යා ලේඛනවලින් සෑහීමකට පත් වෙනවා නම්, ඇමතිතුමා සිටින්නේ වැරදි තැනකයි. එම නිසා සංඛ්‍යා ලේඛනවලින් පමණක් සෑහීමකට පත් නොවී වී වගාව තවත් දියුණු කළ හැකි වන සේ මේ සුළු වාරිමාර්ග දියුණු කරන්නට කටයුතු කළ යුතුයි.

අ. භා. 7.45

තවත් කාරණයක් තිබෙනවා. කෘෂිකර්ම කටයුතු සඳහා මේ රටට ජීප් රථ වැනි රථවාහන විශාල සංඛ්‍යාවක් ගෙන්වූවා. අද බොහෝ දෙනාට අළුත් වාහනයක් ගන්නට බැරි තත්ත්වයක් තිබෙන බව අප දන්නවා. නමුත් දැන් කෘෂිකර්මයේ මුවාවෙන් වගාවේ මුවාවෙන්, ජීප් රථ ඇතුළු රථවාහන විශාල සංඛ්‍යාවක් මේ රටට ගෙන්වා තිබෙනවා. ඇමතිතුමා අවංක අදහසින් මේ රථවාහන ගෙන්වන්නට අවසර දෙන්නට ඇති. නමුත් මේ ගෙන්වා තිබෙන රථවාහන ඇත්ත වශයෙන්ම කෘෂිකාර්මික කටයුතුවලට පාවිච්චි කරනවාද කියා කරුණා කර සොයා බලන්න. මේ රටේ ධනපති පන්තියට අළුත් රථවාහන ගෙන්වා ගන්නට වුවමනාව තිබුණා. දැන් කෘෂිකර්මයේ මුවාවෙන් ඒ අය රථවාහන ගෙන්වා ගන්නට උත්සාහ කරනවා. සමහරුන් ඒ විධියට රථවාහන ගෙන්වා ගෙනත් තිබෙනවා. ඒ ජීප් රථ ආදිය ගෙන්වන තරමට වගාව නම් සංවර්ධනය වී නැහැ. ගරු ඇමතිතුමා හොඳින් කරුණු පරීක්ෂා කර බැලුවහොත් නියම තත්ත්වය අවබෝධ කර ගන්නට පුළුවන් වේවි. අලුත් ජීප් රථ සහ වාහන නොතිබුණු අයට නම් වාසියක් සැලසී තිබෙනවා. ඔවුන්ට අලුත් වාහන ආදිය ලබා ගන්නට පුළුවන් වී තිබෙනවා. ඇත්තෙන්ම කෘෂිකාර්මික සංවර්ධනය කෙසේ වෙතත් ජීප්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රථ ආදියෙන් නම් සංවර්ධනයක් සිදු වී තිබෙන බව කියන්නට පුළුවනි. සාමාන්‍ය ගොවියන්ට නම් ජීප් රථ වුවමනා නැහැ. ඒවා ගන්නට ඔවුන්ට වත්කමක් ඇත්තේත් නැහැ. සාමාන්‍ය ගොවියාට ඇති අනෙකුත් අඩුපාඩුකම් සකස් කර දුන් නොත් ජීප් රථ නැතිවාට ගොවිතැන දියුණු කිරීමට ඔවුන්ට පුළුවන් වන බව කියන අතරම එසේ කළහොත් මෙම ආණ්ඩුවේ බලාපොරොත්තුවද ඉෂ්ට වන බව පෙන්වා දෙන්නට කැමතියි.

බණ්ඩාරනායක අගමැතිතුමාගේ කාල යේදී සිටි කෘෂිකර්ම ඇමතිතුමා වූ පිලිප් ගුණවර්ධන මහතා විසින් කුඹුරු පනත ඉදිරිපත් කෙළේ හොඳ අදහසක් ඇතිවයි. කුඹුරු හිමියන්ගෙන් අඳ ගොවියන් ආරක්ෂා කර ගැනීම ඒ පනතේ පරමාර්ථ යයි. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට වැඩ වැඩි නිසා අඳ ගොවියන්ගේ අයිතිවාසිකම් ලබා ගැනීම ප්‍රමාද වී තිබෙනවා. මෙම ආණ්ඩුව හාල් සලාකයෙන් භාගයක් කපා හැරීමෙන් පසුව කුඹුරු හිමියන් අඳ ගොවියන් ඉවත් කොට වෙනත් අය යොදවා කඩිනමින් ඒ කුඹුරු වැඩ කර ගෙන යනවා. අඳ ගොවියන් අස් කිරීම සම්බන්ධයෙන් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට පැමිණිලි කළ විට ඒ කාරණා ගැන පරීක්ෂා කර බලා තීන්දුවක් දෙන්නට අවුරුදු තුනක පමණ කාලයක් ගන්නවා. සමහර තීන්දු ලැබෙන්නේ අවුරුදු හතක් අටක් ගියාට පසුවයි. මෙය ඉතාමත්ම අසතුටුදායක තත්ත්වයක්. අඳ ගොවි ප්‍රශ්න ආදිය සම්බන්ධයෙන් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට පැමිණිලි විශාල ගණනක් ලැබෙතත් ඒවා ගැන විභාග කරන්නට සිටින නිලධාරි පිරිස ටික දෙනයි. ගොවිතැනින් ජීවත් වූ මිනිසකුට තමන්ගේ අඳ ගොවි අයිතිය පිළිබඳව තීරණයක් ලැබෙන තුරු අවුරුදු තුනක් හතරක් බලාගෙන ඉන්නට පුළුවන්ද? ඒ නිසා අඳ ගොවියන් ආරක්ෂා කිරීම සඳහා මීට වඩා ඉක්මනින් ක්‍රියා කරන්න.

කුඹුරු පනත අනුව කුඹුරුවල ගෙවල් සෑදීම තහනම් වුවත් බදුල්ල වැනි ප්‍රදේශවල නගරාසන්නයේ ඇති කුඹුරු වල ගෙවල් සාදාගෙන යනවා. මේ සම්බන්ධයෙන් පැමිණිලි කළත් වැඩක් නැහැ. පැමිණිල්ලේ තීන්දුව ලැබෙන විට ගෙවල් සාදා ඉවරයි. මේ සම්බන්ධයෙන්ද කල්පනා කර බලන ලෙස මතක් කරනවා.

ඊළඟට අක්කර බදු සහ රක්ෂණ බදු පිළිබඳව සඳහන් කරන්නට කැමතියි. කුඹුරු පනත අනුව එක් කන්නයක් තුළදී කුඹුරු අක්කරයක් සඳහා රුපියල් හයක අක්කර බද්දක් ගෙවන්නට ඕනෑ. ඒ අතර රක්ෂණ බද්ද වශයෙනුත් රුපියල් හයක් ගෙවන්නට ඕනෑ. මේ තත්ත්වය ගොවියන්ට විශාල කරදරයක්. මේ සම්බන්ධයෙන් ගරු අමතිතුමාට කොතෙකුත් පෙත්සම් ලැබී ඇති. එක් කන්නයකදී කුඹුරු අක්කරයක් වෙනුවෙන් අක්කර බද්ද වශයෙන් රුපියල් හයක් සහ රක්ෂණ බද්ද වශයෙන් රුපියල් හයක් ඈයි රුපියල් දොළහක් ගෙවන විට කන්න දෙක සඳහාම රුපියල් විසිහතරක් ගෙවන්නට සිදු වෙනවා. අපේ ප්‍රදේශවල නම් ගංවතුර ආදියෙන් කුඹුරුවලට හානියක් සිදු වන්නේ නැහැ. කෙසේ හෝ හානියක් සිදු වුණත් වන්දියක් ලබා ගැනීම සඳහා අවුරුදු ගණනක් ගත වෙනවා. ඒ නිසා ඒ රක්ෂණ ක්‍රමයෙන් ප්‍රයෝජනයක් නැහැ. එසේ හෙයින් හැකි නම් රක්ෂණ බද්ද සම්පූර්ණයෙන්ම නැති කර දමන ලෙස ඉල්ලා සිටිනවා. එය සම්පූර්ණයෙන්ම නැති කරන්නට බැරි නම් අඩකින් හෝ අඩු කරන ලෙස ඉල්ලා සිටිනවා. ගොවියාට ඇති කරදර ටිකක් හෝ අඩු කරන්නට ක්‍රියා කරන්න. ඒ කාලයේ තිබුණු තත්ත්වය අනුව සලකා එදා සිටි කෘෂිකර්ම ඇමතිතුමා අක්කර බද්ද සහ රක්ෂණ බද්ද මේ තරම් විය යුතු බව තීරණය කරන්නට ඇති. එදා එතුමා ක්‍රියා කරන්නට ඇත්තේ හොඳ චේතනාවෙන් වුවත් දැන් තත්ත්වය අනුව නම් මෙය කරදර සහිතයි. එසේ හෙයින් ඒ පිළිබඳව පියවරක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

ඊළඟට ආහාර නිෂ්පාදන ඕවර්සියර් වරුන් ගැන මතක් කරන්න ඕනෑ. ආහාර නිෂ්පාදන ඕවර්සියර්වරුන්ගෙන් නියම සේවයක් වෙනවාද කියා මා අහනවා. මගේ කොට්ඨාශයෙත් ඕවර්සියර් කෙනෙක් සිටිනවා. එ මනුෂ්‍යයා කවුද කියාවත් ගොවීන් දන්නේ නැහැ. ඔහු දෙන උපදේශයකුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

නැහැ. මේ තැනැත්තාට දෙන පඩිය අපරාධයක්. ඒ නිසා ආහාර නිෂ්පාදන ඕවර්සියර්වරුන් වශයෙන් පත් කර සිටින අය හරියාකාර වැඩ කරනවාද, ඔවුන්ගෙන් නියම සේවයක් සිදුවෙනවාද, එහෙම නැත්නම් ඒ අයට නිකම්ම පිං පඩියක් ගෙවනවාද, යනාදී කරුණු ගැන සොයා බලා ඔවුන්ගෙන් ගොවි ජනතාවට නියම සේවයක් සැලසෙන අන්දමට වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. මගේ කොට්ඨාශයේ ගොවීන් කීප දෙනෙක් යම්කිසි කරුණක් සම්බන්ධව මා හමුවන්නට ආවා. ඒ අවස්ථාවේ මා ඔවුන්ගෙන් ඇසුවා ආහාර නිෂ්පාදන ඕවර්සියර්ට කිව්වේ නැද්ද කිය. ඒ කවුරුවත්ම ඕවර්සියර් අඳුණන්නේවත් නැහැ. ඒ නිසා ඒ කරුණ ගැන ගරු ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඊළඟට ගොවිතැන සඳහා ණය දෙන සමුපකාර සමිති ගැන සඳහන් කළ යුතුව තිබෙනවා. විවිධ සේවා සමුපකාරවලින් ණය ගන්නා විට නොයෙකුත් කරදරවලට මුහුණ පාන්නට ගොවීන්ට සිදු වෙනවා. ගම්වල නොයෙක් විධියේ බේද තිබෙනවා. දේශපාලන බේද, පක්ෂ බේද, පෞද්ගලික භේද ඔය ආදී වශයෙන් නොයෙකුත් බේද තිබෙනවා. සමුපකාර සමිතියෙන් ණය ගන්නට යන විට අර බේද නිසා සමහර අයට නියම වේලාවට ණය ගන්නට ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඒ කරදර මගහැරවීම පිණිස යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

සමුපකාර සමිති ගැන කථා කරන විට තවත් කරුණක් විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ. බදුල්ලේ විවිධ සේවා සමුපකාර සංගමයේ සභාපති මහතාගේ යකඩ හොරකම ගැන මේ ගරු සභාවේ රැව් පිළිරැව් දුන්නා. අද බලපිටියේ ගරු මන්ත්‍රීතුමාත් (එල්. සී. ද සිල්වා මයා.) ඒ ගැන සඳහන් කළා. ඒ ආසනයේ මන්ත්‍රීවරයා වශයෙන් ඒ ප්‍රශ්නය මතුකළ යුතුව තිබුණේ මා විසින් වුවත් මා එය මතු කළේ නැහැ. මා එය මතු නොකළේ ගරු ඇමතිතුමාට සැලකිල්ලක් වශයෙනුත්, මේ ගරු සභාව ගඳගැස්සීමට තිබෙන අකමැත්ත නිසාත් බව කියන්න ඕනෑ. එහෙත් ගරු ඇමතිතුමාට එක කරුණක් මතක් කළ යුතුයි. අප පුද්ගලයකු ආරක්ෂා කරන්න ඕනෑ නැහැ. සමුපකාරය දියුණු කිරීමටයි ගරු ඇමතිතුමාටත් ඕනෑ කරන්නේ. මේ සමුපකාර සංගමයේ සභාපතිවරයා ජිනදාස හෙන්නායක මහත්මයායි. මා සමග තරඟ කර පැරදුණු එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයා. මේ යකඩ හොරකම සම්පූර්ණයෙන්ම සත්‍ය සිද්ධියක් බව ගරු ඇමතිතුමාත් දන්නවා. සිද්ධිය මේකයි: බදුල්ලේ ජනතාවට වුවමනා කරන යකඩ ලබා ගැනීමට උප කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගෙන සමුපකාර තොග වෙළඳ ආයතනයට පැමිණ රුපියල් 12,000 ක යකඩ තොගයක් ලබාගෙන ඒ අවසථාවේදීම හොර කඩයට ගෙන ගොස් විකුණුවා. ඒ අවසථාවේදී කොටහේනේ පොලිසියේ අපරාධ පරීක්ෂණ අංශය මගින් එය ඇල්ලුවා. දැන් ඔහු මේ හොරකමෙන් බේරෙන්න ලැහැස්ති වෙනවා. සොරනාතොට මන්ත්‍රීතුමාත් ඔය සමුපකාර සංගමයේ කාරක සභාවේ සිටිනවා. මේ යකඩ තොගය ගෙනයෑමට පැමිණියේ එහි සභාපති මහත්මයාමයි. මුදල් ගෙවා සමුපකාර සංගමයකට බඩු ලබා ගන්නට බැරි බව ගරු ඇමතිතුමාත් දන්නවා ඇති. මුදල් ගෙවිය යුත්තේ චෙක්පත්වලින්. මුදල් ගෙවා ලබාගන්නට පුළුවන් රුපියල් 5 කට අඩු මුදලක බඩු පමණයි. එහෙත් අර යකඩ තොගය ලබාගෙන තිබෙන්නේ මුදල් ගෙවලයි. මෙයට සමුපකාර තොග වෙළඳ ආයතනයේ නිලධාරීනුත් සම්බන්ධ බව එයින් පෙනෙනවා. ජයසිංහ කියන සමුපකාර සංගමයට බඩු සපයන නිලධාරියාත් කට උත්තරයක් දී තිබෙනවා. මේ බඩු තොගය ගන්නය කියා ඔහුට කියා නැහැ. මේ බඩු තොගය අරගෙන ඇත්තේ ඔහුටත් හොරෙන්. සාමාන්‍යයෙන් බඩු ගත යුත්තේ පාස් පොතේ සඳහන් කරලයි. එහෙත් මේ යකඩ තොගය ලබාගැනීමේදී එසේ පාස් පොතේ සඳහන් නොකර මුදල් ගෙවා ඒවා ලබා ගෙන හොර කඩයට විකුණා තිබෙනවා. කවුරු වුණත් හොරා හොරාමයි. ඒ නිසා මේ රජයේ හොඳ නම ආරක්ෂා කර ගැනීම පිණිස එවැනි දූෂිත පුද්ගලයින් මේ සමුපකාර සංගමයෙන් අයින් කර දමා සමුපකාර ව්‍යාපාරය ආරක්ෂා කර ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා. ඒ අතරම මේ හොරකම සම්බන්ධව ගරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇමතිතුමා අරගෙන තිබෙන පියවර කුමක්ද කියන එකත් සඳහන් කරනවා නම් මා සන්තෝෂ වෙනවා.

අවසාන වශයෙන් තවත් කරුණක් මතක් කරන්නට කැමතියි. ලංකාවට අවශ්‍ය එළවලුවලින් විශාල කොටසක් නිපදවන්නේ ඌව පළාතේ. එහෙත් ඒ ප්‍රදේශයේ ගොවීන්ට වුවමනා කරන විෂ බීජ නාශක බෙහෙත් ලබාගැනීමට දැන් සිදු වී තිබෙන්නේ එකට අටක් වැඩිපුර ගෙවලයි. ඒ නිසා ගොවීන්ට විශාල කරදර යක් සිදු වෙනවා. "ගොවියා දිනන් නාය" යනුවෙන් ආප්තෝපදේශයක් තිබෙනවා. දැන් පවතින තත්ත්වය අනුව අපට ඒ ආප්තෝපදේශය වෙනස් කරන්නටයි සිදු වී තිබෙන්නේ. "ගොවියා හිඟන් නාය" යනුවෙන් තමයි එය වෙනස් කරන්නට සිදු වී තිබෙන්නෙ. අද ගොවීන්ට ගොවි තැනින් ජීවිකාව කරගෙන යන්නට බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ගෝවා රාත්තලක් ශත පහකටවත් විකුණා ගන්නට බැරි තත්ත්වයක් ඇතැම් ප්‍රදේශවල ඇත්ත වශයෙන්ම ඇතැම් අවස්ථාවල ඇති වෙනවා. සමහර එළවලු රාත්තලකට ලැබෙන්නේ ශත දෙකක් පමණයි. ඒ නිසා වවන්නා දිනන්නා නොව —ගොවියා දිනන්නා නොව—හිඟන්නා කියන්නටයි සිද්ධ වෙලා තියෙන්නේ. මීට වඩා යමක් කියන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. තමුන්නාන්සේට ස්තුතියි.

**එම්. එම්. මුස්තාෆා මයා. (සමාජ සේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(ஜனாப் எம். எம் முஸ்தபா—சமூகசேவை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. M. M. Mustapha—Parliamentary Secretary to the Minister of Social Services)

Mr. Deputy Chairman, food is our biggest problem today, and therefore the Government is justified in concentrating on food production. This Ministry is charged with the responsibility of increasing productivity in the agricultural sector. The Ministry of Agriculture which was considered all along as a very important Ministry has achieved even greater importance in the present context.

There are various factors which go to increase food production, and it is my intention within the short time available to me to make a few observations on the production of paddy because I happen to hail from a paddy producing area.

Amparai district is second only to the Anuradhapura district from the point of view of the acreage cultivated and also the quantity of paddy produced annually. Now there are various factors which go to increase paddy production. No doubt fertilizer is necessary and so is weeding. These are all what are called factors which intensify food production. But to my mind, irrigation facilities and drainage facilities are the most important factors.

The other day the hon. Member for Akuressa (Dr. S. A. Wickremasinghe), while speaking on the Votes of the Minister of Land, Irrigation and Power chose to describe the Gal Oya scheme as a national calamity. That was not surprising because this particular scheme never received his patronage because the firm of contractors who constructed the scheme happened to be Americans. Those who have listened to his speeches even in the earlier Parliaments would have heard him express similar views on this scheme. I do not know whether the hon. Member for Akuressa visited the Gal Oya valley before 1949. If he had done so, he will realize that this is one of the schemes of which Ceylon can be proud.

Of course if he had expressed the same sentiments in regard to the sugar industry, I would have agreed with him. The sugar industry in Ceylon is a national calamity. This industry is losing to the tune of Rs. 7 million every year.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**

*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*

(Mr. F. R. Dias Bandaranaike)

Too many working directors.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මුස්තාෆා මයා.
(ஜனாப் முஸ்தபா)
(Mr. Mutapha)

Yes, I understand that every director of the Sri Lanka Sugar Corporation is a working director.

කාරකසභා නියෝජ්‍ය සභාපති
(குழுக்களின் உப அக்கிராசனர்)
(The Deputy Chairman of Committees)

That is under another Minister.

අ. භා. 8

මුස්තාෆා මයා.
(ஜனாப் முஸ்தபா)
(Mr. Mustapha)

Yes, Sir. But in a few minutes you will realize how my remarks are relevant to this discussions.

In the right bank 20,000 acres have been made cultivable by the efforts of the people. Quite a lot of human suffering has gone into the clearing of this land of very thick jungle. The Gal Oya Development Board has not spent a cent in clearing the land to make this land cultivable.

The most important thing is water. Main channels have been constructed but because the distribution channels and field channels are not constructed or completed the peasants are not able to grow paddy on these lands. In fact, I raised this matter when the Hon. Prime Minister, the Hon. Minister of Agriculture and Food, and the Hon. Minister of Land, Irrigation and Power were in the Valley. There was a District Agricultural Committee meeting at which I raised this matter.

The Chairman of the Gal Oya Development Board agreed with me that these channels are necessary. I regret to inform the Hon. Minister of Agriculture and Food that so far not a single foot of channel has been cut.

All that I am trying to say is that if this is our progress in the matter of food production we cannot go very far. So it is not a problem which should engage the attention of only the cultivators. This Ministry which is responsible for intensifying food production should make use of its good offices with the other Ministries, particularly the Ministry of Land, Irrigation and Power, to see that the necessary irrigation facilities are provided in the paddy producing areas, so that the peasant will be able to intensify paddy production.

We are having numerous conferences in connection with the food drive. A conference of government agents is to be held somewhere next week, and the Hon. Prime Minister and five other Ministers are expected to address the government agents. The government agents will in turn go to the provinces, call D. A. C. meetings and address the members. These conferences and speeches alone are not enough to produce paddy. We must get down to the task of providing the necessary facilities to the peasant so that he can produce the paddy that we require.

I think it is George Bernard Shaw who said that if an Asian is pinched he will rattle off three volumes of Charles Dickens. We are all great authors—of plans. We have been planning quite a lot ; numerous plans have been put out. But what is sorely lacking is the readiness on the part of officials to go to the assistance of the cultivator and provide him the necessary irrigation facilities, and so on. I would appeal to the Hon. Minister to see that work on the network of irrigation channels in the right bank of Gal Oya is expedited, so that we can be assured of a double crop in about 20,000 acres, which will take us very far in the matter of achieving self-sufficiency in rice.

I wish to have a clarification on another matter, namely, the expanded scheme of credit facilities which the Government is considering at the moment. Under the present scheme, multi-purpose co-operative societies have to apply to the People's Bank for these loans. If the society is creditworthy, the loan is granted. I understand large numbers of applications are pouring into the Peoples

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Bank. Already, applications have been received for loans to the tune of about Rs. 150 million.

The problem I want clarified is this. One of the conditions on which these loans are granted is that the loan has to be re-paid within nine months, and at the expiry of the nine months the funds of the society with the bank, whether the society has recovered the loans given to members or not, will be debited with the amount of the loan. That would mean that it is only those societies which are financially sound that will be given these loans. I must inform the Hon. Minister that there is a great deal of reluctance on the part of societies which are financially sound, to apply for these loans. The reason is this. These societies, after years of efficient and good management, have built up a reserve out of the profits they made, and if such a society takes a loan from the People's Bank and if the members fail to pay, it will find at the end of nine months that the bank has deducted from its reserve with the bank the entirety of the loan. As you know, some of these cultivators think that the loans they get are presents. And, I do not blame them if they think so, because the Government recently wiped off the loans which remained unpaid over a period of time. In fact, there are certain societies which, under the old scheme of the Commissioner of Agrarian Services had already paid these loans out of their own funds. The Government's wiping out these loans really means no loss to the Government but a loss to the co-operative societies. So I want a clarification. I know of a few good societies which have not applied for these loans. We should like all societies to apply for these loans so that they can give these credit facilities to the cultivators. Otherwise the sufferers will be the cultivators.

In order to ensure better co-ordination, I myself would support the view expressed by the previous speakers that the subject of irrigation should come under the Hon. Minister of Agriculture and Food. There are large schemes, multi-purpose schemes. which the River Valleys Development Board is undertaking. Now it is nothing but correct that those schemes should be undertaken by a body like the River Valleys Development Board. It is better if the sub-divisional irrigation officers come under the Hon. Minister of Agriculture and Food because the Assistant Commissioner of Agrarian Services does not have in his office the necessary technical staff to undertake minor irrigation works. In fact some attempt had been made a few years back in order to give the officers of the Agrarian Department powers in respect of minor irrigation works. But very regrettably, though it is a good way of co-ordinating the work of the Agriculture Department and the irrigation aspects of agriculture, the Agrarian Commissioner's Department does not have the necessary technical staff to undertake this kind of work. So if the sub-divisional irrigation officers are also brought under the Minister of Agriculture, I think it will go a long way to coordinate the work of these two departments in the interests of food production.

I must draw the attention of the Hon. Minister of Agriculture and Food to the fact that there is only one Assistant Commissioner of Agrarian Services in the Amparai District. As I said earlier, the Amparai District is one of the largest rice producing areas in this country. Now the A. C. A. S. has to attend to the G. P. S. work, rice milling work and so on. He has to attend to work in connection with the Paddy Lands Act. In addition to these things he has also to be responsible for minor irrigation works. It is impossible for one officer to manage all this. So I would request the Hon. Minister to appoint at least another Additional A. C. A. S. for the Amparai District with immediate effect.

As regards the Leases Board, the Hon. Minister of Agriculture has already had occasion twice to call

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මුස්තාෆා මයා.]

some of these Leases Board allottees to his office and give them a severe warning because they have not come up to expectations. As far as I am concerned, from the very beginning I always thought that this would not come right because these people, the capitalists, never undertake anything without a profit motive, particularly at this juncture when prominent Members of the Opposition are warning them that in the event of their being returned to power they would take back these lands. So you cannot expect these people who have been allotted land under the Leases Board to invest much capital in these lands. That is one of the reasons why they are going slow on this scheme. While this is happening on the one hand, a few societies in our electorates have applied to the Leases Board for land for paddy cultivation. They have paid the Rs. 250 deposit and applied for land. I know in my own electorate about five societies have done so. These applications were referred to the Gal Oya Development Board for consideration by the Leases Board, but thereafter everybody has lost track of these applications and these poor people have not got the land and have almost lost the Rs. 250 which they paid as deposit.

So I would request the Hon. Minister of Agriculture to see that these people are given the land or, failing that, at least that the money which they deposited, the Rs. 250, is refunded because some of the people are thinking that this is an indirect way of levying a tax on the people.

These are some of the matters I want to raise. I do not want to take any more time.

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කුඩා කාලයේදී අපට අහන්නට ලැබුණු කවියක් මට දැන් මතක් වුණා. ඒ කවිය—

"රටක මව් ද යා —ගොවිකම
වේය දනු ශ්‍රි යා
පොරණ සිහල යා —රැකුණේ
ගොවිකමෙනි ශ්‍රි යා"

යන්නයි. මේ කවියෙන් ප්‍රකාශ වන අර්ථය බොහොම පැහැදිලියි. පුරාණ සිංහලයා අවුරුදු දහස් ගණනක් ජීවත් වෙලා තියෙන්නේ වෙන දෙයකින් නොව ගොවිතැනින් බව කියන්නට පුළුවනි. විරුද්ධ පාර්ශ්වයේ සිටින අප නැවත බලයට පත් වී ආණ්ඩුවක් පිහිටුවා ගත්තාම, ගොවිතැන සඳහා ධනපතියන්ට දෙන ලද ඉඩම් නැවත ආපසු පවරා ගනු ඇතැයි යම් ප්‍රමාණයක බියක් ධනවතුන් අතර පවතින නිසා ඉඩම් බදු ගන්නට කල්පනා කරගෙන සිටින අය ඒ ගැන උනන්දුවක් නොදක්වතැයි සමාජ සේවා ඇමතිතුමාගේ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා මීට මොහොතකට පෙර කථා කරද්දී ප්‍රකාශ කළා. ඒක ඇත්ත. අප අනුගමනය කරන සමාජවාදී ප්‍රතිපත්ති අනුව කිසිම අවස්ථාවක උදව් කරන්නට බැහැ, වැඩ කරවන්නන්ට. අප හැම වෙලාවේම උදව් කරන්නට බලාපොරොත්තු වන්නේ වැඩ කරන්නන්ට මිස වැඩ කරවන්නන්ට නොවෙයි. කරවන අය කවදා හෝ රටින් තුරන් කිරීම පිණිස අපට කළ හැකි හැම දෙයක්ම කරන්නටයි අප බලාපොරොත්තු වන්නේ. වැඩ කරන උදවියට දිය හැකි හැම ආධාරයක්ම දෙන අතර වැඩ කරවන්නට බලාගෙන ඉන්න උදවිය ඉවත් කරන්නට පුළුවන් ක්‍රියා මාර්ගයක් අප වෙත තිබෙන බවත්, එය ක්‍රියාත්මක කිරීමට අප කිසි විටකත් පසුබට වන්නේ නැති බවත්, පැහැදිලිවම කියන්නට කැමතියි.

අ. භා. 8.15

ගරු අගමැතිතුමාටත්, ගරු ඇමතිතුමාටත්, ආණ්ඩුවටත්, එකක් මතක් කර දෙන්නට ඕනෑ. අද වෙනස් වේගන යන සමාජ තත්ත්වය දෙස බලන විට නැවතත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරවන්නන් වැඩි වේගන යන බවයි පෙනෙන්නේ. ගොවි කර්මාන්තයටත් වේගන යන්නේ කරවන්නන් වැඩි වන අතර කරන්නන් අඩුවීමයි. මේ ආණ්ඩුව කරගෙන යන වැඩ දෙස බලා සිටින අපට පෙනී යන්නේ, අද ධනවතුන් ලවා ගොවිතැන් කරවන අතර අවුරුදු දහස් ගණන් වී ගොවිතැනේ සහ හේන් ගොවිතැනේත් නිරත වී සිටි අපේ ගොවීන් ඒ ධනවතුන් යටතේ වැඩ කරන කුලීකරුවන් කරවීමේ ව්‍යාපාරයක් ක්‍රියාත්මක වේගන යන බවයි. මේ ඊනියා ශ්‍රේෂ්ඨ ගොවිතැන් ව්‍යාපාරයෙන් අපේ නියම ගොවීන් කුලීකරුවන් කරවීමේ වැඩ පිළිවෙළක් ඇති වන බව අපට දැනටමත් පෙනී ගොස් තිබෙනවා. පොල් වතුවලත්, රබර් වතුවලත්, තේ වතුවලත් කුලීකරුවන් යෙදෙව්වාක් මෙන් මෙතෙක් කල් ගමේ වී ගොවිතැනට කුලීකරුවන් යෙදෙව්වේ නැහැ. අපේ ජාතියේ ආරක්ෂාවට මෙතෙක් කල් තිබුණේ ගමේ කුඹුරු වැඩ ටික පමණයි. ඒ ටිකත් දැන් කුලීකරුවන් ලවා කරවා ගන්නට යාමෙන් වැඩි කල් යන්නට පෙර මුළු රටම කුලීකාරයන් කිරීමේ ව්‍යාපාරයක් ඇති වන බව පෙනෙනවා. දැන් ඒ කාරණය ගම්වාසීන්ට පැහැදිලි වෙලා තියෙනවා. ඒ ගැන දැන් ගැමියන් තුළ භීතියක් තිබෙනවා.

වැවල නමින් වැවක් බඳින්නට පටන් ගෙන තිබෙනවා. එය වියලි කලාපයේ වැවක්. මේ වැව යටතේ වගා කරන්නට තිබෙන ඉඩම්, ගොවිතැනේ යෙදෙන ගම්වාසීන්ට නොදී ගොවිතැන් කරවන ධනවතුන්ට දීමට වැඩ කටයුතු සලසාගෙන යනවා. ගොවිතැන් ව්‍යාපාරය යටතේ දැන් වැඩියෙන්ම කෙරෙන්නේ ගොවිතැන් කරවන උදවියට උදව් කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමයි. එවැනි වැඩ පිළිවෙළකට පක්ෂ වන්නට අපට නම් කොයි අන්දමකින්වත් හැකියාවක් නැහැ. අප වැයම් කරන්නේ පුරාණ තත්ත්වයෙන් ගොවිතැන් කරන උදවියට —කරවන උදවියට නොවෙයි— අත දී උදව් කරන්නට පුළුවන් යම් වැඩ පිළිවෙළක් තිබෙනවා නම් ඒ වැඩ පිළිවෙල අරගෙන යන්නටයි.

මා වැඩියෙන්ම කථා කරන්නට බලාපොරොත්තු වන්නේ වී ගැනවත් ඉඩම් ගැන වත් නොවෙයි. අකුරුස්සේ ගරු මන්ත්‍රීතුමා (එස්. ඒ. වික්‍රමසිංහ මයා.) ප්‍රකාශ කළාක් මෙන් අනෙක් පළාත්වලට වඩා දඹුල්ල වැනි වියලි කලාපයේ ප්‍රදේශවල ගොවිතැන් කරන ගොවීන් ගොවිතැනින් ප්‍රතිඵල බලාපොරොත්තු වන්නේ රේස් නොම්මර ගන්නා වාගෙයි. රේස් ටිකට් ගන්න මිනිහා සමහරවිට හැම දාමත් පරදින්නට පුළුවන්. ඒ වාගේ අපේ ගොවියනුත් හැම දාමත් පරදිනවා. ඔවුන් හැම දාමත් ගොවිතැන් කරනවා. එහෙත් ඒවා සාර්ථක වන්නේ නැහැ. වතුර නැතිකම නිසා ඒ ගොවීන් හැම දාමත් පරාජයට පත් වෙනවා. ඒ නිසා ඔවුන්ට ජීවත් වීමට ක්‍රමයක් නැහැ. යල් කන්නය ගැන කවුරුන් මොන විධියට කථා කළත්, යල් කන්නය වැඩ කරන කුඹුරුවලින් සියයට එකක්වත් වැඩ කෙරෙන්නේ නැහැ. දඹුල්ල ආදී වියළි කලාපයේ ප්‍රදේශවලින් යල් කන්නයේ කිසිම අස්වැන්නක් ලබා ගන්නට බැහැ. මෙය ඉතාමත් කණගාටුවෙන් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා.

අපේ ප්‍රදේශවල ගොවීන් 1961 සිටම සැහෙන ආදායමක් ලබන ගොවිතැනක් කරගෙන ආවා. එනම්, බීඩි දුම්කොළ වැවීමයි. බීඩි දුම්කොළ සඳහා පිට රට ඇදී යන විශාල මුදල ඉතිරි කර ගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව එම වැවිල්ලට ගොවීන් උනන්දු කළා. ගොවීන් වවන දුම්කොළ සහතික මිළ ක්‍රමයක් අනුව ලබා ගන්නා බව ගොවීන්ට දැන්වූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පළමුවැනි, දෙවැනි, තුන්වැනි, හතරවැනි, පස්වැනි වර්ගවල දුම්කොළ මේ මේ ගණන්වලට ගන්නවායයි මිළ නියමයකුත් කළා. ඒ පිළිබඳව සහතික අවුරුදුපතාම ගොවීන්ට දී තිබෙනවා. මේ අවුරුද්දෙත් දුන්නා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරියකුගේ අත්සනින් යුත් ඒ පත්‍රිකාව සෑම ගොවියකු ළඟම තිබෙනවා. එසේ තිබියදීත්, දෙපාර්තමේන්තුව ඒ දුම්කොළ ගැනීම පසුගිය මාසයේ 30 වැනි දා සිට සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබෙනවා. අපේ ප්‍රදේශවල ගොවියකු අක්කරයක හමාරක දුම්කොළ වගාවක් කරන්නේ ඔහුගේ සම්පූර්ණ වස්තුවම ඒ සඳහා යෙදවීමෙන් බව ගරු ඇමතිතුමා හොඳ හැටි දන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]

ඊයේ දඹුල්ලේ කන්දෙපල්ල කෝරළේ ගොවීන් 200 ක් පමණ ගරු ඇමතිතුමා හමු වීමට මෙහි පැමිණියා. දවල් වන තුරුත් එතුමා මුණ නොගැසුණු නිසා ඔවුන් ආපසු ගියා. 400 ක් අත්සන් කළ පෙත් සමක් තමුන්නාන්සේට ඉදිරිපත් කිරීමට දැන් මා ළඟ තිබෙනවා. දුම්කොළ රාත්තල් 4 ලක්ෂයක් මේ උදවිය විසින් නිෂ්පාදනය කර තිබෙනවා. ඒවා දැන් විකුණා ගන්නට කිසිම පිළිවෙළක් නැහැ. ස්වදේශ කටයුතු බාර ගරු ඇමතිතුමා සමගත් අප මේ ගැන සාකච්ඡා කළා. එතුමාගෙන් අපට ලැබුණු පිළිතුර ඉතාමත් කණගාටු දායකයි. එක් එක්කෙනාගෙන් දුම්කොළ මිළ දී ගන්නට තමන්ට බල නොකළ යුතු බවත්, වෙළඳුන් වශයෙන් තමන් කැමති තැනකින් ඒවා ලබා ගැනීමට ඉඩ දිය යුතු බවත් තමන් බැඳ තැබීමට උත්සාහ නොකළ යුතු බවත් බීඩි ඔතන දුම්කොළ මුදලාලිලා පිරිසක් පැමිණ එතුමාට කී බවයි, ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා අපට කිව්වේ. ඒ නිසා ඒ මුදලාලිලාගේ කීම භාරගත් ස්වදේශ කටයුතු භාර ඇමතිතුමායි මේ ගොවීන්ට මේ විපත කර තිබෙන්නේ.

මා කලින් කීවාක් මෙන්, "කරවන්නන්ගේ ව්‍යාපාරය" මෙතැනටත් ඇතුළු වුණා. බීඩි ඔතන ධනවත් කොම්පැනි කාරයින් අක්කර සිය ගණන් දහස් ගණන් ආණ්ඩුවෙන් ලබා ගෙන බීඩි දුම්කොළ වැව්වා. ඒ නිසා ඔවුන්ට වුවමනා තරම් දුම්කොළ තිබෙනවා. අද දඹුල්ල ප්‍රදේශයේ සෑම ගොවියකුගේ ගෙදරකම වී වෙනුවටත් කුරහන් වෙනුවටත් දුරු මිරිස් වෙනුවටත් තිබෙන්නේ දුම්කොළ ටික පමණයි. වියළි කලාපයේ වැඩිපුර අල, බතල, කොස්, දෙල් වැනි දේ නොවැවෙන නිසා දුම්කොළ ටිකක් වගා කර ගැනීම පමණයි ඒ ගොවීන්ට කරන්නට පුළුවන්කම තිබෙන්නේ.

ඒ පෙත්සමේ විස්තර වශයෙන් මෙසේ සඳහන් වෙනවා :

"බීඩි දුම්කොළ වගාව යල් කන්නයේ ස්ථිර වගාවක් වශයෙන් ආරම්භ වූයේ 1961 වර්ෂයෙන් පසුවය; එයත් ගොවිකම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදිය. මෙම ප්‍රදේශයේ, ලංකාවේ නිපදවන බීඩි දුම්කොළවලින් සියයට 85 ක් පමණ නිපදවන බව සතුටින් මතක් කරමු. අප දන්නා හැටියට මේ ප්‍රදේශයේ අපේ දුප්පත් ගොවියන් අතින් නිපදවෙන බීඩි දුම්කොළ ඉන්දියන් බීඩි දුම්කොළවලට සමාන තත්ත්වයක් උසුලන බව දක්වන්නට කැමැත්තෙමු."

ඉන්දියාවේ දුම්කොළවලටත් වඩා හොඳ බීඩි දුම්කොළ දඹුල්ලේ, කන්දපල්ල කෝරලයේ වැවෙනවා. දුම්කොළ සඳහා වැය වූ විදේශ විනිමය ඉතිරි කර ගැනීම පිණිස තමයි, මේ බීඩි දුම්කොළ වගාව වෙනුවෙන් ගොවීන්ට සහතිකයක් දුන්නේ. ඒ විදේශ විනිමය ඉතිරි වන තැනට බීඩි දුම්කොළ වගාව ඇති වුණා. ඔවුන්ට එසේ සහතිකයක් දී තිබෙද්දීත්, ඔවුන්ගේ බීඩි දුම්කොළ නොගෙන තිබෙනවා.

අනෙක, ඒ ගොවීන්ගෙන් බීඩි දුම්කොළ ලබා ගත් උදවිය දැනට මාසයක් පමණ ගත වී ඇතත්, ඒ ගොවීන්ට තවම මුදල් දී නැහැ. තවත් මාස කීයක් ඒ සඳහා ගත වේදැයි කියන්නට බැරි බව අද උදේ ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා කීවා. එම නිසා ඒ ගොවීන් ඉතා අමාරු තත්ත්වයක වැටී සිටිනවා. ඒ ගොවීන්ගෙන් ලැබී තිබෙන සංදේශය සම්පූර්ණයෙන්ම මා කියවන්නේ නැහැ. ඒ ගොවීන්ගේ ඉල්ලීම් මේවායි :

"සහතික මිළ ක්‍රමයට දුම්කොළ අලෙවි කිරීම කළ යුතුයි. ලියාපදිංචි කරනු ලැබූ ගොවීන්ගේ සියලුම බීඩි දුම්කොළ ඒ අනුව මිළ දී ගත යුතුයි. මිළ දී ගන්නා දුම්කොළවලට අත්පිට මුදල් දිය යුතුයි. මෙතෙක් ණයට ගත් දුම්කොළවලට මුදල් වහාම දිය යුතුයි. මින් ඉදිරියටත් ගොවියන් ලියාපදිංචි කළ යුතුයි. විශාල සංගම්වලට දැනට දුම්කොළ වගාවට දී ඇති අවසරය නැති කළ යුතුයි. රජය දුම්කොළ නිලධාරීන් ලවා දුම්කොළ වගා කරවා ගත යුතුයි. මෙම යල් කන්නයේ දුම්කොළ සහතික මිළ ක්‍රමයට විකුණා ගැනීමට ගොවියන්ට නොහැකි වුවහොත් මින් ඉදිරියට දුම්කොළ වගාව කළ නොහැකිය. බීඩි දුම්කොළ නිපදවන්නන්ගේ සංගමයෙන්, බීඩි නිපදවන්නන් දුම්කොළ මිළ දී ගත යුතුය යන කොන්දේසිය මින් ඉදිරියටත් ක්‍රියාත්මක විය යුතුය."

400 ක් පමණ ගොවීන් ළඟ දුම්කොළ රාත්තල් 4,00,000 ක් පමණ තිබෙනවා. ඒ බව එම ගොවීන් මේ සංදේශය මාර්ගයෙන් කියා තිබෙනවා. මා එම ලියවිල්ල ඇමතිතුමාට ඉදිරිපත් කරන්නට කැමතියි. හැමදාමත් මේ ගොවීන්ගෙන් බීඩි දුම්කොළ ලබා නොගත්තත්, රජය සහතික දී තිබෙන උදවියගේ දුම්කොළ ටික මේ වරවත් ලබා ගැනීම සඳහා ක්‍රමයක් ඇති කරන ලෙස,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ දුම්කොළ වගා කරන ගොවීන් වෙනුවෙන් මා ඉතාමත් ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*
(Mr. Hemachandra Sirisena)
දිගටම ඒ ක්‍රමය ගෙන යා යුතුයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

කොම්පැණිකාරයන්ට ඉඩම් දී බීඩි වගා කරන්නට අවස්ථාව සලසා දෙන්නේ නැත්නම් ගොවීන්ට තමන්ගේ වගාව කරගෙන යන්නට ධෛර්යයක් ලැබෙනවා. එම නිසා, ඇත්ත වශයෙන්ම දුම්කොළ වගා කරන ඒ අසරණ ගොවියන්ගේ යහපත සලසා දීම රජයේ අදහස නම්, දැනට ඔවුන් මුහුණ පා ඇති භයානක තත්ත්වයෙන් ගොඩ එන්නට ඔවුන්ට ආධාර දෙන ලෙස මා ඉතා ආදරයෙන් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ කාරණය ගැන මීට වඩා කථා කරන්නට වුවමනායැයි මා හිතන්නේ නැහැ.

සමුපකාර දෙපාර්තමේන්තුව ගැනත් වචනයක් දෙකක් කියන්නට කැමතියි. සමුපකාර දෙපාර්තමේන්තුව දියුණුව කරා යන බවක් අපට පෙනෙන්නේ නැහැ. එය එන්න එන්නම ප්‍රපාතය කරා ගමන් කරන බවකුයි, අපට පෙනෙන්නේ. සමුපකාර සංගම් දිහා බැලුවත්, සමුපකාර කඩ සමිති දිහා බැලූවත්, අපට පෙනෙන්නේ සමුපකාර ව්‍යාපාරය පරිහාණිය කරා ගමන් කරන බවයි. සමුපකාරයේ නම පාවිච්චි කළත්, අද සමුපකාර ප්‍රතිපත්තිය හරි හැටියට ක්‍රියාත්මක කරන බවක් පෙනෙන්නේ නැහැ. ගරු මන්ත්‍රීවරුන් කීප දෙනකුම කීවා, සමුපකාර සංගම් වසා දමා ඒවා නිලධාරීන්ට භාර දී තිබෙනවාය කියා. ඒවායේ පාලනය නිලධාරීන්ට භාර දීම සමුපකාර ප්‍රතිපත්තිය නොවෙයි. මේ සංගම් සියල්ලක්ම පටන් ගන්නා විට නිලධාරීන් එක් කෙනකු දෙන්නකු මේ සංගම් ඇතුළේ වාඩි වී ඉන්නවා. මේ උදවිය හැම ගණනක්ම බලන බව කියනවා. හැම දේම සොයා බලන බව කියනවා. එහෙත් තුන් ලක්ෂයක් පාඩු වුණායැයි කියන්නේ අවුරුදු දෙක තුනක් ගිය විටයි. රුපියල් 100 ක් පාඩු වන විට, රුපියල් 1,000 ක් පාඩු වන විට ඒ බව පෙනෙන්නේ නැද්ද? ඒ උදවිය හැමදාමත් මෙම සංගම්වල වාඩි වෙලා වැඩ කර ගෙන ගියත් සමිතිය බංකොළොත් වන තුරු, සමිතියට ලක්ෂ හය හත පාඩු වන තුරු, සමහරවිට සමිතියේ තිබෙන මුදල් සියල්ලම ඉවර වී තවදුරටත් ණය වන තුරු එම නිලධාරීන්ට ඒවා පෙනෙන්නේ නැහැ. මහජනයා විසින්ම සමුපකාරය පවත්වා ගෙන යන තුරු මෙම වැඩ පිළිවෙළ සාර්ථක වන්නේ නැති බවයි පෙනෙන්නේ. මෙය පවත්වාගෙන යන්නේ ඒව ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය උඩ නම් ඒවා පිළිබඳ සම්පූර්ණ වග කීම එම නිලධාරීන්ටම භාර දෙන හැටියටයි, මා කියා සිටින්නේ. යම් විධියකින් සමිතියක් වැටුණොත් එසේ නැති නම් යම් සමිතියකට පාඩු සිදු වුණොත් ඒ සඳහා වග කිවයුත්තේ එය භාරව සිටින නිලධාරීන්ය යන්න විශෙෂයෙන්ම සඳහන් කරන්නට වුවමනා බව මෙම අවස්ථාවේදී මා කියා සිටිනවා.

**එකල්හි වේලාව අ. භා. 8.30 වූයෙන්, මන්ත්‍රී මණ්ඩලයට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.**

**කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස් වීම 1967 සැප්තැම්බර් 6 වන බදාදා.**

*நேரம் பி. ப. 8.30 மணியாகிவிடவே, குழுவின் பரிசீலனை பற்றி சபைக்கு அறிவிக்கும் பொருட்டு குழுக்களின் உப அக்கிராசனர், அக்கிராசனத்திலிருந்து நீங்கினர்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது : புதன்கிழமை 6, செப்ரம்பர் 1967.*

*It being 8.30 P.M., the Chairman left the Chair to report Progress.*

*Committee report Progress; to sit again on Wednesday, 6th September 1967.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# කල්තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

එකල්හි වේලාව අ. භා. 8.30 පසුකර තුබූයෙන් කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.31 ට 1967 සැප්තැම්බර් 4 වන දින සභා සම්මතිය අනුව 1967 සැප්තැම්බර් 6 වන බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේ ය.

அப்போது நேரம் பி. ப. 8.30 மணிக்குப் பிந்திவிட்டமையால் குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் வினுவின்றிச் சபையை ஒத்திவைத்தார்கள்.

இதன்படி பி. ப. 8.31 க்கு சபை அதனது 1967 செப்ரம்பர் 4 ஆம் தேதிய தீர்மானத்திற் கிணங்க, 1967 செப்ரம்பர் 6, புதன்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

*And it being past 8.30* P.M., MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned the House without Question put.*

*Adjourned accordingly at 8.31* P.M. *until 9.30* A.M. *on Wednesday, 6th September 1967, pursuant to the Resolution of the House of 4th September 1967.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පරිශිෂ්ටය අංක I

## අංක 2 (අ) දරණ ප්‍රශ්නයට පිළිතුරත් සමග සභාගත කරන ලද වාර්තාව—

**1967 මැයි මස 25 වැනි දින පෙ. ව. 9.30 ට මහලේකම් කාර්යාලීය සාකච්ඡා ශාලාවේදී පැවැත්වුණු යාපනය දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ රැස්වීමේ සටහන්**

යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති වර්නන් අබේසේකර මහතා මුළසුන දැරිය.

**සහභාගිවූවෝ :**

1. දොස්තර ඊ. එම්. වී. නාගනාදන් මහතා, නල්ලූර් පාර්ලිමේන්තු මන්ත්‍රී,
2. කේ. පී. රත්නම් මහතා, කිලිනොච්චි පාර්ලිමේන්තු මන්ත්‍රී,
3. වී. නවරත්නම් මහතා, කයිට්ස් පාර්ලිමේන්තු මන්ත්‍රී,
4. එස්. කදිරවේලුපිල්ලේ මහතා, කෝපායි පාර්ලිමේන්තු මන්ත්‍රී,
5. වී. ධර්මලිංගම් මහතා, උඩුවිල් පාර්ලිමේන්තු මන්ත්‍රී,
6. කේ. තුරෙයිරත්නම් මහතා, පේදුරුතුඩුවේ පාර්ලිමේන්තු මන්ත්‍රී,
7. ජේ. එම්. සබාරත්නම් මහතා, යාපනය දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපති,
8. වී. මුරුගේසුපිල්ලේ මහතා, යාපනය දිස්ත්‍රික්කයේ උප දිසාපති,
9. කේ. සබාරත්නම් මහතා, ස. ගො. ජ. සේ. කො. යාපනය,
10. කේ. පොන්නම්බලම් මහතා, ඉ. ස. නිළධාරි, මාන්කුලම්,
11. ටී. කන්දසාමි මහතා, ස. සං. ස. කො. යාපනය, දකුණ, පරන්තන්,
12. එම්. මතිබාලසිංහම් මහතා, ස. සං. ස. කො. යාපනය නැගෙනහිර, යාපනය,
13. ටී. කුමාරස්වාමි මහතා ස. සං. ස. කො. යාපනය බටහිර, යාපනය,
14. වී. බාලසුප්‍රමනියම් මහතා, දි. වා. ඉ. උතුරු කොට්ඨාශය, වවුනියාව,
15. වී. එස්. වේලුපිල්ලේ මහතා, වා. ඉ. වවුනිකුලම්,
16. සී. කනගසුන්දරම් මහතා, වා. ඉ. මුලතිව් උප කොට්ඨාශය, ඔඩ්ඩුසුද්දන්,
17. එස්. සිවඥනම් මහතා, දි. ඉ. නි. 1 යාපනය කච්චේරිය,
18. කේ. එන්. ජයසීලන් මහතා, දි. කෘ. ව්‍යා. නි. යාපනය,
19. එන්. ෂන්මුගම් මහතා, කෘ. නි. (ගො. පා. නි.) යාපනය,
20. කේ. රාමනාදන් මහතා, පරිපාලන නිලධාරි (ගො. පා. නි.) යාපනය,
21. එන්. වේදරනෙයියසෙයෝන් මහතා, ප්‍රා. ආ. නි. වලි නැගෙනහිර කෝෂායි,
22. වී. කන්දපිල්ලේ මහතා, ප්‍රා. ආ. නි. පලෙයි,
23. එච්. ඊ. පිල්ලේනායගම් මහතා, ප්‍රා. ආ. නි. යාපනය,
24. ආර්. යෝගනාදන් මහතා, ප්‍රා. ආ. නි. කිලිනොච්චි,
25. ඒ. කන්දයියා මහතා, ප්‍රා. ආ. නි. මූලස්ථාන යාපනය කච්චේරිය,
26. එස්. අරුනාශලම් මහතා, ප්‍රා. ආ.නි. මහතා, ඩෙල්ෆ්ට්,
27. එන්. මානික්කනඩරාසා මහතා, ප්‍රා. ආ. නි. වලි බටහිර, වන්කානෙයි,
28. පී. එල්. පැට්‍රික් මහතා, ප්‍රා. ආ. නි. වලි උතුර, තෙලිප්පලෙයි,
29. එස්. විනයාගලිංගම් මහතා, ප්‍රා. ආ. නි. දිවයින්, කයිට්ස්,
30. ආර්. සිදම්බරපිල්ලේ මහතා, ප්‍රා. ආ. නි., තෙන්මරච්චි, චාවාකච්චේරිය,
31. ඒ. සී. විශ්වනාදන් මහතා, ප්‍රා. ආ. නි. වඩමරච්චි, පේදුරුතුඩුව,
32. එන්. සෙල්වනායගම් මහතා, ප්‍රා. ආ. නි., පූනගරි,
33. එන්. බාලසිප්‍රමනියම් මහතා, රජයේ පශු වෛද්‍ය, තින්නවේලි,
34. ඩී. තම්බිතුරේ මහතා, රජයේ පශු වෛද්‍ය නිලධාරි, පේදුරුතුඩුව,
35. පී. සෝමසුන්දරම් මහතා, රජයේ පශු වෛද්‍ය නිලධාරි, කිලිනොච්චි,
36. ටී. කනගදරන් මහතා, අලෙවි නිලධාරි, (යාපනයේ අලෙවි සං. ස. කො. වෙනුවෙන්).

1. 66.11.17 වැනි දින පවත්වන ලද රැස්වීමේ සටහන් සාමාජිකයන් අතරේ කලින් බෙද හරින ලදුව මේ අවස්ථා වේදී ඒවා කියවා ස්ථිර කරන ලදී.

2. එම සටහන්වලින් පැන නගින කාරණා

### (අ) වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**ඒ. යන්ත්‍ර සූත්‍ර නොතිබීම**

ඇතැම් යන්ත්‍ර සූත්‍ර සඳහා ඇනවුම් කරන ලද බවත් ඒවා ලංකාවට සේන්දුවීමට මාස හතරේ සිට හයක පමණ කාලයක් ගත විය හැකි බවටත් ඉ. වා. වි. ලේ විසින් කරන ලද තීරණය කමිටුවට දන්වන ලදී. වවුනිකුලම්හි යන්ත්‍ර සූත්‍ර ඒකකය වඩා සවි සක්තිමත් කරන ලද බවත් ඇල ප්‍රදේශ එළි කිරීම සඳහා අතිරේක ටැක්ටරයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරියාලෙයි නාගපඩ්ඩුවාන් නම් ස්ථානයට යවන ලද බවත් උතුරු ප්‍රදේශයේ දි. වා. ඉ. විසින් දන්වන ලදි. අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර මෙරටට ආනයනය කිරීම කඩිනම් කරන ලෙස ඉ. වා. වි. ලේගෙන් ඉල්ලා සිටීමට තීරණය කරන ලදී

**බී. අක්කරයන්කුලම් ප්‍රවේශ මාර්ගය ගල් හා තාර දමා සකස්කිරීම**

පළමුවැනි හා දෙවැනි හා හයවැනි සැතපුම් ගල් හා තාර දමා සකස්කර ඇති බවත් පාර සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍යවන ද්‍රව්‍ය එකතු කරගෙන යන බවත් දි.වා.ඉ. දන්වීය. වෙන්කර දී ඇති සම්පූර්ණ මුදලම වැය කොට පාර නිමකරන ලෙස කමිටුව දි. වා. ඉ. ගෙන් ඉල්වා සිටියාය.

**සී. කිලිනොච්චි—වඩකච්චි—රාමනාදපුරම් පාර**

කෙනඩි පාර ඔස්සේ අවශ්‍ය වන ද්‍රව්‍ය සපයා ගෙන ඇති බවත් අලගරත්නම් පාරේ අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගැනීමේ කටයුතු කරගෙන යන බවත් දි. වා. ඉ. කියා සිටියේය. කිලිනොච්චි ජනපද වාසියනට ඇති ප්‍රධාන ප්‍රවේශ මාර්ගය මේ බවත් වර්ෂා කාලයේදී මෙම පාරේ බස් රථවලට ගමන් කිරීම දුෂ්කර හෙයින් එය ගල් හා තාර දමා සකස්කිරීම අවශ්‍ය බවත් කිලිනොච්චියේ පාර්ලිමේන්තු මන්ත්‍රී තුමා කියා සිටියේය.

**ඩී. අක්කරයන්කුලම්—වන්නේරි කුලම් පාර**

මෙම පාර පිළිබඳ ඇස්තමේන්තු 1967/68 කෙටුම්පත් ඇස්තමේන්තුවල අඩංගු කරන ලෙස වා. අධ්‍යක්ෂ වෙත යවන ලද බව ප්‍ර. වා. ඉ. දන්වා සිටියේය.

**ඊ. යාපනය දිස්ත්‍රික්කයේ පොළොව යට ඇති ජල සම්පත්**

මේ පිළිබඳව පරීක්ෂණ තවමත් කෙරී ගෙන යන බවත් ඊශ්‍රායල විශේෂඥයාගේ සහ ජල සම්පත් සමීක්ෂණය සම්බන්ධයෙන් දිස්ත්‍රික් කමිටුවට එවන ලද විශේෂ නිළධාරි (භූ විද්‍යා) තැනගේ අතුරු වාර්තා බලාපොරොත්තු වෙන් සිටින බවත් දි. වා. ඉ. කිය.

**එෆ්. වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් කුඹුරු ඇලවල් තැනීම**

" ප්‍රධාන යෝජනා ක්‍රම " යනුවෙන් විග්‍රහ කෙරෙනුයේ අක්කර සියයකට වඩා ප්‍රදේශයකට ජලය සැපයෙන ප්‍රධාන බෙදහැරීමේ ඇලවල්, කුඹුරු ඇලවල් සහ ප්‍රාරම්භක ස්ථාන සහිත යෝජනා ක්‍රමවලට බව දි. වා. ඉ. පැහැදිලි කෙළේය. ජනපද ව්‍යාපාරවල නම් ඉහතින් සඳහන් ප්‍රාරම්භක ස්ථාන හා ඇලවල් නඩත්තු කරනුයේ දෙපාර්තමේන්තුව මඟිනි. මේ නිසා සියළුම ජනපද ව්‍යාපාර ප්‍රධාන යෝජනා ක්‍රම යටතේ ගැනේ. සියළුම ගම් පුළුල් කිරීමේ ව්‍යාපාර සහ ග්‍රාමීය වැව් යටතේ වන ව්‍යාපාර වර්ග කරනුයේ සුළු කර්මාන්ත වශයෙනි. මේවායේ නඩත්තුව දිසාපතිවරයාගේ හෝ ස. ගො. ජ. සෙ. කො. ගේ පාලනය යටතේ ගොවීන් විසින්ම කර ගත යුතුය. ගොවීන් විසින් නඩත්තු කරන සියළුම ඇලවල් දෙපාර්තමේන්තුව විසින් ඉදිකර යුතුයයි රැස්ව සිටි මන්ත්‍රීවරු යෝජනා කළහ.

**ජී. උඩයාර්කට්ටුකුලම්හි වාරිමාර්ග පහසුකම්**

දැනටමත් ව්‍යාපාරයේ සිටින අයට 1967 වර්ෂය සඳහා වතුර නිකුත් කරනු ලැබේ. මෙම විෂයය හදිසි වැඩ සටහනට ඇතුළත් කර ඇති බව ද. වා. ඉ. කියා සිටියේය.

**එච්. කල්විලන්කුලම් දික්කිරීමේ ව්‍යාපාරය**

මෙම ව්‍යාපාරය දික් කිරීමේදී ප්‍ර. වැ. දේ. පාර වෙනත් අතකට හැරවීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී තීරණය කරන ලද බවත් එය විෂය ගත කළ යුතු බවත් දි. වා. ඉ. දන්වීය. දැනට මේ සම්බන්ධයෙන් පරීක්ෂණ කරගෙන යේ.

**අයි. රාමනාදපුරම්හි වාරිමාර්ග පහසුකම්**

වර්තමාන හදිසි වැඩ සටහන යටතේ ක්‍රියා කරගෙන යන බව දි. වා. ඉ. පැවසීය.

**ජේ. කාඩ්ඩුවාන්කොඩ්ඩි පාලම**

මෙම ස්ථානයේහි පස බුරුල් බවත් ආධාර කණු සිටුවීමට නොහැකි බවත් ජූලි මාසය අවසානයේදී පමණ කලපුව සිඳී යන විට මේ ගැන කටයුතු කරන බවත් දි. වා. ඉ. මේ වැඩකටයුතු කඩිනම් කරන ලෙස දි. වා. ඉ. ගෙන් ඉල්ලනු ලැබිනි.

**කේ. කුඹුරු ඉඩම්වලට ජලය සැපයීම පිණිස සුළඟින් ක්‍රියාකරණ පංකා**

මෙයට අවශ්‍යවන අමතර කොටස් දි. වා. ඉ. ට සපයන තුරු මෙය අළුත් වැඩියාවන් කළ නො හැකි බව ප්‍රකාශ වීනි. පොම්පය සඳහා අවශ්‍යවන අමතර කොටස් නිකුත්කිරීමේ කටයුතු ඉක්මන් කරන ලෙස ඉ. වා. වි. ලේගෙන් ඉල්වා සිටීමට කමිටුව තීරණය කළාය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එල්. මණ්ඩතිව්—කයිට්ස් මිරිදිය කලපු යෝජනා ක්‍රමය**

මේ සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යාංශය සමඟ කටයුතු කරගෙන යන බවත් සංවර්ධන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පිළිතුරක් අපේක්ෂාවෙන් සිටින බවත් අතිරේක දිසාපතිවරයා කියා සිටියේය. වාරිමාර්ග පහසුකම් සැපයෙන තුරු දිය බදු අය කර නොගැනීමට නිර්දේශ කිරීමට තීරණය විනි. දිය බදු අයකර නොගත යුතුයයි කයිට්ස් පාර්ලිමේන්තු මන්ත්‍රී තුමා කරුණු ඉදිරිපත් කොට පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කර සිටියේය. රැස්ව සිටි සියළුම මන්ත්‍රීවරුන්ගේ සහයෝගය මේ සම්බන්ධයෙන් ලැබුණි.

**යෝජනාව :**

"දියබදු අයකර නොගැනීම මෙම කමිටුව නිර්දේශ කරන අතර වෙනත් කරදිය බැහැරකිරීමේ යෝජනා ක්‍රම සම්බන්ධයෙන් මෙවැනි බදු අයකර නොගන්නා බව පෙන්වාදීමට මෙම කමිටුව කැමැත්තීය."

**එම්. කරදිය බැහැර කිරීමේ යෝජනා ක්‍රම බාරව සිටින්නෝ**

හානි සිදුවූ ගේට්ටු අළුත්වැඩියා කිරීම සහ අගුළු දැමීමේ කටයුතු දැනට කරගෙන යන බවත් ඒවා නිමවූ විට නඩත්තුව සඳහා ගොවිකාරක සභාවලට භාරදෙන බවත් දි. වා. ඉ. කීය.

**එන්. වලම්පන් ගොවි පොළ**

ප්‍රධාන තක්සේරුකරු විසින් මෙම ඉඩමේ වටිනාකම අක්කරයකට රු. 50 බැගින් තක්සේරු කර ඇති බවත් ඉඩමේ නොදියුණු වටිනාකමෙන් සියයට 4 බැගින් අයකර ගැනීමට ඉඩම් කොමසාරිස් විසින් බලය දී ඇති බවත් අතිරේක දිසාපති කීය. බදු කුලිය නියම කරන ලද්දේ වර්ෂයකට අක්කරයකට රු. 2 බැගිනි. මේ අළුත් ගාස්තු ක්‍රමයට ගෙවීම් කරන ලෙස සමිතියට උපදෙස් දෙන ලදී.

**ඕ. කළුන්දයි ලුණු ලේවාය**

මේ පිළිබඳව ඉඩම් කොමසාරිස්වරයාට ලියා යවා ඇති බව සහ සමිතිය විසින් බදු මුදල් ගෙවීම සම්බන්ධයෙන් පිළිතුරක් අපේක්ෂාවෙන් සිටින බවත් අතිරේක දිසාපති පැවසීය.

**පී. උරුතිරපුරම්හි ගංවතුර වැළැක්වීමේ වේල්ල**

උරුතිරපුරම් ග්‍රාම සංවර්ධන සමිතියට බාරදී ඇති මෙම වැඩය දැන් කරගෙන යන බව අතිරේක දිසාපතිවරයා දැන්විය.

**කිව්. පලිආරු අමුණු යෝජනා ක්‍රමය**

වගාකළ හැකි වපසරිය කොතෙක්දැයි නිශ්චය කරනු පිණිස ඉංජිනේරු සමීක්ෂණ සැලැස්මවල් අපේක්ෂාවෙන් සිටින බව දි. වා .ඉ. කීය.

**ආර්. වවුනිකුලම් වම් ඉවුරේ ඉඩම්වලට උත්ථාපන වාරිමාර්ග පහසුකම්**

අක්කර 134 කින් සමන්විත වන වම් ඉවුරේ බිම් කැබැලි 97 කට සහ දකුණු ඉවුරේ ඉඩම් කැබැලි 38 කට ජලය සැපයීමේ කටයුතු දැන් කරගෙන යන බවත් වම් ඉවුරේ හා දකුණේ ඉවුරේ වන අතිරේක අක්කර 134 කට ජල පහසුකම් 1968 දී ලබාදෙන බවත් දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු දන්වා සිටියේය.

**එස්. කුරුම්බසිඩ්ඩිහි පොම්ප කිරීමේ යෝජනා ක්‍රම**

පරීක්ෂන හා අත්හදා බැලීම් දැන් කරගෙන යන බව දි. වා. ඉ. කීය. ඇත්ත වශයෙන්ම සෙතක් වන්නේ කොපමන වපසරියකටද යන්න තීරණය කර හැක්කේ භූගර්භ විද්‍යා පිළිබඳ විශේෂ නිලධාරි තැනගේ අවසාන වාර්තාව ලැබීමෙන් පසුවය.

**ටී. එලිෆන්ට්පාස්හි මිරිදිය කලපු යෝජනා ක්‍රමය**

නැගෙනහිර දෙසින් මැටියෙන් බැම්මක් බැඳීම සඳහා වන ඇස්තමේන්තුව අනුමත කර ඇති බවත් එම කටයුතු කර ගෙන යෑම ලුණු සංස්ථාවට පවරා ඇති බවත් දි. වා. ඉ. පැහැදිලි කළේය. ජල මට්ටම පහත බැස ගිය පසු මේ ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කෙරෙනු ඇත. දුම්රිය පාලම අසල ආරක්ෂක කටයුතු දැන් නිමවෙමින් පවතී. ඒවා නිමවූ විට කරදිය ගලා ඒම සම්පූර්ණයෙන්ම නවතී.

**යූ. කරියාලෙයි—නාගපඩ්ඩුවාන් යෝජනා ක්‍රමය**

මෙම ව්‍යාපාරය යටතේ වන අක්කර 766 ක වන ප්‍රදේශයකට වාරිමාර්ග පහසුකම් 1967 දී සපයන බව දි. වා. ඉ. කමිටුවට සහතික කොට කීවේය.

කෙවිල් කුලම් නැමැති වැවක් ඉඩෙයිකඩුහි තිබෙන බවත් ඒ සම්බන්ධයෙන්ද පරීක්ෂා කළ යුතු බවත් කෝපායි මන්ත්‍රීවරයා කමිටුවට කරුණු ඉදිරිපත් කර සිටියේය. මෙම විෂයද ප්‍රමුඛත්ව ලැයිස්තුවට ඇතුළත් කොට පරීක්ෂණ පවත්වා කමිටුවට වාර්තාවක් සැපයීමට දි. වා. ඉ. පොරොන්දු විය.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ආ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ඒ. යාපනය දිස්ත්‍රික්කය සඳහා රසායන පොර

පොර සංස්ථාවේ සභාපතිවරයාගේ 67.1.29 වැනි දින දරණ ලිපිය ඉදිරිපත් කරන ලදී. ආහාර නිෂ්පාදනය පිළිබඳ ව්‍යාපාරය කරන කොට ගෙන හදිසියෙන් රසායන පොර අවශ්‍ය නිසා තුනුකායිහි පොර ගබඩාවක් ඉදිකිරීම කඩිනම් කරන ලෙස ඉල්ලා සිටීමට තීරණය විය.

යාපනය පර්යේෂණ මධ්‍යස්ථානයක් අවශ්‍ය යයි කියා සිටි නල්ලූර් පාර්ලිමේන්තු මන්ත්‍රිවරයා එය කවද පිහිටුවනු ලැබේදයි දැන ගැනීමට කැමැත්ත පළ කළේය. මේ සඳහා උපයෝගී කරගත හැකි අක්කර පනහක පමණ ඉඩමක් තින්නවේලි ගොවිපොළ අසල පිහිටා ඇති බව අතිරේක දිසාපතිවරයා කීය. මෙම ඉඩම රජයේ යයි අදහස් කරනු නමුත් එයට හිමිකම් ඉදිරිපත් කරන අයද සිටිති. අප්‍රමාදව පර්යේෂණ ස්ථානයක් පිහිටුවනු වස් මේ සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂකට කරුණු ඉදිරිපත් කළ යුතුයයි තීරණය විය.

බී. මිදි වගාව

මිදි වගාව සඳහා සුදුසු ප්‍රදේශ කවරේ දැයි හා පුහුණුව සඳහා ඉන්දියාවට කෘෂිකර්ම උපදේශකයෙකු යැවෙේදැයි නල්ලූර් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා දි. කෘ. ව්‍යා. නි. ගෙන් විමසුවේය. මාදගල් උරුම්පිරායි හා කොකුවිල් යන ප්‍රදේශ මිදි වගාවට සුදුසු යයි දි. කෘ. ව්‍යා. නි. පිළිතුරු දුන්නේය. 66.11.17 වැනි දින පැවැති දි. කෘ. කමිටු රැස්වීමේ දී ගත් තීරණය සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂගේ අවධාන යොමු කරවීමටත් " අනබ් ඒ සහීබ් " නම් වර්ග ආනයන කිරීම සහ මේ කටයුතු පිළිබඳව කෘෂිකර්ම උපදේශක වරයෙකුට පුහුණුවක් දීම සම්බන්ධයෙන් නිසි පියවර ගන්නා ලෙස ඔහුගෙන් ඉල්ලා සිටීමටත් තීරණය විය.

සී. පට්ටි මධ්‍යස්ථානය

මෙම දිස්ත්‍රික්කයෙහි පශු වෛ. නි. තනතුරු සියල්ලම දැන් පුරවා ඇති බවත් යාපනයට අතිරේක පශු වෛ. නි. කෙනෙකු ලබා දී ඇති බවත් සභාපතිවරයා කියා සිටියේය. සත්ව පාලන හා නිෂ්පාදන නියෝජ්‍ය අධ්‍යක්ෂ වරයාගෙන් ලැබුණු ලිපියක් ඉදිරිපත් කෙරිණ. පිරිහුණු ගොනුන් සියළු දෙනාම කර ඇඹිය යුතු බවත් සෑම පට්ටි මධ්‍යස්ථානයකටම නුමුහුන් ජර්සි පට්ටි ගොනුන් ලබා දිය යුතු බවත් නල්ලූර් පාර්ලිමේන්තු මන්ත්‍රිවරයා කීය.

කිලිනොච්චි රසායනාගාරයේ තදබල ඖෂධ හිඟයක් බලපවත්වන බවත් ගම්මුන්ට තමන්ගේ අවශ්‍යත පෞද්ගලික වෙළඳුන්ගෙන් මිළදී ගැනීමට සිදුවී ඇති බවත් කමිටුවේ සැළකිල්ලට කිලිනොච්චියේ පාර්ලිමේන්තු මන්ත්‍රිවරයා ප්‍රකාශ කළේය. තමන් විසින් ඉල්ලා සිටුනු ලබන ඖෂධ සම්පූර්ණ ප්‍රමාණය තමන්ට ලබා නොදෙන බව වාවාකච්චේරියේ පශු වෛ. නි. පැහැදිලි කර සිටියේය. ඉල්ලා සිටිනු ලැබූ ඖෂධවල ලැයිස් තුවක් සහ සපයන ලද ඖෂධ පිළිබඳ ලැයිස්තුවක් තමාට ලබා දෙන ලෙස පශු වෛ. නි. ගෙන් ඉල්ලා සිටි මන්ත්‍රි වරයා එවිට ඒ සම්බන්ධයෙන් තමාට ඇමැති තුමා සමඟ කටයුතු කළ හැකි බව කියා සිටියේය.

(ඉ) ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

ඒ. සුළි සුළඟින් විපතට පත් ධීවර කාර්මිකයන්ට ගෙවල් 200 ක් ඉදිකිරීම

පදිංචිකරවීමේ ප්‍රශ්නය සැළකිල්ලට භාජනය විය. ඉඩම් නිරවුල්කිරීමේ ආඥපනත යටතේ කටයුතු කළ හැකිවනු වස් රජයේ ඉඩම් සියල්ලම සම්බන්ධයෙන් සැළසුම් පිළියෙල කිරීමට මෙහිදී තීරණය විය.

දිස්ත්‍රික්කය සඳහා නිරවුල්කිරීමේ නිලධාරීන් පත්කළ යුතු බවත් මේ සම්බන්ධයෙන් දිසාපතිවරයා විසින් නිරවුල්කිරීමේ නිලධාරි සමඟ කටයුතු කළ බවත් රැස්වසිටි මන්ත්‍රිවරු යෝජනා කළහ. ළඟදී පත් කෙරෙනු ලබන අතිරේක දිස්ත්‍රික්ක නිලධාරි තැනට මේ කටයුතු කළ හැකි බව අතිරේක දිසාපතිවරයා පැවසීය. නිරවුල් කිරීමේ කටයුතු සම්බන්ධයෙන් නිලධාරියෙකු පුහුණුකිරීමට තීරණය විය.

(ඊ) ඉඩම් දෙපාර්තමේන්තුව

ඒ. රක්ෂා නැති තරුණයින් පදිංචිකරවීමේ යෝජනා ක්‍රමය

මුතුඉයන් කඩ්ඩු ව්‍යාපාරයෙහි පදිංචිකරවීම පිණිස උගත් තරුණයින් යැවීමට තීරණය කර ඇති බව අතිරේක දිසාපතිවරයා කමිටුවට දැන්විය. මෙම තරුණයින්ට එළිකළ ඉඩම් සහ රජයේ ණය මුදල්ද ලැබෙනු ඇත. මෙම දිස්ත්‍රික්කයේ තරුණයින් සඳහා ඉඩම් කැබැලි 250ක් ලබා දෙනු ලැබේ. මෙම ව්‍යාපාරය සඳහා වන ඉඩම් කච් චේරිය යළි ප්‍රසිද්ධ කිරීමට ඒකච්ඡන්දයෙන් තීරණය විනි. ළඟදී පැවැත්වෙන ඉඩම් කච්චේරියේදී තෝරාගත යුත්තේ ගැමියන්ද එසේ නැත්නම් උගත් තරුණයින්දැයි බටහිර මාලි හි ප්‍රා. නි. එන්. මානික්කනධරාසා මහතා මෙහිදී ප්‍රශ්න කළේය. කුසලතාවය අනුව ගම්මුන් මෙන්ම උගත් තරුණයින් ද ප්‍රා. ආ. නි. වරුන් විසින් තෝරා ගත යුතුයයි තීරණය කරනු ලදී.

බී. ග්‍රාමීය වැව්වලින් පස් ඉවත් කිරීම

මෙම කාරණය සම්බන්ධයෙන් නීතිමය ප්‍රශ්නයක් පැන නඟින බව කියා සිටි කයිට්ස් පාර්ලිමේන්තු මන්ත්‍රි වරයා, ගම්මුන් විසින් සාමාන්‍යයෙන් ප්‍රයෝජනයට ගන්නා මෙම වැව් රජයට පවරා ඇති බව මෙහිදී පැහැදිලි කළේය. මෙම වැව් තමන්ට අයිති බව ග්‍රාමීය අධිකාරීන් දැන් කියා සිටින බවත් ඒවා ප්‍රජා සංවර්ධනය සඳහා,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවශ්‍ය බවත් දන් පැහැදිලිවේ. රජයට වියදමක් නොවන පරිද්දෙන් ගම්මුන් විසින් ගැඹුරු නොකරන ලද මේ වැව් ප්‍රාදේශීය බල මණ්ඩලවලට පවරා දෙන ලෙස ඉල්ලීමක් කැරිනි. මෙම වැව්වලට අවශ්‍ය වැඩිදියුණු කිරීම් තමන්ගෙ දෙපාර්තමේන්තුව මඟින් ඉටුකරන බව කියා සිටි සා. ගො. කො. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් ගම් සභාවලට ගෙවීමක් කළ නොහැකි බව කියා සිටියේය. පහත සඳහන් ස්ථානයන්හි පිහිටි වැව් වැඩි දියුණුකිරීම සඳහා වහාම කටයුතු කළ යුතුයයි කිලිනොච්චියේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ඉල්ලා සිටියේය.

1. වඩ්ඩකච්චි,
2. උමායල්පුරම්,
3. රාමනාදපුරම්,

වාරිමාර්ග කටයුතු සඳහා අවශ්‍ය නොවන සියළුම ග්‍රාමීය වැව් පවරාදීම සඳහා කටයුතු කළ යුතුයයි තීරණය විය.

**සී. මන්නාරම් දිස්ත්‍රික්කයෙහි තරුණයින් පදිංචිකරවීම**

මේ සම්බන්ධයෙන් මන්නාරමේ දිසාපතිවරයාගේ අවධානය යොමුකරවීමට තීරණය විය.

**ඩී. ධර්මපුරම් කට්ටිකරුවන් සඳහා කුඹුරු ඉඩම්**

මෙය ප්‍රතිපත්තිමය කරුණක් බවත් පෙළපතින් චේවා ලියාපදිංචි කිරීමෙන් චේවා රටේ පුරවැසියන් වන අයටත් අක්කරය බැගින් ඉඩම් බෙදදෙන බව අතිරේක දිසාපතිවරයා දන්විය. පුරවැසියන් නොවන අයට රජයේ ඉඩම් බෙද දෙනු නොලැබේ.

**ඊ. බීඩි දුම්කොළ**

බීඩි එතීමේ කොළ හිඟ කම කරණ කොටගෙන මෙම දිස්ත්‍රික්කයේ බීඩි කර්මාන්තය අණතුරුදයක තත්ත්වයකට පත්ව ඇති බව කියා සිටි නල්ලූර්හි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා බීඩි ඔතන කොළ සෑහෙන ප්‍රමාණයක් සපයා ලීමට සෑම උත්සාහයක්ම දැරිය යුතුයයි ඉල්ලා සිටියේය. බීඩි දුම්කොළ වගා කිරීම වෙනුවට ලූණු මිරිස් හා අර්තාපල් වගාව ගැන උනන්දුවිය යුතු බව අතිරේක දිසාපතිවරයා යෝජනා කළේය. මිරිස්, දිලිර රෝගයනට භාජනය වන හෙයින් බීඩි දුම්කොළ හා අර්තාපල් ශක්ෂමාරු ක්‍රමයට වගා කළ යුතුයයි මෙහිදී ජේදුරුතුඩුව මන්ත්‍රී වරයා කියා සිටියේය. පහත සඳහන් යෝජනාව නල්ලූර් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින් ඉදිරිපත් කරනු ලදු ව කිලිනොච්චිහි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව :

"බීඩි දුම්කොළ වෙනුවට අතිරේක ආහාර බෝග ද්‍රව්‍ය වගා කරවීමට උනන්දුවිය යුතුයයි මෙම දිස්ත්‍රික්ක කෘෂිකාර්මික කමිටුව රජයෙන් ඉල්ලා සිටී."

රැස්ව සිටි අනිත් මන්ත්‍රීවරු මෙම යෝජනාවට පක්ෂවූහ.

**එෆ්. කිලිනොච්චියේ අලෙවි පහසුකම්**

පසුගිය සති දෙක තුළ අලෙවි දෙපාර්තමේන්තුවේ වෑන් රථය කිලිනොච්චි හා තුනුකායි ප්‍රදේශවලට නොගිය හෙයින් මෙම ප්‍රදේශ දෙකේ නිෂ්පාදකයින්ට බරපතල පාඩු විඳදරීමට සිදු වූ බව කිලිනොච්චියේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා දන්වා සිටියේය. මෙම ප්‍රදේශවලට නිතිපතා චාරිකා යෙදීමට කටයුතු කරන බව අලෙවි සං. කො. ගේ නියෝජිතයා කියා සිටියේය. තුනුකායිහි මිළට ගැනීමේ ස්ථානයක් පිහිටුවීමට ඉල්ලා සිටින ලෙසද තීරණය විය.

**ජී. පරන්තන් පුනාකරි පාරේ 3 1/2 සැතපුම් කණුව කුංචුපරන්තන් හි දී ලූණු මිශ්‍ර කුඹුරු ඉඩම්**

නිලන් ආරු, කොල්ලන්ආරු සහ කල්ආරු සම්බන්ධයෙන් පරීක්ෂණ නිමවී ඇති අතර සැළසුම් සකස්කිරීමේ කටයුතු කෙරිගෙන යන බව දි. වා. ඉ. දන්විය.

**එච්. අක්කරයන්කුලම්–කොඩෙයිකඩ්ඩිනකුලම් පාර**

යථෝක්ත පාර සඳහා රුපියල් පනස්දහසක මුදලක් වෙන්කර ඇති බව දි. ඉ. නි. 1 දන්විය. 1967 ජුනි මාසය අවසානයට පෙර ඇස්තමේන්තු හා සැළසුම් දි. වා. ඉ. විසින් සැපයිය යුතු යයි තීරණය විය.

**අයි. කැලෑ ආරක්ෂක ඉඩමෙන් ඉඩම් නිදහස් කිරීම**

උතුරු කොට්ඨාශයේ අඩවි වන නිලධාරි තැනගෙන් ලැබී ඇති 67.3.20 දින දරණ ලිපිය ඉදිරිපත් කොට සාකච්ඡා වට භාජනය කෙරිනි. මේ පිළිබඳව තව දුරටත් කටයුතු කරගෙන යන ලෙස අතිරේක දිසාපතිගෙන් ඉල්ලුම් කෙරිනි.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජේ. ඇලවල වතුර පිටවීම පිණිස ස්වාභාවික විවර**

මේ පිළිබඳව ඉ. වා. වී. ලේගෙන් පිළිතුරක් අපේක්ෂාවෙන් සිටින බව කමිටුවට දන්වන ලදි. අද හවස දිසාපතිවරයා හමුවීමට එන ඉ. වා. වී. ලේ. සමඟ මේ කාරණය සාකච්ඡා කළ යුතු බවත් වර්ෂා කාලය එළඹීමට කලින් වැඩ නිමකළ යුතු හෙයින් මේ තීරණය ගැන ඔහුට දන්විය යුතු බවත් කිලිනොච්චි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා යෝජනා කළේ ය.

**කේ. කල්ගිය ණය මුදල් අත්හැර දැමීම**

1958, 59 ට පෙර දෙන ලද කෘෂිකාර්මික ණය මුදල් සියල්ල අතහැර දැමීමට අමාත්‍යාංශය තීරණය කර ඇති බව අතිරේක දිසාපතිවරයා කමිටුවට දැන්විය. 64–65 දී දෙන ලද ණය මුදල් වෙන් වෙන් වශයෙන් සළකා අස්වැන්න ආලාපාලුවක් සිදුවී තිබෙන්නේ දැයි ඒ එකක් සම්බන්ධයෙන් නිශ්චය කරනු ලැබේ.

**එල්. ගොවි හමුදව**

ආහාර නිෂ්පාදන ව්‍යාපාරය වඩා වේගවත් කිරීමේ අටියෙන් ගොවි හමුදවේ ඒකක මේ දිස්ත්‍රික්කයේ පිහිටුවීමේ වැදගත්කම කිලිනොච්චියේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා කියා සිටියේය. ඒ සඳහා පහත සඳහන් පෙදෙස් තෝරා ගන්නා ලදී. කමිටුවේ තීරණය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ලේකම්වරයාට සහ ගොවි හමුදවේ කොමසාරිස්වරයාට දැන්විය යුතුයයි නිගමනය කරන ලදී. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය සමඟ තමාට කටයුතු කිරීමට හැකිවනු වස් ඒ නිලධාරින්ට යවන ලිපියේ පිටපතක් තමාට ලබා දෙන ලෙස කිලිනොච්චියේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා කියා සිටියේය.

තෝරාගත් ප්‍රදේශ ප්‍රමුඛත්වය අනුව :

1. කරියාලෙයි නාගපාඩ්ඩුවන්.
2. පෙනියන්කුලම්,
3. අම්බලපේරුමල්කුලම්,
4. වන්නේරිකුලම්,

කිලිනොච්චියේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයා විසින් පළකළ අදහස්වලට අනිත් මන්ත්‍රීවරු සියළු දෙනම එකඟ වූහ. ඒ අතරම ඉහතින් සඳහන් වැව් යටතේ ඉදිකිරීමේ කටයුතු දැන් කරගෙන යන හෙයින් මෙම කාරණය සඳහා දැඩි ප්‍රමුඛත්වයක් දිය යුතුයයි කියා සිටින ලදී. දැනට කරියාලෙයි නාගපාඩ්ඩුවන් හි ඒකකයක් නතර කර තැබීමට වහාම ක්‍රියා කළ යුතුය.

ගොවි හමුදව විසින් ඉටුකළ හැකි වැඩ කොටස් තිබෙන වැව්වල ලැයිස්තුවක් සපයන ලෙස දි. වා. ඉ. ගෙන් ඉල්වා සිටිනු ලැබිනි.

**එම්. කෘෂිකාර්මික හා කාර්මික ප්‍රදර්ශණ**

ඉහත සඳහන් ප්‍රදර්ශන සඳහා සාන්ත යෝහන් විද්‍යාලීය භූමිය තෝරා ගැනීමට හේතු අතිරේක දිසාපතිවරයා විසින් කමිටුව ඉදිරියේ තබන ලදී.

1. ප්‍රදර්ශනය නගරයේ පැවැත්වීමට තීරණය කර තිබුණු අතර නගර ප්‍රදේශයේ සෑහෙන ඉඩකඩ සහ සුදුසු ගොඩනැගිලි සහිත ස්ථානයක් ඇත්තේ සාන්ත යෝහන් විද්‍යාලයේය.
2. විද්‍යාලය භූමිය සහ ගොඩනැගිලි නොමිලේ පාවිච්චි කිරීමට පාසැල් අධිකාරින් විසින් ඉඩදීමට තීරණය කර ඇත.
3. අනිත් පාඨශාලා පැවැත්වෙන කාලය වන ජූලි 27–31 අතර තුර සිය පාසැල වසාදමා මෙම භූමිය ලබාදීමට සාන්ත යෝහන් විද්‍යාලය එකඟව ඇත. මේ නිසා පාසැල් සිසුන්ටද ප්‍රදර්ශණය නැරඹීමට හැකිවේ.
4. ප්‍රදර්ශනය සංවිධානය කිරීමට භාරව සිටින නිලධාරීන් මහලේකම් කාර්යාලයේ සේවය කරන නිසාත් යථෝක්ත භූමිය ඒ අසල පිහිටා ඇති නිසාත් මෙම නිලධාරීන්ගේ සාමාන්‍ය රාජකාරිවලට බාධාවක් නොවන පරිද්දෙන් ප්‍රදර්ශනය සංවිධානය කිරීමේ කටයුතු කරගෙන යා හැකිවේ.

ජූලි 27 වැනිද ප්‍රදර්ශනය විවෘත කිරීම පිණිස ගරු අගමැති තුමාටත් අනිත් දින හතරෙහි ප්‍රදර්ශණය විවෘත කිරීමට කෘෂිකර්ම හා ආහාර, කර්මාන්ත හා ධීවර, ස්වදේශ කටයුතු සහ ඉඩම් වාරිමාර්ග හා විදුලිය බලය පිළිබඳ ගරු ඇමැතිවරුන්ට ආරාධනා කළ යුතුයයි දෙස්තර ඊ. එම්. වී. නාගනාදන් මහතා යෝජනා කළේය. ඒ යෝජනාව කයිට්ස් පාර්ලිමේන්තු මන්ත්‍රී එන්. නවරත්නම් මහතා විසින් ස්ථිර කරනු ලැබිනි.

**එන්. පොල්පැල තවාන්**

ලුණුවිල පිහිටි පොල් පර්යේෂණ ආයතනයේ වැඩ බලන අධ්‍යක්ෂ තැන විසින් එවන ලද 67.2.21 දරණ ලිපිය ඉදිරිපත් කර සාකච්ඡාවට භාජනය කරන ලදී. කිලිනොච්චියේ ගම් වැසියන්ට සිය අවශ්‍යතා කිලිනොච්චි තවානෙන් ලබාගැනීමට නොහැකි බව කිලිනොච්චියේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා කියා සිටියේය. කිලිනොච්චියේ තවාන පුළුල් කළ යුතු බවත් අළුතෙන් තවානක් පලෙයි හි පිහිටිය යුතු බවත් ඔහු යෝජනා කළේය. යාපනය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිස්ත්‍රික්කයේ අවශ්‍යතා සපුරාලීමට අලම්බිල් හි පිහිටි තවාන අපොහොසත් වන හෙයින් වෙනත් ප්‍රදේශවලින් පලෙයිවලට හෝ කිලිනොච්චියට පොල් පැල ගෙනවුත් බෙදා දිය යුතුයයි නල්ලූර් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා යෝජනා කළේය. දැනට අනුගමනය කරන ක්‍රමය වන සියළුම ගෙවීම් ලුණුවිලදී කිරීමේ පුරුද්ද අතහැර ඒ වෙනුවට පලෙයි පරියේෂණ ස්ථානයේදී ගෙවීම බාරගැනීමට පොල් පරියේෂ ආයතනය මඟින් විධිවිධාන යෙදිය යුතුයයි කිලිනොච්චි මන්ත්‍රීවරයා කිය. ඒ යෝජනාව රැස්ව සිටි අනිත් මන්ත්‍රීන් විසින් අනුමත කෙරිනි.

අ. කිලිනොච්චියේ දැනට ඇති තවාන පුළුල් කිරීමට ;

ආ. අතිරේක තවානක් පලෙයිහි පිහිටුවීමට ඉල්ලා සිටීමට තීරණය කරන ලදී.

3. ප්‍රගති වාර්තා සහ වැඩ සටහන්

ඒ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ඉදිරිපත් කරන ලදී.

පහත සඳහන් විෂයයන්ට ප්‍රමුඛත්වය දිය යුතුයයි තීරණය විය.

1. ඉරණමඩු වැව දීර්ඝ කිරීම,
2. කණගම්බිකායි අරන්කුලම්,
3. ඉයන්කන්කුලම්,
4. පුතුමුරිප්පු දීර්ඝ කිරීමේ ව්‍යාපාරය.
5. නැගෙනහිර අරියාලෙයි කරදිය බැහැර කිරීමේ ව්‍යාපාරය.

වුයිආරු ඔයට ඉහලින් පාලමක් ඉදිකිරීම අවශ්‍ය බව සහකාර දිසාපතිවරයා විසින් පවසන ලදී. මේ සඳහා අරමුදල් තිබෙන බවත් එහි කටයුතු 67–88 මහ කන්නයට කලින් නිමකරන බවත් දි. වා. ඉ. දැන්විය,

පහත සඳහන් විෂයයන්ද ප්‍රමුඛත්ව ලැයිස්තුවේ අඩංගු කළ යුතුයයි දි. වා. ඉ. සඳහන් කළේය.

1. වියගකුලම් 41 වන විෂය වශයෙන්,
2. කෝලන්කමම් 42 වන විෂය වශයෙන්,
3. පෙරියතම්බිකුලම්හි පිහිටි පොක්කනෙයි 43 වන විෂය වශයෙන්,
4. කුරුක්කඩල් ව්‍යාපාරය 44 වන විෂය වශයෙන්,
5. ඉඩෙයිකඩු හි පිහිටි කේවල්කුලම් 45 වන විෂය වශයෙන්,
6. තිරුවයිආරු වාරිමාර්ග යෝජනා ක්‍රමය 46 වන විෂය වශයෙන්,

මෙයට එකඟවන ලදී.

බී. ගොවිජන සේවා

ඉදිරිපත් කරන ලදී.

සී. සමුපකාර සංවර්ධනය

ඉදිරිපත් කරන ලදී.

ඩී. අලෙවි දෙපාර්තමේන්තුව

ඉදිරිපත් කරන ලදී.

මිළට ගැනීමේ මධ්‍යස්ථානයක් වශයෙන්ද උපයෝගී කරගත හැකි අලෙවිකිරීමේ වෙළඳ සැලක් තුනුකායි හි විවෘත කළ යුතුයයි කමිටුව තීරණය කළාය. කිලිනොච්චි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව නල්ලූර්හි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව—"ප්‍රාදේශීය නිෂ්පාදකයින්ගේ යහපත තකා තුනුකායි හි ස්ථිර මිළටගැනීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම නිර්දේශ කරන අතර රජය මේ ගැන වහාම පියවර ගත යුතුයයි මෙම කමිටුව තීරනය කරන්නීය."

මෙම කාරණය සම්බන්ධයෙන් අලෙවි සංවර්ධන කොමසාරිස්වරයා ඇමතිමට තීරණය විය.

මෙම දිස්ත්‍රික්කයේ නිෂ්පාදනය කරන බොම්බෙයි ලූණු හා අර්තාපල් කොළඹට ගෙනගොස් විකුණන අතර මෙම දිස්ත්‍රික්කයේ අයට ඒවා නොලැබෙන බවත් පේදුරුතුඩුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා කීය. ඔහු විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව කිලිනොච්චියේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින් ස්ථිර කරන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**යෝජනාව.**—"යාපනය දිස්ත්‍රික්කයේ නිපදවන ලද බොම්බෙයි ළූනු හා අර්තාපල් මේ දිස්ත්‍රික්කයේ පාරිභෝගිකයින්ට විකිණිය යුතුයයි මෙම කමිටුව යෝජනා කරන්නීය."

රැස්ව සිටි අනිත් මන්ත්‍රීවරු මෙම යෝජනාවට එකඟත්වය පළ කළහ.

**ඊ. පශු වෛද්‍ය නිලධාරි**

ඉදිරිපත් කරන ලදී.

කිලිනොච්චි මැතිවරණ කොට්ඨාශයේ පට්ටි සේවා තිබේදැයි නල්ලූර් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් පට්ටි මධ්‍යස්ථානය පිහිටියේ පරන්තන්හි යයි පශු වෛ. නි. කියා සිටියේය. අවශ්‍ය සංඛ්‍යා ලේඛන නොතිබුණු හෙයින් පසුගිය කාර්තුව තුළදී මෙම මධ්‍යස්ථානයෙහි සේවා කියක් නිමකරන ලදදැයි තමාට දැන්විය නොහැකියයි ඔහු කීය.

කෘතිම සිංචන මධ්‍යස්ථානයක් ඩෙල්ෆ්ට් හි විවෘත කළ යුතුයයි කයිට්ස් හි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා යෝජනා කළේය. ඩෙල්ෆ්ට් හි පට්ටි මධ්‍යස්ථානයක් පිහිටුවා තිබුණු බවත් අවශ්‍ය සේවා ප්‍රමාණය මඳ වූ බැවින් ඒ වසා දැමූ බවත් පශු වෛද්‍ය නිලධාරි පැහැදිලි කළේය. ඩෙල්ෆ්ට් හි කෘතිම සිංචන මධ්‍යස්ථානයක් පිහිටීමේ දුෂ්කරතාවය නම් ප්‍රවාහන අපහසුකම් ය. මේ සම්බන්ධයෙන් සත්ව පාලන නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ඇමතීමට තීරණය විය.

**එෆ්. ඉඩම් සංවර්ධනය**

ඉදිරිපත් කරන ලදී.

කිලිනොච්චියෙහි පිහිටි දිස්ත්‍රික් ඉඩම් නිලධාරි නිවාස ඉදිකිරීමේ කටයුතු දැන් කරගෙන යන බව මාන්කුලම් ඉඩම් සංවර්ධන නිලධාරි තැන කිලිනොච්චියේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් පැවසීය. වටකච්චියට උළු සැපයීම සම්බන්ධයෙන් ඔහු කියා සිටියේ නිකුත් කිරීමට අවශ්‍ය උළු ප්‍රමාණය තිබෙතත් ප්‍රවාහන පහසුකම් සැපයීමට තමා අපොහොසත් බවය. වටකච්චි හා මොරසුමොට්ටෙයි ජනපද කට්ටි කරුවන්ට උළු සැපයීමට කඩිනමින් ක්‍රියා කරන ලෙස කිලිනොච්චි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා කීය.

**ජී. කෘෂිකර්මය**—ප්‍රගති වාර්තාව දි. කෘ. ව්‍යා. නි. විසින් ඉදිරිපත් නොකරන ලදී.

කිලිනොච්චි මැතිවරණ කොට්ඨාශයේ උරතිරපුරම් වඩකච්චි රාමනාදපුරම් වැනි ප්‍රදේශවල වී අස්වැන්න වැඩි දියුණු කිරීම සඳහා ක්‍රමයක් පිළිබඳව වාර්තා කරන ලෙස කිලිනොච්චි පාර්ලිමේන්තු මන්ත්‍රී වරයා දි. කෘ. ව්‍යා. නි. ගෙන් ඉල්ලීය.

**4. නියාය පත්‍රයේ විෂයො.**

**1. කල්මඩුකුලම් හි සිරුකෝක්කම් වගාව සඳහා වාරිමාර්ග පහසුකම්**

මේ පිළිබඳව සොයා බලා සවිස්තර වාර්තාවක් තමා ඉදිරිපත් කරන ලද දි. වා. ඉ. කියා සිටියේය. මෙම යෝජනා ක්‍රමය කරන කොට ගෙන කන්දවලෙයි සහ පුලියම් පොක්කනෙයි කට්ටි කරුවන්ට යහපතක් සිදුවන බව කමිටුවට දන්වන ලදී.

**II. ඩයි ආරු සඳහා කුළුණු සොරොව්ව**

මීළඟ කන්නයේදී කුළුණු සොරොව්ව නිමකැරෙන බව දි. වා. ඉ. කීය.

**III. ගව කොටු**

ගවයින් 3,000ක් පමණ දඩාවතේ හැසිරෙන බවත් ගව කොටු ඉදිකිරීම පිණිස ගම්මුන්ට ණය මුදල් ලබා දිය යුතු බවත් ඩෙල්ෆ්ට් පා. ආ. නි. ප්‍රකාශ කළේය. වගා කළ ඉඩම්වලට ගවයින් කඩා වැදීම වැලැක්වීම පිණිස ඩෙල්ෆ්ට් දූවේ සිටින හිලෑ නොකල අස්වයින් අපනයන කළ යුතුයයි ඔහු කීවේය. ඩෙල්ෆ්ට් හි සත්ව පාලන සංවර්ධනය සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමට පේදුරු තුඩුවේ පාර්ලිමේන්තු මන්ත්‍රී තුමා ප්‍රා. ආ. නි. සහ පශු වෛ. නි. ගෙන් සමන්විත වන කමිටුවක් පත් කළ යුතුයයි අතිරේක දිසාපතිවරයා යෝජනා කළේය.

ඒ යෝජනාව කමිටුව විසින් අනුමත කරන ලදී.

**IV. කල්විලන් ආරු ඔයට ඉහලින් පාලම තැනීම**

1967 මැයි මස 26 වැනිදට නියම කරගෙන ඇති දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ කමිටුවේදී මෙම ප්‍රශ්නය ගැන සාකච්ඡා කිරීමට ඒකමතිකව තීරණය කරන ලදී.

**V. අක්කරයන් කුලම් දෙවන පියවරෙහි කට්ටිකරුවන්ට නිවාස ඉදිකිරීම**

මේ ප්‍රතිපත්ති තීරණයක් බව අතිරේක දිසාපති තැන විසින් කමිටුවට දන්වනු ලදු ව මේ සම්බන්ධයෙන් මීළඟ මුදල් වර්ෂයේදී කටයුතු කිරීමට තීරණය විය. මෙම කටයුත්ත ශ්‍රමදාන ක්‍රමය අනුව ඉටුකළ නොහැකිදැයි නල්ලූර් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ඇසීය. ඊට පිළිතුරු දුන් කිලිනොච්චි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා කීවේ කට්ටි කරුවන් ඒ ගැන අකමැත්ත පළකරන බවයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

5. වෙනත් කටයුතු

ඒ. වගා රක්ෂණ ගාස්තු කලට වේලාවට ගෙවීම

කිලිනොච්චි ප්‍රදේශයේ 66/67 මහකන්නය වෙනුවෙන් වගා රක්ෂණ ගෙවීම් සම්බන්ධයෙන් දැඩි ප්‍රමාදයක් සිදුවී ඇති බැව් කිලිනොච්චි පාර්ලිමේන්තු මන්ත්‍රිවරයා පැමිණිලි කළේය. මේ ගෙවීම් කඩිනම් කළ යුතු යයි ගොවි ජන සේවා කොමසාරිස්ගෙන් ඉල්ලා සිටිය යුතුයයි ඔහු පැවැසිය. ප්‍රමාද වූ ඉල්ලීම් රාශියක් ඇති බවත් එවැනි ඉල්ලීම 502 ක් ගොවි ජන සේවා කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇති බැව් සහකාර කොමසාරිස්වරයා විසින් දන්විය. මේ ගෙවීම් කඩිනම් කරන ලෙස ගොවිජන සේවා කොමසාරිස් විසින් (වගා රක්ෂණ අංශය) ගෙන් ඉල්ලා සිටීමට කමිටුව නිගමනය කළාය.

බී. ජල අයිතිවාසිකම් පවරාදීම

ජල අයිතිවාසිකම් පවරා දීම 68.1.1 වැනි දින සිට නතර කර දැමිය යුතුයයි කිලිනොච්චි මන්ත්‍රිවරයා පැවසීය. ඇතැම් අය ජල අයිතිවාසිකම් මිළයට ගන්නා නමුදු සිය ඉඩම් වගා කිරීමට අපොහොසත් වන බැව් දි. කෘ. ව්‍යා. නි. පැහැදිලි කළේය. මෙම ප්‍රශ්නය වැඩිදුරටත් සළකා බැලියයුතු හෙයින් එය මිළඟ දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීමේදී සාකච්ඡාවට භාජනය කළ යුතුයයි සභාපතිවරයා කියා සිටියේය.

සී. බීඩි දුම්කොළ වගා ගොවීන්ට ගෙවීම්

බීඩි දුම්කොළ වගා කරන ගොවීන්ට ගෙවීමේදී ප්‍රමාද සිදුවන බව පේදුරුතුඩුවේ මන්ත්‍රිවරයා පැමිණිලි කළේය. පසුගිය වර්ෂයේදීද මෙවැනි ප්‍රමාද සිදුවිය. මේ නිසා තවමත් මුදල් ලබා නොමැති ගොවීන්ට වහාම ගෙවීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය. ගොවීන්ගෙන් බීඩි දුම්කොළ මිළට ගන්නා බීඩි නිෂ්පාදකයින්ගේ සංගමයට රජයෙන් හෝ බැංකුවලින් ණය මුදල් ලබාගෙන වහාම ගෙවීම් කරන්නට හැකියාව තිබේ. එසේ කළහොත් මෙම වෙළඳාම් කටයුතුවලදී අතරමැදියාට තැනක් නොලැබේ. ගොවීන්ට දුෂ්කරතාවයක් සිදුනොවන පරිද්දෙන් දුම්කොළ ලබාගත් වහාම ගොවීන්ට ඒ සඳහා ගෙවන ලෙස දි. කෘ. ව්‍යා. නි. විසින් බීඩි නිෂ්පාදකයින්ගේ සංගමයෙන් ඉල්ලා සිටිය යුතුයයි කමිටුව තීරණය කළාය.

ඩී. නාගරික සභාවේ ළිඳ

නාගරික සභාවට බද්දක් දී ඇති බවත් ජල සම්පාදන යෝජනා ක්‍රමයේ දෙවන පියවර නිමවන තුරු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට මෙම ළිඳ පාවිච්චි කිරීමට හැකිවනු වස් බද්ද අවසන් කරන බවත් පේදුරුතුඩුවේ මන්ත්‍රිතුමාගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් අතිරේක දිසාපතිවරයා පැවසීය.

රැස්වීම සවස 1.40 ට පමණ නිමාවට පත්විය.

අත්සන—————————.
ලේකම්.

අත්සන් කළේ/වර්නන් අබේසේකර,
දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ සභාපති
සහ යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති.

1967 ජූනි මස 1 වැනි දින
යාපනයේ කච්චේරියේදීය.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**67.6.23 වැනි දින පෙරවරු 9.30 ට මහලේකම් කාර්‍යාලයීය සාකච්ඡා ශාලාවේදී පැවැත්වුණු යාපනය දිස්ත්‍රික්කයේ සම්බන්ධීකරණ කමිටුවේ රැස්වීමේ සටහන**

යාපනයේ දිසාපති වර්නන් අබේසේකර මහතා මූලසුන දැරිය.

**සහභාගි වූවෝ**

1. ජේ. එම්. සබාරත්නම් මහතා, යාපනය දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපති.
2. එස්. රාසරත්නම් මහතා, සෞඛ්‍ය සේවා අධිකාරි, යාපනය.
3. ඒ. සී. විශ්වනාදන් මහතා, ප්‍රා. ආ. නි., වඩමරච්චි.
4. ටී. කන්දසාමි මහතා, සහකාර ඉ. සං. නි.
5. ටී. භගවදස් මහතා, අතිරේක කා. ස. යාපනය කච්චේරිය.
6. එක්ස්. ස්වාමිපිල්ලේ මහතා, ඩිපෝ අධිකාරි, ලංගම, යාපනය.
7. ඒ. තම්බිරාජා මහතා, මැණුම් අධිකාරි, උතුරු කොට්ඨාශය.
8. ඒ. මහාසිවම් මහතා, කම්කරු නිලධාරි, යාපනය
9. එන්. සිවසිතම්පරම් මහතා, පාලන සහකාර, සමාජ සේවා අංශය.
10. කේ. කන්දසාමි මහතා, කා. ස. යාපනය කච්චේරිය.
11. පී. මුරුගේසු මහතා, අති. කා. ස., යාපනය කච්චේරිය.
12. කේ. පී. පතිරණ විමලධර්ම මහතා, සහකාර රේගු අයකැමි, යාපනය.
13. එච්. ඊ. පිල්ලේනායගම් මහතා, ප්‍රා. ආ. නි., යාපනය.
14. පී. එල්. පැට්රික් මහතා, වලි, උතුර, ප්‍රා. ආ. නි.
15. එම්. මතිබාලසිංහම් මහතා, ස. සං. ස. කො., යාපනය නැගෙනහිර.
16. ආර්. සිතම්බර පිල්ලේ මහතා, ප්‍රා. ආ. නි., තෙන්මරච්චි.
17. එස්. අරුනාචලම් මහතා, ප්‍රා. ආ. නි., පච්චිලපලෙයි.
18. ටී. එස්. වේදනායගම් මහතා, අතිරේක නියෝජ්‍ය පිස්කල්, යාපනය.
19. ටී. කන්දසාමි මහතා, ස. සං. ස. කො., යාපනය දකුණ.
20. එස්. සුබ්‍රමනියම් මහතා, ප්‍රාදේශීය කළමනාකාර තැන, ජාතික ලුණු සංස්ථාව.
21. පී. කුමාරස්වාමි මහතා, ස. සං. ස. කො., යාපනය බටහිර.
22. ඒ. සිවසිතම්පරම් මහතා, ස. ගො. ජ. සෙ. කො., (II) යාපනය.
23. එම්. එස්. රාජසිංහම් මහතා, ඉඩම් රෙජිස්ට්‍රාර් හා අතිරේක දිස්ත්‍රික්ක රෙජිස්ට්‍රාර්, යාපනය.
24. ආර්. යෝගනාදන් මහතා, ප්‍රා. ආ. නි. කරච්චි.
25. එස්. විජේසුන්දරම් මහතා, කා. ස. ජාතික නිවාස.
26. ආර්. පේරම්පලම් මහතා, ප්‍රා. මාර්ග ප්‍රවාහන නිළධාරි, යාපනය.
27. වි. කන්දපිල්ලෙයි මහතා, ප්‍රා. ආ. නි. වලි, නැගෙනහිර.
28. එන්. නඩේසන් මහතා, වි. ඉ. ර. වැ. දේ., යාපනය.
29. ටී. තර්මලිංගම් මහතා, ප්‍රා. අධිකාරි, තැපැල් කාර්‍යාල (උතුර).
30. එස්. එස්. සයිමන් මහතා, දි. ඉ. නි., යාපනය කච්චේරිය.
31. කේ. සබාරත්නම් මහතා, ස. ගො. ජ. සෙ. කො., යාපනය.
32. ටී. කනගදරම් මහතා, අලෙවි නිළධාරි.
33. ටී. වී. බාලසුබ්‍රමනියම් මහතා, විදුලි ඉංජිනේරු ,යාපනය ප්‍රදේශය , චුන්නාකම්.
34. එන්. සෙල්වනායගම් මහතා, ප්‍රා. ආ. නි. , පූනගරි.
35. ටී. එස්. තිරුපාලසිංහම් මහතා, සහකාර කළමනාකරු, ධීවර සංස්ථාව, යාපනය.
36. ඒ. ඩී. ආර්. රත්නරාජා මහතා, අඩවි වණ නිලධාරි, උතුරු කොට්ඨාශය, යාපනය.
37. එන්. ජයනාදන් මහතා, දි. ඉ. නි., යාපනය.
38. එස්. සිවඥනම් මහතා, දි. ඉ. නි., යාපනය.
39. පී. රාමනාදන් මහතා, වි. ඉ. ර. වැ. දෙ., මුලතිව්.
40. එස්. පත්මනාදන් මහතා, නියෝජ්‍ය ආ. ඉ. ,උතුරු කොට්ඨාශය.
41. ටී. මුරුගේසුපිල්ලේ මහතා, උප දිසාපති , යාපනය.
42. එස්. කන්දවනම් මහතා, සහකාර අධ්‍යක්ෂ, ග්‍රාම ස. සහ කු. කර්., යාපනය.
43. එම්. තම්බිමුත්තු මහතා, ප්‍රා. ආ. නි. තුනුකායි.
44. එස්. වී. සොර්නලිංගම් මහතා, උප සභාපති, කන්කසන්තුරේ සු. න. සභාව.
45. ටී. පොන්නම්පලම් මහතා, ප්‍රා. ආ. ප. යාපනය.
46. එන්. පී. එස්. විජේසූරිය මහතා, සා. මැ. කො., යාපනය.
47. ඒ. ඥණසුන්දරම් මහතා, බන්ධනාගාර අධිකාරි, යාපනය.
48. ඒ. කන්දයියා මහතා, ප්‍රා. ආ. නි. මුලස්ථාන, යාපනය.
49. එස්. ටී. කන්දයියා මහතා, වා. ඉ. ,යාපනය, උතුරු කොට්ඨාශයේ දි. වා. ඉ. වෙනුවට.
50. එස්. විනයාගලිංගම් මහතා, ප්‍රා. ආ. නි. දිවයින්.

මැයි මස 26 වැනි දින පැවැත්වූ රැස්වීමේ කටයුතු සම්පූර්ණයෙන් නිම කිරීමට නොහැකි වූ හෙයින් එදින න්‍යාය පත්‍රයේ ඉතිරි වැඩ කොටස කරගෙන යෑම සඳහා අද රැස්වීම පැවැත්වෙන බැව් සභාපතිවරයා දන්විය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දෙපාර්තමේන්තුවල ප්‍රගති වාර්තා

(අ) අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ප්‍රගති වාර්තාව ඉදිරිපත්කර සාකච්ඡාවට භාජනය කරන ලදී.

ඒ. නච්චිකුඩ මුස්ලිම් පාඨශාලාව

නච්චිකුඩ මුස්ලිම් පාඨශාලාවට අවශ්‍ය ඉඩම් සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය කවරේදැයි කිලිනොච්චි මහජන මන්ත්‍රීවරයා විමසීය. මේ සඳහා අක්කර පහක රජයේ ඉඩමක් මැන ඇති අතර එය ළඟදීම අධ්‍යාපන දෙපාර්තමේන්තුවට බාරදීමට සූදානම් කර ඇති බව ප්‍රා. ආ. නි. මූලස්ථාන පැවැසුවේය.

බී. තිරුනගර් උරුතිරපුරම් නව පාඨශාලාව

මෙම පාඨශාලාව සඳහා වෙන්කර ඇති ඉඩම ප්‍රජා මධ්‍යස්ථානය සඳහා වෙන්කර ඇති ඉඩම් ඇතුළත ගැනෙන බවත් ඒ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට භාරදිය හැකි බවත් අතිරේක දිසාපති කියා සිටියේය.

(ආ) ධීවර දෙපාර්තමේන්තුව

ඒ. මාළුවන් හා ඉස්සන් ඇතිකිරීම

අත්හද බැලීම සඳහා දිය අගල සූදානම්ව ඇති බව සහකාර බන්ධනාගාර අධිකාරී ඥානසුන්දරම් මහතා දන්වීය. එහෙත් අවශ්‍ය පමණ උසට වතුර රඳවා ගැනීමට දව දඬු හෝ මාළුවන් පැනයෑම වැළැක්වීම පිණිස යකඩ දැල් හෝ සැපයීමට තම දෙපාර්තමේන්තුවට අරමුදල් නැති බව ඔහු වැඩි දුරටත් සඳහන් කළේය.

මේ කාර්‍යය සඳහා අවශ්‍යවන අරමුදල් සපයන ලෙස ධීවර දෙපාර්තමේන්තුවට ලියා යැවිය යුතුයයි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව ඒකමතිකව තීරණය කළාය. මේ සඳහා රු. 500 ක මුදලක් ප්‍රමාණවත් වෙතැයි සඳහන් කරන ලදී. තවද මෙය ධීවර කර්මාන්තයේ ගැටළු සම්බන්ධයෙන් සොයා බැලීමට පත්කරන ලද අනුකාරක සභාව විසින් සොයා බැලිය යුතුයයිද වැඩි දුරටත් තීරණය කරන ලදී.

(ඉ) තැපැල් දෙපාර්තමේන්තුව

ප්‍රගති වාර්තාව ඉදිරිපත් කර සාකච්ඡා කරන ලදී.

ඒ. නව උප තැපැල් කාර්‍යාල

පහත සඳහන් ජනපද ව්‍යාපාරවලට නව උප තැපැල් කාර්‍යාල සැපයිය යුතුයයි කිලිනොච්චි මහජන මන්ත්‍රීවරයා ඉල්ලීමක් කළේය.

1. කරියාලෙයි නගපාඩුව
2. මුලන්කාවිල්
3. තෙනියන්කුලම සහ
4. පලයමුරුකන්ඩිකුලම්

මෙම උප තැපැල් කාර්‍යාල සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ඉදිකරන බැවින් තැපැල් දෙපාර්තමේන්තුව විසින් කළ යුත්තේ උපකරණ සැපයීම සහ කාර්‍ය මණ්ඩලය පමණක් බැව් කියා සිටින ලදී. මෙම ගොඩනැගිලි 1968 ජනවාරි මාසයේදී පමණ නිමවනු ඇත. මේ එක් එක් උප තැපැල් කාර්‍යාල යට උප තැපැල් ස්ථානාධිපතිවරයෙකු හා තැපැල් බෙදන්නෙකු අවශ්‍ය වේ.

බී. පුත්තුවෙඩ්ඩුවන් උප තැපැල් කාර්යාලය

කාර්යාලයෙහි සහ නිවාස වල ආර්ථික කුලිය වශයෙන් රුපියල් 20 ක් ගෙවන ලෙස යථෝක්ත තැපැල් ස්ථානාධිපතිවරයාට නියම කර තිබෙන බව කිලිනොච්චි මහජන මන්ත්‍රීවරයා දන්වීය. මොහුට ගෙවනු ලබන්නේ රුපියල් 25 ක දීමනාවකි. තවද මෙය සී ශ්‍රෙණියේ උප තැපැල් කාර්යාලයකි. මේ සඳහා අයකරන ආර්ථික කුලිය අධික බව ඔහු පැවසීය. ආර්ථික කුලිය තක්සේරු කරන්නේ ප්‍රා. ආ. නි. විසින් බවත් මෙහි කුලිය නැවත තක්සේරු කළ හැකි බවත් අතිරේක දිසාපතිවරයා කීය.

(ඊ) රජයේ වැඩ දෙපාර්තමේන්තුව

ප්‍රගති වාර්තාව ඉදිරිපත් කර සාකච්ඡා කරන ලදී.

ඒ. අලියාවලෙයි මුල්ලියන් පාර

යථෝක්ත පාර ගල් හා තාර දමා සකස් කිරීම පිණිස ඇස්තමේන්තු සකස් කර ඇති බවත් එහි කටයුතු මේ මුදල් වර්ෂයේදී කරන බවත් උතුරු කොට්ඨාශයේ අ. ඉ. සඳහන් කළේය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බී. මාන්කුලම් තුනුකායි පාර**

මෙම පාරේ පළමුවන සැතැප්ම 3.8 වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් නිම කැරෙන බව උතුර කොට්ඨාශයේ ආ. ඉ. දන්විය. මේ සඳහා ඇස්තමේන්තු සකස් කර ර. වැ. දෙ. විසින් දනට මාස හතරකට පමණ පෙර වාරිමාර්ග දෙපාර්තමේන්තුවට යවා ඇත. මෙහි වැඩ ඉක්මනින් ආරම්බ වන බව සඳහන් කරන ලදී.

**සී. කිලිනොච්චි ප්‍රා. ආ. නි. මාර්ගයට ප්‍රවේශ මාර්ගය**

මෙම මුදල් වර්ෂය ඉකුත්වීමට කලින් මෙම ප්‍රවේශ මාර්ගය ගල් හා තාර දමා සකස් කරන බව උතුරු කොට්ඨාශයේ ආ. ඉ. කියා සිටියේය.

**ඩී. මාන්කුලම් තුනුකායි පාර**

මෙම මාර්ගයේ දෙළොස්වන සැතපුම ඉස්සීමට සිදුවී ඇති බව කිලිනොච්චියේ මහජන මන්ත්‍රීවරයා කියා සිටියේය. රජයේ වැඩ අධ්‍යක්ෂවරයා යාපනයට පැමිණෙන අවස්ථාවේදී මේ ගැන සාකච්ඡා කරන බව සභාපතිවරයා දන්විය.

**ඊ. පල්ලවරයාන් කඩ්ඩු පාර**

මෙම පාරේ 18, 19 සහ 20 සැතපුම්වල කිසිම වැඩි දියුණුවක් කර නැති බව කිලිනොච්චියේ මහජන මන්ත්‍රීවරය පැමිණිලි කළේය. මේ සඳහා ගල් තලන රෝලක් නොමැති බවත් එවැනි රෝලක් ලබා ගත් වහාම මෙම වැඩය නිම කරන බව උතුරු කොට්ඨාශයේ ආ. ඉ. දන්විය.

**එෆ්. පල්ලවරායන් කඩ්ඩු තෙනියන්කුලම් පාර**

මෙම පාරේ 14 වන සහ 15 සැතපුම් ඉතාමත් අසතුටුදයක තත්ත්වයක ඇති හෙයින් වහාම එය වැඩිදියුණු කළ යුතුව ඇති බව කියා සිටින ලදී. තමා මේ ගැන සොයාබලන බව උතුරු කොට්ඨාශයේ ආ. ඉ. දන්විය.

(උ) සුරාබදු දෙපාර්තමේන්තුව

**ඒ. සුරාබදු මධ්‍යස්ථානය පරන්තන්**

මේ සඳහා වෙන්කර ඇති ඉඩම කාර්යාල සහ නිවාස සඳහා ප්‍රමාණවත් නොවන බව ප්‍රධාන නිර්මාන ශිල්පි විසින් දන්වා ඇතැයි උ. කො. ආ. ඉ. කීවේය. දනට සුරාබදු මධ්‍යස්ථානයේ කාර්යාලය සඳහා ඉඩකඩ සැපයුව හොත් ප්‍රමාණවත් වෙතැයි යාපනයේ සුරාබදු අධිකාරිවරයා කියා සිටියේය. කාර්යාලයේ පමණක් සැපයීම ප්‍රශ්නය සම්බන්ධයෙන් උ. කො. ආ. ඉ. කටයුතු කළ යුතුයයි තීරණය විය. නිවාස සඳහා අවශ්‍යවන ඉඩම් සම්බන්ධයෙන් පසුව ක්‍රියා කරන බව අතිරේක දිසාපති දන්විය.

(ඌ) ලංකා ගමනාගමන මණ්ඩලය

තමාගේ මැතිවරණ කොට්ඨාශයේ බස් සේවා ඉතාම අසතුටුදයක බවත් මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් සම්බන්ධ කරණ කමිටුව ලංගමයේ ප්‍රධාන ධාවනාකාර කළමනාකරු සහ ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු සමග සාකච්ඡා කළ යුතුයයි කිලිනොච්චියේ මහජන මන්ත්‍රීවරයා කිය.

සියළුම ලංගම ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම පිණිස ඒ නිලධාරින්ට ආරාධනා කිරීමට ඒකච්ඡන්දයෙන් තීරණය විය.

(එ) පළාත් පාලන දෙපාර්තමේන්තුව

ඒ. ඒ ඒ ගම් සභාවලට වෙන් කරන ලද මුදල් ප්‍රමාණය දක්වමින් පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා විසින් එවන ලද ලිපිය ඉදිරිපත් කොට සාකච්ඡාවට භාජනය කරන ලදී. එම ලිපියේ පිටපතක් කිලිනොච්චියේ මහජන මන්ත්‍රීවරයාගේ දනගැනීම සඳහා යැවීමටද තීරණය විය.

**බී. ඉරනකිච් ජැටිය**

මේ සඳහා අවශ්‍යවන සැළසුම් හා ඇස්තමේන්තු පලෙයි හි වී. ඉ. විසින් සකස්කරන ලද බව උ. කො. ආ. ඉ. කියා සිටියේය. දනට සහකාර පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඇති රුපියල් හතලිස් දහක මුදලින් මෙම කටයුතු ආරම්භ කළ යුතුයයි සම්මත විය.

(ඒ) ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව

ග්‍රා. සං. කු. කර්. දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂගේ ප්‍රගති වාර්තාව ඉදිරිපත් කර සාකච්ඡා කරන ලදී.

**ඒ. සමුපකාර සංගම් සඳහා නූල්**

65.10.6 වැනි දිනෙන් පසුව ආරම්භකරන ලද සමිතිවලට අළුත් පංගුවක් නිකුත් නොකරන බව සහකාර අධ්‍යක්ෂ වරයා දන්විය.

**බී. පොදු උපයෝගිතා වැඩ**

මේ සඳහා රුපියල් පනස් පන්දහක මුදලක්ද පාරවල් සඳහා රුපියල් විසිපන්දහක මුදලක්ද වෙන්කර ඇති බව කියා සිටින ලදී. ග්‍රා. සං. කු. කර්. අධ්‍යක්ෂගෙන් අතිරේක අරමුදල් ඉල්ලා සිටිය යුතුයයි ඒකමතිකව තීරණය කරන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පොදු උපයෝගිතා වැඩ සඳහා රු. 10,000 කි.

පාරවල් සඳහා රුපියල් 10,000 කි.

**සී. පැදුරු වියීම කල්විලාන්**

පුහුණුවක් ලැබීම සඳහා එක් ප්‍රදර්ශිකාවක් යැවිය යුතුයයි තීරණය විය. මේ සම්බන්ධයෙන් ග්‍රා. සං. කු. කර්. සහකාර අධ්‍යක්ෂ විසින් කටයුතු කඩිනම් කළ යුතුය.

**පොදු කරුණු**

**ඒ. පශු වෛද්‍ය කාර්යාල සඳහා ඉඩම් තෝරාගැනීම**

1. **යාපනය.** පශුවෛද්‍ය පර්යේෂණ රසායනාගාරයක් සඳහා අක්කර කාලක ඉඩමක් මුදාහරිනු ලෙස කැලෑ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටීමට ඒකමතිකව තීරණය විනි.

2. **චාවකච්චේරි.** සුළු නගර සභා භූමිය තුළ පිහිටි ලාච්චම් හතරක ඉඩමක් පශු වෛද්‍ය කාර්යාලයක් සඳහා මුද හරිනු ලෙස චාවකච්චේරියේ සුළු නගර සභාවෙන් ඉල්ලා සිටීමට දිස්ත්‍රික් සම්බන්ධීකරන කමිටුව තීරණය කළාය. සුළු නගර සභා සීමාව තුළ රජයේ වෙනත් ඉඩම් නැති බව වාර්තා කෙරින.

3. **පේදුරුතුඩුව.** නාගරික ප්‍රදේශයට ආසන්නයෙන් පිහිටි සුදුසු රජයේ ඉඩමක් සොයා බලන ලෙස පේදුරු තුඩුවේ ප්‍රා. ආ. නි. ගෙන් ඉල්වා සිටින ලදි.

**බී. මාන්කුලම් පොලිස් ස්ථානය ඉදිකිරීම**

අංක සීබී 902/56 සහ ජූනි 12 දින දරණ ඉ. වා. වී. ලේ. ගේ ලිපිය සාමාජිකයින්ගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි. වවුනිකුලම් හා මුත්තුඉයන් කඩ්ඩිකුලම් යන ස්ථානවලට මාලාවිවලට වඩා මාන්කුලම් කිට්ටු හෙයින් පොලිස් ස්ථාන ගොඩනැගිලි මාන්කුලම්වල ඉදිකිරීම කළ යුතුවේ.

**සී. ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ ශාඛා කාර්යාලයක් යාපනේ පිහිටුවීම**

මුදල් අගහිඟකම් කරණ කොට ගෙන මෙම යෝජනාව ගරු ඇමැති තුමා විසින් කල් දමන ලද බවත් මේ පිළිබඳ වැඩි විස්තර නිවාස කොමසාරිස්ගෙන් ඉල්වා ඇති බවත් කම්කරු හා නිවාස සහ රැකී රක්ෂා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් දන්වා ඇති බව සඳහන් කරන ලදි.

**ඩී. කිලිනොච්චි රෝහලට විදුලි බලය සැපයීම**

කිලිනොච්චි රෝහලට විදුලි බලය සැපයීමේ සියළුම කටයුතු මෙම මුදල් වර්ෂය ඉකුත්වීමට කලින් නිමකරන බව යාපනයේ ප්‍රදේශයේ විදුලි ඉංජිනේරු තැන විසින් ප්‍රකාශ කරන ලදි.

**(ඕ) කෘෂිකාර්මික පාරවල්—ආහාර නිෂ්පාදන**

මේ කාර්යය සඳහා ර. වැ. දේ. විසින් අළුත් උප ශීර්ෂයක් ඇති කර තිබෙන බව සභාපතිවරයා දන්වීය. මේ සම්බන්ධයෙන් අනුකාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව මඟින් එය අනුමත කරන ලදී.

**අනුකාරක සභාවේ සාමාජිකයෝ :**

දි. ඉ. නි. (i) කැඳවුම්කරු
දි. ඉ. නි. (iii)
ප්‍රා. ආ. නි. කිලිනොච්චි
ප්‍රා. ආ. නි. පූනකරි
ප්‍රා. ආ. නි. තුනුකායි
ඉඩම් ලිපිකරු

අනුකාරක සභාවේ නිර්දේශ මෙයට අමුණා ඇති උප ලේඛනවල අඩංගුවේ—

"ඒ" උපලේඛනය : ර. වැ. දෙ. පාරවල් (වර්ග දෙකයි)
"බී" උප ලේඛනය : වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පාරවල්
"සී" උපලේඛනය : ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ පාරවල් (වර්ග 3 යි)
"ඩී" උප ලේඛනය : ගම්සභා කාර්යාලය.

————————,
ලේකම්.

අත්සන් කළේ/වර්නන් අබේසේකර,
දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති සහ
යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති.

1967 ජූලි මස 7 වැනි දින,
යාපනයේ කච්චේරියේ දී ය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උප ලේඛනය ඒ 1

ඒ හා බී වර්ගයේ ර. වැ. දෙ. පාරවල් ප්‍රමුඛතා ලැයිස්තුව

| ප්‍රමුඛතා අංකය | ඩි. ඉ. කොට්ඨාශය | ප්‍රා. ආ. නි. කොට්ඨාශය | පාරේ නම | ඇස්තමේන්තු අංකය | යෝජනා කරන වැඩි දියුණු කිරීම |
|---|---|---|---|---|---|
| 1. | පලෙයි | කරච්චි | පරන්තන්–මුලතිව් පාර | බී. 12 | සැම කාලයකම බස් ධාවනය කළ හැකි වන පරිද්දෙන් ගල් හා තාර දමා සම්පූර්ණ පාරම සකස් කිරීම |
| 2. | පලෙයි | පූනකරි | පූනේරියන්–මන්නාරම පාර පරන | බී. 14 | එම |
| 3. | පලෙයි | කරච්චි සහ පූනකරි | පරන්තන්–පූනේරියන් පාර | බී. 15 | එම |

ගම් සභාවලින් තැනිය යුතු පාරවල්

| ප්‍රමුඛත්වය | ප්‍රා. ආ. නි. කොට්ඨාශය | ගම් සභාව | පාරේ නම | ඉටු කළ යුතු කාර්ය පිළිබඳ විස්තර |
|---|---|---|---|---|
| 1 | කරච්චි | කරච්චි | කිලිනොච්චි තිරුනගර් ජයන්තිනගර් අළුත් පාර සැ. 2 | පස් පිරවීම සහ බොරළු දැමීම |
| 1 බී | වඩමරච්චි | සිලම්බලිඩ්ඩි පාර | මන්නාරම් පාරේ 12 වන සැතපුම් සිට වේරවිල් | පාරේ ඉතිරිය (සැ. 4) සක්ක සහ තාර දැමීම |
| 2 | පූනකරි | පල්ලවරායන්කාඩු | කුමුලමුනෙයි තෙනියන්කුලම් පාර සැ. 2 | සක්ක සහ තාර දැමීම |
| 3 | කරච්චි | කරච්චි | නාවත්කොඩියන් තාඩ්ඩුවන් කොඩ්ඩි පාර සැ. 3 | පස් පිරවීම සහ බොරළු දැමීම |
| 4 | පූනකරි | පූනකරි | නච්චකාඩු පාර 3 වැනි සැතපුම | සක්ක සහ තාර දැමීම |
| 5 | කරච්චි | කරච්චි | කන්දවලෙයි පුලියම්පොක්කනෙයි පාර සැ. 1½ | පස් පිරවීම සහ බොරළු දැමීම |
| 6 | පූනකරි | පූනකරි | තම්බරාය–අත්තෙයි පාර සැ. 2 | සක්ක සහ තාර දැමීම |
| 7 | කරච්චි | පූනකරි | පරන්තන් පාරේ සිට තියාගම් දක්වා අළුත් පාර සැ. 6 | පස් පිරවීම සහ බොරළු දැමීම |
| 8 | පූනකරි | පූනකරි | තියාගම පාර සැ. 3 | පස් පිරවීම සහ බොරළු දැමීම |
| 9 | පච්චිලපල්ලෙයි | මුහමලෙයි | මහනුවර පාරේ 178–79 සැතපුම් අතරේ සිට මුහමලෙයි ග. පු. ව්‍යාපාරයේ සැ, 3/4 | පස් පිරවීම සහ බොරළු දැමීම |
| 10 | කරච්චි | කරච්චි | කන්දවලෙයි මුඩකරෙයි පාර කෝපායි සැ. 2 | පස් පිරවීම සහ බොරළු දැමීම |
| 11 | පූනකරි සහ තුනුකායි | පල්ලවරායන්කඩ්ඩු | පල්ලවරායන්කඩ්ඩු–වන්නෙරිකුලම් | පාර පිළියෙල කිරීම සහ පිළියෙල කිරීම සැ. 10 |
| 12 | පූනකරි | පල්ලවරායන්කඩ්ඩු | මන්නාරම් පාරේ සැ. 12 සිට වේරවිල් දක්වා | පාරේ ඉතිරිය (සැ. 4 යි) සක්ක සහ තාර දැමීම |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**උප ලේඛනය ඒ 2**

**ඩී.ආර්.සී., පී.ආර්.සී. සහ සුළු පාරවල්, පාලම්, බෝක්කු, පැන්නුම් පාලම් ඇතුළු ඉටු කළ යුතු, වැඩිදියුණු කිරීම් තවමත් භාර ගෙන නොමැති පාරවල්,**

ගග හරහා එතරවන ස්ථාන, බෝක්කු සහ පාලම් ඉදිකිරීම—164 වන ශීර්ෂය, 7 වන සම්මතය, 64 උප ශීර්ෂය. 66/67 ඇස්තමේන්තුව

| | වි. ඉ. කොට්ඨාශය | ප්‍රා.ආ.නි. කොට්ඨාශය | පාරේ නම | ඇස්තමේන්තු අංකය | යෝජනා කරන වැඩි දියුණු කිරීම් |
|---|---|---|---|---|---|
| 1. | පලෙයි ... | පූනකරි ... | පල්ලෙවරායන්කාඩු-වෙල්ලන්කුලම් ... | සී. 22 ... | පල්ලෙවරායන්කඩ්ඩු-වෙල්ලන්කුලම් නිම කර නැති කොටස සක්ක සහ තාර දමා සකස් කිරීම දළ වශයෙන් සැ. 5 කි. |
| 2. | මුල්ලතිව් ... | තුනුකායි ... | මාන්කුලම්-වෙල්ලන්කුලම් ... | ඩී. 32 ... | 9–10 සැතපුමේ ගොඩගසා ඇති සක්ක අතුරා තාර දැමීම. 10–13 වන සැතපුම් ගල් හා තාර දමා සකස් කිරීම |
| 3. | පලෙයි ... | කරච්චි ... | පරන්තන් කරච්චි මුලතිව් ... | සී. 25 ... | 9–11 සැතපුම් සහ 17 වන සැතපුම් සක්ක සහ තාරදමා සකස් කිරීම. |
| 4. | පලෙයි ... | තුනුකායි ... | නාගපුඩ්ඩුවාන් පටු මග ... | ඩී. 61 ... | තුනුකායි තෙනියන්කුලම් සැ. 7 බොරළු දැමීම සහ බෝක්කු තැනීම තෙරන්කන්දල් ආරු ඔයට උඩින් පාලමක් දැමීම පිණිස රු. 25 ඉ. සං. අ. වෙත ඇත. |
| 5. | පලෙයි ... | පූනකරි ... | සෙම්මන්කුන්ඩු පලාව් කිරන්චි ... | සී. 45 ... | පල්ලවරායන්කඩ්ඩු සහ පොන්නවේලි අතර සැ. 11 බොරළු දමා බෝක්කු ඉදිකිරීම |
| 6. | පලෙයි ... | කරච්චි ... | වඩ්ඩකච්චි-පුල්ලියම්පොක්කනයි ... | සී. 38 ... | සැ. 14 ක් බොරළු දැමීම සහ බෝක්කු ඉදිකිරීම |
| 7. | මුල්ලතිව් ... | තුනුකායි ... | කොකුවිල්-තුනුකායි ... | සී. 15 ... | සැ. 12.85 කෙක්කාවිල් සිට පුතුවෙඩ්ඩාවාන් දක්වා ඇති සක්ක සහ තාර දමා සකස් කිරීම. ඉතිරි කොටස බොරළු දැමීම බෝක්කු ඉදිකිරීම |
| 8. | පලෙයි ... | පූනකරි ... | කාක්කයිතිව්-කාවෙයිකුලම් ... | ඩී. 58 ... | කාවියිකුලම් සහ තම්බිරායි හන්දිය අතරේ ඇති පාරේ සැ. 6 ක් බොරළු දමා සකස් කිරීම. බෝක්කු තැනීම, හානි සිදු වූ බෝක්කු දෙකක් අළුත් වැඩියා කිරීම, කරුක්කතිව් සහ වෙට්ටියකුරුච්චි අතර සැතපුම් 1 සක්ක දැමීම සහ තාර දැමීම |
| 9. | පලෙයි සහ... මුලතිව් | කරච්චි | මුරුසුමොඩ්ඩි-කරුප්පඩ්ඩුමුරිප්පු ... | සී. 31 ... | සැ. 6 ක් බොරළු දමා සකස් කිරීම, බෝක්කු දැමීම මුලතිව් වි. ඉ. කොට්ඨාශයේ ඇති සැ. 2 ක් බොරළු දමා සකස් කිරීම සහ බෝක්කු ඉදිකිරීම |
| 10. | පලෙයි ... | පූනකරි සහ කරච්චි | නාගපඩ්ඩුවාන් අඩි පාර (පල්ලෙවරායන් කාඩු සිට තෙන්නියකුලම්) | ඩී. 61 ... | බොරළු දැමීම සහ බෝක්කු ඉදි කිරීම |
| 11. | මුලතිව් ... | තුනුකායි ... | පුවරසන්කුලම්-තුනුකායි පාර ... | ඩී. 34 ... | තුනුකායි සිට නඳන්කන්දල් දක්වා ඇති සැතපුම් හය බොරළු සහ බෝක්කු දමා සෑදීම. පල්ආරු ඔයට උඩින් පාර දැමීමට ඉ. ස/අ. රු. 50,000 ක් වෙන් කර ඇත. |
| 12. | පලෙයි ... | පූනකරි ... | පූනකරි-කල්මුනෙයි පාර ... | ඩී. 57 ... | පළමු සැ. 6 බොරළු දමා බෝක්කු සෑදීම, ගල් තාර දමා සකස් කිරීම |
| 13. | පලෙයි ... | කරච්චි ... | කන්දවලෙයි-වඩකච්චි ... | සී. 29 ... | සැතපුම් 3½ ක් ගල් හා තාර දමා සකස් කිරීම. |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| | වි. ඉ. කොට්ඨාශය | ප්‍රා. ආ.නි. කොට්ඨාශය | පාරේ නම | ඇස්තමේන්තු අංකය | යෝජනා කරන වැඩි දියුණු කිරීම |
|---|---|---|---|---|---|
| 14. | පලෙයි | පච්චිලපලෙයි | මරුතන්කර්නි–වෙට්ටිලකර්නි | ඕ. 51 | සැතපුමක් ගල් හා තාර දමා සකස් කිරීම, සැතපුම් 1 1/2 ක් බොරළු සහ බෝක්කු දමා සකස් කිරීම |
| 15. | පලෙයි | තෙන්මරාච්චි | වරනි–කුඩතනෙයි | සී. 53 | සැතපුම් 1 1/2 ක් සක්ක සහ තාර දැමීම |
| 16. | පලෙයි | පච්චිලපලෙයි | අයියකච්චි–චුන්ඩිකුලම් | ඕ. 56 | සැතපුම් 3 ක් පස් පිරවීම, බොරළු දමා බෝක්කු සෑදීම, කල්වායල් සිට මුල්ලියන් බෙහෙත් හල් දක්වා ඇති සැ. 3 ක් සක්ක සහ තාර දමා සකස් කිරීම |
| 17. | පලෙයි | පලෙයි | කච්චි–කටපාලි–එලිෆන්ට්පාස් පාර | ඕ. 60 | පලෙයි සිට කැටපාලි දෙසට ඇති සැ. 4 බොරළු දමා සහ බෝක්කු දැමීම |
| 18. | පලෙයි | තෙන්මරාච්චි | නාවත්කඩු–සුද්දිපුරම් | ඕ. 64 | සැ. ½ ක් සක්ක සහ තාර දමා සකස් කිරීම |
| 19. | යාපනය | වලි නැගෙනහිර | කයිතඩි–නීර්වැලි | ඕ. 136 | සැ. 1 ක් සක්ක සහ තාර දමා සකස් කිරීම |
| 20. | යාපනය | වැලි උතුර | අලවෙඩ්ඩි අම්පනෝ දක්වා කන්කසන් තුරේ පාරේ 8 වන සැතපුම | | ඉතිරිය සක්ක සහ තාර දමා සකස් කිරීම. |
| 21. | යාපනය | වැලි නැගෙනහිර | රජ විදිය–පුත් තූර් තින්නෙවේලි | | පළමුවන සැතපුම සක්ක සහ තාර දමා සකස් කිරීම |
| 22. | යාපනය | වැලි බටහිර | වෙඩ්ඩියමඩම්–සන්ගරතෙයි | සී. 65 | සැ. 2 1/2 ක් සක්ක සහ තාර දමා සකස් කිරීම |
| 23. | යාපනය | දිවයින් | මන්කුප්පන්–වාදි | සී. 84 | සැ. 2 1/4 ක් සක්ක සහ තාර දමා සකස් කිරීම |
| 24. | යාපනය | යාපනය | අරසඩි පටුමහ කොණ්ඩාවිල් | | සැ. 1 ක් සක්ක සහ තාර දමා සකස් කිරීම |
| 26. | යාපනය | තෙන්මරාච්චි | මාඩුවිල් මහා විද්‍යාලය පාර | සී. | සැ. 1 ක් සක්ක සහ තාර දමා සකස් කිරීම |
| 27. | යාපනය | ඩෙල්ෆ්ට් | පිල්ලෙයාර් කෝවිල–සරපිඩ්ඩි පාර | ඕ. 121 | සැ. 1 ක් සක්ක සහ තාර දමා සකස් කිරීම |
| 28. | යාපනය | වඩමරාච්චි | පර්ලි–වර්ණි පාර නැගෙනහිර කරවඩ්ඩි (ග්‍රා. සේ. කොටස) | | සක්ක සහ තාර දමා සකස් කිරීම |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිශිෂ්ටය

බී උප ලේඛනය

## වාරිමාර්ග දෙපාර්තමේන්තු පාරවල් ප්‍රමුඛතා ලැයිස්තුව

| ප්‍රමුඛතා අංකය | වි. ඉ. කොට්ඨාශය | ප්‍රා. ආ. නි. කොට්ඨාශය | පාරේ නම | යෝජනා කරන වැඩි දියුණු කිරීම |
|---|---|---|---|---|
| 1 | කිලිනොච්චි | තුනුකායි | අක්කරයන්කුලම්–අම්බලපෙරුමල්කුලම් කොඩෙයිකඩ්ඩි-කුලම්–තෙනියන්කුලම් ප්‍රවේශ මාර්ගය | සෑම කාලයකම බස් ධාවනය කළ හැකිවන පරිද්දෙන් සම්පූර්ණ පාරම සක්ක සහ තාර දමා සකස් කිරීම. |
| 2 | එම | කිලිනොච්චි | අක්කරයන්කුලම්–ස්කන්ධපුරම් පාර | එම |
| 3 | වවුනිකුලම් | මන්නායි | වවුනිකුලම් වම්ඉවුර ප්‍රධාන ඇලපාර | එම |
| 4 | එම | තුනුකායි | වවුනිකුලම් දකුණු ඉවුර ප්‍රධාන ඇලපාර | එම |
| 5 | කිලිනොච්චි | එම | අක්කරයන්–වන්නාර්කුලම් පාර | එම |
| 6 | එම | කිලිනොච්චි | පූල් පාර–වැලිකන්දල් ... | සැ : 2½ ක් පස් පිරවීම සහ බොරළු දැමීම |
| 7 | එම | එම | වේලර් පාර ඩී. 10 -කුන්වුපරන්තන් | සැ : 4 ක් පස් පිරවීම සහ බොරළු දැමීම |
| 8 | එම | එම | ඩී. 9 සිට ආරක්ෂිත ඉඩමේ ඔස්සේ අළුත් පාර | සැතපුම් 3 ක් පස්පිරවීම සහ බොරළු දැමීම |

සී 1 උප ලේඛනය

### පළමුව ඉඩම් කොමසාරිස් විසින් ඉදිකොට පසුව වෙනත් අයට බාරදුන් පාරවල්
### නව ජනපද ව්‍යාපාර

| ප්‍රමුඛත්වය | පාරේ නම | වැඩ පිළිබඳ කෙටි විස්තර | දළ ඇස්තමේන්තුව රු. | ශ. | පාර භාරගනු ලැබූ අය |
|---|---|---|---|---|---|
| 1 | ඩයන්කඩ්ඩුකුලම් ප්‍රධාන ප්‍රවේශ මාර්ගය සැතපුම් 3 | සක්ක සහ තාර | 1,12,000 | 0 | ර. වැ. දෙ. |
| 2 | මරුතප්කුලම් ප්‍රධාන ප්‍රවේශ මාර්ග සැතපුම් 2¼ | එම | 1,00,000 | 0 | එම |
| 3 | මුරුන්කන්ඩිකුලම් ප්‍රධාන ප්‍රවේශ මාර්ගය සැතපුම් ½ | එම | 60,000 | 0 | එම |
| 4 | මිරුසුවිල් උ. තෙ. යෝ. ප්‍රධාන ප්‍රවේශ මාර්ග සැතපුම් ½ | එම | 23,000 | 0 | එම |
| 5 | විශ්වමඩුකුලම් උ. තෙ. යෝ. ප්‍රධාන ප්‍රවේශ මාර්ග සැතපුම් 2 | එම | 92,000 | 0 | එම |
| 6 | කරියාලෙයි නාගපාඩුවාන් දම්වැල් 3232 ... | බොරළු | 3,73,200 | 0 | ගම් සභාව |
| 7 | මුල්ලන්කාවිල් උ. ත. යෝ. දම්වැල් 400 | එම | 64,000 | 0 | එම |
| 8 | අක්කරයන් ප්‍රධාන ප්‍රවේශ මාර්ගය සැ : 2¼ | සක්ක සහ තාර | 1,00,000 | 0 | ර. වැ. දෙ. |
| 9 | බී. ඕ. පී. අභ්‍යන්තර පාරවල්, මුරුකන්ඩිකුලම් දම් 780 | බොරළු | 1,39,000 | 0 | ගම් සභාව |
| 10 | බී. ඕ. පී. අභ්‍යන්තර පාරවල් මරුතන්කුලම් දම්. 790 | එම | 1,27,000 | 0 | එම |
| 11 | බී. ඕ. පී. පාරවල් විශ්වමඩුකුලම් දම්. 500 | එම | 86,000 | 0 | එම |
| 12 | බී. ඕ. පී. අභ්‍යන්තර පාරවල් උඩයර් කඩ්ඩුකුලම් දම්. 514 | එම | 87,000 | 0 | එම |
| 13 | අභ්‍යන්තර පාරවල් අක්කරයන් දම් : 720 | එම | 12,0,000 | 0 | එම |
